279 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 279 - இல. 4
Volume 279 - No. 4

2020 නොවැම්බර් 20වන සිකුරාදා
2020 நவம்பர்20, வெள்ளிக்கிழமை
Friday, 20th November, 2020

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ජනාධිපතිවරයාගෙන් ලත් සන්දේශය:**
මහජන ආරක්ෂක ප්‍රකාශනය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**විසර්ජන පනත් කෙටුම්පත, 2021 — [තුන්වන වෙන් කළ දිනය]:**
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී.

**කල් තැබීමේ යෝජනාව:**
කල්මුණේ උතුර දෙමළ උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස උසස් කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2021 - [ஒதுக்கப்பட்ட மூன்றாம் நாள்]:**
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**
கல்முனை வடக்குத் தமிழ் உப பிரதேச செயலகத்தை பிரதேச செயலகமாகத் தரமுயர்த்தல்

---

# PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation

ORAL ANSWERS TO QUESTIONS

APPROPRIATION BILL, 2021 - [Third Allotted Day]:
Second Reading – Debate Adjourned

ADJOURNMENT MOTION:
Upgrading of Kalmunai North Tamil Sub-Divisional Secretariat to a Divisional Secretariat

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2020 නොවැම්බර් 20වන සිකුරාදා***
*2020 நவம்பர்20, வெள்ளிக்கிழமை*
*Friday, 20th November, 2020*

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු රංජිත් සියඹලාපිටිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம்மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர்அவர்கள் [மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. RANJITH SIYAMBALAPITIYA] in the Chair.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகுபிரதிச் சபாநாயகர்அவர்கள்)
(The Hon. Deputy Speaker)

පහත සඳහන් සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් ගරු කථානායකතුමා වෙත ලැබී තිබෙනවා.

**ශ්‍රී ලංකා ජනාධිපති**
**இலங்கை சனாதிபதி**
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7
2020 නොවැම්බර් මස 17 වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

**ගෝඨාභය රාජපක්ෂ**



## ලිපිලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்டபத்திரங்கள்
## PAPERS PRESENTED

2019 වර්ෂය සඳහා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව. - [අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில்இருக்கக்கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2019 වර්ෂය සඳහා කාන්තා, ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව.- [ගරු ජී.එල්. පීරිස් මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக்கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகுபிரதிச் சபாநாயகர்அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු දුමින්ද දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ශෙහාන් සේමසිංහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු තේනුක විදානගමගේ මහතා**
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැල්සිරිපුර, පල්ලෙකැන්දවිල යන ලිපිනයෙහි පදිංචි පී.කේ.බී. ගුණතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මාතලේ, කයිකාවල, කොහිලවත්ත යන ලිපිනයෙහි පදිංචි ඒ.ටී.එම්. සෝමසිරි බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගලේවෙල, බඹරගස්වැව, කටුපොත, අංක 401 දරන ස්ථානයෙහි පදිංචි බී.ඩබ්ලිව්.ඩී.එම්.කේ. ධර්මකීර්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) දඹදෙනිය, විජේකෝන් මාවත යන ලිපිනයෙහි පදිංචි ඊ.පී. තිලක් එදිරිසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) අලව්ව, නව තල්වත්ත, බෝගහවත්ත, අංක 213 දරන ස්ථානයෙහි පදිංචි අයි.ආර්.ඩී. ඉඹුලාන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) අවුලේගම, කොළඹ ගෙදර යන ලිපිනයෙහි පදිංචි එම්. ජයතිස්ස මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොළොන්නාව, සාලමුල්ල, අයි.ඩී.එච්. පාර, අංක 51/1/3 දරන ස්ථානයෙහි පදිංචි එම්.එච්.කේ. රහුමාන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## අලුත්වැඩියාව සඳහා චීනයට යැවූ රේඩාර් රිසීවරය හා ඇන්ටනා ස්කෑනරය: විස්තර
*சீனாவுக்குத் திருத்துவதற்காக அனுப்பப்பட்ட ரேடார் ரிசீவர் மற்றும் அன்டெனா ஸ்கேனர்: விபரம்*
RADAR RECEIVER AND ANTENNA SCANNER SENT TO CHINA FOR REPAIR : DETAILS

19/2020

**1. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2014 වර්ෂයේ අප්‍රේල් මාසයේදී, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් රේඩාර් රිසීවරයක් හා ඇන්ටනා ස්කෑනරයක් අලුත්වැඩියාව සඳහා චීනයට යවා තිබූ බවත්;

(ii) එම භාණ්ඩ අස්ථානගත වී ඇති බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) එම භාණ්ඩ ප්‍රවාහනය කිරීමට භාරගත් සමාගම කවරේද;

(ii) එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් කවුරුන්ද;

(iii) එම සමාගම තවමත් ශ්‍රී ලංකාවේ කවර හෝ රාජ්‍ය ආයතනයකට සේවා සපයන්නේද;

(iv) එම භාණ්ඩ අස්ථානගත වීමෙන් සිදුවූ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் நிதி அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை விமானப்படையானது 2014 ஆம் ஆண்டு ஏப்ரல் மாதம் ரேடார் ரிசீவரொன்றையும் அன்டெனா ஸ்கேனரொன்றையும் திருத்துவதற்காக சீனாவுக்கு அனுப்பியுள்ளது என்பதையும்;

(ii) மேற்படி பொருட்கள் காணாமல் போயுள்ளன என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) மேற்படி பொருட்களை ஏற்றிச் செல்வதற்கு பொறுப்பேற்றிருந்த கம்பனி யாது;

(ii) மேற்படி கம்பனியின் பணிப்பாளர் சபை அங்கத்தவர்கள் யாவர்;

(iii) மேற்படி கம்பனியானது தற்போதும் இலங்கையில் ஏதேனுமோர் அரச நிறுவனத்துக்கு சேவை வழங்குகின்றதா;

(iv) மேற்படி பொருட்கள் காணாமற் போனமையால் ஏற்பட்டுள்ள நட்டம் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister, Minister of Finance, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing:

(a) Will he admit that-

(i) the Sri Lanka Air Force had sent a Radar Receiver and an Antenna Scanner to China for repair in 2014 April; and

(ii) the aforesaid items have been misplaced?

(b) Will he inform this House-

(i) the company that undertook the transporting of the aforesaid items;

(ii) the members of the Director Board of the aforesaid company;

(iii) whether aforesaid company still provides services to any State institution in Sri Lanka; and

(iv) the loss incurred by the misplacement of aforesaid items?

(c) If not, why?

**ගරු චමල් රාජපක්ෂ මහතා (වාරිමාර්ග අමාත්‍ය සහ අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - நீர்ப்பாசன அமைச்சரும் உள்ளகப் பாதுகாப்பு, உள்நாட்டலுவல்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa - Minister of Irrigation and State Minister of Internal Security, Home Affairs and Disaster Management)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) සීමාසහිත කෙයාර් ලොජිස්ටික් පුද්ගලික සමාගම (M/s Care Logistics (Pvt.) Ltd.)

(ii) 1. රොමේෂ් ගෙහාන් ඔලිවර් විජේසිංහ

2. ක්‍රිෂාන් ප්‍රියංකර රමේෂ්

3. නිහාල් විජේවීර

4. නලීන් ප්‍රීතිරාජ් වික්‍රම

(iii) මෙම අමාත්‍යාංශයට තොරතුරු ඉදිරිපත් කළ නොහැක.

(iv) අදාළ අයිතම ගුවන් යානය මිලදී ගැනීමේදී එයට සවිකර තිබුණු ඒවා වන අතර එම අවස්ථාවේදී මිල පිරික්සුම් වාර්තාවක් (Budgetary Quotation) අනුව උපකරණයේ වටිනාකම රුපියල් 74,457,100.00ක් වන නමුත් සැපයුම්කරු වෙත අලුත්වැඩියාවට යවන අවස්ථාවේ මෙම අයිතම අබලි අයිතමයක් ලෙස පැවැති අතර එහි වටිනාකම රුපියල් 29,782,840.00ක් වශයෙන් තක්සේරු කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න කෙටියෙන් අහන්න.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට පිළිතුරක් ලබා දීම ගැන ගරු චමල් රාජපක්ෂ අමාත්‍යතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ගරු අමාත්‍යතුමනි, මේක නිහඬව වැසී ගිය කථාවක්. මා හිතන විධියට මේ ගැන පාර්ලිමේන්තුවේ බොහෝදෙනෙක් දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිලියන 74ක වටිනාකමක් තිබෙන මෙම අයිතමය මිලියන 29කට තමයි තක්සේරු කරලා තිබෙන්නේ. මේ පිළිතුරේ, (ආ) (iii) යටතේ ලබා දුන් "මෙම අමාත්‍යාංශයට තොරතුරු ඉදිරිපත් කළ නොහැක" කියන පිළිතුර තමයි අපට වැදගත් වන්නේ. අලුත්වැඩියා කරන්න මේ කියන සමාගමට ලබා දීපු ඒ උපකරණ අස්ථානගත වෙලා තිබෙනවා. අපට ලැබී තිබෙන තොරතුරු අනුව, මේ කියන සමාගමට රජය සමඟ ගනුදෙනු කරන්න තව තවත් අවස්ථා ලබා දී තිබෙනවා. මෙවැනි දෙයක් වුණාට පසුව ඒ ගැන දැනගෙන වැඩක් නැහැ.

ගරු ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, මෙම රේඩාර් යන්ත්‍රය අස්ථානගත වීම සම්බන්ධ පරීක්ෂණයක් පවත්වා යම්කිසි ක්‍රියා මාර්ගයක් ගෙන තිබෙනවාද කියලා. ඒ වාගේම මේ සමාගමට වෙන මොනවා හරි සම්බන්ධයෙන් - දුන්නේ මොනවාද කියලා අපට කියන්න ඕනෑ නැහැ- රජයත් එක්ක ගනුදෙනු කිරීමේ අවස්ථාවක් ලබා දීලා තිබෙනවාද?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
විමර්ශන කටයුතු තව දුරටත් කරගෙන යනවා, ඒක සොයා ගන්න. නමුත්, එහි අබලි කොටස් -කෑලි- වගයක් ඉතුරු වෙලා තිබෙනවා. ඒක තමයි ප්‍රශ්නය.

වෙනත් රාජ්‍ය ආයතනවලට සේවය සපයන්නේද කියන කාරණය සම්බන්ධයෙන් අපට උත්තරයක් දෙන්න බැහැ. ඕනෑ නම් අපි ඒ ගැන සොයා බලා කියන්නම්. සොයා බලා ලිපියක් මඟින් කියන්නම්.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
අපේ ගරු ඇමතිතුමාගේ පිළිතුර අනුව පෙනෙන්නේ, 2014 වසරේදී මේ රේඩාර් යන්ත්‍රය අලුත්වැඩියා කරන්න ලබා දුන් වීන සමාගමේදී එය අස්ථානගත වෙලා, දැන් ඒ ගැන පරීක්ෂණයක් සිදු වෙනවා කියලායි. දැන් මේ වන විට ඒකට අවුරුදු හයක කාලයක් ගෙවී ගිහිල්ලා තිබෙනවා. ඒ ආයතනය වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වෙලා තිබෙනවාද කියන කාරණාව ගැනත් අපට නිශ්චිත පිළිතුරක් ලබා ගන්න බැහැ. මා හිතන විධියට, මේ රටේ වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහත්මයාත් මේ පිළිබඳව යම් අවබෝධයක් තිබෙන නායකයෙක්. මොකද, එතුමා මේ ක්ෂේත්‍රය හා සම්බන්ධව, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විධියටත්, යුද හමුදා නිලධාරියකු විධියටත් සිටි නිසා. අපි රජයෙන් අහනවා, මේක හැංගිලා, සද්ද නැතුව යන ක්‍රියාදාමයක්ද, මේ කාරණාවත් යට යනවාද කියලා. පසුගිය කාලයේ කෑ ගහලා කිව්වා, කොළඹ වරායේ නැඟෙනහිර ජැටිය දෙන්නේ නැහැ කියලා. නමුත් දැන් සද්ද නැතුව දීලා තිබෙනවා. මේ සමාගමේ මේ ක්‍රියාව සම්බන්ධයෙන් දැන් අවුරුදු හයක් ගිහිල්ලාත් උත්තරයක් හොයා ගන්න බැරි වෙලා තිබෙනවා. අපේ ආණ්ඩුවත් ඒකට වග කියන්න ඕනෑ. මොකද, අපිත් අවුරුදු හතරහමාරක් රට පාලනය කළානේ. වර්තමාන රජයටත් අවුරුද්දක් ගෙවිලා තිබෙන තැන, මේ සඳහා නිසි පිළිතුරක් ලබා දෙන්න බැරි වීම තුළින් කියා පාන්නේ මේ රටේ රාජ්‍ය අංශයටත් කොකා පෙන්වන සමාගම් තිබෙනවා කියලායි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය ආණ්ඩුව FCID කියලා නීති විරෝධී සංවිධානයකුත් හැදුවා; නොයෙක් පරීක්ෂණ කළා. ඒ අවුරුදු පහේදී මේක සොයා ගන්න බැරි වුණා නම්, අවුරුද්දක් ඇතුළත සොයන්නේ කොහොමද? ඒ සඳහා අපටත් තව ටික කාලයක් යයි. නමුත්, මම විශ්වාස කරනවා, තව මාස 6ක් විතර යනකොට මේ සියලු තොරතුරු සොයා ගන්න පුළුවන් වෙයි කියලා. එම නිසා, ඔබේ රජය ෆේල්, අපේ රජය පාස්. එච්චරයි කියන්න තිබෙන්නේ.

## ජාතික පාසල් විදුහල්පතිවරුන්: විස්තර
### தேசிய பாடசாலை அதிபர்கள்: விபரம்
### PRINCIPALS OF NATIONAL SCHOOLS: DETAILS

65/2020

**2. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාතික පාසලක විදුහල්පති ධුරයක් දැරීමට තිබිය යුතු සුදුසුකම් කවරේද;

[ගරු චමින්ද විජේසිරි මහතා]

(ii) එසේ නියමිත සුදුසුකම් සහිත විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iii) එසේ නියමිත සුදුසුකම් සපුරා නොමැති විදුහල්පතිවරු සිටින පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) සෑම ජාතික පාසලක් සඳහාම නියමිත සුදුසුකම් සහිත විදුහල්පතිවරුන් පත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள தேசிய பாடசாலைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இப்பாடசாலைகளின் பெயர்கள் யாவையென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தேசிய பாடசாலையொன்றில் அதிபர் பதவியை வகிப்பதற்கு கொண்டிருக்கவேண்டிய தகைமைகள் யாவையென்பதையும்;

(ii) அதற்கமைவாக உரிய தகைமைகளைக் கொண்டுள்ள அதிபர்கள் பதவிவகிக்கும் பாடசாலைகளின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவையென்பதையும்;

(iii) அவ்வாறு உரிய தகைமைகளை பூர்த்தி செய்திராத அதிபர்கள் பதவிவகிக்கும் பாடசாலைகளின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) அனைத்து தேசிய பாடசாலைகளுக்கும் உரிய தகைமைகளைக் கொண்ட அதிபர்களை நியமிப்பதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கை யாதென் பதையும் அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) the number of National Schools in Sri Lanka; and

(ii) the names of those schools?

(b) Will he also inform this House-

(i) the qualifications required to hold the post of principal in a National School;

(ii) the number of schools and their names where there are qualified principals; and

(iii) the number of schools and their names where there are principals who serve without required qualifications?

(c) Will he further inform this House of the steps taken by the Ministry to appoint duly qualified principals for each National School?

(d) If not, why?

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - கல்வி அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 373කි.

(ii) ඔව්. ඒ සියලු විස්තර ඇමුණුම 01හි ඇතුළත් කර ඇත.

(ආ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1/11/111 ශ්‍රේණියේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ/විශේෂ සේවක සංඛ්‍යාවේ හෝ විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම. (විශේෂ සේවක සංඛ්‍යාවේ නිලධාරින් II ශ්‍රේණියට පත් වූ පසු එම ශ්‍රේණියේ සම්පූර්ණ සේවා කාලය තුළ උපරිම ලෙස වසර 5ක් විදුහල්පති/නියෝජ්‍ය විදුහල්පති තනතුරක සේවය කළ හැකිය.)

(ii) පාසල් සංඛ්‍යාව 203කි. ඊට අදාළ සියලු විස්තර ඇමුණුම 02හි ඇතුළත් කර තිබේ.

(iii) පාසල් සංඛ්‍යාව 170කි. ඊට අදාළ විස්තර ඇමුණුම 03හි ඇතුළත් කර තිබේ. ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරමි.

(ඇ) එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අයදුම් පත්‍ර කැඳවා ඇති අතර, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 2020 දෙසැම්බර් මස 04වැනි දා වේ.

(ඈ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්තුතියි, ගරු ඇමතිතුමනි.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, තුන්සිය ගණනකට ආසන්න ජාතික පාසල් සහ පළාත් පාසල් එක්ක ගත්තාම, අපේ රටේ ලක්ෂ 43කට ආසන්න දරුවන් ප්‍රමාණයක් ඉගෙනුම ලබන පාසල් විශාල සංඛ්‍යාවක් තිබෙනවා. මගේ ප්‍රශ්නයේ (ඇ) කොටසට ඔබතුමා ලබා දුන් පිළිතුර අනුව ඔබතුමන්ලා තවම විදුහල්පතිවරුන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරලා නැහැ. නමුත්, අපට ආරංචි හැටියට මෙවැනි අවදානම් තත්ත්වයක් තිබියදී ඔබතුමන්ලා පාසල් විවෘත කරන්න යනවා. මේ කොවිඩ් අවදානමත් එක්ක අපේ රටේ අනාගතය යම් අනතුරකට දමනවාය කියන කාරණය තමයි විදුහල්පතිවරු ප්‍රමුඛ රටේම කථාබහට ලක් වන්නේ. අපි දන්නවා, පැලියගොඩ කොවිඩ් පොකුර රට පුරා ව්‍යාප්ත වෙමින් ගිය බව. අද වන විටත් එහි අඩුවීමක් නැහැ. එම නිසා අපි ඉල්ලීමක් කරනවා, විශේෂයෙන් මේ පාසල් විවෘත කිරීමේදී අවශ්‍ය පහසුකම් ලබා දෙන්න කටයුතු කරන්න කියලා. අපි ආණ්ඩුවට කරන චෝදනාව මෙයයි. මේ කොරෝනා වසංගතයත් එක්ක රට වැසීම නිසා පාසල් පද්ධතියත් වහන්න සිද්ධ වුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

---
* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එහිදී දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකිරීම තුළ තමයි මේ රට විවෘත කිරීමට ආණ්ඩුව කටයුතු කරන්නේ කියන චෝදනාව අපි කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඒ සම්බන්ධයෙන් උත්තරයක් දෙන්න පුළුවන්ද?

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ විදුහල්පතිවරු ගැන. නමුත්, කොරෝනා ප්‍රශ්නය වැදගත් නිසා මම එම ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න කැමැතියි. මේවා හිතුවක්කාර විධියට හෝ අත්තනෝමතික විධියට ගන්නා තීරණ නොවෙයි. අපේ විදුහල්පතිවරුන්, ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් සමඟ මේ සම්බන්ධයෙන් අපි කථා කරලා තිබෙනවා. ඒ වාගේම වෛද්‍ය ක්ෂේත්‍රයේ විශේෂඥයන් සමඟ කථා කරලා ඒ සියලුදෙනාගේම අදහස් සැලකිල්ලට භාජන කරලා තමයි අපි තීරණ අරගෙන තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ අසන්නේ සම්පූර්ණ වෙනස් අතුරු ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2019 නොවැම්බර් මාසයේ අපි රට භාර ගන්න කොට තිබුණු තත්ත්වය මම කියන්න කැමතියි.

මේ රටේ ජාතික පාසල් 373ක් තිබෙනවා. ඉන් 278කටම යහ පාලන රජය විදුහල්පතිවරුන් පත් කරලා තිබුණේ නැහැ. ජාතික පාසල් 373න් 278ක්ම විදුහල්පතිවරු නැතිවයි පවත්වාගෙන ගියේ. ඉතින්, විදුහල්පතිවරයකු නැතුව පාසලක් සංවර්ධනය කරන්නේ කෙහොමද? අපි මේ රට භාර ගත්තාට පස්සේ, පාසල් 108කට විදුහල්පතිවරු පත් කරන්න වහාම වැඩකටයුතු කළා. එතකොට, ඉතිරි වෙලා තිබුණේ පාසල් 170යි. ඒ 170ට අපි අයදුම් පත්‍ර කැඳවා තිබෙනවා. ඒවා අපේ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරලා තිබෙනවා. ලකුණු දෙන ක්‍රමයත් ඉතා විනිවිද ක්‍රමයක්. ඒ ක්‍රමය පිළිබඳ විස්තරත් අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කර තිබෙනවා. මේ අන්දමින් අපට දායාද වෙච්ච ප්‍රශ්න ගොඩක් තිබෙනවා. නායකයකු නැතුව ආයතනයක් වර්ධනය කරන්නේ කොහොමද? එදා විදුහල්පතිවරු පත් කළේ නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව අපි කනගාටු වෙනවා. අපේ ආණ්ඩුව කාලයේ දේශපාලන මැදිහත්වීමකින් තොරව විභාගයකින් සියලු විදුහල්පතිවරුන් තෝරා පත් කරගෙන, බඳවා ගැනීම් කරන්න පළාත් අමාත්‍යාංශයට යැව්වා. හැබැයි පළාත්වල ඉන්න ජාතික පාසල් අධ්‍යක්ෂවරු, දේශපාලන අත පෙවීම් එක්ක එම විදුහල්පතිවරුන් බඳවා ගත්තේ නැහැ කියන චෝදනාව එදා අපේ ආණ්ඩු කාලයේත් අපි දිගින් දිගටම කථා කළා, ගරු ඇමතිතුමනි. ඒක ගැන සොයලා බලන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ අවසාන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, විදුහල්පතිවරුන් පත් කරලා නැති ඉස්කෝල තිබෙද්දී නැවත ඉස්කෝල විවෘත කරනවා කියන කාරණය මම මෙයට සම්බන්ධ කළේ මේ නිසායි. ගරු ඇමතිතුමනි, උගත් වෛද්‍යවරුන්ගේ තීන්දු, තීරණ හා නිර්දේශ අපි විවේචනයට ලක් කරන්නේ නැහැ. නමුත් යම් විධියකින් ඉගෙන ගන්න දරුවන්ට අතපසු වීමක්ෙද්දීත්තහැ ත්තේත ොග ව්‍යාප්තිය වෙලා, අනාගතයේ තවත් රැල්ලක් නිර්මාණය කිරීමේ වගකීම ආවොත්, ඔබේ ආණ්ඩුව එහිදී චෝදනා කරන්නේ මේ ඉගෙන ගන්නා දරුවන්ටද කියලා මා අහන්න කැමැතියි. මොකද, මුලින් වතාවේ කිව්වා, රටේ පුරවැසියන් මේකට නිසි විධියට අනුගත වුණේ නැහැ, ඒක නිසා රෝගය ව්‍යාප්ත වුණා කියලා. පාසල්වල සිටින දරුවන්ට මේ රෝගය හැදුනාම දරුවන්ට ඇඟිල්ල දිගු කරන්න උත්සාහයක යෙදෙනවාද කියන කාරණය තමයි අපි ආණ්ඩුවෙන් අහන්නේ.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
කිසිසේත් දරුවන්ට ඇඟිල්ල දිගු කරන්න අපේ උත්සාහයක් නැහැ. අපි රට වෙනුවෙන් මේ සියලු සාධක සැලකිල්ලට භාජන කරලා තමයි තීරණ ගන්නේ. එම දරුවන්ගේ සෞඛ්‍ය සුරක්ෂිතභාවය හා දරුවන්ගේ අනාගතය සම්බන්ධයෙන් සිතා බලා, දරුවන්ට අධ්‍යාපනය සපයා දෙන්නේ කොහොමද කියන මේ කාරණා සියල්ලක්ම සැලකිල්ලට භාජන කරලා තමයි ආණ්ඩුවක් හැටියට අපි තුලනාත්මක තීරණයක් ගත්තේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු ඇමතිතුමා කැමැති නම් මට පොඩි පැහැදිලි කිරීමක් කරගන්න පුළුවන්ද?

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු ඇමතිතුමනි, මම රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියටයි මේ ප්‍රශ්නය අහන්නේ. සබරගමුව පළාතේ තිබෙන බෙලිහුල්ඔය විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයකු විධියට ඔබතුමාත් හිටපු නිසා මේ කාරණාව දන්නවා ඇති.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කෙටියෙන් ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු ඇමතිතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් කරන්නේ. එතුමා එයට කැමති වුණා නේ. බෙලිහුල්ඔය විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා දැන් ඉවත් කරලා තිබෙනවා. එතුමාගේ පළමුවැනි term එක අවසන් වෙලා දැන් ගොඩක් කල් වෙනවා. එම විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විධියට හිටියේ සුනිල් ශාන්ත මැතිතුමා. එම තනතුරට කෙනෙක් බඳවා ගැනීම සඳහා ඔබතුමන්ලා අවශ්‍ය සම්මුඛ පරීක්ෂණත් පවත්වා තිබෙනවා. නමුත් දැන් මාස ගණනාවක් වෙනවා, තවමත් එම තනතුරට කිසිවෙක්

[ගරු හේෂා විතානගේ මහතා]

බඳවා ගෙන නැහැ. ඔබතුමා කිව්වා, පාසල්වල විදුහල්පතිවරු නැතිව පාසල් අකර්මණ්‍ය වෙනවා කියලා. ඒ වාගේම තමයි විශ්වවිද්‍යාලයේත් උපකුලපතිවරයකු නැති වුණාම ඒ ආයතනය අකර්මණ්‍ය වෙනවා. ගරු ඇමතිතුමනි, මේ තනතුරට සුනිල් ශාන්ත මැතිතුමා බඳවා ගැනීම යම් දේශපාලන හස්තයක් විසින් නතර කරලා තිබෙනවාද? එතුමා මේ තනතුර සඳහා සුදුසුකම්වලින් ඉහළම මට්ටමේ සිටින කෙනෙක්. ඒ වාගේම, පසුගිය වසර 5 තුළ විශ්වවිද්‍යාලයට වෛද්‍ය පීඨයක් ලබාදීම සඳහාත් පුරෝගාමීව කටයුතු කරපු කෙනෙක්. මේ බඳවා ගැනීම ප්‍රමාද වෙන්නේ මොකද කියන එක ගැන අපට දැනගන්න අවශ්‍යයි. UGC එකේ Chairman විධියට ඉන්නේත් මේ රටට වැඩ කරන්න පුළුවන් හොඳ මහත්මයෙක් කියලා අපි දන්නවා. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් අපි ඔබතුමාගෙන් ගෞරවනීය උත්තරයක් බලාපොරොත්තු වෙනවා.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

කිසිසේත්ම දේශපාලන සාධක පදනම් කරගෙන මේ රටේ විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන් පත් කිරීමට උත්සාහ දරන්නේ නැහැ. ඒක කිසිසේත්ම අපි කරන්නේ නැහැ.

ඔබතුමා ප්‍රශ්නයක් අහනකොට මට කල් දෙන්න ඕනෑ. ප්‍රශ්නය අහලා තිබෙන්නේ විදුහල්පතිවරයා ගැන. ඔබතුමා මගෙන් අහනවා සබරගමු විශ්වවිද්‍යාලයේ පුද්ගලයෙක් ගැන. අහවල් පුද්ගලයාට අහවල් තනතුර භාර දෙනවාද කියලා පුද්ගලයකු කේන්ද්‍ර කරගෙනයි මේ ප්‍රශ්නය අහන්නේ. මම හිතනවා, සම්ප්‍රදායක් හැටියට ඒක වැරදියි. ඒ පුද්ගලයාට මේ තනතුර දෙනවාද කියලා මගෙන් අහන එක කිසිසේත්ම සාධාරණ නැහැ කියලා මම හිතනවා. මට ඒ පිළිබඳව දැනුම් දීමක් කරලාත් නැහැ. එම පුද්ගලයා යම් කිසි canvass කිරීමක් හැටියට ඒක පෙනෙනවා නම් එය සුදුසු නැහැ කියලායි මම හිතන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ ඉඳලා මාත් උසස් අධ්‍යාපන ඇමති ධුරයේ හිටියා. ඒ කාලය තුළ උප කුලපති පත් වුණේ Council එකේ ඡන්දයෙන්. ඡන්දයෙන් පළමුවැනියා, දෙවැනියා, තුන්වැනියා කියලා නම් තුනක් ජනාධිපතිතුමාට යවනවා. ඒ තුන් දෙනාගෙන් එක්කෙනෙක් පත් කරන්න ජනාධිපතිතුමාට බලය තිබෙනවා. ජේ.ආර්.ජයවර්ධන මැතිතුමාගේ කාලයේ ඉඳලා යහ පාලන ආණ්ඩුව තෙක්ම කළේ එහෙමයි. හැබැයි, දැන් ඒ ක්‍රමය වෙනස් කරලා. කවුන්සිලයේ ඡන්දය පැත්තකට දමලා සම්මුඛ පරීක්ෂණ කැඳවලා තමන් කැමති පුද්ගලයාට ලකුණු දීලා ඔහු උප කුලපති කරනවා. ඒක වැරදියි නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමා කෙටියෙන් පැහැදිලි කරන්න. මේ යන්නේ අමතර වෙලාවක්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු ඇමතිතුමා විශ්වවිද්‍යාලවල හිටපු කෙනෙක්. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයට ගිය කෙනෙක්. මේ වාගේ දේශපාලන හස්තයකට යටත් කරමින් -

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ප්‍රශ්නය ගිය සතියේත් ඇහුවා. මම ගිය සතියේත් ඉතාම පැහැදිලි පිළිතුරක් දුන්නා. ඒ ක්‍රමවේදය කිසිසේත්ම වෙනස් කරලා නැහැ. මා උපකුලපතිවරයකු හැටියට තෝරාගෙන කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය මගේ නම යවනකොට, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තෝරා ගත්තේ ඒ තුන් දෙනාගෙන් එක්කෙනෙක්. ඒ ක්‍රමවේදය අදත් පවතිනවා. එය කිසිසේත් වෙනස් වෙලා නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

දැන් කවුන්සලයේ ඡන්දය තිබෙනවාද? මට ඒක විතරක් කියන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් එතුමන්ලා කොළය වහලා ගහන්න යන්නේ.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

මගේ නම යවන කොට ඡන්දයක් තිබුණේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. LakshmanKiriella)

ඔබතුමා ගැන නොවෙයි, කවුන්සලයේ ඡන්දය තිබෙනවාද කියලායි මම ඇහුවේ.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ඡන්දයක් කවදාවත් තිබුණේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. LakshmanKiriella)

එතුමා කියන දේ අසත්‍යයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැම දාම කවුන්සලයේ ඡන්දය තිබෙනවා. මාත් උසස් අධ්‍යාපන ඇමතිවරයා හැටියට හිටියා නේ.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

හැම දාම ඡන්දයක් තිබුණේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. LakshmanKiriella)

ඔබතුමා පාර්ලිමේන්තුව නොමඟ යවන්න එපා.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාලක මණ්ඩලය නම් තුනක් යවනවා. ඒ කාලයේත් පාලක මණ්ඩලයට නම් තුනක් යැව්වා. දැනටත් එහෙම යවනවා. අන්තිමට ජනාධිපතිවරයා තමයි ඒ නම් තුනෙන් කෙනෙකු පත් කරන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇමතිතුමාගෙන් ඒ ගැන වෙනම ප්‍රශ්නයක් අහන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon.  LakshmanKiriella)
නම් තුනක් යවනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමා පාර්ලිමේන්තුව නොමඟ යවනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர்அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 3 -109/2020- (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon.BuddhikaPathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (විදේශ අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு  தினேஷ் குணவர்தன - வெளிநாட்டு அலுவல்கள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Foreign and the Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 4 -164/2020- (2), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 2015-2019 දක්වා සිමෙන්ති ආනයනය: විස්තර
### 2015-2019 வரை சீமெந்து இறக்குமதி: விபரம்
### IMPORT OF CEMENT FROM 2015-2019: DETAILS

223/2020

**5.** **ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ -

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ සිමෙන්ති ප්‍රමාණය කොපමණද;

(ii) එම සිමෙන්ති ආනයනය කළ රටවල් කවරේද;

(iii) සිමෙන්ති ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) උක්ත කාල සීමාව තුළ ශ්‍රී ලංකාවට සිමෙන්ති ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் நிதி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) 2015 ஆம் ஆண்டு தொடக்கம் 2019 ஆம் ஆண்டு வரையிலான ஒவ்வொரு வருடத்திலும் -

(i) இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட சீமெந்தின் அளவு யாதென்பதையும்;

(ii) மேற்படி சீமெந்து எந்தெந்த நாடுகளிலிருந்து இறக்குமதி செய்யப்பட்டன என்பதையும்;

(iii) மேற்படி சீமெந்தினை இறக்குமதி செய்த கம்பெனிகள் யாவையென்பதையும்;

தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி காலப்பகுதியில் இலங்கைக்கு சீமெந்தினை இறக்குமதி செய்வதற்காகச் செலவாகிய மொத்தத் தொகை எவ்வளவென்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Finance -

(a) Will he inform this House separately, pertaining to each of the year during the period from 2015 to 2019-

(i) the quantity of cement imported into Sri Lanka;

(ii) the countries from which the cement was imported; and

(iii) the names of the companies which imported the cement?

(b) Will he also inform this House of the total expenditure of importing cement into Sri Lanka during the period concerned?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்டவிடை :*
** Answer tabled:*

(අ) (i) ඇමුණුම 01හි දක්වා ඇත.

ඇමුණුම 01

| HS Code | HS Description | Quantity (units) 2015 | Quantity (units) 2016 | Quantity (units) 2017 | Quantity (units) 2018 | Quantity (units) 2019 | CIF (Rs.) 2015 | CIF (Rs.) 2016 | CIF (Rs.) 2017 | CIF (Rs.) 2018 | CIF (Rs.) 2019 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 25231000 | Cement clinkers | 2,881,714,299 | 4,104,119,399 | 3,879,633,284 | 3,204,630,316 | 3,273,988,974 | 26,866,622,843 | 27,532,478,100 | 26,737,035,536 | 24,820,980,278 | 28,835,934,007 |
| 25232100 | White portland cement,whether or not artifi. coloured | 11,984,370 | 19,178,896 | 17,554,638 | 17,590,041 | 14,559,452 | 248,523,888 | 373,399,196 | 386,127,191 | 401,173,929 | 356,908,684 |
| 25232903 | #N/A | 1,000,000 | - | - | - | - | 7,590,127 | - | - | - | - |
| 25232910 | Other - Water-proof cement, boiler cement and similar compositions | 40,947 | 170,775 | 840,086 | 7,654 | 5,353 | 4,080,269 | 9,096,273 | 8,451,803 | 1,831,021 | 995,349 |
| 25232920 | Other portland cement imported in packing of 50kg and below | 1,032,036,844 | 1,491,982,308 | 1,383,941,772 | 1,093,460,917 | 931,973,966 | 9,711,417,740 | 13,881,116,108 | 13,155,255,704 | 10,650,491,454 | 9,536,053,545 |
| 25232930 | Other portland cement imported in packing of over 50 kg or in bulk | 3,046,293,945 | 3,786,850,470 | 4,273,121,301 | 4,002,970,187 | 3,195,721,756 | 29,371,457,943 | 36,290,788,683 | 39,905,215,744 | 37,292,434,707 | 32,345,019,428 |
| 25233000 | Aluminous cement | 145,377 | 102,794 | 129,414 | 79,132 | 99,018 | 14,090,355 | 8,819,885 | 13,536,804 | 11,462,762 | 14,749,318 |
| 25239000 | Other hydraulic cements | 429,041 | 544,834 | 311,189 | 332,598 | 656 | 14,560,272 | 25,819,349 | 29,222,485 | 28,364,981 | 352,216 |

(අ) (ii) ඇමුණුම 02හි දක්වා ඇත.

ඇමුණුම 02

| HS HEADING | EX CTRY |
|---|---|
| 2523 | Australia |
| | Belgium |
| | China |
| | Cyprus |
| | Egypt |
| | France |
| | Germany |
| | Hong Kong |
| | India |
| | Indonesia |
| | Iran, Islamic Republic of |
| | Italy |
| | Japan |
| | Korea, Republic of |
| | Malaysia |
| | Maldives |
| | Netherlands |
| | Pakistan |
| | Poland |
| | Russian Federation |
| | Singapore |
| | Spain |
| | Taiwan, Province of China |
| | Thailand |
| | Turkey |
| | United Arab Emirates |
| | United Kingdom |
| | United States |
| | Viet Nam |

(අ) (iii) ඇමුණුම 03හි* දක්වා ඇත.

(ආ) රු. 368,891,457,977.00 (රුපියල් මිලියන 368,891)

(ඇ) පැන නොනඟී.

## මාර්ග අනතුරු අවම කිරීම: සැලසුම්
## வீதி விபத்துக்களைக் குறைத்தல்: வேலைத்திட்டம்
MINIMIZATION OF ROAD ACCIDENTS: ARRANGEMENTS

435/2020

6. **ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) දිනකට මාර්ග අනතුරු විශාල ප්‍රමාණයක් සිදු වන බව එතුමා පිළිගන්නේද?

(ආ) (i) එම මාර්ග අනතුරුවලින් දිනකට මිය යන පුද්ගලයන් සංඛ්‍යාව දළ වශයෙන් කොපමණද;

(ii) 2018 හා 2019 වර්ෂවල සිදු වූ මාර්ග අනතුරුවලින් මිය ගිය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාර්ග අනතුරු අවම කර ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා පොලිසියෙහි පවතින වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(ඈ) (i) මාර්ග අනතුරු අවම කිරීම පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත්කර තිබූ බව දන්නේද;

(ii) එම තේරීම් කාරක සභාව මඟින් ලබා දී තිබූ නිර්දේශ හා නිගමන සැලකිල්ලට ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் நிதி அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) நாளொன்றில் பெருமளவிலான வீதி விபத்துக்கள் இடம்பெறுகின்றன என்பதை அவர் ஏற்றுக் கொள்வாரா?

(ஆ) (i) மேற்படி வீதி விபத்துக்களின் மூலம் நாளொன்றில் உயிரிழப்பவர்களின் எண்ணிக்கை அண்ணளவாக எத்தனை என்பதையும்;

(ii) 2018 மற்றும் 2019 ஆகிய வருடங்களில் வீதி விபத்துக்களினால் மரணித்தவர்களின் எண்ணிக்கை தனித்தனியாக எத்தனை என்பதையும்;

(iii) வீதி விபத்துக்களைக் குறைப்பதற்காக இலங் கைப் பொலிஸிடமுள்ள வேலைத்திட்டம் யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) (i) வீதி விபத்துக்களைக் குறைத்தல் பற்றிய பாராளுமன்றத் தெரிகுழுவொன்று நியமிக்கப் பட்டிருந்தது என்பதையும்;

(ii) குறித்த தெரிவுக்குழுவினால் வழங்கப்பட்டுள்ள விதப்புரைகள் மற்றும் தீர்மானங்கள் கருத்திற் கொள்ளப்பட்டுள்ளனவா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister, Minister of Finance, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing-

(a) Will he admit that a large number of road accidents take place every day?

(b) Will he inform this House -

(i) the average number of persons who die in road accidents per day;

(ii) separately, the number of persons who died in road accidents in years 2018 and 2019; and

(iii) the arrangement that is in place with Sri Lanka Police at present to minimize the number of road accidents?

(c) Will he also inform this House-

(i) whether he is aware that a Parliament Select Committee on minimizing of road accidents had been appointed; and

(ii) whether the decisions and recommendations of that Select Committee have been taken into consideration?

(d) If not, why?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) දෛනිකව මාරක රිය අනතුරුවලින් පුද්ගලයන් 08 දෙනෙක් හෝ 09 දෙනෙක් මිය යයි.

(ii)

| වර්ෂය | මිය ගිය පුද්ගලයන් සංඛ්‍යාව |
|---|---|
| 2018 | 3,151 |
| 2019 | 2,899 |

(iii) මාර්ග අනතුරු අවම කර ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය මඟින් පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

මාර්ග රිය අනතුරු සිදු වීමට හේතු වන ප්‍රධාන වැරදි කිහිපයක් ශ්‍රී ලංකා පොලීසිය විසින් හඳුනාගෙන ඇත.

එනම්, මාර්ගය මත හැරවීම, ඉස්සර කිරීම, අධික වේගයෙන් රිය පැදවීම, බීමත්ව රිය පැදවීම යනාදිය වේ. එම වැරදි ඉලක්ක කර ගනිමින් මාර්ගය තුළ මීට අදාළ නීති උල්ලංඝනය කරනු ලබන රියැදුරන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමින් රථවාහන නඩු ලබා ගැනීම හා පැය 24ක කාලයම ආවරණය වන පරිදි දිවයින පුරාම විශේෂ මෙහෙයුම් සිදු කිරීම.

ශ්‍රී ලංකා පොලීසිය තුළ 2020.06.30 දින වන විට රථවාහන අංශවලට අනුයුක්ත නිලධාරින් 9,389ක් සිටින අතර, එම නිලධාරින් අතරින් ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ රථවාහන කළමනාකරණ පාඨමාලාව හදාරා ඇති නිලධාරින් ගණන 2,371කි. රථවාහන මූලස්ථානය මඟින් රථවාහන ක්ෂේත්‍රය සම්බන්ධ නව නීති රීති හා රෙගුලාසි පිළිබඳව මනා දැනුවත් කිරීමක් සිදු කර, ශ්‍රී ලංකාව තුළ දෛනිකව සිදු වන රිය අනතුරු අවම මට්ටමක පවත්වාගෙන යෑමට ඉටු කළ යුතු රාජකාරි සම්බන්ධයෙන් මෙම නිධාරින්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම.

දැනට සිටින රථවාහන රාජකාරියේ නියුතු නිලධාරින් සංඛ්‍යාව දිවයින තුළ පවතින මාර්ග පද්ධතියට අදාළව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් රථවාහන අංශ සඳහා තවත් නිලධාරින් අනුයුක්ත කර ගැනීමට කටයුතු කිරීම.

මාර්ග පද්ධතිය තුළ අනතුරු වැඩි වශයෙන් සිදුවන ස්ථාන, පොලිස් වසම් අනුව හඳුනා ගනිමින් ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රජා පොලිස් ඒකක හා රාජ්‍ය හා රාජ්‍ය නොවන අනුග්‍රාහකයන්ගේ සහයෝගය ඇතිව අනතුරු වැළැක්වීමේ පුවරු සවිකර රියැදුරන් සහ පදිකයන් දැනුවත් කිරීමට කටයුතු කිරීම.

මාර්ග නීතිවලට අවනත නොවී හා අපරීක්ෂාකාරි ලෙස මාර්ග භාවිත කරනු ලබන පදිකයන් හඳුනාගෙන එක් එක් පොලිස් ස්ථානවල සති

[ගරු චමල් රාජපක්ෂ මහතා]

අන්ත උපදෙස් පන්ති සඳහා ඔවුන් යොමු කරවීමට කටයුතු කිරීම.

රාජ්‍ය හා රාජ්‍ය නොවන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය, ගුවන් විදුලි සේවා ආයතන හා සම්බන්ධ වෙමින් රිය අනතුරු වළක්වා ගැනීම සම්බන්ධ උපදෙස් ලබා දීම මඟින් සියලුම ජනතාව දැනුවත් කිරීම සඳහා ගුවන් කාලය ලබා ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

රථවාහන මූලස්ථානය මඟින් දිවයින පුරා ආවරණය වන පරිදි තෝරාගත් පොලිස් වසම්වල ප්‍රධාන පාසල්වල සිසු දරු දැරියන් සඳහා මාර්ගය භාවිත කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දීමේ විශේෂ වැඩසටහන් ශ්‍රව්‍ය, දෘශ්‍ය හා වීදි නාට්‍ය ඇසුරින් පැවැත්වීමට කටයුතු කිරීම.

බස්නාහිර පළාත තුළ මං තීරු නීතිය නිවැරදිව භාවිත නොකිරීම හේතුවෙන් සිදු වන රිය අනතුරු ඉහළ ප්‍රතිශතයක් ගන්නා අතර, මෙයට පිළියමක් වශයෙන් රජයේ නව ප්‍රතිපත්ති අනුව මං තීරු නීතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහ "නැවත අරඹමු මහමඟ විනය" යන තේමාව යටතේ රියැදුරන් හික්මීමක් ඇති විනයගරුක පුද්ගලයන් බවට පත් කිරීමට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ අතර, එය වැඩිදියුණු කරමින් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

(ඇ) (i) ඔව්.

(ii) ඔව්.

(ඈ) පැන නොනඟී.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමා දැන් කිව්වා, මේ මාර්ග අනතුරුවලින් දවසකට 8 දෙනකු හෝ 9 දෙනකු මිය යනවා කියලා. වර්ෂ අනුව ගත්තාම, සෑම වර්ෂයකම 3,000කට වැඩි පිරිසක් මාර්ග අනතුරුවලින් පමණක් මිය යනවා. ඒ කියන්නේ, දැන් කොරෝනා වයිරසයෙන් මිය යන ප්‍රමාණයටත් වඩා, පසුගිය කාලයේ ත්‍රස්තවාදී ප්‍රහාර නිසා මිය ගිය ප්‍රමාණයටත් වඩා සංඛ්‍යාවක් මාර්ග අනතුරුවලින් මිය යනවා. එම නිසා, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ වැඩි අවධානයක් යොමු විය යුතුයි කියා මම හිතනවා. ගරු ඇමතිතුමාගෙන් මම මේක අහන්නේ, එය විශේෂ අවධානය යොමු කළ යුතු ප්‍රශ්නයක් නිසායි.

පොලිස් දෙපාර්තමේන්තුව පැත්තෙන් ඒ වෙනුවෙන් විශාල කාර්යභාරයක් කරනවා. ඒ නිලධාරින්ටත් අපි ස්තුතිවන්ත වෙනවා. මේ සම්බන්ධයෙන් වැදගත්ම කාර්යය වන රියැදුරු බලපත්‍ර ලබා දෙන එක ඉතාම කෙටි ආකාරයකින් තමයි සිදු වන්නේ. ඒ බලපත්‍ර ලබා දුන්නාට පස්සේ, රජය මැදිහත් වෙලා, පොලිස් දෙපාර්තමේන්තුව මැදිහත් වෙලා මේ රියැදුරන්ට කෙටි කාලීන පුහුණුවක් ලබාදීම සුදුසුයි කියා මා යෝජනා කරනවා. ගරු ඇමතිතුමනි, රජයේ ආයතනවල මැදිහත්වීමෙන් එවැනි කෙටිකාලීන පුහුණුවක් ලබා දෙන්න පුළුවන්ද?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
දැනටමත් සුළු වැරැදි කරන රියැදුරන් රථවාහන අංශයට ගෙනැවිත් සති අන්තවල පුහුණුවීම් කටයුතු සිදු කරනවා. ඊට අමතරව ඔබතුමා යෝජනා කළ පරිදි සියලු රියැදුරන් සම්බන්ධව අඩුම ගණනේ වර්ෂ තුනකට වරක්වත් යම්කිසි සමීක්ෂණයක් කරන්න, සොයා බලන්න හෝ පුහුණුවක් ලබා දෙන්න අපි කටයුතු කරන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ඇත්තෙන්ම එසේ පුහුණුවක් ලබා දීම විශේෂයෙන්ම අපගේ රියැදුරන්ගේ ආකල්ප වර්ධනය කරන්නත් පිටුවහලක් වෙනවා කියා මා හිතනවා. ඒ නිසා එම කටයුතු ආරම්භ කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු අමාත්‍යතුමනි, රියැදුරු බලපත්‍ර ලබා දීම සඳහා පවතින රජයේ අනුමැතිය ලත් එම ආයතන සම්බන්ධව රජය පැත්තෙන් නියාමනයක් කෙරෙනවාද?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
එම ප්‍රශ්නය නැවත අහන්න.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු අමාත්‍යතුමනි, රියැදුරු බලපත්‍ර ලබා දෙන්නේ පෞද්ගලික ආයතනවලින්. හැබැයි, එම ආයතන රජයේ අනුමැතිය ලත් ඒවා. එම පෞද්ගලික ආයතන සම්බන්ධව රාජ්‍ය මැදිහත්වීමකින් නියාමනයක් කෙරෙනවාද, කියා මා දැනගන්න කැමැතියි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ඒක මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් තමයි සිදු විය යුත්තේ. මම හිතන විධියට ඒ ප්‍රශ්නය ප්‍රවාහන ඇමතිතුමාටයි යොමු විය යුත්තේ. එහෙම නැත්නම් අපිත් ඉදිරියේදී ඒ සඳහා අවධානය යොමු කරලා කටයුතු කරන්නම්.

## මද්‍රසා පාසල්: නියාමනය
### மத்ரஸா பாடசாலைகள்: ஒழுங்குமுறை
### MADRASA SCHOOLS: REGULATION

448/2020

**7. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන මද්‍රසා පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) 2019 වර්ෂයේදී සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු මෙම මද්‍රසා පාසල් පිළිබඳ විශාල කතිකාවක් සමාජය තුළ ඇති වී තිබෙන බව එතුමා දන්නේද?

(ඇ) (i) මෙම මද්‍රසා පාසල් නියාමනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර;

(ii) එම පාසල් සම්බන්ධව වත්මන් රජයේ ස්ථාවරය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்பொழுது நடைமுறையிலுள்ள மத்ரஸா பாடசாலைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி பாடசாலைகள் அமைந்துள்ள இடங்களின் முகவரிகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2019 ஆம் ஆண்டு உயிர்த்த ஞாயிறன்று இடம்பெற்ற தாக்குதல்களையடுத்து, மத்ரஸா பாடசாலைகள் தொடர்பில் சமூகத்தில் பெருமளவு பேசப்படுகின்றது என்பதை அவர் அறிவாரா?

(இ) (i) மேற்படி மத்ரஸா பாடசாலைகளை ஒழுங்குபடுத்துவதற்கு அமைச்சினால் எடுக்கப்படவுள்ள நடவடிக்கைகளையும்;

(ii) இப்பாடசாலைகள் தொடர்பாக தற்போதைய அரசாங்கத்தின் நிலைப்பாட்டினையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of Madrasa schools in operation at present in Sri Lanka; and

(ii) the addresses of locations where these schools are situated?

(b) Is he aware that there is an intense social dialogue in society about these Madrasa schools subsequent to the Easter Sunday attacks in the year 2019?

Will he also inform this House-

(c) (i) the steps to be taken by the Ministry to regulate those Madrasa schools; and

(ii) the stand of the incumbent Government with regard to these schools?

(d) If not, why?

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 317කි.

(ii) ඔව්. ඊට අදාළ විස්තර ඇමුණුමෙහි දක්වා තිබෙනවා. මම එම ඇමුණුම **සභාගත*** කරනවා.

(ආ) ඔව්.

(ඇ) (i) පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු අරාබි විද්‍යාල අධ්‍යාපනය විධිමත් කිරීම සම්බන්ධව මද්‍රසා අධ්‍යාපන පනත් කෙටුම්පතක් එවකට තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි.

එහිදී එම අරාබි විද්‍යාල අධ්‍යාපන කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නියාමන කළ යුතු බවට තීරණය කරන ලදුව, එම පනත කෙටුම්පත් කිරීමේ වගකීම අමාත්‍ය මණ්ඩලය විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරන ලදී.

(ii) ගරු මන්ත්‍රීතුමනි, අපේ ස්ථාවරය මෙසේයි.

එක එක පාසල් වර්ගීකරණය කරලා, ඒවා වර්ගවලට සීමා කළ ප්‍රතිපත්තියක් අපි අනුගමනය කරන්නේ නැහැ. රට තුළ රජයේ පාසල් තිබෙනවා, පෞද්ගලික පාසල් තිබෙනවා, ජාත්‍යන්තර පාසල් තිබෙනවා. ඒ සියල්ල සම්බන්ධයෙන් අපි අනුගමනය කරන්නේ පොදු ප්‍රතිපත්තියක්. අධ්‍යාපනය ලබා දෙන්න ඕනෑ. කොයි විධියේ පාසලකට වුණත් ඒකට නිදහස දෙන්න ඕනෑ. හැබැයි, අධ්‍යාපනය ලබා දීමේදී මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, අපේ නීති පද්ධතියට ගරු කරමින් ඒවා උල්ලංඝනය නොකරමින් තමයි එම අධ්‍යාපන කටයුතු සලසා දිය යුත්තේ. ඒ සම්බන්ධයෙන් රජය වෙනුවෙන් පොදුවේ යම්කිසි නියාමනයක්, අධීක්ෂණයක් අධ්‍යාපන අමාත්‍යාංශය කරනවා. අහවල් ඉස්කෝලයකට, අහවල් ඉස්කෝල වර්ගයකට කියලා නොවෙයි, සියලු පාසල් සම්බන්ධයෙන් අපි පොදුවේ අනුගමනය කරන ප්‍රතිපත්තිය එයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

(ඈ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මා අධ්‍යාපන අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ ප්‍රශ්නයට ඍජු පිළිතුරක් ලබා දීම පිළිබඳව. අපි පාසල් වර්ගීකරණය කරන්නේ නැහැ. නමුත් පාස්කු ප්‍රහාරයෙන් පසුව මද්‍රසා පාසල් පිළිබඳව දැවැන්ත කතිකාවතක් ඇති වුණා. එහිදී අපි දැක්කා මාධ්‍ය ඔස්සේත්, ඒ වාගේම එවකට විපක්ෂයේ සිටි මන්ත්‍රීවරුනුත් කිව්වා, මද්‍රසා පාසල්වලදී අන්තවාදී අදහස් ඒ දරුවන්ගේ ඔළු තුළට දමනවා, එවැනි මතවලින් ඒ දරුවන් පෝෂණය කරනවා කියලා. එම නිසා තමයි අපි පැහැදිලිව ඇහුවේ, එම පාසල් අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණයට ලක් වෙනවාද කියලා. එහෙම නැතුව ඒ පාසල් වර්ගීකරණය කරන්න කියලා නොවෙයි කිව්වේ. එම නිසා අධ්‍යාපන ඇමතිතුමාගෙන් මා දැන ගන්න කැමැතියි, වර්තමානය වන විට, මේ මොහොත වන විට මද්‍රසා පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අධීක්ෂණය වෙනවාද කියලා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ඒ ප්‍රශ්නය මට යොමු කළ නිසා මා කියන්න ඕනෑ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන ජනාධිපතිවරයා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හැටියට කටයුතු කළ කාලයේ මද්‍රසා පාසලක ඉගැන්වීම සඳහා අපේ රටට ඇතුළු වෙන්න පිට රටකින් කවුරු හෝ වීසා ඉල්ලනවා නම්, ඉතාම පරිස්සමින් අපි ඒ ගැන සොයා බැලුව බව. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව හා බුද්ධි අංශ අතර ඉතාම සමීප සම්බන්ධයක් හා සම්බන්ධීකරණයක් තිබුණා. ඒ වීසා ඉල්ලුම් කරන පුද්ගලයාගේ අතීතය සම්බන්ධයෙන්, අතීතයේ හැසිරීම සම්බන්ධයෙන් යම් කිසි ගැටලුවක් තිබෙනවා නම්, ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ බොහෝ අවස්ථා තිබෙනවා. හැබැයි, යහපාලන රජය යටතේ ඒ යාන්ත්‍රණය සම්පූර්ණයෙන් අඩාල කළා; නිදර්ශන ඕනෑ තරම් තිබෙනවා. ඊට පසුව on arrival visa දුන්නා. ඒ එන පුද්ගලයාගේ පසුබිම ගැන කිසිවක් හොයන්නේ නැතුව ගුවන් තොටුපොළට ආවාම වීසා දීලා මද්‍රසා පාසලක ඉගැන්වීම සඳහා අවසර දුන්නා. ඒ ප්‍රතිපත්තිය අපි කිසිසේත් අනුගමනය කරන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මේ පාසල්වල මොනවාද වෙන්නේ, ඒවායේ පාඨමාලා මොනවාද, උගන්වන්නේ කවුද, ශිෂ්‍යයන් බඳවා ගන්නේ කොහොමද කියන කාරණා සම්බන්ධයෙන් අපි වගකීම භාර ගන්නවා. ඒක මගේ අමාත්‍යාංශයේ යුතුකමක්. මා උපරිම මට්ටමෙන් ඒ යුතුකම ඉෂ්ට කරනවා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය විධියට මා ගරු ඇමතිතුමාගෙන් මේ ප්‍රශ්නය අහනවා. විශේෂයෙන්ම බේරුවල ප්‍රදේශයේ මවුලවිවරයෙක් පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය පිළිබඳ විමර්ශනය කරන කොමිෂන් සභාවට ප්‍රකාශ කර සිටියා, පාසල් අච්චු පොත්වලට යම් කිසි අන්තවාදී මත සහිත පාඩම් ඉගැන්වීම් අධ්‍යාපන අමාත්‍යාංශය ඔස්සේ නිර්දේශ කරලා තිබෙනවා, ඒවා පොත්වල සටහන් වෙලා තිබෙනවා කියලා. එවැනි දේවල් හඳුනාගෙන තිබෙනවාද? අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ඒවා විෂය නිර්දේශයට ඇතුළත් කළේ කවුද කියන එක පිළිබඳව විමර්ශනයක් කරලා සොයාගෙන තිබෙනවාද කියා මම දැන ගන්න කැමැතියි.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආගමික අධ්‍යාපනය සපයා දෙන්නට ඕනෑ. හැබැයි, ආගමික අධ්‍යාපනයේ මුවාවෙන් වෙනත් අරමුණු ඉෂ්ට කර ගන්න ඉඩ දෙන්න බැහැ. ඔබතුමා කියන විධියට පාසල්වල පාවිච්චි කරන පොත් මොනවාද, පාඩම් මොනවාද කියලා අධීක්ෂණයක් තිබෙන්නට ඕනෑ. පසුගිය අවුරුදු 5 තුළ එවැනි අධීක්ෂණයක් නොතිබුණු එක තමයි ප්‍රශ්නය. විදේශීය රටකින් එන පුද්ගලයෙකුට පාසල්වල උගන්වන්න අවසර දෙන්නේ කොහොමද, ඒ පුද්ගලයාගේ ඉතිහාසය ගැන කිසිවක් සොයන්නේ නැතුව? එම සම්පූර්ණ ප්‍රතිපත්තිය අපි වෙනස් කරන බව මම මේ ගරු සභාවට ඉතාම පැහැදිලිව ප්‍රකාශ කරනවා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්න දෙක අහලා ඉවරයි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු ඇමතිතුමාගේ උත්තරයට අනුව පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඇමතිතුමා කැමැති නම් පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

අහන්න, මම පැහැදිලි කරන්නම්.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට ගරු කරනවා. ගරු ඇමතිතුමනි, මම අහන ප්‍රශ්නය මෙයයි. අන්තවාදී මත සහිත පාඩම් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කොට ඒවා අධ්‍යාපන අමාත්‍යාංශයේ අච්චු පොත්වලට ඇතුළත් කර තිබෙනවාද? ඒවා හඳුනාගෙන තිබෙනවාද, ඒ පිළිබඳව විමර්ශනයක් වෙනවාද කියන එක පිළිබඳව තමයි මට දැන ගන්න අවශ්‍ය.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ඒක සම්පූර්ණයෙන්ම වැරැදියි. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස් කර නිකුත් කරන ලද පොතක එහෙම දෙයක් කිසිසේත් නැහැ. හැබැයි, පිට රටින් ආපු නොයෙක් නොයෙක් පුද්ගලයන් ඉගැන්වීම සඳහා teaching materials හදනවානේ. එම teaching materials අපේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද materials නොවෙයි; ඒ ගොල්ලෝ හදන materials. ඒ ගොල්ලන්ට ගුරු පත්වීම් ලබා දිය යුතුද, නැද්ද, පාවිච්චි කරන පොත් මොනවාද, ඒවායේ අඩංගු කරුණු, ඒවා උගන්වන පුද්ගලයන්, ඒ සියල්ලක්ම ගැනම තමයි අපි විභාග කළ යුත්තේ. ඉස්සර කාලයේ ඒ වාගේ නොවෙයි. ඉස්සර කාලයේ *carte blanche;* සම්පූර්ණ නිදහස තිබුණා, ඒ අයගේ කැමැත්ත පරිදි ඕනෑම දෙයක් කරන්න. අපි ඒ ප්‍රතිපත්ති වෙනස් කරනවා.

ඒ වාගේම, දැන් පාස්කු ප්‍රහාරය පිළිබඳව සොයා බලනවා. එම කොමිෂන් සභාවේ සඳහන් වුණු කරුණක්, එතැන ඉදිරිපත් කරපු සාක්ෂියක් ගැන ඔබතුමා සඳහන් කළා. ඒ වාර්තාවත් ඉතාම ප්‍රයෝජනවත් වාර්තාවක් වෙයි කියා මම හිතනවා. අදාළ සියලු කරුණු සමාලෝචනය කරලා, එම වාර්තාවට ඒ පිළිබඳ නිගමන ඇතුළත් වෙයි. ඒ වාර්තාව අපි බොහොම පරිස්සමෙන් හා ගැඹුරින් අධ්‍යයනය කරනවා. අධ්‍යයනය කරලා ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගන්න අපි අදහස් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඊළඟට, ප්‍රශ්න අංක 8-456/2020 - (1), ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවෙනි වටය.

## පැරණි යෝධ ඇළ: යථාවත් කිරීම
## பழைய யோத கால்வாய்: மறுசீரமைப்பு
## ANCIENT YODHA ELA: RESTORATION

456/2020

**8. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு இஷாக் ரஹுமான் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Ishak Rahuman.)
වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති, කලාවැව ජලාශයේ සිට තිසාවැව ජලාශය දක්වා ජලය රැගෙන යන පැරණි යෝධ ඇළ වල්බිහිවී ඇති බව එතුමා දන්නේද?

(ආ) (i) මෙම ඇළ මාර්ගය ශුද්ධ පවිත්‍ර කර යථාවත් කිරීමට වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) එම වැඩපිළිවෙළ ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) அனுராதபுர மாவட்டத்தில் அமைந்துள்ள கலாவெவ நீர்த்தேக்கத்திலிருந்து திசாவெவ நீர்த்தேக்கம் வரை நீரைக் கொண்டுச்செல்லும் பழைய யோத கால்வாய் தூர்ந்துபோயுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி கால்வாயைச் சுத்திகரித்து இயல்பு நிலைக்கு கொண்டு வருவதற்கு வேலைத்திட்டமொன்று உண்டா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி வேலைத்திட்டம் யாதென்பதையும்;

(iii) மேற்படி வேலைத்திட்டம் தொடங்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation:

(a) Is he aware that the ancient Yodha Ela - Giant Canal - which carries water from the Kalawewa Reservoir to the Thisawewa Reservoir located in the District of Anuradhapura has gone into wilderness?

(b) Will he inform this House-

(i) whether any programme is available to clean and restore this canal;

(ii) if so, what the said programme is; and

(iii) the date on which the said programme would be initiated?

(c) If not, why?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව්.

(ආ) (i) ඔව්.

(ii) වාර්ෂිකව වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින්, මෙම ඇළ නඩත්තු කිරීමට සීමිත ප්‍රතිපාදන මුදලක් ලබා දෙන අතර, එමඟින් වාරි කටයුතු සඳහා ජලය රැගෙන යාමට හැකි පරිදි ජලජ ශාක ඉවත් කිරීමෙන් ඇළ මාර්ගය පිරිසිදු කරනු ලබයි. අත්‍යවශ්‍ය කොටස්වල පමණක් කැලය සුද්ද කරනු ලබයි. මෙම ප්‍රතිපාදන තවදුරටත් ඉහළ නංවා ගැනීම සඳහා 2021 අය වැයට යෝජනා ඉදිරිපත් කර ඇත.

(iii) 2021 වසරේදී මෙම මෙහෙයුම් හා නඩත්තු කඩිනමින් ආරම්භ කිරීමට ඇස්තමේන්තු සකස් කර ඇති අතර, ප්‍රතිපාදන ලැබුණු වහාම ආරම්භ කිරීමට නියමිතව ඇත.

(ඇ) අදාළ නොවේ.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (විදේශ අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - வெளிநாட்டு அலுவல்கள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Foreign and the Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2020 නොවැම්බර් 23 සඳුදා, 24 අඟහරුවාදා, 25 බදාදා, 26 බ්‍රහස්පතින්දා, 27 සිකුරාදා, 28 සෙනසුරාදා, 30 සඳුදා සහ 2020 දෙසැම්බර් 01 අඟහරුවාදා, 02 බදාදා, 03 බ්‍රහස්පතින්දා, 04 සිකුරාදා, 05 සෙනසුරාදා, 07 සඳුදා, 08 අඟහරුවාදා, 09 බදාදා, 10 බ්‍රහස්පතින්දා "විසර්ජන (2021)" පනත් කෙටුම්පත සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන (2021)" පනත් කෙටුම්පත සලකා බැලීම සඳහා 2020 නොවැම්බර් 23 සඳුදා සිට 30 සඳුදා දක්වා ද, 2020 දෙසැම්බර් 01 අඟහරුවාදා සිට 09 බදාදා දක්වා ද, වෙන් කළ දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ. භා. 5.30 දක්වා ද විය යුතු ය:

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

එසේ වුවද, අ. භා. 5.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8 (4), (5) සහ (6) ඡේද හි විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ සභානායකතුමා,- පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),- පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන (2021)" පනත් කෙටුම්පත සලකා බැලීම සඳහා වෙන් කළ, 2020 දෙසැම්බර් 10 බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.00 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2021, පෙර දින කල් තබන ලද විවාදය යළි ඇරඹීම, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

# විසර්ජන පනත් කෙටුම්පත, 2021
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2021
## APPROPRIATION BILL, 2021

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***
***ඊට අදාළ ප්‍රශ්නය [නොවැම්බර් 17]***
***"පනත් කෙටුම්පත දැන් දෙ වන වර කියවිය යුතු ය" [ගරු මහින්ද රාජපක්ෂ මහතා]***
***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 17]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question* - [17th November]
*"That the Bill be now read a Second time".*- [The Hon. Mahinda Rajapaksa.]
*Question again proposed.*

[පූ.භා. 10.05]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa -Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමෙරිකාවේ කළු ජාතික ප්‍රජාවේ විමුක්ති සටනේ නායක මාර්ටින් ලූතර් කිං මැතිතුමා විටෙක මෙසේ ප්‍රකාශ කළා: “Our lives begin to end the day we become silent about things that matter”. "අවධානයට යොමු විය යුතු කරුණු පිළිබඳව අප නිහඬ වූ දිනය යනු අපගේ ජීවිත අවසානය ආරම්භ වන දිනයයි" යන්න එහි අදහසයි.

අද මේ සාකච්ඡාවට භාජන වන අය වැය කියන්නේ ඉතා වැදගත් කාරණාවක්; මැනවින් සාකච්ඡාවට භාජන විය යුතු කාරණාවක්. මේ ඉදිරිපත් කරපු අය වැය අපි තක්සේරු කළ යුත්තේ කොහොමද? මේ අය වැයේ සාර්ථක අසාර්ථකභාවය පිළිබඳව ලිට්මස් පරීක්ෂණය විය යුත්තේ මොකක්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විශ්වාස කරන ආකාරයට ජනාධිපතිවරණයේදීත්, මහ මැතිවරණයේදීත් ඉදිරිපත් වූ රට හදන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ අඩංගු ජනතා පොරොන්දු, අය වැය යෝජනාවල, අය වැය ප්‍රතිපත්තිවල කොතෙක් දුරට ක්‍රියාත්මක වනවාද?

ඒක තමයි පළමුවන කාරණාව. දෙවනුව, මේ අය වැය වර්තමාන තත්ත්වයට ඔබින ආකාරයට ජනතා ප්‍රශ්නවලට විසඳුම් ලබා දී තිබෙනවාද? තුන්වනුව, මේ අය වැය යම් ස්ථාවර, ශක්තිමත් දර්ශනයක් තුළ රට ඉදිරියට ගෙන යන මාවතක ක්‍රියාත්මක වනවාද, නැද්ද කියන කාරණාව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තිබෙන්නේ, "රට හදන සෞභාග්‍යයේ දැක්ම, ඔබට රටක්-රටට හෙටක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය. 69 ලක්ෂයක් ජනතාව ජනාධිපතිවරණයේදීත්, 68 ලක්ෂයක් ජනතාව මහ මැතිවරණයේදීත් තමුන්නාන්සේලාට වරම ලබා දුන්නා. ඒක සුවිශේෂී වරමක්. පොරොන්දු ගණනාවක්, ප්‍රතිඥා රැසක් මෙහි අඩංගු වෙලා තිබෙනවා. සමාජයත් සමඟ ගිවිසුමක් - social contract එකක් - ඇති වුණා. නමුත්, මේ අය වැය දිහා බැලුවාම පෙනෙනවා, මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ජනතාවට සාධනීය ක්‍රියාදාම එකක්වත් මේ අය වැය කථාවේ අඩංගු වෙලා නැහැ කියා. ඒක බොහොම කනගාටුවෙන් අපි ප්‍රකාශ කරනවා. මහජන අධිකරණය ඉදිරියේ මේ ප්‍රතිපත්ති ප්‍රකාශයත්, මේ අය වැයත් පුස්සක් බවට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රටේ තිබෙන පීඩනකාරී, අසහනකාරී පරිසරය තුළ මහ ජනතාවට හුස්ම ගන්න බැරි තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. අද ජනතාවට දිය යුතු වෙන්ටිලේටරය විසන්ධි කරලා. කොවිඩ් ආසාදිත ප්‍රජාවට අවශ්‍ය ventilators, දැඩි සත්කාරක ඇඳන් අද නැහැ. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොහොට්ටුවේ වෙන්ටිලේටරය නම් හොඳට වැඩ කරනවා. බොරුවෙන්, මුසාවෙන්, මුලාවෙන්, රැවටීමෙන්, ඇන්දවීමෙන් පොහොට්ටුව නම් තම ඉලක්කය කරා ගිහින් තිබෙනවා. ජනාධිපතිවරණය දිනුවා; මහ මැතිවරණය දිනුවා; තුනෙන් දෙකේ බලයෙන් දිනුවා; විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත කරගත්තා; ද්විත්ව පුරවැසි අයිතිය තහවුරු කරගත්තා. දැන් ඉතින්, ජනතාව උන්නත් එකයි මළත් එකයි. ඒක තමයි, කනගාටුවෙන් හෝ කිව යුතු, රටේ අද පවතින යථාර්ථය. මම කැමැතියි මේ අවස්ථාවේදී "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය **සභාගත*** කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් අය වැයක් සාකච්ඡාවට භාජන වනකොට මූලිකව අවධානය යොමු කරන්නේ සාර්ව ආර්ථික විචල්‍යයන් -macroeconomic indicators- පිළිබඳයි. ඒ වාගේම, microeconomic ස්ථාවරය ගැනත් සාකච්ඡාවට භාජන වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් අද තිබෙන්නේ වෙනස් තත්ත්වයක්. අද මොන අය වැයක්

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ක්‍රියාත්මක කරන්නටත් පෙර රටේ ජනතාව ජීවත් කරවන්නට ඕනෑ; රට තිබෙන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී මාර්ටින් ලූතර් කිං විරුවාණන්ගේ ප්‍රකාශයක් ගෙනහැර දක්වන්න කැමැතියි. එතුමා එක් අවස්ථාවකදී කියා තිබෙනවා, "To ignore evil is to become an accomplice to it" කියා. එනම්, "නපුර නොසලකා හැරීම යනු, එම නපුරේම හවුල්කරුවන් වීමයි." කියන එකයි. ඒ නිසා කනගාටුවෙන් හෝ කියන්නට ඕනෑ, මේ කුරිරු, නපුරු වසංගතයට අවධානය යොමු කිරීම මේ අය වැයෙන් සම්පූර්ණයෙන්ම පැහැර හැරලා තිබෙන බව. සාමාන්‍යයෙන්, කොවිඩ්-19 පරාජය කරන්නට, මර්දනය කරන්නට, එම කටයුතු කළමනාකරණය කරන්නට ගන්නා වූ ක්‍රියා මාර්ග වෙනුවෙන් මේ අය වැය කථාවේ සැහෙන්න ඉඩක් වෙන් කර තිබෙන්නට ඕනෑ. ඒත් මේ අය වැය කථාවෙන් එවන් ප්‍රමුඛතාවක් ලබා දීලා නැහැ කියන එක කනගාටුවෙන් හෝ කිව යුතුයි. ඇයි එහෙම ප්‍රමුඛතාවක් ලබා දීලා නැත්තේ? මේ වර්තමාන රජයට කොවිඩ්-19 ප්‍රශ්නය ගැන උනන්දුවක් නැහැ; වුවමනාවක් නැහැ; අවශ්‍යතාවක් නැහැ. මොකක්ද හේතුව? තමන්ගේ වැඩේ කරගෙන තිබීමයි, හේතුව.

දැන් බොහෝදෙනා හිතාගෙන ඉන්නවා, 'අවුරුදු කිහිපයකට හරි. ඔක්කෝම හරි' කියලා. තමන්ට රිසි සේ කටයුතු කරන්නට බලය ලැබිලා තිබෙන නිසා කොවිඩ්-19 මර්දනයට අද ලැබිලා තිබෙන්නේ ඉතාම අඩු අවධානයක්. මේක කනගාටුදායක තත්ත්වයක්. අපි මේ රජයෙන් අහන්න කැමැතියි, කොවිඩ්-19 මර්දනය කිරීම සඳහා වන මෙවලම් ටික කෝ කියලා. කෝ, ක්‍රමෝපායික මෙවලම් ටික? කෝ, strategic tools ටික? මොකක්ද ventilators හිඟයට විසඳුම? මොකක්ද දැඩි සත්කාර ඇඳන් - ICU ඇඳන් - හිඟයට විසඳුම? මොකක්ද PCR පරීක්ෂණ යන්ත්‍රවල හිඟයට විසඳුම? මොකක්ද PCR පරීක්ෂණ රටේ අඩුවෙන් කිරීම මඟ හරවන්න තිබෙන විසඳුම? මේ එකදු ප්‍රශ්නයකටවත් රජයට ප්‍රගතිශීලී විසඳුමක් නැහැ; පැහැදිලි විසඳුමක් නැහැ; පිරිසිදු උත්තරයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ලෝකයේ තරගයට එන්නත් නිර්මාණය වෙනවා; බෙහෙත් නිර්මාණය වෙනවා. Pfizer ආයතනය, BioNTech ආයතනය ඒකාබද්ධව සියයට 95ක සාර්ථකත්වයක් තිබෙන එන්නතක් නිර්මාණය කරලා තිබෙනවා. Moderna ආයතනය සියයට 95ක සාර්ථකත්වය තිබෙන තවත් එන්නතක් නිර්මාණය කරලා තිබෙනවා. ඊයේ දවසේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයත් කිව්වා, ඒ අයත් මේකට සාර්ථක විසඳුමක් නිර්මාණය කරලා තිබෙනවා කියලා. මා අහන්න කැමැතියි, වර්තමාන රජය ඒ ආයතන සම්බන්ධ කරගෙන අපේ රටේ සමස්ත ජන ප්‍රජාවට අවශ්‍ය ඒ එන්නත් ප්‍රමාණය ලබාගැනීම සඳහා නිකමටවත් කථා කරලා තිබෙනවාද, සාකච්ඡා කරලා තිබෙනවාද, මූලික ගිවිසුම්වලට එළඹ තිබෙනවාද කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුරෝපා හවුල, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය ඇතුළු ලෝකයේ රටවල් රාශියක් දැනටමත් ඒ ආයතන සමඟ ගිවිසුම්ගත වෙලා හමාරයි, එන්නත් මාත්‍රා මිලියන ගණනක් ඒ රටවලට ඇණවුම් කරන්න. ඒ අය ඒ වැඩේ කරලා ඉවරයි. එහෙම නම්, දැන් ඒ එන්නත් ලබාගැනීමේ පෝලිමේ අප ඉන්නේ අග. ඒ මොකද? මේ රජය කාර්යක්ෂම ලෙස, උනන්දුවෙන් කටයුතු කරලා නැහැ, ඒ එන්නත් ගිවිසුම්වලට ප්‍රවේශ වන්න. මම දන්නේ නැහැ, ඒ ගැන හිතලාවත් තිබෙනවාද කියලා. හැබැයි, එන්නත් ගැන කථා කරන කොට, බෙහෙත් ගැන කථා කරනකොට උසුළු විසුළු කරන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වසරේ ජනවාරි, පෙබරවාරි ඉඳලා කියපු හැම දෙයක්ම, හැම ඉස්පිල්ලක් පාපිල්ලක්ම සත්‍යයක් බවට පත් වෙලා තිබෙන බව මම කියන්න කැමැතියි. හැබැයි, ආණ්ඩු පාර්ශ්වය කළේ උසුළු විසුළු කිරීම, මඩ ගැසීම, වෙනමම මුදලට troll farms අරගෙන සමාජ මාධ්‍ය ජාලවල කෘත්‍රිම comments දැමීමයි. ඒවාට නම් මේ ආණ්ඩුව බොහොම දක්ෂයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රජයට උදවු කරන්න අපි කැමතියි. මේ එන්නත් ඇණවුම් කිරීමේදී, එන්නත් ලබා ගැනීමේදී බැරි වෙලාවත් මූල්‍ය ප්‍රශ්නයක් තිබෙනවා නම්, කැනඩා රජයට කථා කරන්න කියලා මම මේ රජයට උපදෙස් දෙනවා.

මම මේ තොරතුරත් **සභාගත*** කරනවා.

දැන් කැනඩාව ඒ රටට ඒ එන්නත් ටික ඇණවුම් කරලාත් හමාරයි. කැනඩාවේ එන්නත්වල අතිරික්තයක් තිබෙනවා. අපේ විදේශ කටයුතු ඇමතිතුමාත් මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ ඉන්නවා. අඩුම ගණනේ කැනඩාවේ නියෝජිතවරයාට කථා කරලා, අතිරික්තයක් තිබෙන ඒ එන්නත් ටික හෝ අපේ රටට ලබා ගන්නට රාජ්‍ය තාන්ත්‍රික ගිවිසුමකට එළැඹෙන්න. තමුන්නාන්සේලාට මම මේ උදවුවක් කරන්නේ.

අඩුම ගණනේ මේ කාරණාවෙන්වත් පොඩි අධ්‍යයනයක් ලබන්න. ලෝකයම එන්නත් ගැන කථා කරන කොට, එන්නත් ඇණවුම් කරන කොට, එන්නත් පිළිබඳව සාකච්ඡා කරන කොට, ගිවිසුම් ගහන කොට අපේ රටේ මොනවාද වෙලා තිබෙන්නේ? ආණ්ඩුවේ ප්‍රධානීන් කිහිප දෙනෙකු දේශීය පැණි වෙළෙන්දන් බවට පත් වෙලා සිටිනවා. දැන් පැණියක් උස්සාගෙන යනවා. මේක හරිද? ඔවුන් පැණි වෙළෙන්දන් බවට පත් වෙලා. ලෝකය මේ තරම් එන්නත් ගැන කටයුතු කරන කොට රජය ඇතුළෙන්ම ස්වකීය සුබසිද්ධිය -සුබසාධනය- උදෙසා පැණි වෙළෙඳ ජාවාරම්කාරයන් නිර්මාණය වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ventilators ගෙන්වීම වෙනුවට, kidney dialysis machines ගෙන්වීම වෙනුවට අද වෙලා තිබෙන්නේ මොකක්ද? ඒ උපකරණ ගෙන්වන්නට ටෙන්ඩර් කැඳවන්නේ නැහැ. අද ටෙන්ඩර් කැඳවන්නේ කළ ගෙඩි හා මුට්ටි ඇණවුම් කරන්නයි. කළ ගෙඩියෙන්, මුට්ටියෙන් බෙහෙත් ටික හරියනවා කියලා හිතා ගෙනයි කටයුතු කරන්නේ. නමුත් රටට අවශ්‍ය ventilators ප්‍රමාණය නැහැ; kidney dialysis machines ප්‍රමාණය නැහැ. මේ කොරෝනා තත්ත්වය තුළ සිදු වන අසික්කිතම ක්‍රියාවලිය මොකක්ද? ජනතාවගේ දුක, කඳුළ, වේදනාව, රෝගී තත්ත්වය උඩින් ජනතාවගේ මළ කඳන් උඩින් මුදල් ගරන කොරෝනා ජාවාරම් lumpen, ධනපති පැලැන්තියක් අද නිර්මාණය වනවා. දෙයාකාර lumpen පැලැන්තියක් අද උපකරණවලින්, test kitsවලින් මුදල් හොයන, ඩොලර් කාක්කන් වෙන්න හදනවා. ඔවුන් බෙහෙත්වලින් කෝටි - ප්‍රකෝටිපතියන් වෙන්නට හදනවා. වර්තමාන රජය බලයට ගෙන එන්නට ගුවන් යානා පිටින් අපේ රටට ආපු -එතකොට නම් කිව්වේ රටවිරුවන් කියලා- රටවිරුවන් මේ රජය අසරණ විරුවන් බවට පත් කරලා තිබෙනවා. ඒ අයගේ ගුවන් ටිකට් පතෙනුත් ගහනවා; මෙහේට ඇවිල්ලා කරන නිරෝධායන ක්‍රියාවලියෙනුත් ගහනවා; හෝටලයෙනුත් ගහනවා. දැන් අලුත්ම ජාවාරමක්, කොරෝනා ව්‍යාපාර - businesses - නිර්මාණය වෙලා තිබෙනවා. මළ මිනී උඩින් ජාවාරම්කරුවන් බිහි වීම අපි වහාම නතර කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ තිබෙන්නේ නිදහස් සෞඛ්‍ය ප්‍රතිපත්තියක්. ඒකට අපි අත තබන්නට කිසිසේත්ම ඉඩ තියන්නේ නැහැ. අපේ රටට අවශ්‍ය එන්නත් ප්‍රමාණය ලබා ගැනීම මේ රජයේ වගකීමක් වනවා. අපේ රටට අවශ්‍ය එන්නත් ටික ලබා ගන්නවා පමණක් නොවෙයි, මේ රටේ සියලු ජන කොට්ඨාසවල සෑම සියලු දෙනෙකුටම එය නොමිලේ ලබා දෙන්නට රජය කටයුතු කරන්නට ඕනෑ. සමගි ජන බලවේගයේ අපි එන්නත් ටික නොමිලේ ලබා දෙන තුරු පොදු

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ජනයා වෙනුවෙන් ජනතාවාදී අරගලයක නිරත වනවාය කියන කාරණය මම මේ අවස්ථාවේදී පැහැදිලිව ප්‍රකාශ කරනවා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ කොරෝනා වසංගතය අපට මර්දනය කරන්නට පුළුවන්; කළමනාකරණය කරන්නට පුළුවන්. මට මතක් වෙනවා, වින්ස්ටන් චර්චිල් අගමැතිතුමාගේ කියමනක්. දෙවන ලෝක මහා සංග්‍රාමයේ ඉතාම අන්ධකාර අවස්ථාවක, අමාරු අවස්ථාවක එතුමා කිව්වා, "It is no use saying, 'We are doing our best'. You have got to succeed in doing what is necessary"; 'අපි අපේ කටයුතු ඉතාම හොඳින් කරනවා' යැයි කියා කීමෙන් ඵලක් නැත. ඔබ විසින් අවශ්‍ය දේ සැබැවින්ම කළ යුතුව පවතී" කියලා. වින්ස්ටන් චර්චිල් මැතිතුමාගේ ඒ උදාරතර අදහස් සමඟ අපි විශ්වාස කරනවා, මේ කොරෝනා ප්‍රශ්නයෙන් අපට ගොඩ එන්න පුළුවන් කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් අමාත්‍යතුමා -ගරු අග්‍රාමාත්‍යතුමා- ප්‍රකාශ කළා, ගම සමඟ පිළිසඳරක් තිබුණා කියලා. ඒ පිළිසඳරෙන් ඉදිරිපත් වුණු යෝජනා ටිකයි මේ අය වැය ලේඛනයේ තිබෙන්නේ කියලා එතුමා කියනවා. මා එතුමාට කියන්න කැමැතියි, පිළිසඳර නොවෙයි වැදගත් වන්නේ, "රට හදන සෞභාග්‍යයේ දැක්ම"යි කියලා. ඒකයි වැදගත් වෙන්නේ.

මේ රජයට වග කීමක් තිබෙනවා, මේ රටේ ජනතාවට ජීවත් වීමේ අයිතිය ලබා දෙන්න. අද ඒ අයිතිය පැහැරගෙන තිබෙනවා. බලයට පැමිණි දවසේ ඉඳලාම දේශපාලන පළිගැනීම් තමයි කළේ. රැකියා අහිමි කළා, ජීවනෝපායයන් අහිමි කළා. නිවාස අධිකාරියේ 2,500කගේ, ව්‍යාපෘති සහකාරවරුන් 6,800කගේ, පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ 1,500කගේ, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 167කගේ, ඩෙංගු ක්ෂේත්‍රයේ 1,100කගේ රැකියා, ලංකා ගමනාගමන මණ්ඩලයේ 1,500කගේ උසස්වීම් නැති කරලා තිබෙනවා. උසස්වීම් නැති කරලා ඈත ස්ථානවලට මාරු කළා. ජාතික සේවක සංගමය, රාජ්‍ය සේවා වෘත්තීය සමිති සම්මේලනය, ජාතික වතු කම්කරු සංගමය, අධ්‍යාපන සේවක සංගමය යන වෘත්තීය සමිතිවල සාමාජිකයන්ගේ රැකියා අයිතිය අහිමි කළා; ජීවත් වීමේ අයිතිය අහිමි කළා. එහෙම කළ එක වැරැදියි. බලයට පැමිණි හැටියේම කළේ පළිගැනීමයි.

සුපිරි ධනවතුන්ට දැවැන්ත බදු සහන ලබා දුන්නා. ඒක තමයි ආපු හැටියේම කළ පළමුවන කාරණය. එහෙම කරලා රාජ්‍ය ආදායම අහිමි කර ගත්තා. රාජ්‍ය සේවකයන්ට කළේ මොකක්ද? රනුග්ගේ කමිටු වාර්තාවෙන් රුපියල් 3,000 සිට රුපියල් 24,000 දක්වා වැඩි කළ වැටුප් මේ රජය බලයට පැමිණි හැටියේම අහිමි කළා. විධායක ශ්‍රේණියේ රාජ්‍ය සේවකයන්ට ලබා දෙනවාය කිව්ව රුපියල් 15,000 අපි වෙන් කරලායි තිබුණේ. ඒකත් නතර කළා.

ඒ විතරක් නොවෙයි. විශේෂ කැබිනට් පත්‍රිකාවක් ගෙනැවිත් විශ්‍රාමික ප්‍රජාවට වෙන් කර තිබුණු ඒ මූල්‍ය ශක්තිය එක පෑන් පහරින් අහිමි කළා. මා මේ අවස්ථාවේදීත් මේ රජයෙන් ඉල්ලීමක් කරනවා, අඩුම තරමින් මේ කොරෝනා තත්ත්වය අවබෝධ කරගෙන, මේ කොරෝනා තත්ත්වය පිළිබඳව හදවත උණුවෙලා, හදවත සසලවෙලා, මේ මිනිසුන් ගැන හිතලා, පළිගැනීමට ලක්වුණු සියලුදෙනාටම ඒ රැකියා අවස්ථා, ජීවත්වීමේ අයිතිය ලබා දෙන්න, අපි වැඩි කළ වැටුප කරුණාකර ලබා දෙන්න, විශ්‍රාමිකයන්ට ලැබිය යුතු ඒ වැටුප් වැඩිවීම ලබා දෙන්න, රාජ්‍ය සේවකයන්ට රනුග්ගේ කමිටු වාර්තාවේ සඳහන් සහන ටික ලබා දෙන්න, විධායක නිලධාරින්ට ඒ සහන ලබා දෙන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා රජයෙන් ඉල්ලීමක් කරනවා. ඊර්ෂ්‍යාව, කුහකකම, ක්‍රෝධය, වෛරය කේන්ද්‍ර කරගෙන රටෙන් පළිගන්න එපා, රටේ ජනතාවගෙන් පළිගන්න එපා කියලා.

අපේ ගරු අගමැතිතුමා අය වැය කථාවේ 47වන පිටුවේ කියනවා, "මේ රටේ පොදු ජනතාව සහනාධාර හෝ නොමිලේ කිසිවක් රජයෙන් ඉල්ලා සිටියේ නැහැ"යි කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම රාජ්‍ය පාර්ශ්වයේ සියලුදෙනාගෙන්ම ඉල්ලීමක් කරනවා, අභයාරාම විහාරස්ථානයට ගිහිල්ලා ගෞරවනීය, වන්දනීය අතිපූජනීය මුරුත්තෙට්ටුවේ ආනන්ද නායක මාහිමිපාණන් වහන්සේ පොඩ්ඩක් බැහැ දකින්න කියලා. මොකද, අද පළ කර තිබෙන වීඩියෝවක් ගැන මේ අවස්ථාවේ මා කියන්න ඕනෑ. ආනන්දාරාමය ළඟ පිරිසක් පෝලිමේ ඉන්නවා. ඇවිල්ලා පන්සලෙන් සහන ඉල්ලනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අභයාරාමය ළඟ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සමාවෙන්න, වැරදීමක්. අභයාරාම විහාරස්ථානය. අභයාරාම විහාරස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වන මුරුත්තෙට්ටුවේ ආනන්ද නායක මාහිමිපාණන් වහන්සේගෙන් ඒ ගැන අහන්න. මම කියපු වීඩියෝව ගැනත් පොඩ්ඩක් බලන්න. සහන ඉල්ලලා පිරිසක් පෝලිමේ ඉන්නවා. මේ අය වැයේ කියනවා, මිනිසුන් සහන ඉල්ලන්නේ නැහැ කියලා. වෙන කොහේවත් නොවෙයි, අභයාරාමයටම ගිහිල්ලා ඒක බලන්න. සුපුරුදු තැන නේ. ගෞරවනීය, වන්දනීය නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ බැහැ දකින්න. බලය ලැබුණාට පසුව උන් වහන්සේගේ යෝජනා, දේශනා පයට පෑගෙන දූවිලි තරමවත් ගණන් නොගෙන ඉන්නේ නැතුව කරුණාකරලා උන් වහන්සේ ළඟට ගිහිල්ලා දණ නමස්කාර පූර්වකව රටේ ජනතාවගේ හදවතේ දුක, කඳුළ, වේදනාව, ඒ කැකෑරෙන කැක්කුම පිළිබඳව අවබෝධයක් ලබා ගන්න කියලා අපි ආණ්ඩු පාර්ශ්වයේ තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා.

සහන නම් දුන්නා, පොහොසතුන්ට. ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසයේ දුන්නා. මොනවාද? බදු සහන දුන්නා. බදු සහන දීලා මොනවාද කළේ? රුපියල් බිලියන 600 සිට රුපියල් බිලියන 800ක් දක්වා රටේ රාජ්‍ය ආදායම නැති කර ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එංගලන්තයේ මුදල් ඇමතිතුමා, - Chancellor of the Exchequer - රිෂි සුනාක් පිළිබඳව බලන්න. එතුමා මොකක්ද කර තිබෙන්නේ? එංගලන්තයේ "furlough" කියලා වැඩසටහනක් ආරම්භ කරලා තිබෙනවා. ඒ මඟින් හැම පෞද්ගලික ආයතනයකම සේවය කරන හැම පුද්ගලයෙකුගේම වැටුපෙන් සියයට අසූවක් රජය ගෙවනවා. අන්න, fiscal stimulus පැකේජය; අන්න, මූල්‍ය උත්තේජක පැකේජය. අපේ රටේ හැටනව ලක්ෂයකගේ ජනාධිපතිවරණ, මහ මැතිවරණ ආශිර්වාදය තුළ, ඒ මහා දැවැන්ත ජයග්‍රහණය තුළ නිර්මාණය වුණු මේ ජනතාවාදී, ජනහිතකාමී ප්‍රගතිශීලී ආණ්ඩුවේ fiscal stimulus පැකේජය කෝ කියලා මම අහන්න කැමැතියි. මූල්‍ය උත්තේජක පැකේජය කෝ? බොහෝ දෙනෙකුට ජීවනෝපාය අහිමි වෙලා, ආර්ථික කේන්ද්‍රස්ථාන අඩපණ වෙලා, කර්මාන්ත පද්ධතිය සහමුලින්ම කඩා වැටිලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වනවිට කොවිඩ් නිසා නවතම මාදිලියේ දුප්පත්කමක් නිර්මාණය වෙලා තිබෙනවා. අද අපේ රටේ කොවිඩ් දුප්පත්කම නිර්මාණය වෙලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආහාර දරිද්‍රතාව - food poverty, ආදායම්

දරිද්‍රතාව - income poverty, දරුවන්ගේ දරිද්‍රතාව - child poverty, කාන්තා දරිද්‍රතාව - women's poverty - අද බරපතළ තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. Child poverty ගැන කථා කරනකොට කියන්න ඕනෑ, අද එක්සත් ජාතීන්ගේ විශ්ව ළමා දිනය බව. ළමා අයිතීන් සුරක්ෂා කරන දිනය. නමුත් ළමා අයිතීන් ගැන කථා කරනවා නම්, ළමා දරිද්‍රතාව ගැන කථා කරනවා නම් අද අපේ රටේ තත්ත්වය බොහොම කනගාටුදායකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවුරුද්දේ මැයි මාසයේ UNICEF එක කළ සමීක්ෂණයකට අදාළ වාර්තාවක් මේ අවස්ථාවේ දී මා **සභාගත*** කරනවා.

UNICEF එක මේ අවුරුද්දේ මැයි මාසයේ කියා තිබෙන්නේ මොකක්ද? මේ කොවිඩ් ප්‍රශ්නය නිසා අපේ රටේ පවුල් ප්‍රමාණයෙන් සියයට තිහක් ආහාර පාරිභෝජනය අඩු කර තිබෙනවා. මම මේ වාර්තාව සභාගත කරනවා, විශේෂයෙන්ම රජයේ නියෝජිතයන්ට කියවීම සඳහා. අපේ රටේ පවුල් ප්‍රමාණයෙන් සියයට තිහක් අඩුවෙන් තමයි ආහාර ගන්නේ. ඒ සියයට තිහෙනුත් සියයට අසූවක් ප්‍රෝටීන් ආහාර වර්ග වන මස්, මාළු, බිත්තර, කිරි ආහාර ගැනීම සම්පූර්ණයෙන්ම අඩු කරලා තිබෙනවා.

සියයට 54ක් එළවලු සහ පලතුරු පරිභෝජනය අඩු කරලා තිබෙනවා. කොවිඩ් වසංගතයට පෙර අපේ රටේ දරු පරපුරෙන් සියයට 39ක් යකඩ සහිත ආහාර ලබා ගෙන නැහැ, යුනිසෙෆ් ආයතනය කළ ගවේෂණ හා සමීක්ෂණ අනුව. කොවිඩ් වසංගතයට ඉස්සර වෙලා අපේ රටේ දරු පරපුරෙන් සියයයට 39ක් යකඩ සහිත ආහාර ලබාගෙන නැත්නම්, දැන් කොහොමට ඇතිද? දැන් කොයි තරම් අසරණ තත්ත්වයකට පත් වෙලා ඇතිද? යුනිසෙෆ් ආයතනයේ අපේ රටේ නියෝජිත, ටිම් සටන් මැතිතුමා මෙසේ කියා තිබෙනවා. එතුමා ඇත්ත වශයෙන්ම ආරම්භයේ දී රජය ප්‍රශංසාවට ලක් කරලා කියා තිබෙනවා, අප්‍රේල් මාසයේ දී හා මැයි මාසයේ දී ජනතාවට රුපියල් පන්දහස ලබා දීම බොහොම හොඳයි කියලා. හැබැයි එතුමා කියා තිබෙනවා, එය ස්ථාවරව, සාර්ථකව ක්‍රියාත්මක වෙන්න නම් තවත් අමතර මාස හයක් ඒ රුපියල් පන්දහස ලබා දෙන්න ඕනෑය කියලා. ලබා දුන්නාද? ඇත්ත වශයෙන්ම නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද විශ්ව ළමා දිනය දවසේ කියන්න සිදු වෙන කනගාටුදායක කාරණාව මොකක්ද? අපේ රටේ ළමා දරිද්‍රතාව - child poverty - පිළිබඳව සංඛ්‍යාලේඛන නැහැ. අඩු ගණනේ ඒ ගැන හිතන්නවත් පටන් ගත්තේ, අපේ ආණ්ඩුව කාලයේ දීයි. 2019 මාර්තු මාසයේ දී CEPA, Census and Statistics Department, Oxford Poverty and Human Development Initiative යන ආයතන round table conference එකක් තියලා එය ආරම්භ කළා. නමුත් අද වනකොට මේ රජය child poverty කියන මාතෘකාව සම්පූර්ණයෙන්ම පැත්තකට දමලා තිබෙනවා. විශේෂයෙන්ම කෘෂිකාර්මික, ධීවර, කම්කරු, රැකියාවක් කළ නොහැකි, වයස්ගත කොටස්වල තමයි මේ ළමා දරිද්‍රතාව කියන ප්‍රශ්නය තිබෙන්නේ. අඩුම ගණනේ දැන්වත් මේ දරිද්‍රතාව පිළිබඳව, ආහාර දරිද්‍රතාව, ආදායමක් නැති නිසා ඇති වන ආදායම් දරිද්‍රතාව - income poverty, child poverty පිළිබඳව අවධානය යොමු කළ යුතුයි කියලා මා කියනවා. විශේෂයෙන්ම අවදානම් සහිත ජන කොට්ඨාසයක් වන අපේ රටේ කාන්තා පරපුරේ -සියයට 51.5ක්- ආර්ථික අවස්ථා අඩු වෙලා තිබෙනවා. ආර්ථික අවපාතය වැඩියෙන්ම කාන්තා පාර්ශ්වයට බලපා තිබෙනවා. ඇත්ත වශයෙන්ම බෙහෙවින්ම අවදානම් තත්ත්වයේ රැකියා කරන අපේ කාන්තා පරපුරේ දරිද්‍රතාව සම්බන්ධයෙන් රජය මීට වඩා වැඩි අවධානයක් යොමු කළ යුතුයි කියා මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සංචාරක ක්ෂේත්‍රය දිහා බලන්න; සහමුලින්ම කඩා වැටිලා. අපේ කාලයේ පාස්කු ප්‍රහාරයෙන් පසුව "සංචාරක පොඩ්ඩෝ" කියලා වැඩසටහනක් පටන් ගත්තා. සංචාරක ක්ෂේත්‍රයේ සේවය කළ බොහෝ දෙනෙකුට පොලී රහිතව ලක්ෂ පහක ණයක් ලබා දුන්නා. අද එහෙම වැඩ පිළිවෙළක් නැහැ. අද සංචාරක ක්ෂේත්‍රයට ලබා දෙන සහනයක් නැහැ. සංචාරක ක්ෂේත්‍රයේ ලක්ෂ ගණනක් අද සහමුලින්ම අනාථ වෙලා. අද කලාකරුවන් අනාථ වෙලා. මහා ලොකුවට කියනවා, කලාකරුවන්ට රැකවරණය දෙනවාය, ශක්තිය දෙනවාය කියලා. ඒක ක්‍රියාත්මක වන්නේ නැහැ. සුළු හා මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන්ට මහා පරිමාණයේ කර්මාන්තකරුවන්ට ලබා දෙන සහන කෝ? ණය වාරික ගෙවීම අත්හිටුවා තිබෙනවා. ඒක ඇත්ත. හැබැයි, කනගාටුදායක කාරණාව තමයි ඉදිරියේ දී ඒ ණය වාරික තවත් වැඩි කරලා ගෙවන්න ඒ කර්මාන්තකරුවන්ට සිදු වීම. ඒ අයට ලබා දෙන්න ඕනෑ ණය සහන පමණක් නොවෙයි. එංගලන්තයේ, ඇමෙරිකාවේ ලබා දෙනවා වාගේ ආධාර හා සහන ලබා දීමේ වැඩ පිළිවෙළක් අපේ රටේත් ක්‍රියාත්මක කරන්න ඕනෑ. බොරුවට ඇවිල්ලා ඔලුව කස කසා ඉන්න බැහැ. අනේ! අපේ ජාතික ආදායම, රාජ්‍ය ආදායම අඩු වෙලා, අපි කෝටිපතියන්ට, ප්‍රකෝටිපතියන්ට බදු සහන දුන්නා, ඒක නිසා ආණ්ඩුවට සල්ලි නැහැ කියලා හේතු දක්වන්නට අවස්ථාව නොවෙයි මේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ පියාණන් ආරම්භ කළ ඇඟලුම් කම්හල් 200 වැඩසටහන තුළින් අතිවිශාල පිරිසක් තමන්ට අවශ්‍ය කනකර ටික ලබා ගත්තා. කියන්න කනගාටුයි, ප්‍රේමදාස යුගයේ සුද්දියන්ට ජංගි මහනවා කියලා දෝෂාරෝපණයට ලක් කළ, අවලාදයට ලක් කළ ඇඟලුම් සේවය අද සහමුලින්ම කඩා වැටිලා පමණක් නොවෙයි, අද රටේ බහුතරයක් ජනතාව කනකර ටික උකස් කරලායි ජීවත් වන්නේ. මේ රජයට හිතක් පපුවක් නැද්ද? ඇයි, මෙහෙම දරදඬු වෙන්නේ? මෙහෙම දරදඬු, සෘජු ස්ථාවරයක් තියාගන්න අවස්ථාව නොවෙයි, මේක. මේ වෙලාවේ හදවත උණු වෙන්න ඕනෑ, ජනතා දුක දැකලා ඒ දුකට පිළියම් යොදන්න ඕනෑ. ඒකයි, හැටනව ලක්ෂයක් ජනතාව මැතිවරණ දෙකකදීම ඔබතුමන්ලාට ඓතිහාසික වරමක් ලබා දුන්නේ. යකඩ හිතක් තියාගන්න නොවෙයි ඔවුන් ඒ වරම දුන්නේ. ඔබතුමන්ලා නම්‍යශීලී වෙන්න ඕනෑ; සවන් දෙන්න ඕනෑ; දුක තේරුම් ගන්න ඕනෑ; ජනතා දුකට පිහිට වෙන්න ඕනෑ.

අද ස්වයං රැකියාලාභීන් අනාථ වෙලා ඉන්නවා. ත්‍රිරෝද රථ රියැදුරා, කඩල වෙළෙන්දා, රටකජු වෙළෙන්දා, එළවලු, පළතුරු වෙළෙන්දා, සාරවිට වෙළෙන්දා ඇතුළු ඉදිආප්ප ව්‍යාපාර කරන, බත් කඩ කරන දෛනික වැටුප්ලාභීන් -daily wage earners - සහ කුලියට වැඩ කරන අය, ගොවියා, ධීවරයා, කම්කරුවා කියන ජන සමාජයම සම්පූර්ණයෙන් අනාථයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බලන්න, ලීසිංවලට දෙනවා කිව්ව සහනයත් පුස්සක් නේ; බොරුවක් නේ. ලීසිං සහනය දීලා, නොගෙවූ ලීසිං වාරිකවලට ඒ සහන කාලයෙන් පස්සේ අමතර පොලියකුත් අය කරනවා. එතකොට, ඒක සහනයක් වෙන්නේ කොහොමද? සෞභාග්‍යයේ ඉදිරි දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ සහනය මේකද?

අද රණ විරුවන් සම්පූර්ණයෙන්ම අමතක කර තිබෙනවා. රට විරුවන්වත් අමතක කර තිබෙනවා. ඔබතුමන්ලාට මතක ඇති, දහස් ගණනක් දෙනා planesවලින් ආවේ ඡන්දය දමන්න නේ. අද මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ රට විරුවන් පිට රටින් අපේ රටට ගෙන්වන කොට ටිකට් පතේ -ගුවන් ගමන් බලපත්‍රයේ - ඉඳලා, හෝටල් ගාස්තුවේ ඉඳලා හැම එකකින්ම ගහනවා. "ටිකට්,

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

හෝටල් ගැහිල්ල." කාගෙන්ද මේ ගහන්නේ? ඡන්දය දුන්න රට විරුවන්ගෙන්. මෙහෙමත් ආණ්ඩුවක්! එම රට විරුවන් ඒ රටවල තිබෙන අපේ තානාපති කාර්යාලවලට කථා කරනකොට -මම මේ කියන්නේ, ඒ රට විරුවන්ගේ අඳෝනාව- අපේ තානාපති කාර්යාල මොනවාද කරන්නේ? දුරකථන විසන්ධි කරනවා; බණිනවා; රවටනවා. ඒ රටවල භාෂාව හදාරා තිබෙන සමහර අය අපේ මව් භාෂාවෙන් කථා කරන්නේ නැතිව ඒ භාෂාවෙන් කථා කරනවා. ඔන්න, අපේ තානාපති කාර්යාලවල අය වැඩ කරන හැටි. මේකද, වියත් ආණ්ඩුව? වියත් ආණ්ඩුවේ, වියත් තානාපති සේවය මේකද?

ආබාධිත රණ විරුවන්ට ලබා දෙනවා කියපු සහන ටික කෝ? ඒවා මේ අය වැයේ නැහැ. නිකම් වාක්‍යයක් විතරක් තිබෙනවා. මුදල් වෙන් කිරීමක් නැහැ. අපේ රටේ ආබාධිත ප්‍රජාවට ලබා දෙන සහන කෝ? ලොකුවට කියනවා, ජනතාවට පෝෂණ මල්ලයි, ත්‍රිපෝෂයි දෙනවා කියලා. ඒක දිය යුතු දෙයක් නේ. ඒක හැම ආණ්ඩුවක්ම දෙන දෙයක්. හැම දාම දෙන දේ මොකටද අය වැය කථාවේ කියන්නේ? ඇයි, ජනතාව රවටන්න හදන්නේ?

අද බඩු මිල අහස උසට නැඟලා. බඩු මිල ඉහළ යෑම නවත්වන්න මේ රජයට තිබෙන විසඳුම මොකක්ද? ඒකට චක්‍රලේඛ නිකුත් කිරීම, ගැසට් නිකුත් කිරීම, නියෝග නිකුත් කිරීම තමයි කරන්නේ. රජය කියනවා, "අනිවාර්යයෙන්ම මේ නියෝගය ක්‍රියාත්මක වෙන්න ඕනෑ, මේක රජයේ නියෝගයක්, චක්‍රලේඛයක්, රජයෙන් එවන උපදෙසක්" කියලා. නමුත්, මහ පොළොවේ යථාර්ථය මොකක්ද? දැන් පත්තර කඩවල, බෝතල් කඩවල චක්‍රලේඛ පිරිලා තිබෙනවා. නමුත්, මහ පොළොවේ ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. චක්‍රලේඛ නිකුත් කළාට පස්සේ, ගැසට් ගැහුවාට පස්සේ තමයි බඩු මිල වැඩි වෙන්නේ. ඒවා නිකුත් කරන්නේ බඩු මිල අඩු කරන්නයි. හැබැයි, චක්‍රලේඛ මුද්‍රණය කිරීමේ ප්‍රතිඵලය තමයි, බඩු මිල ඉහළ යෑම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක උද්ධච්ච ආණ්ඩුවක්; බොහොම ආඩම්බරකාර ආණ්ඩුවක්. අපි මේ අවුරුද්දේ ජනවාරි මාසයේ ඉඳලා කියපු දේවල් එකකටවත් සවන් දුන්නේ නැහැ. ජනවාරි 24වන දා, පෙබරවාරි 05වන දා අපි දැකපු දේ මේ උත්තරීතර සභාවට වාර්තා කළා. අපි මුව ආවරණ ගැන කිව්වා; වරාය හා ගුවන් තොටුපොළ ගැන කිව්වා; බෙහෙත් ගැන කිව්වා; පොකුරු ව්‍යාප්තිය, සමාජ ව්‍යාප්තිය ගැන කිව්වා. නිරෝධායන නීති ගැන කියනකොට, "පාර්ලිමේන්තුවට නිරෝධායනයක් අවශ්‍ය නැහැ, මේක පොදු තැනක් නොවෙයි" කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිවරණ සමයේ එක වෙලාවක මම වේදිකාවකදී අත සෝදා ගත්තා. ඒ වීඩියෝව වෙනමම කපලා අරගෙන පෙන්වමින් විවිධ මාධ්‍ය ආයතන මට පහර පිට පහර ගැහුවා, අත සේදුවා කියලා. දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? දැන් විසිහතර පැයම, දවස් තුන්සියහැටපහම පිරිසිදුව ඉන්න කියලා නියෝග දෙනවා. අපි කියපු හැම දෙයක්ම දැන් සත්‍ය වෙලා තිබෙනවා.

ආණ්ඩුවේ නොහැකියාව වසාගන්න දැන් කරන්නේ මොකක්ද? මේ ආණ්ඩුව මාධ්‍ය මර්දනයක නියැලී ඉන්නවා. දැන් තමන්ගේ නොහැකියාව, අකාර්යක්ෂමතාව, බැරි බව වහගන්න, වැඩ බැරි ආණ්ඩුව, අසමත් ආණ්ඩුව තමන්ගේ අසමත්භාවය වහගන්න කරන්නේ මොකක්ද? මාධ්‍යවේදීන් අත්අඩංගුවට ගන්නවා. ධනුෂ්ක රාමනායක, තිලංක කාරියවසම්, චිරන්ත අමරසිංහ වැනි අය අත්අඩංගුවට ගන්නවා. කථා කිරීමේ නිදහස අපේ රටේ නැද්ද? භාෂණයේ නිදහස නැද්ද? අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වැනි පරිච්ඡේදයේ 14.(1) අනුව්‍යවස්ථාවේ මොකක්ද කියන්නේ? සෑම පුරවැසියෙකුටම අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්; මතය පළ කරන්න පුළුවන්; කථා කරන්න පුළුවන්. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් මේ ආණ්ඩුවට අමතක වෙලා හමාරයි. ඒ ගැන බොහොම කනගාටුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටක නීතියක් තිබෙනවා. ඒ වාගේම රටවැසියන්ට අයිතියක් තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඒ උත්තරීතර නීතිය සුරකින්න අපි කටයුතු කරනවා. සමාජ මාධ්‍යවල නිදහසේ අදහස් ඉදිරිපත් කරන කිසිම කෙනෙකුට ඇඟිල්ලකින්වත් අත තබන්නට සමඟි ජනබලවේගයේ අපි ඉඩ තබන්නේ නැහැ. සමාජ මාධ්‍ය ගැන කථා කරන කොට මට කොපමණ පහර ගැසුවාද? කොපමණ උසුළු විසුළු කළාද? නමුත්, අපි හිංසනය, කෲරත්වය මාධ්‍ය මර්දනය කරන්න පාවිච්චි කළේ නැහැ. අපි ඒ හැම දෙයක්ම බොහොම සිනාමුසු මුහුණින් භාර ගත්තා. නිවැරදි හෝ වැරදි විවේචනත් අපි බොහොම මධ්‍යස්ථව භාර ගත්තා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාවේ අවසන් කොටසටයි දැන් මම ඇවිල්ලා ඉන්නේ. මේ ආණ්ඩුවේ දර්ශනය මොකක්ද? එතුමන්ලාට දර්ශනයක් තිබෙනවාද? දර්ශනයක් නැහැ; වැඩ පිළිවෙළකුත් නැහැ; ඉලක්කයකුත් නැහැ; හරයකුත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහත්මා ගාන්ධිතුමා විටෙක මෙසේ කියනවා: “I cannot conceive of a greater loss than the loss of one's self-respect”. සිංහල භාෂාවෙන් කිව්වොත් එහි සරල අදහස, "ආත්ම ගෞරවය අහිමි වීම තරම් වූ අන් කිසිදු අහිමිවීමක් පිළිබඳව මාහට නම් සිතාගත නොහැක" යන්නයි. මහත්මා ගාන්ධි මැතිතුමා ප්‍රකාශ කළ ආකාරයට, අද ආණ්ඩුව තමන්ගේ ආත්ම ගරුත්වයත් නැති කර ගෙන තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකට විසඳුම මොකක්ද? සමඟි ජනබලවේගයේ අප සතුව විසඳුම තිබෙනවා.

අද ප්‍රධාන වශයෙන් ද්විත්ව අභියෝගයක් තිබෙනවා. එකක්, කොරෝනා අභියෝගයයි. අනෙක, ආර්ථික අභියෝගයයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඔක්කෝටම පෙර, මේ රටේ ප්‍රශ්නවලට විසඳුමක් සපයන්න නම්, අපි මේ රටේ ජනතාවගේ යථා තත්ත්වය, ගෘහයක යථා තත්ත්වය හඳුනා ගන්න ඕනෑ. වහාම ක්‍රියාත්මක වන පරිදි, ගෘහයක ආදායම් වියදම් සමීක්ෂණයක් - household income and expenditure survey එකක් - කරන්න ඕනෑ. එතකොට, අපට ගෘහයේ යථාර්ථය අවබෝධ කර ගන්න පුළුවන්. ඒ වාගේම, ලංකාවේ demographic and health survey එකක් කරන්න ඕනෑ. අවසාන වශයෙන් එම සමීක්ෂණය කළේ 2016දීයි. එම වාර්තාව මම **සභාගත*** කරනවා.

ඒක වහාම ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ සමීක්ෂණ දෙක කළාම අපට පුළුවන්කම ලැබෙනවා, හැම පවුලක්ම සුරක්ෂිත කරන්න; හැම පුරවැසියෙක්ම සුරක්ෂිත කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොරෝනා මර්දන ව්‍යාපාරය අපි භාර දෙන්න ඕනෑ, අපේ සෞඛ්‍ය විශේෂඥවරුන්ට; ඒ සම්බන්ධ විශේෂඥවරුන්ට. ත්‍රිවිධ හමුදාව, පොලීසිය ඇතුළු ආරක්ෂක අංශ හොඳ වැඩ කොටසක් කරනවා. ඒ අය හොඳයි සෞඛ්‍ය ආරක්ෂණ වැඩසටහන්වලට. ඒ බුද්ධි ඒකක උපයෝගී කරගෙන ඒවා ක්‍රියාත්මක කරන්න. හැබැයි, සෞඛ්‍ය ක්‍රියාදාමය විශේෂඥවරුන්ට ලබා දෙන්නට ඕනෑ.

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහාචාර්ය තිස්ස විතාරණ මැතිතුමා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙක්. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමනි, එතුමා තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක්. මොකක්ද එතුමා කියන්නේ? "Virology ගැන විශේෂඥයෙක් වූ මගෙන් අද වන තෙක් කොරෝනා මර්දනය ගැන එක වචනයක්වත් අහලා නැහැ" කියලා එතුමා කියනවා. ඒකයි අද තිබෙන දුක්ඛිත තත්ත්වය.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම තව විනාඩි කීපයක් ගන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1929 ලෝක ආර්ථික අවපාතයක් ආවා; the great world economic Depression. එවිට ඇමෙරිකාවේ ෆ්‍රැන්ක්ලින් ඩිලානෝ රූස්වෙල්ට් ජනාධිපතිතුමා මොකක්ද කළේ? එතුමා ඒ නිර්මාණය වුණු අලුත් තත්ත්වයට අලුත් විසඳුමක් ලබා දුන්නා. ජනතාවට new deal එකක් දුන්නා. නව ගනු දෙනුවක් හරහා ආර්ථිකය ශක්තිමත් කළා. ආර්ථිකයට මූල්‍ය ශක්තිය ලබා දුන්නා. ඒක පොම්ප කළා. ඒ හයිය ලබා දුන්නා. දැන් අපිත් මොකක්ද කරන්න ඕනෑ? අපි රාජ්‍ය ආදායම වැඩි කර ගන්න ඕනෑ. කාර්යක්ෂමතාව ඉහළ දමන්නට ඕනෑ. නාස්තිය අඩු කරන්නට ඕනෑ. අත්‍යවශ්‍ය වියදම් පමණක් කරන්නට ඕනෑ. රටට ඵලදායි නොවන වියදම් සියල්ලක්ම කපා හරින්නට ඕනෑ. විශ්වසනීයත්වය ගොඩ නඟන්නට ඕනෑ. Rating agenciesවල අපේ rating එක ඉහළ දමා ගන්න ඕනෑ. මූල්‍ය වෙළෙඳ පොළේ විශ්වාසය ලබා ගන්නට ඕනෑ. එතකොට අපට පුළුවන් මූල්‍ය වෙළෙඳ පොළට ගිහිල්ලා තවත් මුදල් අරගෙන ඵලදායි ආර්ථික සැලැස්මක් තුළින් රට ගොඩනඟන්න. ඒ කර්තව්‍ය අපට කරන්නට පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිරිය ගැන සැලසුම් කරන, ඉදිරිය ගැන හිතන අපේ ක්‍රමෝපායික වැඩසටහනක් තිබෙන්නට ඕනෑ. ක්‍රමෝපායික සැලසුම් - strategic planning - වැඩසටහනක් තිබෙන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොරෝනා වයිරසය ලොව පුරා පැතිරයන මේ මොහොතේ ඇමෙරිකා එක්සත් ජනපදයේ Centre for Disease Control and Prevention කියන ආයතනය තවත් භයංකාර වයිරසයක් ගැන සොයා බලනවා. අලුත් වයිරසයක් නිර්මාණය වෙලා තිබෙනවා. හරියට 'ඉබෝලා' වයිරසයට සමාන, 'චපාරේ' කියන වයිරසය. මේවා ගැන අපේ ආණ්ඩුව දැන ගන්නට ඕනෑ. ඇමෙරිකා එක්සත් ජනපදයේ Centre for Disease Control and Prevention ආයතනයත් එක්ක කථා කරලා ඒ අවදානම ගැනත් අපේ රට හිතන්නට ඕනෑ. නමුත් හිතා ගන්නට අමාරුයි, කොරෝනාවලට මෙහෙම සැලසුම් කළා නම්, ඉදිරි සෞඛ්‍ය අභියෝගවලට කොයි විධියට සැලසුම් කරයිද කියලා. මම මේ කාරණාව සඳහන් ලේඛනය ආණ්ඩුවේ ප්‍රධානින්ගේ අවධානය උදෙසා **සභාගත*** කරනවා.

'චපාරේ' කියන වයිරසය ගැනත් තමුන්නාන්සේලා පොඩ්ඩක් හොයලා බලන්න. ඇමෙරිකා එක්සත් ජනපදයේ Disease Control and Prevention Centre එකට කථා කරලා, මොකක්ද ඒ තත්ත්වය කියලා අවබෝධ කර ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මා කියන්නේ මෙයයි. ජනතාවට හුස්ම ගන්න ඉඩක් අපි ලබා දෙන්නට ඕනෑ. අපි එක කාරණයක් අවබෝධ කර ගන්නට ඕනෑ. මේ රජය නිර්මාණය කරන සංවෘත ආර්ථික සැලැස්ම අද රටේ ආර්ථික ප්‍රශ්නවලට විසඳුමක් නොවෙයි. අපි ආපහු යන්නේ වහල් රටකටද, අපි ආපහු යන්නේ වැහිච්ච රටකටද, අපි ආපහු යන්නේ පෝලිම් යුගයකටද, අපි ආපහු යන්නේ සලාක ක්‍රමයකටද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුරෝපා හවුල - European Union - ඒකාබද්ධ නිවේදනයක් ඉදිරිපත් කරලා අනතුරු ඇඟවීමක් කරනවා. මොකක්ද European Union එක කියන්නේ? නොදන්න අයගේ දැන ගැනීමටයි මම මේක කියන්නේ. 2019 අපේ රටේ සම්පූර්ණ අපනයනවලින් සියයට 29.8ක්, අපේ රටේ භාණ්ඩ ඇමෙරිකානු ඩොලර් මිලියන 3,552ක් අපනයනය කරපු, කේන්ද්‍රස්ථානය තමයි European Union කියන්නේ. මොකක්ද ඒ ගොල්ලෝ කියන්නේ? ඒ ගොල්ලෝ කියනවා, "ජාත්‍යන්තර වෙළෙඳාම කියන්නේ "one-way street" එකක් නොවෙයි. මේක එක පැත්තකට යන දෙයක් නොවෙයි, දෙපැත්තට යන දෙයක්" කියලා. වහාම ආනයන තහනම ඉවත් කරන්න කියලා අනතුරු ඇඟවීමක් කරනවා. ඒකෙන් ඉඟියක් කරනවා, ජීඑස්පී ප්ලස් සහනයටත් මේක බලපාන්න ඉඩ තිබෙනවා කියලා. නොදන්නා අයගේ දැනගැනීම උදෙසා මම මේක හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම අපේ රටේ ඉදිරි ගමන පෞද්ගලික ව්‍යවසායකත්වය කේන්ද්‍ර කරගත්, ආයෝජනයට මුල් තැන ලබා දෙන සමබර මිශ්‍ර ආර්ථික ක්‍රමවේදයක් හරහා ගොඩ නඟන්නට ඕනෑ. ව්‍යවසායකයන්ට ශක්තිය ලබා දෙනවා කියන්නේ, ගජ මිතුරන්ට හයිය ලබාදීම පමණක් නොවෙයි. ඒ නිසා අපේ රටට new vision එකක්, new deal එකක්, අලුත් ආරම්භයක්, අලුත් ගමනක් අවශ්‍යයි. අපේ රටට නව කාර්මීකරණ යුගයක් අවශ්‍යයි. අපි විශ්වාස කරන ආකාරයට මේ නව කාර්මීකරණ යුගයේ කේන්ද්‍රස්ථාන 4ක් කේන්ද්‍ර කරගෙන අපි මේ ගමන යන්න ලෑස්තියි. අපි ලෑස්තියි මේක සමඟි ජන බලවේගයේ doctrine එක හැටියට ඉදිරිපත් කරන්න. එක, දැනුම - knowledge. දෙක, බුද්ධිය - intelligence. තුන, තොරතුරු - information. හතර, තාක්ෂණය - technology. මේක ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා නම්, KIIT approach. මෙන්න මේ කේන්ද්‍රස්ථාන මුදුන්පත් කරගෙන අපි ඉදිරියට යන්න ඕනෑ. තවදුරටත් දළ දේශීය නිෂ්පාදනයට පමණක් අවධානය යොමු කරන්නේ නැතිව අපි වෙනස් විධියකට හිතන්න ඕනෑ. භූතානය වාගේ දළ ජාතික සතුට පිළිබඳව මඳක් හිතන්න. භූතානය කියනවා, "Good governance, sustainable development, preservation and promotion of culture and environmental conservation"; "යහපත් පාලනය, තිරසර සංවර්ධනය, සංස්කෘතික ක්ෂේත්‍රය සුරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සහ පාරිසරික සංරක්ෂණය" කියලා. Yes, we can; ඔව්, අපට පුළුවන් ඉදිරියට යන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට මේ අභියෝග ජය ගන්නට පුළුවන්. විශේෂයෙන්ම මම කියන්නට කැමැතියි, අපේ සමඟි ජන බලවේගය සතුව ඒ හැකියාව, දක්ෂතාව, කුසලතාව, දැනුම මිනුම හා කාර්යක්ෂමතාව තිබෙන බව.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

වින්ස්ටන් චර්චිල් මැතිතුමාගේ ප්‍රකාශයකින් මගේ කථාව අවසන් කරන්නම්. එතුමා එක් අවස්ථාවකදී මෙසේ කියා තිබෙනවා: "I have nothing to offer but blood, toil, tears and sweat"; "රුධිරය, ශ්‍රමය, කඳුළු හා දහඩිය හැරුණුකොට පිරිනැමිය හැකි අන් කිසිවක් හෝ මා සතුව නොමැත."

සමගි ජන බලවේගයේ අපිත් කියන්න කැමැතියි, රට දැය වෙනුවෙන් රුධිරය, ශ්‍රමය, කඳුළු, දහඩිය කැපකොට අපේ මාතෘභූමිය සුරක්ෂා කරන්නට, සෞභාග්‍යසම්පන්න ස්වයංපෝෂිත රටක් බිහි කරන්නට අපි සූදානම් බව. එයට නායකත්වය ලබා දෙන්නට අපි ලෑස්තියි කියමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වාසුදේව නානායක්කාර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පෙර කරුණක් පැහැදිලි කරන්න මට අවස්ථාව දෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ මේ පාර්ලිමේන්තුවේ විවාදය පැවැත්වෙද්දී video feed එක නැවතුණා. මේ ගරු සභාවට මාධ්‍යවේදින්ට පැමිණීමත් දැන් තහනම් කරලානේ තිබෙන්නේ. ඒ නිසා මාධ්‍යවේදින් බලාපොරොත්තු වුණේ මේ video feed එකෙන් තොරතුරු ගන්නයි. අපි මෙතැන හිටපු නිලධාරි මහත්වරුන්ගෙන් ඒ ගැන ඇහුවාම කිව්වා, මේ ඔක්කෝම tape කරලා තිබෙන්නේ, ඒ tape එක මාධ්‍යයට release කරනවා කියලා. දැන් මාධ්‍ය කියනවා, ඊයේ tape එක release කළේ නැහැ කියලා. ඊයේ මේ ගරු සභාවේ කථා කරපු සමහර කථිකයන්ගේ කථා මාධ්‍යයට ලැබිලා නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, signalsවල fault එකක් තිබිලා තිබෙනවා. අපි ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් කරන්නම්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒක නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි මම කියන්නේ. ඒ video එක තවම මාධ්‍යයට ගිහිල්ලා නැහැ නේ. දැන් ගිහිල්ලා තිබෙනවාද? ඒ ගොල්ලන් කියනවාලු video එක නැහැ කියලා. ඒක නැති වෙන්න විධියක් නැහැ නේ. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියපු කාරණයට මම එකඟ වෙනවා. ඊයේ මේ සිද්ධිය වුණාම අපි ඒ වෙලාවේම මේ ගැන ඇහුවා. ඉතා ඉක්මනින්ම ඒක යථා තත්ත්වයට ගේන්න පුළුවන් කිව්වා. නමුත් ඒ කථා සහ ඒ කටයුතු මාධ්‍යයට release කරලා නැහැ. ප්‍රමාද වෙලා තමයි release කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම මම කියන්න කැමැතියි that I have brought this matter up at the Party Leaders' Meeting, where both sides agreed that the Information Systems and Management Department should be revisited and a committee must go into the matters that could arise. කථානායකතුමා ඒ ගැන දැන් එකඟ වෙලා කමිටුව පත් කරනවා, දෙපාර්ශ්වයේම එකඟත්වය මත. මේ සිද්ධිය වාගේ ඒවා විතරක් නොවෙයි, තවත් සිද්ධි වෙන්න පුළුවන්. මේ ගැන, a forewarning was given. Therefore, I think we should move fast so that this committee could go into the matter without listening only to one side of the story. මේක තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I completely agree with the Hon. Leader of the House because still, the video has not been released. මේ සිද්ධිය වුණේ ඊයේ විග්නේෂ්වරන් මන්ත්‍රීතුමා කථා කරන වෙලාවේ. ඉතින් තවම දීලා නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව් මන්ත්‍රීතුමා. අපි ඒ ගැන කථානායකතුමා දැනුවත් කරලා වහාම කටයුතු කරන්න බලන්නම්. දැඩි අවධානයෙන් යුතුව කටයුතු කරන්නම්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මෙහෙමනේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න මම කථා කරන තෙක්. මේ ගරු සභාවේ කටයුතු recod කළා නම් ඒ tape එක මාධ්‍යයට release කරන්න එපායැ. මම අහන සෘජු ප්‍රශ්නය මේකයි. ඒ Tape එක නැති වෙලාද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා කෙටි වෙලාවක් ලබා දෙන්න. මේ ගැන සුවිශේෂී අවධානය යොමු කරලා අවශ්‍ය කටයුතු කරනවා. දැන් අපට මෙතැනට ඒ නිලධාරින් කැඳවන්න බැහැ නේ.

ගරු මරික්කාර් මන්ත්‍රීතුමා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය කථාව සජීවීව මාධ්‍යට ගන්න බැහැයි කියපු වෙලාවෙම කිව්වා, එය පටිගත කරලා live transmission එකක් දෙනවා කියලා. දැන් ඒ live transmission එක fail වුණත්, delayed transmission එකක් දෙන්න පුළුවන්. එතකොට මේ record කරපු එක delayed transmission එකට නොයන්නේ ආණ්ඩුව විවේචනය කරන ඒවා නොයවා සිටීම නිසා ද කියන එකත් ප්‍රශ්නයක් විධියට තිබෙනවා. ඇත්තටම error එකක් තිබෙනවා නම්, chip එකේ මේවා තිබෙන්නෙ ඕනෑ. ඒ තිබෙන එක යවන්න බැරි ඇයි?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්න ඕනෑ, අපි කිසි ලෙසකින් කිසිම දෙයක් පාලනය කරන්න කටයුතු කරන්නේ නැහැ කියන එක. ගරු කථානායකතුමාට තමයි මේ නියෝග දීමේ අයිතිය තිබෙන්නේ. මහ ලේකම්තුමාගේ ප්‍රධාන කාර්ය මණ්ඩලය කරලා නැත්නම් ඒකට නියෝගයක් දෙන්න. මොකද, ඊයේ ඒ අවස්ථාවේදීම අපි විමසන කොට කිව්වා, ඉතා ඉක්මනින්ම release කරනවා කියලා. Therefore, both sides agreed. ඒක කළ යුත්තේ ඒ කර්තව්‍ය භාර නිලධාරින්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු සභානායකතුමනි. අපි ඒක වහාම නිවැරදි කිරීමට නියෝග කරනවා. ඒ ගැන වැඩිදුරටත් සොයා බලා නැවත එවැනි කටයුතු ඇති නොවන ආකාරයට කටයුතු කරනවා. ඒ කාරණාව පැහැදිලියි. දැන් අපට සභාවේ කටයුතුවලට යන්න තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එය තාක්ෂණික දෝෂයක් කියන කරුණ අපට පැහැදිලියි. නමුත්, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන video camera එක සහ screen එක කියන්නේ දෙකක්. ඒවා දෙවිධියකටයි ක්‍රියා කරන්නේ. Screen එකේ තමයි මුලින්ම ප්‍රශ්නය තිබුණේ. හැබැයි, video camera එකේ record වෙන්න ඕනෑ. මේක බරපතළ ප්‍රශ්නයක්. මොකද, විග්නේෂ්වරන් මන්ත්‍රීතුමා කථා කරද්දී නැවතුණා, මම කථා කරද්දී හරි ගියා. මම කථා කරපු වෙලාවේ හරි ගිය එක ගැන මට පොඩි සතුටක් තිබෙනවා. කෙසේ වෙතත්, මේ පිළිබඳව ඔබතුමා හොයා බලා කටයුතු කරනවා නම් හොඳයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අපි මේ පිළිබඳව වාර්තාවක් ලබා ගෙන මේ ගරු සභාව දැනුවත් කරනවා. මේ තත්ත්වය වහාම නිවැරදි කරනවා.

ගරු වාසුදේව නානායක්කාර අමාත්‍යතුමනි, ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ. භා. 10.57]

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of Water Supply)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා බොහොම දක්ෂ ලෙස විවිධ නායකයන්ගේ කියමන් උපුටා දක්වනවා. අපි ඒක දැක්කා. අන්තිමට කිව්වේ චර්චිල්ගේ කියමනක්. නමුත් ඒවා වැරදි සන්දර්භයක - context එකක - තමයි එතුමා ඉදිරිපත් කරන්නේ. ඉතින් ඒක ගැන අපි පුදුම වෙන්නේ නැහැ. ආත්ම ගෞරවය නැති කර ගැනීම ගැන නම් එතුමාට සංස්කෘතික අරමුදලේ සිහිවටන තිබෙනවා. ඒ වාගේම එතුමා විසින් දෙන ලද නීති විරෝධී පත්වීම් තිබෙනවා. මේ සියල්ලම ආත්ම ගෞරවය නැතිවීම පිළිබඳ හොඳ සිහිවටන. ඒ නිසා මම විශ්වාස කරන විධියට නම් එතුමා ඒ කියමන් මෙතැන ප්‍රකාශ කරන්නේ, එතුමාටම හඬ නඟා කියා ගැනීමක් හැටියටයි.

කොරෝනා වසංගතය ගැන අපේ රජය ක්‍රියා කර තිබෙන ආකාරය ගැන දැඩි විවේචනයක් කළා.

නමුත් කොරෝනා වසංගතයට මුහුණ දෙන ලෝකයේ විවිධ රටවල් අතර අපේ රට ඉතාම දක්ෂ ලෙස එයට මුහුණ දීලා, එය ආරම්භයේදීම යම් ආකාරයකට මැඩ පවත්වා ගත්තත්, අපට පාලනය කළ නොහැකි යම් යම් හේතු නිසා එම රෝගී තත්ත්වය නැවත මතු වී ආවා. කොරෝනා වසංගතය පාලනය කිරීමට මේ දක්වා අප ගෙන තිබෙන ක්‍රියාමාර්ගවල සාර්ථකත්වය දැන් දැන් කාටත් පෙනෙමින් තිබෙනවා.

ඒ vaccine එක ගෙන්වන්න order කළේ නැහැ කියනවා. ඒ vaccine එක තවමත් අත්හදා බලමින් තිබෙනවා. නොයෙක් රටවල් තමතමන්ගේ වත්කම් අනුව දැන් ඉඳලාම මිලියන ගණනක් ඒවා order කරලා ඇති. අපටත් එය වුවමනා වෙච්ච දවසට අපි order කර ගන්නවා. ඒ vaccine එක වුවමනා වුණු දවසට ඒකට වුවමනා කරන මුදලුත් අපි හොයා ගන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඉතින් දැන් වුවමනායි නේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
දැනට ඒ vaccine එක අපට වුවමනායි කියලා මම හිතන්නේ නැහැ. ඒක ඇමෙරිකාවට වුවමනායි. Vaccine එක වෙනුවට පාවිච්චි කළ හැකි දේවල් තිබෙනවා. අපි ඒවා පාවිච්චි කරමින් අද මේ කොරෝනා වසංගත තත්ත්වය පාලනය කරනවා. හැබැයි, vaccine එක ගෙන්විය යුතුයි කියලා අපේ වෛද්‍යවරු තීරණය කළාම ඒවා ගෙන්වීමට අපි මේ වනකොට මුදල් වෙන් කරමින් සිටිනවා. ඔබතුමා දන්නවාද කියන්න මම දන්නේ නැහැ, disaster management කියලා එකක් තිබෙන බව.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
Sir, I rise to a point of Order.

ගරු ඇමතිතුමනි, මේ රටට vaccine එක එපා කියලා කියන්න එපා. දැන් එංගලන්තයේ,- [බාධාකිරීම්] පොඩ්ඩක් ඉන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ, නැහැ, මම කිව්වේ නැහැ, vaccine එක ඕනෑ නැහැයි කියලා. දැන්ම ඕනෑ නැහැ කියලායි මම කිව්වේ.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
කිව්වා, කිව්වා. දැන්ම ඕනෑ නැහැ කියලා කිව්වේ. [බාධා කිරීමක්] මම කියන දේ අහගන්න. මට කථා කරන්න අවස්ථාව ලබා දීලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
එංගලන්තයේ priority දීලා තිබෙනවා,-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒවා කරන්න පුළුවන් දේවල්. මගේ කථාවට බාධා කරන්න එපා. ඔබතුමාගේ වෙලාවේදී ඒ ගැන කියන්න. [බාධා කිරීම්] හිතුණු හිතුණු වෙලාවට එහෙම කථා කරන්න පුළුවන්ද? ඒ, හමුදාවේදී. හමුදාවට යන්න, හිතුණු හිතුණු වෙලාවට commands දෙන්න. මෙහේ එහෙම බැහැ. [බාධා කිරීම්] කරුණාකරලා තමන්ගේ වෙලාවේදී කථා කරන්න. මේ, පාර්ලිමේන්තුව. මේක හමුදාව නොවෙයි. [බාධා කිරීම්] ඕනෑම වෙලාවක පාර්ලිමේන්තුවේදී ඕනෑ ඕනෑ දේවල් කියන්න ඔබතුමාට පුළුවන්

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

කියලා ලොකුවට හිතාගෙන ඉන්න එපා. [බාධා කිරීම්] කරුණාකරලා නිකම් ඉන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාඩි වෙන්න. Disaster management වෙනුවෙන් අපි මේ වර්ෂයේ රුපියල් මිලියන 4,264.5ක් වෙන් කරලා තිබෙනවා. අපි disaster management වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. මේ වසංගතය ආපදාවක් හැටියට අපි කල්පනා කරනවා. මේ ආපදාවට මුහුණ දෙන්න වන ආපදා ක්‍රම අපි අනුගමනය කරනවා. රටේ පවතින මෙම වසංගතය පාලනය කිරීමට අවශ්‍ය බුද්ධිමය තොරතුරු සියල්ලම හමුදාව විසින් සැපයෙනවා. ඒ නිසා හමුදාවයි, වෛද්‍ය අංශයයි, මේ රටේ ජනතා නියෝජිතයනුයි කියන මේ සියලුදෙනාගේම එකතුවෙන් තමයි අපි මේ කටයුත්ත කළේ. මිනිසුන්ට සහන ලබා දීලා නැහැ කියලා කියනවා, එංගලන්තයේ වාගේ. එංගලන්තයේ වාගේ සහන දෙන්න නම් එංගලන්තයේ වාගේ රාජ්‍ය ආදායම තිබෙන්න ඕනෑ; එංගලන්තයේ වාගේ ආර්ථික දියුණුවක් තිබෙන්න ඕනෑ. අපේ වාගේ රටකට පුළුවන් මේ රටේ තත්ත්වයෙන් සහන ලබා දෙන්න. එංගලන්තයට පුළුවන්, එංගලන්තයේ තත්ත්වයෙන් සහන ලබා දෙන්න.

යුරෝපා හවුලේ නියෝජිතයන් දැන් අපට අනතුරු ඇඟවීමක් කරලා තිබෙනවා කිව්වා. යුරෝපා හවුලේ නියෝජිතයන් කියනවා, අපේ ආනයනය දිගටම වහගෙන ඉන්න එපා කියලා. ඒගොල්ලන් අපට විදේශ විනිමය ගෙනැල්ලා දෙනවාද? එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපට හැම දාම කියපු දේ. ඒ අය කිව්වේ, "ඒක අරින්න. ඇරලා, ගෙනෙන ඒවා ඕනෑ තරම් ගෙනෙන්න දෙන්න. එතකොට ඔය ගොල්ලන්ට ඕනෑ ණය අපි දෙන්නම්" කියලායි. ඒ ණය දෙන ප්‍රමාණයට අපේ රුපියල පහළ වැටෙනවා. ඒක තමයි ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ දිගටම සිද්ධ වුණේ. අපි කරන ලොකුම දේ මොකක්ද? ඒ තමයි, රුපියලේ පහළ වැටීම නවත්වාගෙන රුපියල ස්ථාවර තත්ත්වයක තබාගැනීම. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ තිබුණු පොලී රේට්ටු මතක් කරගන්න. අපි පොලී රේට්ටු පහළ දමා, පොලී රේට්ටු ස්ථාවර තත්ත්වයක තබාගන්නවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ එහෙම නොවූ බව මතක තබාගන්න. අපි උද්ධමනය ස්ථාවර තත්ත්වයක තබාගන්නවා. අපි ඒ මඟින් තමයි මිනිසුන්ගේ මූර්ත වැටුප අඩුවීම වළක්වන්නේ. එය, උද්ධමනය වැඩි වෙන්න ඇරලා, රුපියල පහළ වැටෙන්න ඇරලා, පොලී රේට්ටු ඉහළට දමලා මිනිසුන්ගේ පඩි වැඩි කිරීමට වඩා වටිනා මාර්ගයක් බව මා ඔබතුමාට කියන්න කැමැතියි.

ඊළඟට, ඔබතුමාගේ කථාවේදී කිව්වා, අපි ගරු කළ යුතු දේවල් මොනවාද කියලා යුරෝපා හවුලේ උදවිය අපට කියා තිබෙන බව. ඒක හරි. අපි ගරු කළ යුතු දේවල් මේ රටේ ජනතාව අතිවිශාල බහුතරයකින් තීන්දු කරලා තිබෙනවා. ඒ තීන්දු කර තිබෙන දේ අනුවයි අප කටයුතු කරන්නේ. පසුගිය ආණ්ඩුව ගිහින් ඇමෙරිකාවත් එක්ක එකතු වෙලා ගෙන ආ යෝජනාවෙන් අපි ඉවත් වීම මේ රටේ බහුතර ජනතාවගේ තීන්දුවයි. ඒ ජන වරමට අනුව තමයි අපි ක්‍රියාත්මක වුණේ. ඒ ජන වරම ක්‍රියාත්මක කිරීමේදී, අපි ඒ යෝජනාවෙන් ඉවත් වන බවත්, මේ රටේ සංහිඳියාව, මේ රටේ මානව හිමිකම්, මේ රටේ යුක්තිය පිළිබඳ අප අපේම වැටහීම අනුව හා මේ රටේ ජනතාවගේ පුළුල් අවබෝධය අනුව ක්‍රියා කරන බවත් අපි යුරෝපා හවුලට දැන්විය යුතුව තිබෙනවා. අපේ විදේශ කටයුතු ඇමතිවරයා ජිනීවා නුවරට ගිහින් ඒ පිළිබඳ හොඳ ප්‍රකාශයක් කළා.

අපේ මිත්‍ර යුරෝපා රටවල් සමඟ අපි වෙළඳාම් කරමු. වෙළඳාම කියන එක, එක පැත්තකට විතරක් නොවෙයි, දෙතුන් පැත්තටම යන්න ඕනෑ තමයි. නමුත් මෙවැනි අර්බුදකාරී අවස්ථාවක අපට රුපියල් බිලියන 20කට වඩා ආනයනයට වියදම් කරන්න බැහැ කියන එක වරදක් ද? ඒක වරදක් ද? ඔය කියන විධියට වෙළඳාම දෙපැත්තට යන්න වුවමනා වනකොට, වුවමනා ඕනෑම දෙයකට රටට එන්න දෙන්න සිදු වනකොට, ඊට වුවමනා කරන විදේශ විනිමය අපට නොමැති වනකොට අප ගත යුතු පියවර ලෝක වෙළෙඳ ගිවිසුමේ ම නම් කරලා තිබෙනවා. විශාල විදේශ විනිමය අර්බුදයක් ඇති වුණොත් ගත හැකි පියවර ලෝක වෙළෙඳ ගිවිසුමේ තිබෙනවා. ආනයන නැවැත්වීමේ තීන්දු ගැනීමට අපට අයිතිය තිබෙනවා. ආනයනය සීමා කිරීමට අපට අයිතිය තිබෙනවා. එම නිසා ලෝක වෙළඳ ගිවිසුම ආයෙමත් කියවන්න වෙයි.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු ඇමතිතුමනි,-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු මන්ත්‍රීතුමා, මගේ කථාවට බාධා නොකර ඔබතුමාගේ කථාවේදී ඕනෑ දෙයක් කියන්න. අපි අහගෙන ඉන්නම්. [බාධා කිරීම්] මොකක්ද, ඔබතුමාට ඇති වෙලා තිබෙන රිදීම? කොහේටද රිදුණේ? යුරෝපයට ගහන කොට රිදෙනවාද? එවැන්නක් තමයි මට පෙනෙන්න තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகுஉறுப்பினர்ஒருவர்)
(An Hon. Member)
අයියෝ, අයියෝ! කොයි පැත්තද, රිදෙන්නේ?

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகுமனுஷநாணாயக்கார)
(The Hon. ManushaNanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රීති ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகுபிரதிச்சபாநாயகர்அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමනි, මොකක්ද රීති ප්‍රශ්නය?

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகுமனுஷநாணாயக்கார)
(The Hon. ManushaNanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට තිබෙන ප්‍රශ්නය යුරෝපය සම්බන්ධ කාරණාවට අදාළ එකක් නොවෙයි. අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මේකයි. මේ රටේ, මෝටර් සයිකල් කර්මාන්තයෙන්, රථවාහන කර්මාන්තයෙන් ජීවත් වෙච්ච මහා විශාල පිරිසක් ඉන්නවා, - [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகுபிரதிச்சபாநாயகர்அவர்கள்)
(The Hon. Deputy Speaker)
එය රීති ප්‍රශ්නයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. VasudevaNanayakkara)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. රීති ප්‍රශ්නය කියන්නේ මොකක්ද කියලා ඉස්සෙල්ලා හඳුනාගන්න. [බාධා කිරීම්] අපි ඉතා පැහැදිලිව කියා තිබෙනවා. [බාධා කිරීම්] අපි ඉතා පැහැදිලිව කියා තිබෙනවා. මා දන්නේ නැහැ, යුරෝපා හවුල මෙය නොදැක්කේ ඇයි කියලා. අපි කියා තිබෙනවා, අපි අපේ රටේ කර්මාන්තවලට

අවශ්‍ය අමු ද්‍රව්‍ය ගෙනෙනවා, යන්ත්‍ර සූත්‍ර ගෙනෙනවා කියලා. අපි පැහැදිලිව කියා තිබෙනවා, ඒවා ඒ තහනමට ඇතුළත් නැහැ කියලා. අපට අවශ්‍ය අමුද්‍රව්‍ය, අපට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මේ රටේ කර්මාන්ත පවත්වාගෙන යෑම සඳහා ගෙනෙන බව අපි ප්‍රකාශ කරලා තිබෙනවා. මම කිව්වේ ඒකයි. "There are none so blind as those who will not see" කියා කියමනක්, එනම් "කවුද මේවා දකින්න අකමැති? ඒ දකින්න අකමැති අය තරම් නොපෙනෙන වෙනත් අය ලෝකයේ නැහැ" කියා කියමනක් තිබෙනවා. ඒ කියමන තමයි අපි නැවතත් මතක් කරන්න ඕනෑ.

අපි මේ රටේ ගත්තා වූ විවිධ පියවර අතර ගැසට් මඟින් බඩු මිල අඩු කිරීමත් එකක්. ඔබතුමා කිව්වා, ඒ ගැසට් ගැහුවාට බඩු මිල අඩු වන්නේ නැහැ කියලා. අපි ඒක දන්නවා. වෙළඳ පොළේ තිබෙන බලය ගැනත් අපි දන්නවා. වෙළඳ පොළේ බලවේග මත තමුන්නාන්සේලා තැබූ විශ්වාසය ගැනත් අපි දන්නවා; මූල්‍ය ප්‍රාග්ධනයට දුන් නිදහස ගැනත් අපි දන්නවා. ඒ ඔක්කොම මැද්දේ එදා මේ රටේ සිදු වෙච්ච රුපියලේ වැටීම, මිල වැඩි වීම් හා උද්ධමන තත්ත්වය ගැනත් අපි දන්නවා. අපේ පාරිභෝගියාත්, අපේ නිෂ්පාදකයාත් අවසාන වශයෙන් ප්‍රධාන තැනට ගැනීම අපේ වැඩ පිළිවෙළයි, අපේ දර්ශනයයි. ඒ සඳහා වෙළඳාමේ තිබෙන්නා වූ යම් යම් සීමා අපි තදින් ක්‍රියාත්මක කරන්න ඕනෑ. වෙළඳාමේ යෙදී සිටින උදවියට නිෂ්පාදකයාගේ හා පාරිභෝගිකයාගේ කර උඩ නැගලා යන්න ඉඩ දෙන්න බැහැ. මේක අපේ දර්ශනය. අපේ දර්ශනය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ දර්ශනයයි. වෙළඳ පොළේ තිබෙන්නා වූ ක්‍රියාකාරිත්වයෙන් ඇති වන්නා වූ පීඩා පාලනය කිරීමට මේ රටේ රාජ්‍ය මැදිහත්වීම අවශ්‍ය බව අපි පිළිගෙන තිබෙනවා. ඒ නිසායි ගැසට් නිකුත් කරන්නේ. ගැසට් එකේ තිබෙන දේ ක්‍රියාත්මක කරගැනීමට තවත් පියවර ගන්න ඕනෑ. ඒ පියවරත් ගන්න ආණ්ඩුව ලෑස්තියි. ගැසට් එක තමයි පළමුවැනි පියවර. [බාධා කිරීමක්] ඔව්, ගැසට් එකේ තිබෙන ඒවා ක්‍රියාත්මක කරගන්න අවශ්‍ය ඊළඟ පියවරත් අපි ගන්නවා. අපි වෙළඳ පොළට දිය යුතු බෙහෙත් දෙනවා. ඒ ගැන බය වෙන්න එපා.

තමුන්නාන්සේලා කිව්වා, අපි ධනපතියන්ට විශාල මුදලක් උපයා ගන්න බදු සහන විශාල වශයෙන් දුන්නා කියලා. මේ රටේ වැටී තිබුණු පෞද්ගලික අංශයේ ව්‍යාපාර නැඟිටුවා ගන්න, මේ රටේ පෞද්ගලික අංශයෙන් ආර්ථිකයට බලාපොරොත්තු වන දායකත්වය ලබාගන්න අපට කවදාවත් පුළුවන් වන්නේ නැහැ, ඒ ව්‍යාපාර ඒ වැටී තිබුණු තත්ත්වයේම තිබුණා නම්.

අපි VAT එක අඩු කළේ, මේ රටේ පාරිභෝගිකයන්ට ඒකෙන් ලැබිය යුතු සහනය ලබා දෙන්නයි. නමුත්, හාමතේ සිටි ව්‍යාපාරිකයෝ ඒක ගිලගත්තා. අපි ඒක දන්නවා. නමුත්, දිගින් දිගටම වෙළඳ පොළ තුළ මෙය ක්‍රියාත්මක වන කොට VAT එක අඩු කරමින් -සියයට 15 සිට සියයට 8 දක්වා අඩු කරමින්- අප ලබා දුන් විශාල සහනයේ වාසිය ඉදිරි කාලයේදී ජනතාවට දැනෙන්න පටන්ගනීවි. තමුන්නාන්සේලා තේරුම්ගන්න ඕනෑ, පළමුවන වටයේදී VAT එක සියයට 15 සිට සියයට 8ට බැස්සුවාම ඒක ගිලගත් නමුත් දිගින් දිගට වෙළඳ පොළේ තරගකාරිත්වය තුළ සියයට 8ට අඩු කළ VAT එකේ සහනය පාරිභෝගිකයන් අතට යන එක වළක්වන්න පුළුවන් වන්නේ නැහැ කියන කාරණය. ඒ නිසා - [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
තවම ගිහිල්ලා නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
තවම ගිහිල්ලා නැහැ තමයි. මම ඒක පිළිගන්නවා. නමුත්, තමුන්නාන්සේලා වෙළඳ පොළ බලවේගවල ඒ කියන තරගකාරිත්වය ගැන නිතරම කථා කරන අය. සියයට 15ට තිබුණු බදු සියයට 8ට බැහැලා තිබෙන කොට, වෙළෙන්දන් අතර තිබෙන තරගකාරිත්වය මත ඔවුන් ඔවුන්ගේ භාණ්ඩ අළෙවි කරගැනීම සඳහා දිගින් දිගටම ක්‍රියාත්මක වන කොට, ඒ සියයට 8 සහනය පාරිභෝගිකයා දක්වා එන්න පටන්ගන්නවා. එහෙමයි වෙළඳ පොළේ ක්‍රියාකාරිත්වය සිදු වන්නේ. නමුත්, තමුන්නාන්සේලාගේ 'මර බදු' යටතේ කාලයක් හෙම්බත් වෙලා සිටි එම ව්‍යාපාරිකයන් සහනය ලැබුණු පළමුවන වටයේදීම ඒවා ගිලගත්තා. ඒකයි ඇත්ත කථාව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මර බදු?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්. තමුන්නාන්සේලා එදා මිනිසුන්ගේ බෙල්ල මිරිකා බදු අය කරගත්තා. ඒ බදු සහනය දුන්නාම ඒක පාරිභෝගිකයා-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] *took the Chair.*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, ඔබතුමා ඇතුළු සියලුදෙනා දන්නවා, යම් සහනයක් දුන්නාම ඒ සහනය පාරිභෝගිකයාට යන්නේ නැති බව. නමුත්, බද්ද වැඩි කළාම, වැඩි කළ බදු වෙනුවෙන්, ඒ වැඩි කළ ප්‍රමාණයටත් වඩා ගෙවන්න පාරිභෝගිකයාට සිදු වෙනවා. ගරු මන්ත්‍රීවරුනි, තමුන්නාන්සේලා සියයට 8 සිට සියයට 15 දක්වා බදු වැඩි කළාම මේ රටේ පාරිභෝගිකයාට ඒවා ගෙවන්න වුණේ එහෙම තමයි.

තමුන්නාන්සේලාගේ කාලයේ ඇති වෙච්ච ඒ තත්ත්වය පිළිබඳ වාර්තාව මෙතැන කියවන්න මට වෙලාව නැහැ. විපක්ෂ නායකතුමා දැන් අපට ධර්මය දේශනා කරනවා. නමුත්, එදා මේ රටේ බැඳුම්කර වංචාව නිසා විශාල පොලී රේට්ටුවකට ණය ගැනීමේ බර අපේ රටට එකතු කළේ තමුන්නාන්සේලායි. ඒ බැඳුම්කර වංචාවෙන් හම්බ කරපු විශාල ධනස්කන්ධයෙන් කොටසක් තමුන්නාන්සේලා භුක්ති විඳිනවා. ඒ විධියට අතීතයේදී ඉතාම දුර්ජන පාලනයක් ගෙන ගිහිල්ලා, අද මෙතැනට ඇවිල්ලා විපක්ෂ නායකතුමා නාට්‍යාකාරයෙන් ධර්මය දේශනා කරනවා. එදා ඒ හැම අවස්ථාවකම විපක්ෂ නායකතුමා ඒවාට ඔළුව නවලා හිටියා. අද මොනවාද, මෙතැන ඇවිල්ලා කථා කරන්නේ? ඒවා ගැන නොදන්නා මිනිහෙක් වාගේ අලුත් ඩීල් එකක් ගැන කථා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මං කථාව අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

අපේ දර්ශනය අනුව අපට සමාජය ප්‍රමුඛයි. වෙළෙඳ පොළ නොවෙයි, ප්‍රාග්ධනය නොවෙයි, අපට ප්‍රමුඛ ජනතාවගේ ශ්‍රමයයි. මේ රටේ නිලධාරීන්ගේ බලයට වඩා ජනතාවගේ සහභාගිත්වයයි අපි ප්‍රධානකොට ගන්නේ. අපි මේ රටේ අලුත් දර්ශනයක් අනුවයි මේ ගමන යමින් ඉන්නේ. ඒ දර්ශනය මේ රටේ ජනතාවගේ උවමනාවන් පෙරදැරි කර ගත්ත දර්ශනයක්. එම නිසා තමයි මේ රටේ දුප්පත්ම ජනතාව ලක්ෂයක් ක්‍රමානුකූලව රජයේ සේවකයන් බවට පත් කිරීම සඳහා තිස්අටදහසකට වහාම රැකියා දුන්නේ; ඔබතුමන්ලාගේ කාලයේ හාමතේ හිටපු උපාධිධාරීන් හැටඅටදහසකට මේ අපේ ආණ්ඩුව යටතේ රැකියා දුන්නේ. ඒ අපේ වාර්තාවයි. ඒ වාර්තා ඔක්කෝම මකලා, විපක්ෂ නායකතුමා අද මෙතැන අඳුරු චිත්‍රයක් මැව්වා. ඒ අඳුරු චිත්‍රය එතුමාගේ අනාගතයේ අඳුරු චිත්‍රය බව මතක තියා ගන්න කියමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[11.17 a.m.]

**ගරු සාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
கௌரவ சபாநாயகர் அவர்களே, இது கார்த்திகை மாதம். அந்த அடிப்படையில் இந்த மண்ணுக்காக உயிரைத் தியாகம் செய்த அனைத்து மாவீர்களையும் முதலாவதாக நான் நினைவுகூர வேண்டும்.

Sir, the Budget for 2021 has been presented and we observe that there is a deficit in this Budget which is far more than the country's revenue. For the last 75 years, Budgets have been presented in this House and since the late 1970s, I think all the Budgets have had a large allocation for defence because of an unresolved ethnic conflict. I think that is one of the main reasons why we have such a major deficit in our Budget and we are trillions and trillions of rupees in debt right now.

To have a proper economy in this country, I think, first of all, we need to address the national political question. If not, this country will not have a Budget surplus in the near future. I do not think it can be done by His Excellency Gotabaya Rajapaksa or any other President unless this ethnic conflict is resolved.

As you are aware, as the TNA, today we go before the international community, we go to all the countries and the only thing that we lobby for is a political solution and justice for our people. However, imagine the amount of investments that we can bring into this country if we go lobbying for investments on behalf of this country.

Sir, I listened to His Excellency President Gotabaya Rajapaksa's address to the nation a few days ago after the Budget.

විදේශිකයන්ට අවශ්‍ය විධියට මේ රටේ තීරණ ගත්ත යුගය අවසන් කියලා ජනාධිපතිතුමා කියලා තිබුණා. ඇත්තටම විදේශිකයන්ට අවශ්‍ය විධියට මේ රටේ තීරණ ගන්නවාද නැද්ද කියන එක නොවෙයි මෙතැන තිබෙන ගැටලුව. හැබැයි, විදේශ රටවල් එකතු කරගෙන අපි මේ ගමන ඉස්සරහට ගියේ නැත්නම් අපට කවදාවත් මේ රටේ ආර්ථිකය හදන්නට බැහැ. මොකද, මේ රට දූපතක් වුණාට, මේ රටේ ආර්ථිකය හදනකොට අනෙක් රටවල් ඔක්කෝම එක්ක එකතු වෙලා වැඩ කරන්න ඕනෑ කාලයක් මේක. ඇත්තටම අපි දැන් ඉන්නේ ගල් යුගයේ -Stone Age එකේ- නොවෙයි. මම ගිය අවුරුද්දේ දඹානට ගිය වෙලාවේ එහේ dance කරපු ඔක්කෝටම රුපියල් 100, 200 tips දීලා එනකොට අන්තිම අවස්ථාවේ දෙන්න මගේ ළඟ මාරු සල්ලි තිබුණේ නැහැ. එතකොට මට වැද්දෙක් කිව්වා, "සර්, යන ගමන් මට reload එකක් දාන්න" කියලා. ඒ කියන්නේ දැන් මේ රට ඉස්සර තිබුණා වාගේ ගල් යුගයේ රටක් නොවෙයි කියන එකයි. එම නිසා දැන් තිබෙන්නේ විදේශිකයන් එක්ක වැඩ කරන්නේ නැතුව ඉන්න පුළුවන් කාලයක් නොවෙයි කියන එක අපි හොඳට මතක තබා ගන්න ඕනෑ.

ඇත්තටම මේ රටේ ද්‍රවිඩ ජාතිකයන් කියන national political question එකට solution එකක් දෙන්න පුළුවන් නම්, අද අපට ගොඩක් ආයෝජන ලංකාවට ගේන්න පුළුවන්. මම දැක්කා, ඊයේ ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා කථා කරනකොට කිව්වා, 1983 කලබලය නිසා මේ රටේ හිටපු හොඳින් ඉගෙන ගත් ව්‍යාපාරිකයන්, විද්වතුන් මේ රටින් පිට ගියා කියලා. ඒක කියපු එක ගැන මම ඒ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ රටින් පිට ගිය විද්වතුන් ඔක්කෝම අද ලෝකයේ හැම තැනම හොඳ හොඳ තනතුරුවල ඉන්නවා. ඇමෙරිකාවේ Vice Presidentගේ Secretaryත් Sri Lankan Tamil background එකක් තිබෙන කෙනෙක්. ඒක නිසා අපට මේ අවස්ථාව අපේ රට වෙනුවෙන් පාවිච්චි කරන්න පුළුවන්. හැබැයි අපේ TNA එක අද මොකදට ඒක පාවිච්චි කරන්නේ? අපි ඒක පාවිච්චි කරන්නේ, මේ රටේ තිබෙන ප්‍රශ්න විසඳාගන්නයි. We are trying to use this position to solve the national question, not to bring investments into this country. So, if you can solve this question, we can actually help you bring investments into this country.

ඒ වාගේම ජනාධිපතිතුමා තවත් විශේෂ ප්‍රකාශයක් කරලා තිබුණා. I hope there is some tattletale in this House who would go and tell the President that I raised this matter in this House. I really hope that the President does get this message because I feel that the President is unaware of some of these things that are happening in this country. ඇත්තටම ඒ කථාවේදී ජනාධිපතිතුමා කියලා තිබුණා, එතුමාට උපදේශනය කරන්න භික්ෂූන්වහන්සේලාගෙන් සමන්විත මඩුල්ලක් පත් කර තිබෙනවා; මාසිකව රැස්වීම් පවත්වලා ඒ භික්ෂූන්වහන්සේලා උපදෙස් දෙනවා කියලා. ඒ වාගේම high posts ලබා දෙන්න විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් එතුමා පත් කරලා තිබෙනවා කිව්වා. High posts ලබා දෙන්නේ කාටද කියලා තීරණය කරන්නේ විද්වතුන්ගෙන් සමන්විත එම කමිටුවෙන් කියලා එතුමා කිව්වා. ඒක නිසා මම මේ අවස්ථාවේ ජනාධිපතිතුමාගෙන් අහන්න කැමැතියි, පිල්ලෙයාන් මන්ත්‍රීතුමාට මඩකලපුව දිස්ත්‍රික්කයේ DCC Co-Chairman තනතුර ලබා දීලා තිබෙන්නේ එම high posts සම්බන්ධයෙන් කටයුතු කරන විද්වතුන්ගේ තීන්දුවක් අනුවද, එහෙම නැත්නම් භික්ෂු මඩුල්ල කථා කරලාද කියලා.

ඒ වාගේම, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සංවිධායකවරයෙක් මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉන්නවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ එම සංවිධායකතුමාට තිබෙන එකම qualification එක තමයි, මිනිස්සු බෝට්ටුවෙන් ඕස්ට්‍රේලියාවට පටවා යැවීම නිසා හිරේට ගොස් එන්න සිදුවීම. ඔහුට එම තනතුර ලබා දීලා තිබෙන්නේත් high posts සම්බන්ධයෙන් කටයුතු කරන විද්වතුන්ගෙන් සමන්විත මඩුල්ලයි, භික්ෂූන්වහන්සේලායි එකතු වෙලාද කියන එක මම මේ අවස්ථාවේ ජනාධිපතිතුමාගෙන් අහන්න කැමැතියි.

ඉදිරි අනාගතයේදී අපට මේ රට හොඳ තැනකට ගේන්න ඕනෑ. ඇත්තටම ඒ සඳහා අපි ළඟ ගොඩක් හොඳ plans තිබෙනවා. ගරු කංචන විජේසේකර අමාත්‍යතුමා මේ සභාවේ ඉන්නවා. ඇත්තටම මම කියන්න කැමැතියි, මඩකලපුවේ aquaculture project එකක් හදන්න අපි එතුමාට උදව් කරනවා කියලා. අපට පුළුවන් විධියට අපි උදව් කරනවා. ගරු වියාලේන්ද්‍රන් මන්ත්‍රීතුමාත් ඒකට සම්බන්ධ වෙලා උදව් කරනවා. ඇත්තටම හොඳ වැඩ කරන්න අපි support කරනවා. හැබැයි, අද ආණ්ඩු පක්ෂයත් එක්ක ඉන්න මඩකලපුව දිස්ත්‍රික්කයේ අයට ඒ තරම් knowledge එකක් තිබෙනවාද කියලා මට සැකයක් තිබෙනවා. මොකද, පිල්ලෙයාන් මන්ත්‍රීතුමා හිරේ ඉඳලා එනවා; උදේට DCC රැස්වීමකට යනවා. එතැන කාර්යාලයක් දාලා තිබෙනවා, රැස්වීම ඉවර වෙලා ඒ කාර්යාලයට ගිහිල්ලා මිනිස්සුන්ට එන්න කියලා කථා කරනවා. හිරේ ඉන්න කෙනෙකුට, PTA - Prevention of Terrorism Act - එක යටතේ අත්අඩංගුවට ගත් කෙනෙකුට එහෙම කරන්න පුළුවන්ද? මේ රටේ සමහර හිරකරුවන්ට ගිහිල්ලා ඔවුන්ගේ අම්මා තාත්තාවත් බලන්න බැහැ. මොකද, කොවිඩ්-19 නිසා. හැබැයි, පිල්ලෙයාන් මන්ත්‍රීතුමා මඩකලපුව දිස්ත්‍රික්කයට ඇවිල්ලා ඇවිද ඇවිද ඉන්නවා. කෝවිල්වලට යනවා, උත්සව පවත්වනවා. කොහොමද ඒ වාගේ දේවල් කරන්නේ? ඒ වාගේ දේවල් කරන්න ඉඩ දෙන්න පුළුවන්ද? "Vision for Batticaloa" කියලා සංකල්පයක් මම මඩකලපුව දිස්ත්‍රික්කයේ පටන් ගත්තා. මොකද, අපි තමයි ඒ පැත්ත ගැන දන්නේ. ඉගෙන ගත්ත මන්ත්‍රීවරු, සාමාන්‍යයෙන් දේවල් ගැන දන්නා මන්ත්‍රීවරු TNA එකේ ඉන්නවා. උතුරු නැඟෙනහිර තිබෙන resources ගැන අපට හොඳ knowledge එකක් තිබෙනවා. එම resources තියාගෙන මේ රට develop කරන්නේ කොහොමද කියලා අපි ළඟ proposals තිබෙනවා. කථා කරන්න, අපි ඒවා දෙන්නම්. හැබැයි, ඒ දේවල් කරන්න.

1983 කලබල කාලයේ ලංකාව දාලා ගිය අයට නැවත ලංකාවට එන්න ඕනෑ නම්, ඒ අයගේ ආයෝජන ගේන්න ඕනෑ නම්, අපි ඒ අයට මේ රටේ ජීවත් වෙන්න පුළුවන් කියන විශ්වාසය ඇති කරන්න ඕනෑ. 1983දී තිබුණු situation එකම තමයි අදත් තිබෙන්නේ. මම කියන්නේ, political solution එක ගැන. A political solution should not necessarily be given because of terrorism. It should be given because there is a national ethnic question and because the Tamils and the Muslims of this country - the minorities of this country - are requesting for that. That is why it should be given. I heard some people say," Terrorism තිබුණු නිසා political solution එකක් දෙන්න ඕනෑ. දැන් ඒක නහැ". Terrorism ඇති වුණේ political solution එකක් දුන්නේ නැති නිසායි. Political solution එකක් දීලා තිබුණා නම් terrorism ඇති වෙන්නේ නැහැ.

අද බලන්න ඕනෑ, මේ high posts දීපු අය මඩකලපුවේ කරන වැඩ. ඒවා ගැන හොයා බලන්න. I really hope that there would be someone close to the President who would go and tell this to him. ජනාධිපතිතුමා ළඟින් ආශ්‍රය කරනවා කියලා මා හිතන කෙනෙක් දවසක් මට කිව්වා, ජනාධිපතිතුමා සිංගප්පූරුවේ ලී ක්වාන් යූ වාගේ කෙනෙක් වෙන්න ආසයි කියලා. ජනාධිපතිතුමා 'ෆේල්' කිය කියා විපක්ෂයේ ඉන්න ගොඩක් අය කථා කළා. මා හිතන විධියට ජනාධිපතිතුමා තවම ෆේල් නැහැ. මොකද, තවම අවුරුද්දයි ගත වෙලා තිබෙන්නේ. එතුමාට තවත් අවුරුදු හතරක් තිබෙනවා. හැබැයි, මේ යන විධියට ගියොත් එහෙම ජනාධිපතිතුමා ෆේල් වෙයි. If you do not give a political solution, you cannot have economic solutions. I will give you some reasons for saying that. මා නම කියන්නේ නැහැ, අද මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් වැලි permits 32ක් දීලා තිබෙනවා. අපේ මඩකලපුව දිස්ත්‍රික්කයේ අනෙක් මන්ත්‍රීතුමාගෙනුත් ඇහුවොත් කියයි, ඒ කවුද කියලා. මහින්ද අමරවීර ඇමතිතුමා මඩකලපුවට ආපු වෙලාවේ මා පෞද්ගලිකව ගිහිල්ලා එතුමා හම්බ වෙලා කිව්වා, අලුත් වැලි permits දෙන්න එපා කියලා. ඒත් වැලි permits 32ක් අලුතින් දීලා තිබෙනවා. එක වැලි permit එකකින් රුපියල් ලක්ෂ පහක් අරගෙන තිබෙනවා. මාසෙට රුපියල් ලක්ෂ දෙකක් දෙන්න ඕනෑ, එක වැලි permit එකකට. අවුරුද්දකට වැලි permits දීලා තිබෙනවා. එතකොට කිලෝ මීටර 22ක river එකක riverbed එකේ ඕනෑ තැනකින් වැලි ගන්න පුළුවන්. දැන් කෝච්චියෙත් කොළඹට වැලි ගෙනෙනවා. වැලි ගන්න එක ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒක මඩකලපුව දිස්ත්‍රික්කයේ ජනතාවට අයිති දේපළක්. කවුරු හරි කෙනෙකුට රුපියල් ලක්ෂ දෙකක් දීලා වැලි ගන්න තිබෙන අවශ්‍යතාව මොකක්ද? මාසෙට රුපියල් ලක්ෂ 64ක්. අවුරුද්දට රුපියල් ලක්ෂ 750ක්. ගත්ත advance එකත් එක්ක අවුරුද්දට රුපියල් ලක්ෂ 1,000ක්. මොකක්ද මේ? පාර්ලිමේන්තුවට එන්නේ රුපියල් ලක්ෂ 1,000ක් සල්ලි ගන්නද? තව තිබෙනවා වැඩ. තව තිබෙනවා හොඳ කථා.

ජනාධිපතිතුමා කියලා තිබෙනවා, රැකියා ලක්ෂයක් දෙනවා කියලා. ඒ රැකියා ලක්ෂයෙන් තිසිපන්දහසකට රැකියා දීලා තිබෙනවා කියලා ජනාධිපතිතුමාගේ කථාවේදී කිව්වා. අපට හරි සතුටුයි එහෙම දීපු එක ගැන. මඩකලපුවේ 250 දෙනෙකුට දීලා තිබෙනවා. ඒ අයගෙන් රුපියල් ලක්ෂය ගණනේ අරගෙන තිබෙනවා කියලා කියනවා. කවුද කියන්නේ? අගමැතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්, කරුණා අම්මාන්. මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්කවල අගමැතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම් කියනවා, මඩකලපුවේ ඇමතිවරු, මන්ත්‍රීවරු -මා නොවෙයි කියන්නේ. හොයලා බලන්න. මා ඒකයි කියන්නේ, මේ වාගේ දේවල් කරලා ජනාධිපතිතුමාට ලී ක්වාන් යූ වෙන්න බැහැ. මේ වාගේ දේවල් කරන අය ළඟ තියා ගන්නත් එපා. 2015දී මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා වෙනුවෙන් මමත් ඡන්දයට වැඩ කළා. ඒ කාලයේදීත් මේ කල්ලිය ඉඳලා තමයි එතුමා පැරැද්දුවේ. මට හොඳට මතකයි. මම නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාටත් දවසක් කථා කරලා කිව්වා. ඒ දවස්වල polling booth agentsලාට රුපියල් දසදහස ගණනේ එවා තිබුණා. එතකොට National Gem and Jewellery Authority එකේ Chairman තමයි ආවේ. මගේ ආසනයේ polling booths 113ක් තිබුණා. මම මෙතැනදී ඒ නම කියන්නේ නැහැ. ආපු ගමන් ඔහු ඒ ඔක්කෝම සල්ලි ටික අරගෙන මට රූලයි, පැන්සලයි, form එකයි එවා තිබුණා, මේ ටික පුරවලා දමන්න කියලා. එහෙම අය තමයි ආපසු ළං කරගෙන තියාගෙන ඉන්නේ. මේවා ගැන හොඳට හොයලා බලන්න. එහෙම හොයලා බලන්නේ නැතුව මේ රටේ ආර්ථිකය සංවර්ධනය කරන්න බැහැ.

මේ රටට විදේශිකයන්ගේ සල්ලි ගෙනෙන්න ඕනෑ. අපි ළඟ ideas තිබෙනවා. ඒවා අපි කියන්නම්. දැන් dual citizenship දීලා තිබෙනවා. Dual citizenship දීලා තිබෙන අයගෙන් අය කරන fee එක අඩු කරන්න. ලංකාවෙන් පිට ගිය දෙමළ අය ලක්ෂ 10ක් පමණ ඉන්නවා. Political solution එකක් දීලා, මේ ලක්ෂ 10ම ලංකාවේ citizenship ගත්තොත්, අනිවාර්යයෙන්ම ඒ ගොල්ලන්ගේ ආයතන ලංකාව ඇතුළට එනවා. ඒ ආයතන ලංකාව ඇතුළත තිබෙයි. අද චීනයෙන් ගෙනෙන සල්ලිවලට මොකද වෙන්නේ? මේ ආයෝජනවලට මොකද වෙන්නේ? The useful life of this investment would be over by the time we pay up the loan. Then, what will happen? The investment would be a dud; it would be useless and it would not be worth anything at all by the time they leave.

උදාහරණයක් වශයෙන් මම තව එක කාරණයක් කියන්න ඕනෑ. මම එස්.එම්. චන්ද්‍රසේන ඇමතිතුමා හම්බවෙන්න ගියා. නිකම් එක telephone call එකකින්, 2016දී ඒ project එක පටන් ගෙන තිබෙන්නේ. That person is happy to invest Canadian Dollars 100,000. It could be a small amount, but he is one person who is happy to invest. ඇමතිතුමා අත්සන් කර දීලාත්

[ගරු සාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

LRC එකෙන් අද වන තෙක් ඉඩම ලබා දුන්නේ නැහැ. 2016 සිට එන ප්‍රශ්නයක් මේක. මම මේ වතාවේයි පාර්ලිමේන්තුවට ආවේ. ඒක නිසා අහන්න එපා, TNA එක මොකක්ද කළේ කියලා. හැබැයි, මේක 2016 සිට ආපු ප්‍රශ්නයක්. හැබැයි, දැන් එස්.එම්. චන්ද්‍රසේන ඇමතිතුමා minute එකක් දාලා දීලා මාස දෙකක් වනවා, LRC එකේ Chairman තවම ඉඩම ලබා දුන්නේ නැහැ. හරියට මම මේ එතුමාගේ ගෙදර ඉඩමෙන් කෑල්ලක් ඉල්ලනවා වාගේයි. මේ, අක්කර 12ක ඉඩමක්. The investment is worth Canadian Dollars100,000. So, we have to get rid of this red tape.

Then, we brought in an investment for coconut development. පොල් ත්‍රිකෝණය කුරුණෑගල, පුත්තලමේ සිට වෙනස් කරලා උතුරු නැඟෙනහිරට ගෙනයනවා කියලා ගිය ආණ්ඩුවෙන් යෝජනාවක් ගෙනාවා. ඒ proposal එක ගෙනියලා South Indian company එකක් එක්ක කථා කළා desiccated coconut, virgin coconut oil නිෂ්පාදනය සඳහා. That is how you can develop the country's economy. අපි ආයෝජනයක් ගෙනෙන්න කිව්වාම, වාකරේ Forest Conservation Department එකේ නිලධාරියෙක් කියනවා ඒ ඉඩම ඇතුළේ protected ගහක් තිබෙනවා කියා. අක්කර 50ක් එක protected ගහක් තිබෙන නිසා දෙන්න බැහැයි කියනවා! එහෙම නම්, මේ investment එක කරන්නේ කොහොමද? රට ඇතුළට සල්ලි ගෙනෙන විධිය අපි මේ කියන්නේ.

ත්‍රිකුණාමලයේ harbour එක තිබෙනවා. The Trincomalee Harbour is a natural harbour. Why are we not developing that natural harbour? We have built a harbour in Hambantota whereas we can develop the natural harbour in Trincomalee. Why have we not done that? ඊයේ කථා කළ ත්‍රිකුණාමලය නියෝජනය කරන මන්ත්‍රීතුමා අද මෙතැන සිටියා නම් ඒක කියයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Rasamanickam, your time is over.

**ගරු සාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I think I get two minutes from the time allotted to the Hon. S. Noharathalingam as well.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The time, along with that, is over now.

**ගරු සාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Please give me one minute more, Sir. I will wind up. So, we can develop these things. අද ත්‍රිකුණාමලයේ ඉඩම් බෙදා දෙනවා කියනවා. කුඹුරු කරන්න ඉඩම් බෙදා දෙනවාට වඩා එතැන Trincomalee Harbour එක develop කළා නම් අපට පුළුවන්, එතැනට economic centre එකක් ගේන්න. Mannar-Rameshwaram ferry එක ගෙනාවා නම්, තව investments ගෙනෙන්න පුළුවන්. Jaffna and Batticaloa International Airports හැදුවා නම්, තව අපට investments ගෙනෙන්න පුළුවන්. හැබැයි, මයිලත්තමඩු, මාදවනෙ කියන ප්‍රදේශයට ගිහිල්ලා මොනවාද කරන්නේ? තව ටික කාලයකින් අපට මේ රටට කිරිත් import කරන්න වෙනවා.

**ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා (පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ச. வியாழேந்திரன் - பின்தங்கிய கிராம பிரதேச அபிவிருத்தி, வீட்டு விலங்கின வளர்ப்பு மற்றும் சிறுபொருளாதார பயிர்ச்செய்கை மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. S. Viyalanderan - State Minister of Backward Rural Areas Development and Promotion of Domestic Animal Husbandry and Minor Economic Crop Cultivation)
கௌரவ பாராளுமன்ற உறுப்பினர் சாணக்கியன் அவர்கள் கூறிய ஒரு விடயத்துக்கு நான் இந்த உயரிய சபையிலே கருத்துத் தெரிவிக்க வேண்டும். அது என்னவென்றால், ஓரிலட்சம் வேலை வாய்ப்பிலே அங்கு நிதி பெறப்பட்டதாக கருணா அவர்கள் கூறியிருக்கின்றார். அவர் காலத்துக் குக்காலம் இவ்வாறான சில நகைச்சுவைகளைச் செய்வார். ஆனால், அதை அவர் நிரூபிக்கவேண்டும். உண்மையிலே மேதகு ஜனாதிபதி அவர்களுடைய உயரிய நோக்குக்கமைய அங்கு வழங்கப்பட்ட நியமனங்கள் ஏழை மக்களுக்கு வழங்கப்பட்டிருக்கின்றன. ஆனால், அவர்கள் ஏதாவது பிழையான தகவல்களைக் கொடுத்து வேலைக்குச் சேர்ந்திருந் தால், அது கண்டறியப்பட்டால் அவர்கள் அதிலிருந்து நீக்கப்படுவார்கள் என்று அவர்களுடைய நியமனங்களில் சொல்லப்பட்டிருக்கின்றது. அதில் வெளிப்படையான தன்மையிருக்கின்றது. ஆகவே, கருணா அவர்களுடைய கருத்தை உண்மையான கருத்தாக ஏற்றுக்கொள்ள முடியாது. அவர் எந்த ஆதாரமுமில்லாமல் பேசிய பேச்சு அது. நான் அதற்கு ஏற்கனவே மறுப்புத் தெரிவித்திருக்கின்றேன் என்பதை இந்த உயரிய சபையிலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු මනූෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
මේක point of Order එකක් ද? [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please stop it now. That is enough.

**ගරු සාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, he mentioned something. So, I have to answer. - [*Interruption.*] පුහුල් හොරා කරෙන් දැනේ. අන්න, කථා කළා. පුහුල් හොරා කරෙන් දැනේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

මීළඟට, ගරු උදය ගම්මන්පිල ඇමතිතුමා.

[පූ.භා. 11.31]

**ගරු උදය ගම්මන්පිල මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு உதய கம்மன்பில - வலுசக்தி அமைச்சர்)
(The Hon. Udaya Gammanpila - Minister of Energy)

"අසාරේ සාරමතිනෝ
සාරේ චාසාර දස්සිනෝ
තේ සාරං නාධිගච්ඡන්ති
මිච්ඡා සංකප්ප ගෝචරා"

"සරු දේ නිසරු ලෙසත්, නිසරු දේ සරු ලෙසත් ගැනීමට හුරු වූ පුද්ගලයාට කිසිම දිනක නිවැරදි දේ අවබෝධ කර ගැනීමට

නොහැක්කේය" කියලා බුදුරජාණන් වහන්සේ මීට වසර 2,600කට කලින් දේශනා කළේ මෙවන් විපක්ෂයක් ශ්‍රී ලංකාවේ බිහිවනවාය කියන එක කොසොල් රජතුමාගේ සිහින වාගේම අනාගතය දැකීමෙන් යැයි කියන එක අපට විශ්වාසයෙන් යුතුව පැහැදිලි කරන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, රාත්‍රියේ අඳුරේ දිදුලන චන්ද්‍රයා දහවල් කාලයේදී හිරු ආලෝකය ලැබීමත් සමඟම එක්කෝ නොපෙනී යනවා. එහෙම නැත්නම් නොපෙනෙන, පෙනෙන ගණනට තිබෙනවා. මේ සියල්ල අපි දැකිය යුත්තේ ඒ පසුබිම සමඟයි. එකම චන්ද්‍රයා දවාලට රැයට වෙනස් වන්නේ චන්ද්‍රයා තිබෙන පසුබිම වෙනස්ව තිබෙන නිසායි.

එහෙම නම්, ගරු අග්‍රාමාත්‍යතුමා මුදල් අමාත්‍යවරයා ලෙස ඉදිරිපත් කරන ලද මේ අය වැය පිළිබඳ අපි විවරණයක යෙදෙන්න ඕනෑ; විශ්ලේෂණයක යෙදෙන්න ඕනෑ, පවතින පසුබිම හඳුනා ගැනීමෙන්. ජාතික සහ ජාත්‍යන්තර පසුබිම හඳුනා ගැනීමෙන්.

ගරු කථානායකතුමනි, 2020 ඔක්තෝබර් මාසයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, "World Economic Outlook" හරහා මේ වසරේ ලෝක ආර්ථික තත්ත්වය පිළිබඳ මතය ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අනුව මේ වසර තුළ සමස්ත ලෝක ආර්ථිකයේ වර්ධන වේගය පෙන්වන්නේ, සෘණ 4.4ක්. වෙනත් වචනවලින් කියනවා නම්, සියයට 4.4කින් සමස්ත ලෝක ආර්ථිකය හැකිළී යාවිය කියලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාර්තාවේ දක්වා තිබෙනවා. රටින් රටටත් ආර්ථික වර්ධන වේගය ගැන කථා කරනවා. එහිදි පසුගිය වසරේ සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් පෙන්වූ අපේ අසල්වැසි ඉන්දියාව මේ වසරේ වාර්තා කරන්නේ, ආර්ථික වර්ධන වේගය සෘණ අගයක්. එය සියයට 10කින් ආර්ථිකය හැකිළී යාමක් කියලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පුරෝකථනය කරනවා. එලෙස ඉන්දියාව සියයට 8ක ආර්ථික වර්ධන වේගයක සිට සෘණ සියයට 10කට යනවා කියද්දී, ශ්‍රී ලංකාව ගැන කියන්නේ මොකක්ද? යන්තම් සියයට 2.3ක විතර ආර්ථික වර්ධන වේගයක් පෙන්වපු ශ්‍රී ලංකා ආර්ථිකය සෘණ වන්නේ සියයට 3කින් පමණයි කියන එක තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පුරෝකථනය කරන්නේ. සමස්ත ලෝකය මුහුණ දීලා තිබෙන ලෝක වසංගත තත්ත්වය හමුවේ ආර්ථික අභියෝග කළමනාකරණය කිරීමේ දී ලෝකයේ අන් රටවල් අතරින් ශ්‍රී ලංකාව ඉදිරියෙන්ම සිටිනවා කියලා කියන්නේ අපි නොවෙයි. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා වන්දනා නමස්කාර කරන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලයි එහෙම කියන්නේ කියන එක අපි විපක්ෂයට සිහිපත් කරනවා.

ගරු කථානායකතුමනි, මා මිත්‍ර හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත්, ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාත් දිගු දේශනා පවත්වමින් මේ අය වැය පිළිබඳ කර්කශ විවේචන ඉදිරිපත් කරමින්, ආර්ථිකය කළ යුත්තේ කෙසේදැයි අපට දේශනා පැවැත්වූවා. එතුමන්ලාගේ දේශනාවලට රැවටිලා, ඒ දේශනාවලින් නොමඟ ගිහිල්ලා තමයි, "කරලා පෙන්වන්න. මේ සුන්දර දේශය අපට හදලා දෙන්න"කියලා 2015දී එතුමන්ලාට රට භාර දුන්නේ. නමුත් මොකද වුණේ? 2015-2019 කියන ඒ වසර පහ තුළ ඒක පුද්ගල ආදායම වර්ධනය වුණේ ඩොලර් 33කින් විතරයි. ගරු කථානායකතුමනි, ඩොලර් 33ක් කියන්නේ වසරකට ඩොලර් 6යි. ඉතිහාසයේ නොවූවිරූ අයුරින් අතිශයින්ම පහත් අගයකින් තමයි එතුමන්ලාගේ වසර පහේ ආර්ථිකය වර්ධනය වුණේ. ඒ විතරක් නොවෙයි. ට්‍රිලියන 7ක්ව තිබුණු ආණ්ඩුවේ ණය, ට්‍රිලියන 6ක් තිබුණු ආණ්ඩුවේට්‍රිලියන 13ක් දක්වා වැඩි කර ගත්තා. දෙගුණයක් වෙන්න ඔන්න මෙන්න කියා තිබුණේ. "කරපු දේකුත් නැහැ. බෙරේ පළුවකුත් නැහැ" වාගේ කරපු වැඩක් නැති වුණාට, ඔන්න ණය කන්දක් නම් අරගෙන තිබෙනවා.

2005දී අපි ආණ්ඩුව භාර ගනිද්දී, දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව රටේ ණය අනුපාතය තිබුණේ සියයට 103යි. සියයට 103ක් තිබුණු ණය අනුපාතය අපි සියයට 71 දක්වා පහළට ගෙනැල්ලායි එතුමන්ලාට රට භාර දුන්නේ. එතුමන්ලා මොකක්ද කළේ? ඒක සියයට 87ක් දක්වා වර්ධනය කර ගත්තා. "පණ්ඩිතයාට ඒදණ්ඩේ යන්න බැහැ" වාගේ විපක්ෂයේ සිට දෙසන අයට ආණ්ඩුවට ආවාම කරලා පෙන්වන්න බැහැ කියලා, අපි පසුගිය අවුරුදු පහ පෙන්වමින් තමුන්නාන්සේලාට සිහිපත් කරනවා. කථාව හොඳයි; කථාව තරමට වැඩත් තිබෙන්න ඕනෑ. එතැනයි තමුන්නාන්සේලා ෆේල්; තමුන්නාන්සේලා අසමත් එතැනයි.

ආනයන සීමා කිරීම ගැන විපක්ෂයෙන්, විපක්ෂ නායකතුමාගෙන් කර්කශ විවේචන එල්ල වුණා. ගරු කථානායකතුමනි, මේ ආනයන සීමාව ගැන දේශීය නිෂ්පාදකයා සතුටු වෙද්දි, දේශීය ගොවියා සතුටු වෙද්දි, විදේශීය රටවල අපනයන වෙළෙඳ පොළ වෙනුවෙන් පෙනී සිටින, විදේශීය රටවල නියෝජිතයන් වෙනුවෙන් පෙනී සිටින විපක්ෂයේ මන්ත්‍රීවරුන් අද ඒ ගැන දුක් වනවා; විවේචනය කරනවා; අපට බැණ වදිනවා. ගරු කථානායකතුමනි, 2019 වසරේදී අපි භාණ්ඩ පිට රට යවලා - අපනයනයෙන්- ඩොලර් බිලියන 12ක් උපයා ගනිද්දී පිට රටින් භාණ්ඩ ගෙන්වීම සඳහා ඩොලර් බිලියන 20ක් වියදම් කළා. එතුමන්ලාගේ ආණ්ඩුවේ අන්තිම අවුරුද්දේ අපනයන ආදායම ඩොලර් බිලියන 12යි. හැබැයි, ආනයන වියදම ඩොලර් බිලියන 20යි. මේ ඩොලර් බිලියන 8ක පරතරය පියවා ගත්තේ කොහොමද? විදේශීය ශ්‍රමිකයන් එවූ මුදල්වලින්, සංචාරක කර්මාන්තයෙන්, විදේශ ආයෝජනවලින් සහ ණය ලබා ගැනීමෙන්. 2019 වසරේ ආනයන අපනයන පරතරය ඒ විධියට පියවා ගත්තා.

"Recent Economic Developments" යන මැයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව 2020 ඔක්තෝබර් මාසයේ නිකුත් කළ වාර්තාව අපට ලබා දී තිබෙනවා. එම වාර්තාව අනුව, 2020 අගෝස්තු මාසය අවසන් වන විට -පළමුවන මාස අටේදී පමණක්- ආනයන සහ අපනයන අතර පරතරය ඩොලර් බිලියන 4යි. අපි මේ මුදල පියවා ගන්නේ කොහොමද? සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන විදේශ විනිමය අද බින්දුවටම බැහැලා තිබෙන්නේ. විදේශීය ආයෝජන නැත්තටම නැති ගානයි. විදේශගත ශ්‍රමිකයන්ට ඔවුන්ගේ රැකියා අහිමිවෙලා තිබෙනවා. කොරෝනා වසංගතයට ගොදුරුවෙලා, ජීවත් වෙන්න විධියක් නැහැ කියලා, මෙතෙක් අපේ රටට සල්ලි එවපු ඒ අය, "අනේ! අපි ලංකාවට ගෙන්වා ගන්නතුරු හෝ අපි රස්සාවක් හොයා ගන්නතුරු අපට සල්ලි එවන්න" කියන තත්ත්වයට අද පත්වෙලා ඉන්නවා.

ඊළඟට, තමුන්නාන්සේලා සීමාව ඉක්මවා වගකීම් විරහිතව ණය ගැනීම නිසා තවදුරටත් විදේශ ණය ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් තිබෙනවා. ආනයන අපනයන අතර පරතරය පියවන්න සාම්ප්‍රදායිකව පාවිච්චි කළ විදේශ ආයෝජනත් දැන් නැත්නම්, සංචාරක කර්මාන්තයත් කෙරෙන්නේ නැත්නම්, විදේශගත ශ්‍රමිකයන්ගෙන් ලැබෙන මුදලත් වෙන දා වාගේ ලැබෙන්නේ නැත්නම් මේ පරතරය පියවා ගන්නේ කොහොමද? ඒ සඳහා අපට අපනයන ආදායමේ මට්ටමට හැකි පමණින් ආනයන සීමා කරන්න සිද්ධ වෙනවා. එහෙම හොඳ නැත්නම්, ඊට වඩා හොඳ ක්‍රම තිබෙනවා නම්, විවේචන වෙනුවට අන්න ඒ විකල්ප ඉදිරිපත් කරන්න කියලා අපි විපක්ෂයට අභියෝග කරනවා.

ගරු කථානායකතුමනි, ආනයන සීමා නිසා වසර පුරාවටම ඩොලරය රුපියල් 185 මට්ටමේ පවත්වා ගන්න අපට හැකි වුණා. ඇයි, අපට එහෙම කරන්න සිද්ධ වුණේ? පසුගිය ආණ්ඩුවේ වගකීම් විරහිත, අනවශ්‍ය ණය ලබා ගැනීම් නිසා මේ වසරේ පමණක් අපට ඩොලර් බිලියන 4.5ක් විදේශ ණය වශයෙන් ගෙවන්න සිද්ධ වුණා. විපක්ෂයට බැණ වදිමින් සිටිනවා වෙනුවට, වග කිවයුතු ආණ්ඩුවක් විධියට ඒ ඩොලර් බිලියන 4.5ම අඩු

[ගරු උදය ගම්මන්පිල මහතා]

නැතිව, පොලී ඩොලර් ගණන අඩු නැතිව -මුළු මුදලම- මේ වන විට ගෙවා තිබෙන බව අපි ඉතා ආඩම්බරයෙන් ප්‍රකාශ කරනවා, ගරු කථානායකතුමනි.

අපි කොහොමද මේ ණය ගෙවන්නේ? මම ඒ ගැනත් කියන්නම්. ඔක්තෝබර් 4වන දා අපි ඩොලර් බිලියනයක ණයක් ගෙවා දැමුවා. ගරු කථානායකතුමනි, ඩොලරය රුපියල් 185ක් නම්, ඩොලර් බිලියනයක ණයක් ගෙවා දමන්න රුපියල් බිලියන 185ක් මහ බැංකුවට ගෙවලා, ඩොලර් බිලියනයක් අරගෙන ඒ ණය ගෙවා දමන්න අපට සිද්ධ වෙනවා. ගරු කථානායකතුමනි, විදේශ විනිමය අනුපාතයේ අපේ රුපියල පාවෙලා යන්න ඉඩ ඇරලා, රුපියල පිරිහෙන්න ඉඩ ඇරලා, රුපියල් 185ට තිබෙන ඩොලරය රුපියල් 186ක් වුණොත්, -ඒ වැඩිවන සෑම රුපියලකටම - ණය ගෙවීමට මහ බැංකුවෙන් ඩොලර් බිලියනයක් ලබා ගැනීම සඳහා වැඩිපුර රුපියල් බිලියනයක් සොයා ගන්න ආණ්ඩුවට සිද්ධ වෙනවා. ඒ රුපියල් බිලියනය හොයා ගන්න වෙන්නේ මේ රටේ ජනතාව මත බදු පනවා ඔවුන් මත පීඩනයක් ඇති කිරීමෙන්. ඒ නිසා තමයි, ලෝකයේ ප්‍රධාන අපනයන වෙළෙඳ පොළවල් වන ඇමෙරිකා එක්සත් ජනපදයේත්, යුරෝපා සංගමයේත් මිලදී ගැනීමේ හැකියාව කඩා වැටිලා තිබෙන්නේ.

කොවිඩ්-19 වසංගතය නිසා ආර්ථිකය කඩා වැටිලා තිබෙන මොහොතක, ණය ගෙවා ගැනීමේදී ජනතාවට බරක් නොවෙන්න නම්, අපි රුපියල ස්ථාවරව පවත්වා ගත යුතුයි. රුපියල ස්ථාවරව පවත්වා ගැනීමට නම්, මේ අනුගමනය කර තිබෙන ආර්ථික ප්‍රතිපත්තිය හැර අපට වෙනත් විකල්පයක් නැහැ. ඒ නිසායි අපි විපක්ෂයට අභියෝග කරන්නේ. ඔබතුමන්ලාට දෙසැම්බර් 10වන දා වෙනතුරු කල් තිබෙනවා. මේ ක්‍රමය වැරදියි නම් නිවැරදි ක්‍රමය මොකක්ද කියන එක තමුන්නාන්සේලා රටට, ලෝකයට කියන්න.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ ජනාධිපතිතුමා ජාතිය අමතා ප්‍රකාශ කළ ආකාරයටම, අපි විශ්වාසය තබන්නේ විපක්ෂය මෙන් විදේශ බලවතුන් මත නොවෙයි. අපි විශ්වාසය තබන්නේ ජාත්‍යන්තර සංවිධාන මත නොවෙයි. අපි විශ්වාසය තබන්නේ NGOsවලින් ලැබෙන උපදෙස් මත නොවෙයි. දේශීය දැනුම, දේශීය ව්‍යවසායකයා, දේශීය ජනතාව, දේශීය සම්පත් මතයි අපි විශ්වාසය තබන්නේ. කාටවත් පරාජය කරන්න බැහැ කියපු කොටි ත්‍රස්තවාදය මහින්ද-ගෝඨාභය සුසංයෝගය තුළින් පරාජය කළා. එය පරාජය කළ ආකාරයෙන්ම, මහින්ද-ගෝඨාභය සුසංයෝගය ලොවට ආදර්ශයක් වෙමින් කොවිඩ්-19 යුද්ධයත් ජයගෙන, මේ ආර්ථික යුද්ධයත් ජයගන්නවා කියන උදාන වාක්‍යය ප්‍රකාශ කරමින්, මා නිහඬ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.42]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු කථානායකතුමනි, අපේ ගම්වල ජනවහරේ තිබෙන අපූරු, ප්‍රසිද්ධ කථාවක් මට මතක් වෙනවා. දවසක් ඈත ගමක ඉඳලා කිහිප දෙනෙක් කොළඹට ආපු වෙලාවක pavement එකේ වෙළෙන්දෙක් බොහොම ලස්සනට packet කළ හොඳ labels ගහපු කමිස තොගයක් බිම දමා ගෙන විකුණනවා දැකලා තිබෙනවා. මිනිස්සු වට වෙලා, පොරකකා උණු කැවුම් වාගේ ඒවා මිලදී ගන්නා හැටිත් මේ අය දැකලා තිබෙනවා. ඒ පදික වෙළෙන්දා කෑ ගහලා කියනවා, “වෙන දා එකක් ගත්ත මිලට අද දෙකක් ගන්න පුළුවන්, පිට නෑ, පිට නෑ අපෙන් විතරයි” කියලා. අර ගමෙන් ආපු අයත් හිතුවා, 'මෙච්චර ලස්සනට packet කරලා තිබෙන කමිස වෙන දා එකක් ගත්ත එකේ අද දෙකක්ම ඒ ගණනට ගන්න පුළුවන් නේ, ඒක නිසා කමිස දෙක දෙක අරගෙන ගමේ යන්න ඕනෑ' කියලා. එහෙම හිතලා, ඒ මිනිස්සු "පිට නෑ, පිට නෑ" කියපු කමිස දෙක දෙක අරගත්තා. අන්තිමට ගමේ ගිහිල්ලා ඒ කමිස දිග හැරලා බැලුවාම තමයි ඔවුන් දැක්කේ කොලර් එක තිබෙනවා, අත් දෙක තිබෙනවා, බොත්තම් සමඟ ඉස්සරහා පැත්ත තිබෙනවා, ඒත් කමිසයේ පිට නැති නිසා අඳින්න බැරි බව. ගරු කථානායකතුමනි. මට මේ අය වැය කථාව අහනකොටත් මතක් වුණේ ඒ පිට නැති කමිසයේ කථාව.

ගරු කථානායකතුමනි, මේ අය වැයත් හරියට පිට නැති කමිසයක් වාගෙයි. අපි දන්නවා, අය වැය ලේඛනයක් කියන්නේ ආණ්ඩුවේ පසුගිය වසරේ සාර්ථක අසාර්ථක බව පිළිබඳ ශේෂ පත්‍රයක් වාගේම, ඉදිරි වසරේ සාර්ථක අසාර්ථකත්වය පිළිබඳ පුරෝකථනයක් බව. ගරු කථානායකතුමනි, අය වැය කථාව ඉදිරිපත් කරනකොට ගරු අගමැතිතුමා සඳහන් කළ පරිදිම, මේ අය වැයේ පදනම ජනාධිපතිවරණයේදීත්, පසුගිය මහ මැතිවරණයේදීත් දෙපාරක්ම ජනතාව අතර බෙදපු, අද ඔබතුමා අසුන් ගෙන සිටින මූලාසනයේ ඉඳගෙන ජනාධිපතිතුමා ඉදිරිපත් කළ, "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය කියලායි අපිත් විශ්වාස කරන්නේ. “ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්” කියන තේමා පාඨය තමයි මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ගොඩක් පිටුවල අපට දකින්න ලැබෙන්නේ.

ගරු කථානායකතුමනි, ජනාධිපතිවරයාගේ සම්පූර්ණ ධුර කාලය දවස් 1,825යි. එයින් දින 365ක් දැන් ගත වෙලා ඉවරයි. එතුමාට තව තිබෙන්නේ දින 1,460යි. ධුර කාලයෙන් පහෙන් එකක් ඉවර වෙලා, අවුරුද්දකින් පසු ආපසු හැරිලා බලනකොට ආණ්ඩුවේ ලොකු ලොකු පවුල් කිහිපයක් හැරුණු කොට සතුටින් සිටින පවුල් ඉන්නේ කීයෙන් කීයක්ද කියලා අපි දකිනවා. ඇත්ත වශයෙන්ම, "ගම සමඟ පිළිසඳර" මාධ්‍ය සංදර්ශනයක් නොකර, සැබෑ ලෙස ජනතාවගේ අදහස් විමසන වැඩසටහනක් වුණා නම්, මේ දවස්වල ගමට, නගරයට ගියාම තමුන්නාන්සේලාට දැක ගන්න පුළුවන්, මේ රටේ සතුටින් ජීවත්වෙන පවුල් කීයෙන් කීයක්ද ඉන්නේ කියලා.

ගරු කථානායකතුමනි, අවුරුද්දකට පස්සේ මේ ආණ්ඩුවට ජනතාවගෙන් ලැබිලා තිබෙන සහතිකය මොකක්ද? තමුන්නාන්සේලාට ඡන්දය දීපු හැටනව ලක්ෂයත්, ඒ වාගේම ඡන්දය නොදීපු ලක්ෂ සංඛ්‍යාත පිරිසගෙනුත් බහුතරයක් අද කියන්නේ මොකක්ද? "මේක 'ෆේල්' ආණ්ඩුවක්" කියන එක අවුරුද්දක් යනකොට රට පුරාම ජනතාවගේ මුවින් පිට වෙන්න පටන් ගෙන තිබෙනවා. ආණ්ඩුව "ෆේල්" කිව්වාම ඔබතුමන්ලා සමාජ මාධ්‍ය සහ විපක්ෂය දිහා වෛරයෙන් බලන්න එපා. තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂියෙන් අහලා බලන්න ඇත්තටම ජනතාවගේ පැත්තෙන් නැඟෙන මේ සහතිකය කොච්චර සාධාරණද, අසාධාරණද කියලා. තමුන්නාන්සේලාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ 39වන පිටුවේ ගොවි ජනතාව නඟා සිටුවන විධිය ගැන දීර්ඝ විග්‍රහයක් කරලා තිබෙනවා. එහි සඳහන් වෙලා තිබෙන විධියට, ඒ වචනවලින්ම කියනවා නම් මෙන්න මෙහෙමයි ඒ ගැන කියලා තිබෙන්නේ:

> “....ගොවියා නැවත නඟා සිටුවීම සඳහා පොහොර සහනාධාර ක්‍රමය වෙනුවට වගාවට අවශ්‍ය පොහොර සහ කාබනික පොහොර නොමිලේම ලබා දීමට කටයුතු කෙරේ....”

ඒ කාරණය ඉතාම පැහැදිලිව එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කර තිබෙනවා. මේ අය වැයේදී අමතක කළ, ගොවීන්ට

කියපු තව සුරංගනා කථා බොහොමයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. දැන් තමුන්නාන්සේලා ඒවා ඕනෑකමින්ම අමතක කළාට, ජනතාවටත්, අපටත් ඒවා හොඳට මතකයි. මේ පොතේ ඒවා හොඳට සටහන් කරලා තිබෙනවා. ඒ අතරේ ගොවි විශ්‍රාම වැටුප ගැන ලොකු කතන්දර කියලා තිබෙනවා. ගොවි ණය කපා හැරීම් ගැන බොහොම ලස්සනට රචනාවක් ලියලා තිබෙනවා. ගොවි රක්ෂණ වැඩසටහන් වාගේ ඒවාත් අද තමුන්නාන්සේලා අමතක කරලා තිබුණාට මේ පොතේ ඒවා ගැන හොඳට සටහන් කරලා තිබෙනවා. ඒවා ජනතාවට හොඳට මතකයි.

පොහොර නොමිලේ ලබා දෙනවාය කියන කථාවට කොච්චර පිරිසක් රැවටුණාද? උඩරට පළාතේ එළවලු ගොවියෝ, අපේ වාගේ පළාත්වල කුඩා තේ වතු හිමියෝ, කුරුඳු ගොවියෝ, නොමිලේ පොහොර ලබා දෙනවා කියලා කිව්වාම ඒ පොරොන්දුවට විශාල වශයෙන් ආකර්ෂණය වෙලා, ඡන්දය ලබා දුන්නු බව අපි දන්නවා. මෙවර අය වැය ඉදිරිපත් කරන කොට ඒ ගොවීන් ඔක්කෝම අමතක කරලා දාලා තිබෙනවා. පොහොර මිටිය රුපියල් 1,500ට ගන්න විධිය තමයි තමුන්නාන්සේලා මෙවර අය වැයෙන් ප්‍රකාශ කරලා තිබෙන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Agriculture)
ගරු මන්ත්‍රීතුමනි, මම පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
මගේ වෙලාවට බාධා නොකර කථා කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මේ කාරණය පිළිබඳව දැනුමක් නැති නිසා ඔබතුමා සම්පූර්ණ වැරැදි දෙයක් කිව්වේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව තමයි පොහොර සහනාධාරය කැපුවේ, ගරු මන්ත්‍රීතුමා. ගොවියාගේ පොහොර සහනාධාරය පසුගිය අවුරුදු පහේ කැපුවා. එතකොට ඔබතුමා කැබිනට් මණ්ඩලයේ හිටියේ. අපේ ගරු මන්ත්‍රීතුමා, වී ගොවියාට හෙක්ටෙයාර දෙක දක්වා සියයට සියයක් නොමිලේ පොහොර ලබා දෙනවා. ඒ සඳහා වැය වන මුදල වන රුපියල් 144,000ක් රජය නිකම් ලබා දෙනවා. අනිකුත් වගා සඳහා අවශ්‍ය රුපියල් 4,000ක් වන පොහොර මිටිය රුපියල් 1,500ට ලබා දෙනවා. ඒ අනුව රුපියල් 2,500ක සහනාධාරයක් ලැබෙනවා. කෘෂිකර්ම ඇමතිතුමා හැටියට මම ඔබතුමාගේ දැන ගැනීම සඳහායි මේ කරුණ කිව්වේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகுகயந்தகருணாதிலக்க)
(The Hon.Gayantha Karunatilleka)
බොහොම හොඳයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අපි දෙන්නා පාසල් මිත්‍රයෝ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
මම ඉස්කෝලේ යන කාලයේ ඉඳලා ඔබතුමාගේ දක්ෂතාව ගැන දන්නවා. මේ පොතේ තිබෙන එක තමයි මම කිව්වේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා පොත කියවන්න එපා. ඔබතුමා කෘෂිකර්ම ඇමතිතුමා විශ්වාස කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
පොතේ 39 වැනි පිටුව බලන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා කෘෂිකර්ම ඇමතිතුමා විශ්වාස කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
මට මේ පොතට වඩා කෘෂිකර්ම ඇමති විශ්වාසයි. හැබැයි, මේ පොතේ තිබෙන එක තමයි මම මේ කියන්නේ. හරිනේ. ජනතාව කියවන්නේ මේ පොතනේ. මට තව සුළු වෙලාවයි තිබෙන්නේ. නොමිලේ පොහොර ලබා දෙනවාය කියන කථාව එක්කෝ ඡන්ද ප්‍රෝඩාවක්. එහෙම නැත්නම් ආණ්ඩුව ෆේල් කියන කාරණය තමුන්නාන්සේලාට පිළිගන්න වනවා.

ගරු කථානායකතුමනි, ජනතාව නිකම් ආවාට ගියාට තමුන්නාන්සේලා ෆේල් කියලා කිව්වේ නැහැ. ඒකට හේතු ඇතිවයි කිව්වේ. මාස ගණනාවක ඉඳලා -මේ ආණ්ඩුව බලයට ආපු දවසේ ඉඳලා- මේ දක්වාම ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල බැහැගෙන ගියා. තෙල් මිල අඩු වීමේ වාසිය ජනතාවට ලබා දෙන්න කිව්වාම ආණ්ඩුව කිව්වේ මොකක්ද?

ගරු කථානායකතුමනි, තෙල් මිල අඩු කළොත් ඒ වාසිය ලැබෙන්නේ වාහන තිබෙන අයට විතරයි, ඒ නිසා අපි තෙල් මිල අඩු වීමේ වාසිය හැමෝටම ලැබෙන විධියට -සාමාන්‍ය මිනිහාටත් ගලා ගෙන යන විධියට- සැමන් ටින් එකෙන්, පරිප්පුවලින්, සීනිවලින්, අත්‍යවශ්‍ය භාණ්ඩවලින් අඩු කරලා පෙන්වනවා කියලා තමයි තමුන්නාන්සේලා කිව්වේ. නමුත් වෙලා තිබෙන දේ බලන්න. අද වනකොට තෙල් මිලේ වාසියත් නැහැ. අඩු කරනවාය කියපු සැමන්, පරිප්පු, සීනි, ලූනු, - සැපද කියලා අහපුවා - එකකවත් මිල අඩු වෙලා නැහැ. තමුන්නාන්සේලා ගහපු ගැසට් පවා අද මේ රටේ ජනතාවට විහිළුවක් වෙලා තිබෙනවා. මේ කෙටි කාලය තුළ මේ ආණ්ඩුව තරම් බඩු මිල අඩු කරන්න ගැසට් ගහපු ආණ්ඩුවක් තවත් නැහැ. අඩු ගණනේ තමුන්නාන්සේලාගේ සතොසවත් තමුන්නාන්සේලා ගහන ගැසට් එක ගණන් ගන්නේ නැති තත්ත්වයට අද වනකොට හැල්ලු වෙලා තිබෙනවා.

මේ වාගේ ආණ්ඩුවකට ජනතාව කියන්න ඕනෑ, ෆේල් කියලාද, එහෙම නැත්නම් පාස් කියලාද?

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව "සෞභාග්‍යයේ දැක්මේ" රචනාවක් වාගේ කියපුවා අද අනික් පැත්ත කැරකෙන හැටි තමයි ජනතාව පැහැදිලිව දකින්නේ. මම ඉතාම කෙටියෙන් තවත් අදහසක් ප්‍රකාශ කරන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகுசபாநாயகர்அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
මට තව විනාඩි දෙකක් ලබා දෙන්න, ගරු කථානායකතුමනි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

වතු කම්කරුවන්ගේ රුපියල් දහසේ වැටුප ගැන ආපසු අය වැයේ කියනවා. මේ රුපියල් දහස ගැන කියපු පළමුවැනි වතාව නොවෙයි. මම ළඟ පෙබරවාරි මාසයේ 05වැනි දා හැන්සාඩ් වාර්තාව තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ප්‍රශ්න කළාම අගමැතිතුමා මේ ගරු සභාවේදී කිව්වා, මාර්තු 01 වැනිදා ඉඳලා මේ මුදල ගෙවනවා කියලා. ජනවාරි 01වැනි දා ඉඳලා ගෙවනවා කියලා දැන් කියනවා. හැබැයි, සතයක්වත් රජයෙන් වෙන් කරලා නැහැ. හාම්පුතුන් පිට තමයි වගකීම පටවලා තිබෙන්නේ. අඩු ගණනේ ජනවසම, රාජ්‍ය වැවිලි සංස්ථාව වාගේ ආණ්ඩුව සතු වතුවල කම්කරුවන්ටවත් මේ රුපියල් දහස ලබා දෙන්න මුදලක් වෙන් කළාද කියලා අපි අහන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, වසරක් යද්දී ෆේල් වුණු මේ ආණ්ඩුවට අපි මතක් කරන්න කැමැතියි, අපි 2015 බලයට පත් වුණාම - පළමුවැනි අවුරුද්දේම- අපේ හැටදෙලක්ෂයක ජනතාවට අභිමානයෙන් කථා කරන්න පුළුවන් අවස්ථාවක් උදා කළ බව. අනන්තවත් අපට වැරදිච්ච තැන් තිබෙනවා. ඒ කාලය තුළ අපි පෙට්‍රල් මිල අඩු කළා; ඩීසල් මිල අඩු කළා. භූමිතෙල් මිල අඩු කළා. රුපියල් 33කින් පෙට්‍රල් ලීටරයක් අඩු කළා. [බාධාකිරීම්] විදුලි බිල සියයට 25කින් අඩු කළා. අවුරුදු 4ක් යන කල් ඒකට අත තැබුවේ නැහැ. ඒ වාගේම, ගෑස් දෙවතාවක් අඩු කළා. රජයේ සේවකයන්ගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
මට තව තත්පරයක් දෙන්න, ගරු කථානායකතුමනි.

මහපොළ ශිෂ්‍යත්ව ආධාර මුදල රුපියල් 2,500 සිට රුපියල් 5,000 දක්වා වැඩි කළා. පාසල් ගොඩනැඟිලි රාශියක් හැදුවා. බෙහෙත් මිල අඩු කළා. ඒ වාගේම රුපියල් 36කට තිබුණු පැනඩෝල් කාඩ් එක රුපියල් 16කට බැස්සුවා. අක්ෂි කාච දුන්නා, පිළිකා රෝගීන්ට සීමාවකින් තොරව බෙහෙත් දුන්නා, stents දුන්නා, ලක්ෂ 6ක් වූ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප වැඩි කළා. වැඩිහිටි දීමනාව රුපියල් 1,000 සිට රුපියල් 2,000 දක්වා වැඩි කළා. සමෘද්ධි සහනාධාර මුදල දෙගුණයක් කළා. ගැබිනි මව්වරුන්ට පෝෂණ මල්ල දෙන්න රුපියල් 20,000ක් දුන්නා. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්න කටයුතු කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ලැයිස්තුව කියෙව්වා ඇති. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු කථානායකතුමනි, ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමාට වෙන් කර තිබෙන කාලයෙන් මම විනාඩියක් ගන්නවා.

පළමුවන අවුරුද්ද ගතවනකොට ජනමාධ්‍ය ඇමතිවරයා හැටියට මට පුළුවන් වුණා, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැවිත් සම්මත කර ගන්න. '1990 සුවසැරිය' ගෙනෙනකොට බිල්ලෝ මැව්වා. අද ඒක තමයි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පණ නළ බවට පත්වෙලා තිබෙන්නේ කියන එකත් මතක් කරමින්, දින 365ක් ඇතුළත මේ තරම් අසාර්ථක වුණු, ෆේල් වුණු ආණ්ඩුවක් මේ රටේ තිබුණාද කියන සැකය අපට තිබෙනවාය කියන කාරණය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.53]

**ගරු නාමල් රාජපක්ෂ මහතා (තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ - இளைஞர் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Namal Rajapaksa - Minister of Youth and Sports)
ගරු කථානායකතුමනි, 2021 අය වැය පිළිබඳව විවාද කරන අවස්ථාවේදී අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න ඉඩ ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, කොරෝනා වයිරසය සහ එහි ව්‍යාප්තිය පාලනය කළ ආකාරය පිළිබඳව අද සහ පසුගිය දිනවල බොහෝදෙනෙක් කථා කළා. මේ රටේ ජනතාව දන්නවා, මුළු ලෝකයටම කොරෝනා පාලනය කර ගන්න බැරි වනකොට, ලංකාවේ වෛද්‍ය අංශ, රාජ්‍ය සේවකයන්, ත්‍රිවිධ හමුදාව, පොලීසිය එකතුවෙලා මේ වයිරසයේ ව්‍යාප්තිය ඉතාම සාර්ථක විධියට පාලනය කර ගන්න අපට අවස්ථාව ලැබුණු බව.

කොරෝනා දෙවන රැල්ලේදී අද වනකොටත් ආණ්ඩුවක් විධියට ගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් ගත්ත ඒ තීන්දු තීරණ අනුව COVID Task Force එක වෛද්‍යවරුන්ගේ නිර්දේශ අනුව ඉතාම සාර්ථකව එය පාලනය කරගෙන යනවා. දැන් කථාබහට ලක්වුණේ ඒ vaccine එක තවම order කරලා නැත්තේ ඇයි කියන එකයි. ගරු කථානායකතුමනි, ලෝක සෞඛ්‍ය සංවිධානය - WHO- තවම එය අනුමත කරලා නැහැ. ඒ එක්කම, ලෝකයේ කිසිම රටක් නිල වශයෙන් ඒ බෙහෙත පිළිබඳව තවම නිශ්චිත තීරණයක් ගෙන නැහැ. එතකොට ලෝකයේ කිසිම රටක් නිශ්චිත තීරණයක් නොගත්ත දෙයකට අපේ ජනතාව test කරන්න අපි දෙන්න ඕනෑද? දැන් ඔබතුමන්ලා කියන්නේ ඔබතුමන්ලා බලයේ සිටියා නම්, මේ vaccine එකේ පරීක්ෂණ කටයුතු සඳහා අපේ රටේ ජනතාව ලබා දෙනවාය කියන එකයි. ඒක නේ අහන්නේ. මේ රටේ ජනතාව guinea pigsලා කරන්නයි හදන්නේ. අපි කුඩා කාලයේ පාසල් යනකොට කියා දෙනවා, පරීක්ෂණ සඳහා මීයන් තමයි පාවිච්චි කරන්නේ කියලා. දැන් ඔබතුමන්ලා කියන්නේ, ලෝකයේ අනික් රටවල් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කරනවා, අපේ අයත් ඒකට දෙන්න කියලායි. [බාධා කිරීමක්] ඒ කාලයේ කළා.

ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ එක්තරා රටකින් - මම රටේ නම කියන්නේ නැහැ- බෙහෙතක් ගෙනැවිත් අපේ රටේ තැලසීමියා රෝගීන්ට පාවිච්චි කළා, පිළිකා රෝගීන්ට පාවිච්චි කළා. ගරු විපක්ෂ නායකතුමනි, අපි ඒකට සූදානම් නැහැ. හැබැයි, මේ vaccine එක පාවිච්චි කරන්න සුදුසුයි කියලා ලෝක සෞඛ්‍ය සංවිධානය තීන්දු කළ දවසට ඒක අපේ රටේ ජනතාවට ලබා දෙන්න ආණ්ඩුවක් හැටියට අපි කටයුතු කරනවාය කියන එක මතක් කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, පසුගිය ආණ්ඩුව ඒ යහ පාලන කාල සීමාව තුළ මේ රටේ සමස්ත ආර්ථික පද්ධතිය විනාශ කළා. මා ඒ ගැන පුන-පුනා කථා කරන්නේ නැහැ. ඒ ගැන කථා කරලා එළක්

නැහැ. හැබැයි, ආයෝජන ගැන, මේ අය වැය ලේඛනය ගැන අද ඔබතුමන්ලා විවේචනය කරනවා. පසුගිය අවුරුදු 5ක කාල සීමාව තුළ ඔබතුමන්ලා කරපු දේවල් පිළිබඳව සම්පූර්ණයෙන් අමතක කරලායි කථා කරන්නේ. ඒකයි අපට තිබෙන කනගාටුව.

පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් ලැබුණු බුද්ධි අංශ වාර්තා නොපිළිගත්ත කාරණය අපි පැත්තක තියමු. අපේ ආණ්ඩුව සංවර්ධනය සඳහා ගත්ත ණය ගැන ඔබතුමන්ලා අද විවේචනය කරනවා. හැබැයි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ ඩොලර් බිලියන 6කට වඩා Sovereign Bonds ලබාගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒවායෙන් කර තිබෙන්නේ මොකක්ද? කරලා තිබෙන සංවර්ධනය මොකක්ද? අවුරුදු දහයකට බිලියන හයකට වැඩියි. ගරු කථානායකතුමනි, එතුමන්ලා 2018-2019 කාලයේ ගත් ඒවාට 2029 වෙනකොටත් අපට ගෙවන්න වෙනවා. හැබැයි, ඒවා ගත්තේ මොකටද, ඒවා අරගෙන හදපු දේවල් මොනවාද කියලා අද තමුන්නාන්සේලාට කියන්න දෙයක් ඉතුරු වෙලා නැහැ. හැබැයි, ඔබතමුන්නාන්සේලා රනිල් වික්‍රමසිංහ මහත්මයාටයි, පැරදිච්ච අයටයි දෙහි කපලා ඇඟ බේරා ගන්න උත්සාහ කරනවා. එහෙම හරියන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, එතුමන්ලාගේ ආණ්ඩුවේ එදා අවුරුදු පහක් පමණ නිවාස ඇමතිවරයා විධියට කටයුතු කළේ අද විපක්ෂ නායකවරයා වන සජිත් ප්‍රේමදාස මහත්මයායි. ඒ කාලයේ පෙළපාළි යමින්, පෝස්ටර් ගසා, කටවුට් ගසා, වනජීවී කලාප ටික ශුද්ධ කරලා ණය දුන්නා. පුරාවිද්‍යා කැණීම් කරපු ස්ථාන අයින් කරලා, ඩෝසර් කරලා ණය දුන්නා. ගරු කථානායකතුමනි, එසේ ණය දීලා හැදුවේ ගෙවල් 7,000යි. ඒවාත් ණයට! අහිංසක දුප්පත් මිනිසුන්ගේ නිවාස ප්‍රශ්න විසඳනවා කියලා මිනිසුන් ණයකාරයන් බවට පත් කළා. මේක තමයි ඇත්ත කථාව. ඒක ඔබතුමන්ලා දන්නවා. ඔබතුමන්ලා නොදැක්කා වාගේ සිටියාට, ඔබතුමන්ලා ඒක දන්නවා. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කළ වැඩේ වැරදියි කියලා ඔබතුමන්ලා දන්නවා. ලුණුගම්වෙහෙරට ගිහිල්ලා ගම්මානයක් හැදුවා. ගම්මානය හදලා බලනකොට, ඒ ප්‍රදේශය වනජීවී කලාපයක්. ඉතාම ප්‍රසිද්ධ පුද්ගලයෙකුගේ නම දමලායි ඒක හැදුවේ. මම කිව්වා, දැන් ඒක ඒ මනුෂ්‍යයාගේ නමින්ම රක්ෂිතයක් ලෙස නම් කරන්න කියලා. මොකද, මිනිසුන්ට එතැන පදිංචි වෙන්න බැහැ.

පසුගිය අවුරුද්දට අපි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව, මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේ ආණ්ඩුව ගෙවල් 7,000කට ආධාර ලබා දීලා හදා අවසන් කර තිබෙනවා, ගරු කථානායකතුමනි. ගෙවල් 7,000ක්! අපි මේ අවුරුද්ද අවසන් වෙනකොට එම ගෙවල් 7,000 ගෙවල් 10,000ක් බවට පත් කරනවා, ගරු කථානායකතුමනි. අපි ගෙවල් 10,000ක් හදනවා. හැබැයි, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කළා වාගේ ඒවා ණය දීලා හදන ගෙවල් නොවෙයි; ඒවා ආධාර දීලා හදන ගෙවල්. ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලා පසුගිය කාලයේ මගේ ගමට ඇවිල්ලා සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගේ ගෙවල් ගාව මුල්ගල් තිබ්බා. මතකයි නේද? උත්සව තිබුණා. කෝ, මුල්ගල? මුල්ගලත් හොරු ගලවා ගෙන ගිහිල්ලා ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේම. ලෝකයේ ලොකුම තෙල් පිරිපහදුව දමනවා කිව්වා. ලෝකයේ ලොකුම ටයර් නිෂ්පාදනාගාරය දමනවා කිව්වා. මේ වෙල්ගම මැතිතුමාත්, මමත් එතැනට ගිහිල්ලා ගුටි කෑවා. ගරු වෙල්ගම මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඒක මතකයි නේද? මේ අය ඔබතුමාටත් ගැහුවා, දැන් ඔහොම ළඟින් වාඩි කරවාගෙන සිටියාට. මතකයි නේද ඒක? කෝ, මුල්ගල? ගරු කථානායකතුමනි, මේ අය තනිකර බොරුවක් කළේ.

විදේශ ආයෝජන ගෙනෙනවා කියලා තනිකර බොරුවක් කළා. ඒ විතරක් නොවෙයි, එතුමන්ලා කුණු කොල්ලයට හම්බන්තොට වරාය විකුණුවා. කුණුකොල්ලයට හම්බන්තොට වරාය විකුණා, වරායට ආපු ආයෝජන සියල්ලම ක්‍රියාත්මක කරවන්න කටයුතු කළේ නැහැ. ගරු මන්ත්‍රීවරුනි, අපේ කාලයේ අත්සන් කළ ගිවිසුම් පවා ඔබතුමන්ලා මඟ හැරියා. ගරු කථානායකතුමනි, අපේ ආණ්ඩුව බලයට ඇවිත් අවුරුද්දක් වෙනවා. ඊයේ අපි ගිවිසුමක් අත්සන් කළා, හම්බන්තොට වරාය කලාපයේ ටයර් කර්මාන්තශාලාවකට. ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලාත් ඒ වාගේ එකක් අත්සන් කළා නේද? අර හොරණ පැත්තේ දමනවා කිව්වේ. තවම ඒක හදනවා. අවුරුදු පහක් තිස්සේ බිල්ඩිම හදනවා. [බාධා කිරීමක්] ආ! වොක්ස්වැගන් එක. ඒක අමතක වුණා. හැබැයි, ඔබතුමන්ලා වොක්ස්වැගන් කර්මාන්තශාලාව හදලා තිබුණා නම්, රනිල් මහත්මයා ඉස්සරහා සීට් එකේ වාඩි කරවා ගෙන සජිත් මහත්මයා කුරුණෑගල ඉඳලා තල්ලු කරගෙන කොළඹට එන වෙලාව මේක. මොකක්ද වුණේ අන්තිමට? මොකක්ද වුණේ? පොල් ගස් ටිකත් කපා ගෙන ගියා.

මම කලින් කිව්වා වාගේ අපි ඊයේ ගිවිසුමක් අත්සන් කළා, ටයර් කර්මාන්තශාලාවක් දමන්න. ඩොලර් මිලියන 300යි, පළමු ආයෝජනය. දෙවැනි අදියරේ තවත් ඩොලර් මිලියන 300ක් ඒ අය ආයෝජනය කරනවා. ඒ විතරක් නොවෙයි, Port City එකට ඩොලර් බිලියනයක ආයෝජනයක් කරනවා. මේ වනකොට අපි පෞද්ගලික අංශය සමඟ සාකච්ඡා කරගෙන යනවා, ගරු කථානායකතුමනි. විදේශ ආයෝජන ගෙනෙනවා. අපේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, මේවා ණය කියලා. නැහැ. මේවා ණය නොවෙයි; මේවා ආයෝජන. අපි ණය ගත්තා, අපි ණය ගන්නවා. අපි ණය ගන්නේ යටිතල පහසුකම් හදන්නයි. යටිතල පහසුකම් හැදුවොත් තමයි ගරු කථානායකතුමනි, ආයෝජන ලංකාවට එන්නේ. අපි මහා පරිමාණයේ ආයෝජන සඳහා හම්බන්තොට වරායේදී අත්සන් කළ ගිවිසුමත් එක්ක සෘජු හා වක්‍ර රැකියා 2,000ක් ඊළඟ අවුරුදු දෙකහමාර තුළ ඇති වෙනවා. ඒ වාගේම අවුරුද්දකට ටයර් මිලියන නවයක් පිටරට යවන්න පුළුවන් වෙනවා. අපි අපේක්ෂා කරන ආදායම, විදේශ විනිමය ඩොලර් මිලියන 300යි. ඒ කියන්නේ අදට ලංකාවේ තිබෙන සම්පූර්ණ විදේශ විනිමය වාගේ සියයට තුනක් එක කර්මාන්තශාලාවකින් අපි හම්බන්තොටින් අපේ රටේ ආර්ථිකයට ලබා දෙන්න කටයුතු කරනවා. ඒ, මහා පරිමාණයේ ව්‍යාපෘතිවලින්.

අපේ අතිගරු අග්‍රාමාත්‍යතුමාගේ, අතිගරු ජනාධිපතිතුමාගේ බලාපොරොත්තුව ව්‍යවසායකයන් හදන එකයි. අපි ව්‍යවසායකයන් හදන්න ඕනෑ. අපි හැම දාම යැපෙන්නන් හදුවාට හරියන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. අපි හදන්න ඕනෑ, ව්‍යවසායකයන්. ගරු කථානායකතුමනි, ව්‍යවසායකයන් තමයි රැකියා උත්පාදනය කරන්නේ. මේ රටේ තරුණ පරම්පරාව ව්‍යවසායකයන් බවට පරිවර්තනය කරන්න ඕනෑ.

අපි පසුගිය දවසක මුලතිව්වලට ගියා. මුලතිව් දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් සියයට 48ක් සමෘද්ධිලාභීන්.

දිස්ත්‍රික්කයක ජනතාවගෙන් සියයට 48කට සමෘද්ධිය ලබා දෙනවා කියලා අපට සතුටු වෙන්න බැහැ. මාතලේ දිස්ත්‍රික්කයේ සියයට 33ක් සමෘද්ධිලාභීන්. ඒක අපට ආඩම්බර වෙන්න පුළුවන් කාරණයක් නොවෙයි. එහෙම නම් ඒ සමෘද්ධිලාභී පවුල් සමෘද්ධි ව්‍යාපාරයෙන් මුදා ගෙන රටේ දේශීය ආර්ථිකයට දායකත්වයක් ලබා දෙන පිරිසක් බවට පරිවර්තනය කරන්න ඕනෑ. ලංකාවේ ව්‍යවසායකයන්ගේ ප්‍රතිශතය සියයට 4යි, ගරු කථානායකතුමනි. සියයට 4යි! ලෝකයේ දියුණු වන රටවල සියයට 25ක, සියයට 28ක තරුණ පිරිසක් ව්‍යවසායකයන් බවට පත් වෙලා ඉන්නවා. ඒක තමයි යථාර්ථය. හැම දාම ආණ්ඩුවේ හෝ පෞද්ගලික අංශයේ රැකියාවක් කරන යැපෙන්නන් හදන එක නොවෙයි අපේ යුතුකම. ආර්ථිකයට දායකත්වයක් දෙන්න පුළුවන් පිරිසක් අපි මේ රටේ ගොඩ නඟන්න ඕනෑ, ගරු කථානායකතුමනි. එම නිසා අපේ අය වැය ලේඛනය තුළ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහාත් වැඩි අවධානයක් යොමු කරලා තිබෙන බව අපි තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ. තරුණ කටයුතු අමාත්‍යාංශය විධියට අපේ අමාත්‍යාංශය වෙන්න පුළුවන්, කෘෂිකර්ම අමාත්‍යාංශය වෙන්න පුළුවන්, ධීවර අමාත්‍යාංශය

[ගරු නාමල් රාජපක්ෂ මහතා]

වෙන්න පුළුවන්, අපේ දයාසිරි ජයසේකර ඇමතිතුමාගේ අමාත්‍යාංශය වෙන්න පුළුවන්, ඒ සියල්ලෙන්ම අපි බලාපොරොත්තු වන්නේ, රටේ ව්‍යවසායකයන් ඇති කිරීමටයි. ඊයේ අපි බන්දුල ගුණවර්ධන ඇමතිතුමා සමඟ ගිහිල්ලා තරුණයන් දහසක් "Q-shop" කියන සංකල්පය යටතේ ගමේ ආර්ථිකයට දායකත්වය දෙන්න පුළුවන්, දේශීය නිෂ්පාදන විකුණන්න පුළුවන් ව්‍යවසායකයන් බවට පරිවර්තනය කළා. එහෙම නැත්නම් supermarket concept එක ගමට ගෙන යන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි ඊයේ ආරම්භ කළා, ගරු කථානායකතුමනි. ලබන අවුරුද්ද වනකොට, ඊළඟ අවුරුදු කිහිපය තුළ අපි අපේක්ෂා කරනවා, ගම තුළ ව්‍යවසායකයන් දහසක් නිර්මාණය කරලා, ගමේ ආර්ථිකයට, දේශීය නිෂ්පාදනවලට ප්‍රමුඛතාව දෙන ආර්ථිකයක් බවට අපේ ආර්ථිකය පරිවර්තනය කරන්න.

ඒ විතරක් නොවයි. යටිතල පහසුකම් සංවර්ධනය ගැනත් කියන්න ඕනෑ. දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා මේ සභාවේ ඉන්නවා. පසුගිය දා එතුමා මාළු කනවා අපි දැක්කා. ඔබතුමා මාධ්‍යයට නම් කිව්වා fresh මාළු කියලා. හැබැයි ඊට කලින් කිව්වා, ඊට කලින් දවසේ උදේ ගත්ත ඒවා කියලා. එම නිසා අනෙක් පාර වැල්ලෙන්ම අරගෙන කෑවොත් හොඳයි. ඒ කෙසේ වෙතත්- [බාධා කිරීමක්] පොඩ්ඩක් මේක අහගන්න. ඔබතුමාට මේක වැදගත්. මේ අවස්ථාවේ ගරු සභාවේ අපේ කංචන විජේසේකර ඇමතිතුමා ඉන්නවා; ඩග්ලස් දේවානන්දා ඇමතිතුමා ඉන්නවා. අපි මේ අවුරුද්ද වනකොට රැකව, මහවැල්ල, ගන්දර, කුඩාවැල්ල ධීවර වරායවල වැඩ කටයුතු ආරම්භ කරනවා. බේරුවල ධීවර වරාය, කුඩාවැල්ල ධීවර වරාය අලුත්වැඩියා කිරීමේ කටයුතු කරනවා. ඔබතුමා දන්නවා, කුඩාවැල්ල ධීවර වරායේ tent එකක් ගහ ගන්න ඕනෑ. ඒ සියල්ලටම මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ එක්කම Point Pedro වරායත්- [බාධා කිරීමක්] හරි, ඔබතුමා කියන්න. වෙලාව දෙන්න විනාඩියක් විතර, ගරු කථානායකතුමනි, පව් නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. ඉක්මනට, හැබැයි, විනාඩියෙන් කියන්න.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
විනාඩියෙන් කියනවා, ගරු කථානායකතුමනි. රැකව, මහවැල්ල,- [බාධා කිරීමක්] අමු මාළු කාලා හරි ධීවරයාගේ ප්‍රශ්න විසඳා ගන්න, මාළු ටික විකුණා ගන්න වැඩ පිළිවෙළක් යෙදුවේ මම. ඒක මතක තියා ගන්න. ඒ වාගේම, ඒ වරායවල් සියල්ලම ආරම්භ කළේ මම; අපේ යහ පාලන රජය. ඒ වැඩ ටික කර ගෙන යන්න. ඒකයි මම කියන්නේ. ඔබතුමන්ලා ඒ වැඩ ටික කරගෙන යන්න.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
හරි. අපි ඔබතුමාටත් මුල් ගල් තියන දවසට එන්න කියනවා. ඔබතුමා වරාය කෙසේ වෙතත් පොකිරිස්සන් කොරටුවක් දමලා, අන්න, මිනිස්සු අනාථ වෙලා ඉන්නවා. ඒ ගැනත් පොඩ්ඩක් බලන්න. ඒ කෙසේ වෙතත්- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි. නාමල් රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලයත් අවසන් වෙනවා, මේ වැඩෙන්.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
මට තව විනාඩියක කාලයක් දෙන්න, ගරු කථානායකතුමනි.

ඒ එක්කම හම්බන්තොටට වරාය අලුත්වැඩියා කරන්න, යාපනයේ Point Pedro වරාය අලුත්වැඩියා කරන්න අපි වැඩ පිළිවෙළ ආරම්භ කරලා තිබෙනවා. එම නිසා- [බාධා කිරීමක්] හිටපු ගරු ඇමතිතුමනි, ඔබතුමා එක්ක මා බැණ ගන්න යන්නේ නැහැ. අපි එක ගමේ. පොඩි කාලේ ඉඳලා ඔබතුමා මා දන්නවා; මා බලාගෙන තිබෙනවා. එම නිසා මම මොකුත් කියන්න යන්නේ නැහැ.

කෙසේ වෙතත් ගරු කථානායකතුමනි, අපේ මේ රටේ ව්‍යවසායකයන් නිර්මාණය කිරීමේ වැඩ පිළිවෙළ මෙවර අය වැය තුළින් ක්‍රියාත්මක කරනවා. ඒ තුළ දේශීය ආර්ථිකය ශක්තිමත් කරන වැඩ පිළවෙළක් අපි ක්‍රියාත්මක කරනවාය කියන කාරණයත් මම මතක් කර සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.05]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, අද පැවැත්වෙන මේ අය වැය විවාදයේදී මම කියන්න ඕනෑ, මේ සංඛ්‍යා ලේඛනවලට වඩා වැදගත් වන්නේ අපේ රටේ සාමාන්‍ය ජනයාට මේ අය වැය තුළින් මොන වාගේ සහනයක් ලබා දුන්නාද කියන කාරණය බව. අද වන විට කොරෝනා වසංගතයෙන් පීඩා විඳින, තමන්ගේ රැකියාව කර ගන්න බැරුව, තමන්ගේ ව්‍යාපාරය කර ගන්න බැරුව දුක් විඳින, තමන්ගේ පවුල නඩත්තු කරගන්න බැරුව දුක් විඳින ජනතාව ගැන මේ අය වැය මඟින් රජය බැලුවාද කියලා අපි අද විපක්ෂය හැටියට ප්‍රශ්න කරනවා. අපි දකිනවා, අද ධීවර ජනතාවට ඔවුන්ගේ මාළු ටික විකුණා ගන්න බැරි වෙලා තිබෙන බව. ඒ වාගේම අපි දකිනවා, ධීවර ජනතාවට -යම් පිරිසකට- කොරෝනා වයිරසය ආසාදනය වීම නිසා අද මොන තරම් පීඩාවෙන් ජීවත් වෙනවාද කියලා. මේ රජය ඒ ධීවර ජනතාව දෙස හැරිලාවත් බැලුවාද කියලා විපක්ෂය හැටියට අපට ප්‍රශ්න කරන්න වෙනවා. ඒ ධීවර ජනතාවගේ නිෂ්පාදන විකුණා ගන්න බැරි වනකොට මේ ඉන්න මැති ඇමතිවරු ඒකට යම් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළාද කියලා අපට ප්‍රශ්න කරන්න වෙනවා.

**ගරු කංචන විජේසේකර මහතා (විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - அலங்கார மீன்கள், நன்னீர் மீன்கள், இறால்களை வளர்த்தல், கடற்றொழில் துறைமுகங்கள் அபிவிருத்தி, பலநாள் கடற்றொழில் அலுவல்கள் மற்றும் மீன் ஏற்றுமதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - State Minister of Ornamental Fish, Inland Fish and Prawn Farming, Fishery Harbour Development, Multiday Fishing Activities and Fish Exports)
Sir, I rise to a point of Order.

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට බාධා කරනවා නොවෙයි. ධීවර සංස්ථාව මේ වන විට රුපියල් ලක්ෂ 800ක මත්ස්‍ය තොග මිලදී ගෙන තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. කාට හෝ විකුණාගන්න

බැරි නම්, ඒවා දෙන්න ධීවර සංස්ථාවට. අපි මිලදී ගන්නවා. අපි සෘජුව මිලදී ගන්නවා. හැබැයි, අතරමැදියන්ගෙන් නම් ගන්නේ නැහැ.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ඒ ව්‍යාපෘතිය සාර්ථක නම්, මේ දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාට TV එක ඉස්සරහට ගිහිල්ලා මාළු කන්න වෙන්නේ නැහැ. ඔබතුමන්ලා සාර්ථක නම් දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා TV එක ඉස්සරහට ගිහිල්ලා මාළු කන්නේ නැහැ.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා, ඔබතුමා කියන්නේ කාරණා දෙකක්. මත්ස්‍ය තොග විකුණාගන්න බැරි එකයි, මිනිසුන් මාළු මිලදී ගන්නේ නැති එකයි කියන්නේ, කාරණා දෙකක්. අපි මත්ස්‍ය තොග මිලදී ගෙන තිබෙනවා. නමුත්, මිනිසුන්ට මාළු කන්න යම්කිසි සැකයක් තිබෙනවා. ඒ සැකය දුරු කිරීම සඳහා අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒකයි මේකයි පටලවා ගන්න එපා. ඔබතුමා හැමදාම පටලවා ගන්නවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, මම පටලවා ගත්තේ නැහැ. එතුමන්ලා මත්ස්‍ය තොග ගන්නවා නම්, මත්ස්‍ය මිල මේ තරම් අඩු වන්නේ නැහැ. මත්ස්‍ය මිල අඩු වන හින්දා තමයි ධීවරයාට අද ජීවත් වෙන්න අමාරු වෙලා තිබෙන්නේ. 2015 අවුරුද්දට ඉස්සෙල්ලා එතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ, තෙල් මිල අඩු කරන්න කියලා ධීවරයන් ඉල්ලන කොට ආණ්ඩුව ඒ ධීවරයන්ට වෙඩි තැබුවා. ඒ වාගේම තමයි ඔබතුමන්ලා අදත් ධීවරයන්ට සලකන්නේ. ඒ හින්දා ඔබතුමන්ලාගේ සුන්දර කථා අහන්න ධීවරයෝ අද කැමැති නැහැ.

තමුන්නාන්සේලා ධීවරයන්ට පමණක් නොවෙයි, එහෙම කළේ. තමුන්නාන්සේලා එළවලු ගොවියාට කළේ මොනවාද කියන එකත් අපි විශේෂයෙන්ම මතක් කර දෙන්න ඕනෑ. එදා එළවලු ගොවියාට විවිධ බෝග වගා කරන්න කිව්වා. එළවලු ගොවියා ඒ අස්වැන්න විකුණන්න යන කොට ඔවුන්ට ඒ සඳහා අවස්ථාවක් තිබුණේ නැහැ. ඒ එළවලු කුණු කොල්ලයට දීලා, පාඩු පිට පාඩු ලබපු නිසා වහ බොන තත්ත්වයට මේ රජය එදා එළවලු ගොවියා තල්ලු කළා.

අද අපේ විදේශ ශ්‍රමිකයන්ට මොනවාද වෙලා තිබෙන්නේ? විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රශ්න අහන්න අද මේ රජයේ කවුද ඉන්නේ? කිසිවෙක් නැහැ. අද අපේ විදේශ ශ්‍රමිකයන්ගේ රැකියාව අහිමි වීම නිසා ගෙවල් කුලිය ගෙවාගන්න බැරිව ඒ රටවල අසරණව ඉන්නවා. ඔවුන්ට ලංකාවට එන්න නිවැරදි ක්‍රමවේදයක් හදන්න කියලා ඒ අය ඉල්ලන කොට ආණ්ඩුව අද කියනවා, ඒ අය නිරෝධායනය කරන්න මේ රටේ ඉඩ පහසුකම් නැහැ කියලා. ඉතින්, ඒක විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රශ්නයක්ද? අපේ විදේශ ශ්‍රමිකයන් බලාගන්නා එක මේ රජයේ වගකීමක්. ඒ අය මේ රටේ පුරවැසියෝ. එම නිසා අපි කියනවා, මේ රටේ නිරෝධායන මධ්‍යස්ථානවල තිබෙන පහසුකම් වැඩි කරලා ඒ සඳහා යම් ක්‍රමවේදයක් හදන්න කියලා. "කොරෝනා" කියන්නේ, ඊයේ පෙරේදා පටන්ගත් වසංගතයක් නොවෙයි නේ. කොරෝනා වසංගතය පටන් ගෙන මේ වන විට මාස ගණනක් වෙනවා. අපේ විදේශ ශ්‍රමිකයෝ මේ රටට එන්න අවස්ථාවක් දෙන්න කියලා මාස ගණනක ඉඳලා ඉල්ලනවා. නමුත්, ඒකට ඇහුම් කන් නොදී ආණ්ඩුව අද විවිධ ව්‍යාපාරිකයන්ට අවස්ථා දීලා අපේ විදේශ ශ්‍රමිකයන් සූරාගෙන කන තත්ත්වයට පත් කරලා තිබෙනවා.

ආණ්ඩුව ආනයනය ගැනත් කථා කළා. ආනයනය තහනම් කරනවා කිව්වා. ආනයනය තහනම් කරලා අපේ රටේ රුපියල ස්ථාවරව තබාගන්නවා කිව්වා. නමුත්, අපි අහන්නේ, වාහන ආනයනය කළ ආයතනවලින්, ඒ ආශ්‍රිත ව්‍යාපාරවලින් යැපුණු පුද්ගලයන්ට මේ රජය මොනවාද කළේ කියලායි. අපේ දුප්පතාට එහාට මෙහාට යන්න තිබුණු, දුප්පතාගේ ප්‍රවාහන මාධ්‍ය වන bike එක පවා අද මේ රටට ගෙන්වන්න ඉඩ දෙන්නේ නැහැ. ඒවාට සම්බන්ධ ව්‍යාපාරවල නියැළුණු පුද්ගලයන්ට මොනවාද කළේ? එම ව්‍යාපාරවලට සම්බන්ධ වෙලා තමන්ගේ ජීවිත, තමන්ගේ දරු පවුල් රැකගත් පුද්ගලයන්ට මොනවාද වෙන්නේ කියලා ආණ්ඩුවට කිසිම ගාණක් නැහැ.

වතු කම්කරුවන්ට රුපියල් 1,000ක දෛනික වැටුපක් දෙනවා ලු. මොන බොරුද මේ කියන්නේ? වතු සමාගම් කියනවා, "ඒ ගොල්ලෝ ඒක දෙන්නේ නැහැ" කියලා. ඔබතුමන්ලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා, රුපියල් 1,000 දෙන්න කියලා වතු සමාගම්වලට නියෝග කරනවා කියලා. ඉතින්, වතු සමාගම් ඒක දෙනවාද නැද්ද කියලා අපට, ජනතාවට බලාගෙන ඉන්න සිද්ධ වෙලා තිබෙනවා. නමුත්, අන්තිමට ඒ මුදල දුන්නේ නැත්නම් කවුද ඒකට වග කියන්නේ? එහි වගකීම ගන්න රජයේ කවුරුවත් නැහැ.

අද වන කොට ඇඟලුම් කර්මාන්තයේ තත්ත්වය බලන්න. එදා, 1990 ගණන්වල ඇඟලුම් කර්මාන්තය මේ රටේ ස්ථාපිත කරපු හින්දා තමයි විදේශ විනිමය විශාල ප්‍රමාණයක් මේ රටට එන්නේ. අපි ඇඟලුම් කර්මාන්තය ශක්තිමත් කරලා ඉස්සරහට ගෙන ගියා. දෙවන කොරෝනා රැල්ල ඒ ඇඟලුම් කර්මාන්තය ආශ්‍රිතව පටන්ගත්තා. ඒකෙන් වූ හානිය අවම කිරීම සඳහා මේ රජය වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළේ නැහැ.

මේ රටේ කුකුළු කර්මාන්තය ගත්තත් එහෙමයි. කුකුළන්ට කෑමවත් දෙන්න බැරි වීම නිසා කුකුළන් මිය යන තත්ත්වයට කුකුළු කර්මාන්තය පත් වෙලා තිබෙනවා. ඉතින්, මේ රජයට මේ වාගේ සරල ආර්ථික කාරණා පවා කළමනාකරණය කරගන්න බැරි වීම නිසා අද වන කොට අපේ රට සෘණ ආර්ථිකයක් කරා ඇදගෙන ගිහින් තිබෙනවා. අපි කියනවා, කොරෝනා වසංගතයත් එක්ක විවිධ රටවල් ඒ රටවල සිටින ව්‍යාපාරිකයන්ට, ජනතාවට විශාල සහන දෙන්න ක්‍රියාත්මක වුණා කියලා. නමුත්, ලංකාව ගත්තාම අවම වශයෙන් තමයි අද සහන දීලා තිබෙන්නේ. අවම වශයෙන් තමයි ඒ සඳහා මුදල් වෙන් කර තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, මට තවත් මිනිත්තුවක් දෙන්න.

අද අපේ රටේ ණය ට්‍රිලියන 14යි. ඒක, දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 93යි. ඒ වාගේම අවුරුද්දකට ණය සහ පොලිය ට්‍රිලියන 2ක් ගෙවන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. මේ වෙනුවෙන් අපි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. ඒ ණය සහ පොලී ගෙවීම කොරෝනා හින්දා අපට තවත් අමාරු වෙලා තිබෙනවා. ඒ නිසා ඒ සඳහා වැඩ පිළිවෙළක් වහාම ඉදිරිපත් කරන්න කියලා අපි රජයට කියනවා. එහෙම ඉදිරිපත් කරන්නේ නැතිව දිගින් දිගටම මේ රට අසමත් කරන්න එපා, රජයේ, ජනාධිපතිතුමාගේ අසමත්භාවය ජනතාව පිට පටවන්න එපා කියමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක් තිබෙනවා.

[අ.භා. 12.13]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා (ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் - கிராமிய வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை மற்றும் கட்டிடப்பொருள் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Indika Anuruddha Herath - State Minister of Rural Housing and Construction and Building Material Industries)
ගරු කථානායකතුමනි, 2021 වසර සඳහා අය වැය ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ මම සතුටු වනවා, අපේ විපක්ෂ නායකතුමා කථාව කරලා කාමරයට ගිහිල්ලා ඉන්නේ නැතිව මේ කථාවට පොඩ්ඩක් ඇහුම් කන් දෙන්න දැන් මෙතැන සිටියා නම්. එතුමා බොහොම සංවේදී වෙලා කථා කළා, නිවාස සංවර්ධන අධිකාරියේ සහ එය අයත් අමාත්‍යාංශයේ සේවකයන් ඉවත් කිරීමක් ගැන. එතුමා මේ ගරු සභාවේ සිටියා නම්, ඒ ගැන අපට කියලා දෙන්න තිබුණා. මේ කථාව කරගෙන යන අතරතුර හෝ එතුමා ආවොත් එතුමාට අපි කියලා දෙනවා, එතුමා අමාත්‍යාංශය කරගෙන ගිය ආකාරය සහ නිවාස වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරපු ආකාරය. මොකද, රටේ මිනිසුන්ගේ නිවාස ප්‍රශ්නයට ඕනෑම ආණ්ඩුවක -ගිය ආණ්ඩුවේ වුණත්, මේ ආණ්ඩුවේ වුණත්- අය වැය තුළ සුවිශේෂී තැනක් ලැබෙනවා.

නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා කථා කරලා වාඩි වෙද්දී මට හිතුණේ එතුමා හිටපු ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා නොවෙයිද කියලායි. එතුමා කිව්වා, එළවලු ගොවියා විනාශයි කියලා. අපි දන්නවා, විශේෂයෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවීන්ට, මුළු රටේම සිටින ගොවීන්ට ශීතාගාර හදා දෙනවා කියලා එතුමන්ලාගේ අය වැය හතර පහ තුළම එළවලු ගොවියාට කරපු වංචාව ගැන. එතුමා ධීවරයා ගැනත් කථා කළා. ධීවරයාටත් එවැනිම පොරොන්දු දුන්නා මිසක්, ඒ පොරොන්දු පත්‍රයටම සීමා වී සිටියා මිසක් ඒ කිසි දෙයක් යථාර්ථයක් කළේ නැහැ.

විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා ඊයේ-පෙරේදා කරපු කථා මම අහගෙන සිටියා. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, සහල් සමුපකාර සමිතිය ගැන. පොළොන්නරුවේ තිබෙන "ශක්ති" සහල් සමුපකාර සමිතිය කළේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාටයි, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාටයි මැතිවරණය කිරීමට සහාය දීමයි. මම අද ඒ විස්තර හැන්සාඩ්ගත කරන්නම්. මා ළඟ තිබෙනවා, ඒ රූපරාමු එක්ක සියලු දේවල්. එතුමන්ලා දේශපාලනයයි කළේ. එතුමන්ලා එදා හම්බන්තොට දිස්ත්‍රික්කයට එක වී ඇටයක් දුන්නේ නැහැ. වී මෝල් හිමියන්ගේ සංගමය විධියට මම එතුමන්ලාගේ පස්සෙන් ගිහිල්ලා කිව්වා, රටේ සැමදෙනාටම පොදුවේ වී ටික ලබා දෙන්න කියලා. නමුත්, ඒ වැඩ කටයුත්ත කළේ නැහැ. උතුරු මැද පළාතේ ආණ්ඩුකාරවරයා, ඒ වාගේම උතුරුමැද පළාතේ සමුපකාර කොමසාරිස්වරයා අද පරීක්ෂණයක් කරලා තිබෙනවා. මිලියන 150කට වඩා වැඩි වංචාවක් කරලා තිබෙනවා. එය විශාල මුදල් වංචාවක්. ඒ, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා හදපු සමුපකාර සමිතියේ.

එදා වැඩක් කරගන්න බැරි වෙච්ච අය අද කොවිඩ්වල එල්ලිලා. දැන් අපි දන්නවා, ලෝක වසංගතයක් තියෙද්දි රටේ ආර්ථිකය මොන තැනටද යන්නේ කියලා. එදා ඔබතුමන්ලාගේ ආණ්ඩුව පැවැති කාලයේ රටේ ආර්ථිකය ගැන කථා කරද්දි මිනිසුන් කිව්වේ, "ආණ්ඩුව ආර්ථිකය කෑවා" කියලායි. එදා ඔබතුමන්ලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කළේ මොනවාද? එදා ඔබතුමන්ලා හැම දවසකම වාගේ පරිපූරක ඉදිරිපත් කළේ මොනවාටද? ඒ, ඔබතුමන්ලාට සුඛෝපභෝගී වාහන ටික ගන්නයි. අද මැති ඇමතිවරු විතරක් නොවෙයි, මේ රටේ සියලුදෙනා අනවශ්‍ය වියදම් කපා හැරීම වෙනුවෙන් කැප කිරීම් කරලා තිබෙනවා.

එදා සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා නිවාස සංවර්ධන අධිකාරියට විශාල පිරිසක් අනවශ්‍ය විධියට බඳවාගෙන තමන්ගේ දේශපාලන ක්‍රියාවලියට යොදවපු හින්දා ඔබතුමන්ලා දන්නවා, හම්බන්තොට දිස්ත්‍රික්කයේ දහස් ගණන් තරුණ තරුණියන්ට වන්දි ගෙවන්න සිදු වුණු බව. එතුමා හම්බන්තොට දිස්ත්‍රික්කය ඔය කියන තරමේ සුරපුරයක් කළා නම්, එතුමාට තිබුණා නේ හම්බන්තොටින් ඡන්දය ඉල්ලන්න. අද මෙතැනට ඇවිල්ලා එතුමා බණ දේශනා කරනවා. පන්සල් හැදුවා කියලා, කියපු ආකාරයටම එතුමා ඒවා කළා නම්, එතුමාට තිබුණා නේ හම්බන්තොටින් ඡන්දය ඉල්ලන්න. ඇයි එතුමා කොළඹට පැනලා ආවේ? එදා ඒ මිනිසුන් ලෑස්ති වෙලා සිටියා, මැතිවරණ වේදිකාවට ගොඩ වුණොත් ගහන්න. අපට කථා කරලා කිව්වා. ඔබතුමා දන්නවා නේ. ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා නේ. ඔබතුමා දැන් මේ ආණ්ඩුවට යාඥා කරනවා, ගෙවල් ටික හදලා දෙන්න කියලා. ගෙවල් ටික හදලා දෙන්න කියලා, ඉල්ලීම් කරනවා. [බාධා කිරීම්] ගෙවල් ටික හදලා තිබුණා නම්, අපෙන් ඉල්ලුවේ මොනවාද? ගෙවල් නොවෙයි, ඔක්කෝම කටු ගෙවල්. ගෙවල් නොවෙයි, ඔක්කෝම නටබුන්. කොහේද ගෙවල් හදලා තිබුණේ? [බාධා කිරීම්]ෆොන්සේකා මන්ත්‍රීතුමනි, ඔබතුමා කෑගහන්න එපා. ඔබතුමා කිව්වා, ඔබතුමාගේ තුනටිය පණ නැහැ, හොඳ වාහනයක් ඕනෑ කියලා. ඔබතුමා කිව්වා, තුනටිය පණ නැහැ, ඔබතුමාට ගමන්-බිමන් යන්න හොඳ වාහනයක් ඕනෑ කියලා. එහෙම තමයි ඔබතුමන්ලා වරප්‍රසාද ගත්තේ. දැන් මෙතැන ඇවිල්ලා කියනවා, “ලෝකය දිනුවා, රට දිනුවා, ජාත්‍යන්තරය දිනුවා, අරකයි මේකයි”කියලා. ගරු කථානායකතුමනි, එතුමන්ලා බාල් නැටුවා මිසක් රජය කළේ නැහැ.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
ගරු කථානායකතුමනි, එතුමා මගේ නම කිව්වා.

මගේ කොන්ද හොඳට පණ තිබෙනවා. මම හමුදාවට අණ දුන්නා, අවුරුදු පහක්. තමුන්නාන්සේ දැන ගන්න, මම වාහනයක් නැතිව පුද්ගලික වාහනය තියාගෙන මාස 10ක් ඇමති කෙනකු විධියට වැඩ කළා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
අපි දැක්කා පුද්ගලික වාහනේ ගිය හැටි. මොකද, ඒ වෙලාවේ අපිත් හිටියේ පාර්ලිමේන්තුවේ. ඔබතුමා කිව්වා, “කොන්ද පණ නැහැ. මට හොඳ වාහනයක් ඕනෑ” කියලා. මතකද, එහෙමයි කිව්වේ. මිනිසුන්ගේ පටි තද කර ගන්න කිව්වා. එදා හිටපු නායකයා කිව්වා, “පටි තද කර ගන්න” කියලා. හරිද? “මිනිසුන්ගේ පටි තද කර ගන්න” කිව්වා. ඔබතුමන්ලා පරිපූරක දදා කෝටි ගණන් වටිනා වාහන ගත්තා. අමාත්‍යාංශයේ ලක්ෂ තුන්හාරසීය මාසෙට වියදම් කළා. අර හිටපු පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමා කිව්වා, හෝටල් බුක් කරලා වන සංරක්ෂණය කරනවා කියලා බාල් නැටුවා කියලා. ඒක තමයි ඔබතුමන්ලා කළේ. නැතුව වෙන දෙයක් නොවෙයි. මා ළඟ තොරතුරු තිබෙනවා. මම පෙන්වන්නම්.

ගරු කථානායකතුමනි, මම මේ ලියවිල්ල සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා.

පෝස්ටර් ගහන්න බිලියනයකට වැඩිය නිවාස සංවර්ධන අධිකාරියේ මුදල් වියදම් කළා. හැබැයි, පහුගිය අවුරුදු පහටම ගෙවල් හදන්න එතුමන්ලා වියදම් කළේ බිලියන එකහමාරයි. ඉතිරි ඔක්කෝම වියදම් කළේ පෝස්ටර් ගහන්න. හරිද? තමුන්නාන්සේලා අද මෙතැන නිවාස ගැන කථා කරනවා. තමුන්නාන්සේලාගෙන් මම අහනවා, කෝ සජිත් ප්‍රේමදාස හිටපු ඇමතිවරයා? එතුමාට එන්න කියන්න. එතුමාට කථා කරලා කියන්න, "කාමරයේ ඉඳන් අහගෙන ඉන්න එපා. ඇවිල්ලා මේවාට උත්තර දෙන්න" කියලා. ගරු කථානායකතුමනි, මේ මන්ත්‍රීතුමන්ලාගෙන් අහන්න එතුමන්ලාගේ දිස්ත්‍රික්කවල කොහේද ගෙවල් හැදුණේ කියලා. [බාධා කිරීමක්] ඔබතුමා කෑගහන්න එපා. "ගෙවල් ටික හදලා දෙන්න" කියලා ඔබතුමා මගෙන්ම ඉල්ලුවා නේ. ඔබතුමා සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා වෙනුවෙන් කෑගහන්න එපා. ඔබතුමා මගෙන්ම ඉල්ලුවා ගෙවල් ටික හදලා දෙන්න කියලා. නිවාස ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන ඔක්කෝම විනාශ කළා. ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාව සියයට 14 පොලියට මිලියන පන්සියයකට උකස් තියලා පෝස්ටර් ගැහුවා. මිලියන 200ක් හම්බ කරන්න පුළුවන් තැන මිලියන හයට ආදායම වැට්ටුවා. මධ්‍යම්නෑ තැන මිලියන හයට ආදායම වැටුම සංස්කෘතික අරමුදල ඉවර කළා. එහෙම කරලා තමයි දැන් කියන්නේ, අපි ආණ්ඩු කරන හැටි කියලා. මේ සියලු වාර්තා සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා.

ඉංජිනේරු සංස්ථාවේ සේවකයන් 25 දෙනෙක් අඹන්පොල ඉඩමේ අඹ අහුලන්න, පොල් අහුලන්න ගෙනිහින් දැම්මා. අඹන්පොළ ඉඩම කාගේද කියන එක කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දන්නවා. එලෙස තව සේවකයෝ ගණනාවක් පෞද්ගලික වැඩවලට ගිහින් දැම්මා. "ජාල්" සැලූන් එක කාගේද? ෂැන්ග්‍රි-ලා එකේ තිබෙන ජාල් සැලූන් එකේ තුවා හෝදන්න ගිහින් දැම්මා. ඒ ගිහින් දැම්මේ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා මිසක් වෙන කවුරුවත් නොවෙයි. හොයා ගන්න, මම ඒ සියලු රූප රාමු සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, අපි කියන්නේ මේ වෙනුවෙන් වෙනම පරීක්ෂණ -[බාධා කිරීම්] කෝටි දෙකක්. කෝටි දෙකක්! [බාධා කිරීම්] කොළේ පෙන්වන්නම්. ඔබතුමන්ලා වාගේ අපි කොළේ වහලා ගහන්නේ නැහැ. කොළේ ඕනෑද? ඕනෑ නම් රූපයත් එක්කම පෙන්වන්නම්. ලස්සනට තියෙනවා. ගරු කථානායකතුමනි, රටේම මිනිස්සු අද රුපියල් බිලියන 26ක ණයකාරයෝ කරලා තිබෙනවා. කවුද ඒක කරලා තිබෙන්නේ? 2015 අවුරුද්දේ ගෙවල් හදා දෙනවා කියලා ණයකාරයෝ කරලා තිබෙනවා. මෙන්න කොළේ තිබෙනවා බලාගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු කථානායකතුමනි, වන්නි දිස්ත්‍රික් අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා මට තව විනාඩි 05ක් දුන්නා.

මෙන්න මේ ඡායාරූපය බලන්න. තුවා හෝදනවා. මේ සේවකයා වැඩ කරන්නේ ඉංජිනේරු සංස්ථාවේ. මේ 26 දෙනාට මේ අවුරුදු 5ට කෝටි දෙකකට වැඩිය පඩි ගෙව්වා. කවුද ඇහුවේ කාගේද salon එක, කාගේද team එක, කවුද මෙතැන ඉන්නේ කියලා. මේ සියලු දේවල් ජාතික අපරාධ, ගරු මන්ත්‍රීතුමා. ගෙවල් හදලා දෙනවා කියලා ගෙවල් හැදුවා නම්, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා හම්බන්තොටින්ම ඡන්දය ඉල්ලනවා කියලා මම කිව්වේ ඒකයි. ගෙවල් හදනවාට වඩා මිනිස්සු බිලියන 26ක ණයකාරයෝ කෙරුවා. අද උතුරේ මිනිස්සු අපට කථා කරලා කියනවා, ගෙවල් හදලා දෙන්න කියලා. අද රට වටේ ඉන්න මිනිස්සු කථා කරලා කියනවා ගෙවල් හදලා දෙන්න කියලා. ඒ මිනිසුන්ගේ කනකර උකස් තියලා ඒ මිනිස්සු මහ පාරට ඇදලා දැම්මා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
රැකී රක්ෂා දෙනවා කියලා මිනිස්සු මහ පාරට ඇදලා දැම්මා. ඒ සියලු අයට ව්‍යාජ විධියට පඩි ගෙව්වා. පඩි ගෙවන්න භාණ්ඩාගාරයෙන් මුදල් වියදම් කළා. ඒ ආයතනවලට මුදල් වියදම් කළා. ඒ නිසා අපි සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට පැහැදිලිවම කියනවා, පාර්ලිමේන්තුවට ඇවිල්ලා බණ භාවනා කරනවාට වඩා යථාර්ථවාදීව තමුන්ගේ වැරැද්ද පිළිගන්න කියලා.

අපි ඊයේ කථා කරන විට ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාට හන්තානේ ඉඩම ගැන කිව්වා. එතකොට කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා, "ඒක මගේ ඉඩමක්. මම ඒක අධිකරණයට ගිහිල්ලා ඔප්පු කර ගන්නම්" කියලා. තව ඉඩම් ගත්ත ගොඩක් අය ඉන්නවා. ඒ සියලුදෙනාට නඩු එනවා. ඒ සියලුදෙනා ඒ වෙලාවට කථා කරලා තමුන්ගේ නිර්දෝෂීභාවය කියන්න. ඒක කියන්නවත් අද විපක්ෂ නායකවරයා පාර්ලිමේන්තුවට එන්නේ නැහැ. එතුමා තව කල්ප කාලයකින් රජයක් ගන්න බලාපොරොත්තු වෙනවා නම්, ඒත් මිනිස්සු එතුමාට ඡන්දය දෙන්නේ නැහැ, මේ කරපු ජාතික අපරාධ නිසා. එතුමා ආණ්ඩු කරන්නේ කොහොමද? එතුමාගේ අමාත්‍යාංශය කරලා පෙන්වලා තිබෙනවා, එතුමා "ෆේල්" කියලා. වෙන කවුරුවත් නොවෙයි, සජිත් ප්‍රේමදාස "ෆේල්" කියලා එතුමාගේ අමාත්‍යාංශය හරහාම එතුමා පෙන්වා දීලා තිබෙනවා. දැන් කාටවත් "පාස්, ෆේල්" කියන්න එන්න එපා. එතුමා "ෆේල්" කියලා එතුමාම පෙන්වලා ඉවරයි. හම්බන්තොටින් "ෆේල්" කියලා පෙන්නුවා නම්, ඒ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා විතරයි, වෙන කවුරුත් නොවෙයි. ඒ හදලා දුන්නු හැම දෙයක්ම කැළේට ගිහිල්ලා දැම්මා. මහත්තයෝ, ලබන වසරේ අපි නිවාස 16,000ක් හදනවා. හැම මැතිවරණ කොට්ඨාසයකටම තට්ටු නිවාස 100 බැගින් අපි හදලා දෙනවා.

අපි මේ වෙද්දී රට පුරා "ඔබට ගෙයක් - රටට හෙටක්" වැඩසටහන යටතේ නිවාස 10,000කට වඩා හදා දීලා තිබෙනවා. අපි මිනිස්සු ණයකාරයෝ කරලා නැහැ. මේ නිවාස 10,000ට අපි එක මනුස්සයෙක්වත් ණයකාරයෙක් කරලා නැහැ. අපට බිලියන 20කට වැඩිය මේ අය වැය තුළින් මුදල් වෙන් කරලා තිබෙනවා, උතුරේ පේදුරුතුඩුවේ ඉඳලා දෙවුන්දර තුඩුවට එනකම් මිනිස්සුන්ගේ ගෙවල් හදලා දෙන්න. අද මිනිස්සු සන්තෝෂයෙන් ඒ ගෙවල්වල ජීවත් වෙනවා. ඒ මිනිසුන්ගේ දරුවෝ සන්තෝෂයෙන් ජීවත් වෙනවා. ඒ නිසා ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ කිසිම ඇමතිවරයෙකුට ඒ ආත්ම තෘප්තිය ලබා ගන්න බැරිව ගියා. ගරු කථානායකතුමනි, ඇයි බැරිව ගියේ? හැමෝම ණයකාරයෝ කෙරුවා. 2015දී තියපු මුල් ගලක් 2020 වෙනකම්

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

තවමත් ඒ විධියටම තිබෙනවා. ඔබතුමන්ලා ඒවා හදන්න මුදල් දුන්නේ නැහැ. එකින් එකට, එකින් එකට ඔබතුමන්ලා කළේ මුල්ගල් තිය තියා යන එක මිසක්, වෙන දෙයක් නොවෙයි. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව කියන්න ඕනෑ, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගේ බූදලයෙන් හරි රූපවාහිනී සංස්ථාවේ මිලියන 110ක මුදල ගෙවන්න කියලා. ශුද්ධවන්තයෝ වාගේ කථා කරන්නේ නැතිව ඒ සල්ලි ගෙවන්න කියන්න.

ස්වාභාවිකව මතුවූ කොවිඩ්-19 ලෝක වසංගතය නිසා අපේ රටේ ආර්ථිකය අඩු මට්ටමකට ආවාට, ඔබතුමන්ලා එදා සියයට7ක තිබ්බ ආර්ථිකය සියයට 2කටත් අඩුවට ගෙනාවේ කොල්ල කාපු හින්දා කියලා මතක තියා ගන්න. ඔබතුමන්ලා ඒ වෙලාවේ ආණ්ඩුව, රට, මනුස්සයෝ සියලුදෙනා කොල්ල කාපු නිසා තමයි ඔබතුමන්ලා ඔය තත්ත්වයට වැටුණේ, රට මේ තත්ත්වයට වැටුණේ කියලා මතක තියා ගන්න. නාමල් රාජපක්ෂ මැතිතුමා කිව්වා වාගේ කිසිම හැඟීමක් නැතිව හම්බන්තොට වරාය විකුණලා දාපු නිසා තමයි ඔබතුමන්ලාට දෛවය මේ විධියට පාඩම් උගන්වා දුන්නේ කියලා මතක තියා ගන්න. ගරු මන්ත්‍රීතුමනි, හැමදේකම අනාවරණයක් තිබෙනවා. අපි ඉදිරියේ දී මේ සියල්ල අනාවරණය කරනවා. ඉංජිනේරු සංස්ථාවට කරපු දේ, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට කරපු දේ, අමාත්‍යාංශයේ නිවාස අධිකාරියට කරපු දේ, තමන්ගේ මධ්‍යම සංස්කෘතික අරමුදලට කරපු දේ අපි අනාවරණය කරනවා. අපි සියලු දේවල් පෙන්වලා දෙනවා. අද මිනිස්සුන්ට එකම පිහිට මේ ආණ්ඩුවේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත්, ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමාත් විතරයි. ඒ ගොල්ලන් මිනිස්සුන්ව බලා ගන්නවා. එතුමා 2005 වසරේ රට භාර ගෙන අවුරුදු 30ක යුද්ධය අවසන් කර රට සංවර්ධනය කරලා දුන්නා. ඒ සියල්ල විනාශ කළා. [බාධා කිරීමක්] දිලිප් වෙදආරච්චි මහත්මයා ඕනෑවට වැඩිය කෑ ගහන්න එපා. අද ඔබතුමා highway එකෙන් යන්නේ, එන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයාට පින්සිද්ධ වෙන්න. නැත්නම් ඔබතුමාට ඒකවත් නැහැ. ඒ නිසා බොරුවට කෑ ගහන්න එපා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ප්‍රේමදාස මැතිතුමා තමයි ඉස්සෙල්ලාම මුල් ගල තිබ්බේ. ඒක තමයි හැදුවේ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු කථානායකතුමනි, මට ලබා දුන් කාලය සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා. අද දවසේ හෝ හෙට දවසේවත් මේ විපක්ෂ නායකතුමාට මේවාට උත්තර දෙන්න කියලා ඉල්ලමින් මට කථා කිරීමට ලබා දුන් කාලය සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විනාඩි දෙකක කාලයක් ඉතිරි වුණා. පස්වරු 1.00 දක්වා දිවා භෝජනය සඳහා සභාවේ කටයුතු අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**සහකාර මහ ලේකම්**
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)
කරුණාකර, කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
"ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.***
*அதன்படி, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. HARSHANA RAJAKARUNA *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர்அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම තුන් වතාවක් පාර්ලිමේන්තුවට පත් වෙලා තිබෙනවා. පළමුවැනි වතාවේ මම මාස පහයි හිටියේ, හිරේ දැම්මා. කොහොම වුණත්, මම අය වැය විවාද ගණනාවකට ඇහුම්කන් දීලා තිබෙනවා.

මේ වතාවේත් අපි දකින්නේ පරණ සුපුරුදු දෙයමයි. හැම දාම වාගේ, සිරිත් පරිදි අය වැය කියලා ඉලක්කම් හරඹයක් යනවා; පැලැස්තර දැමීමේ සංකල්පය තිබෙනවා; විශාල ලෙස ණය ගැනීමක් සිදු වනවා; මුදල් අච්චු ගැසීමක් සිදු වනවා; අවසානයේදී රටේ ආර්ථිකය කඩා වැටෙනවා; රට නැවතත් ණය වෙනවා. මේක තමයි මේ වතාවේ අය වැයෙනුත් අපට දකින්න ලැබෙන්නේ.

අපේ යහ පාලන රජය අවුරුදු පහකට රුපියල් බිලියන 5,500ක් ණය වශයෙන් ගත්තා. අපි ඒකෙන් විශාල ප්‍රමාණයක් පාවිච්චි කළේ ඊට කලින් අරගෙන තිබුණු ණය ගෙවා අවසන් කරන්නයි. ඊට කලින් -2005 සිට 2015 දක්වා- තිබුණු රජය රුපියල් බිලියන 5,000ක ණය අරගෙන තිබුණා. 2005ට කලින්, පාර්ලිමේන්තු ඉතිහාසයේ අය වැයවලදී ණය අරගෙන තිබුණේ රුපියල් බිලියන 2,000යි. 2005 - 2015 දක්වා තිබුණු රජය රුපියල් බිලියන 5,000ක ණය අරගෙන තිබුණා. අපි රුපියල් බිලියන 5,500ක ණය ගත්තා. මේ වතාවේ වර්ෂ දෙකකට පමණක් වර්තමාන රජය රුපියල් බිලියන 5,730ක් ණය ගන්නවා.

මේ යන විදිය අනුව, මේ වසර පහ අවසානයේදී අනිවාර්යයෙන්ම රුපියල් බිලියන 10,000ක් ඉක්මවා යන ණය මුදලක් ගැනීමට මේ රජය කුරුමානම් අල්ලන බව අපට පෙනෙනවා. අපේ රජයට කලින් තිබුණු රජය රුපියල් බිලියන 5,000ක ණය ගත්තා. ඒකෙන් ව්‍යාපෘති කීපයක් කළා. හැබැයි, ඒ ව්‍යාපෘති එකක්වත් ප්‍රතිලාභ ලැබුණු ඒවා නොවෙයි. හම්බන්තොට වරාය, ගුවන් තොටුපොළ, සම්මන්ත්‍රණ ශාලාව කියන ව්‍යාපෘති සියල්ලම ප්‍රතිලාභ නැතිව නිකම් මැස්සෝ වහමින් තිබුණා. යම්කිසි ප්‍රමාණයකට හෝ ඒවා ඉහළට ගන්න පුළුවන් වුණේ අපේ රජය බලයට පත් වෙලා කරපු යම් යම් උත්සාහ කිරීම් නිසා පමණයි.

තමුන්නාන්සේලා ඉදිරිපත් කරන මේ අය වැයේ තිබෙන සංඛ්‍යා ගැනත් අපට වැඩි විශ්වාසයක් නැහැ. මම උදාහරණයක් කියන්නම්. 2020 වසරේ මාස 7කට රුපියල් බිලියන 763ක ආදායමක් පෙන්නුවා. 2020 අවසාන වනකොට ආදායම වශයෙන් පෙන්වනවා, රුපියල් බිලියන 1,588ක්. මේක යථාර්ථයක් නොවෙයි. ඒක අපට වටහා ගැනීමට අමාරුයි. අය වැය හරහා වැරැදි සංඛ්‍යාලේඛන ඉදිරිපත් කිරීම තුළින් යම්කිසි මුළාවක් - රැවටීමක්- කිරීමට උත්සාහ දරන බව අපට පෙනෙනවා.

අගමැතිතුමා අය වැය කථාව ඉදිරිපත් කරමින් කිව්වා, කෘෂි කාර්මික හා කර්මාන්ත ආශ්‍රිත අපනයන ආර්ථිකයක් කරා රට ගෙන යනවා කියලා. මේ අය වැය හරහා, කෘෂි කාර්මික හා කර්මාන්ත ආශ්‍රිත අපනයන ආර්ථිකයක් ගොඩ නැඟීමට එතුමන්ලා උත්සාහ දරනවා, ඒ සඳහා යම් ගමනක් යනවා කියලා ගරු අගමැතිතුමා කිව්වා. නමුත් මේ වෙලාවේ මම මේ කාරණය මතක් කර දෙන්න කැමැතියි. මේ ආණ්ඩුව 2005 ඉඳලා 2015 වනතුරුත් තිබුණා. ඒ අවුරුදු දහයේදී මේ රටේ ඇඟලුම් කර්මාන්තශාලාවලින් සියයට 50ක් වැහුණා. පොල් කර්මාන්තය, පොල් කොහු කර්මාන්තය, පොල් තෙල් කර්මාන්තය ආශ්‍රිත කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් පොල් ත්‍රිකෝණයේ තිබෙනවා. එතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ ඒවායෙනුත් සියයට 50ක් වැහුණා. කර්මාන්ත ගොඩ නැඟීම සම්බන්ධයෙන් බැලුවාම, මේ රජයට එච්චර පුරසාරම් දොඩවන්න පුළුවන් ඉතිහාසයක් තිබෙනවාය කියලා අපට පෙනෙන්නේ නැහැ.

ඊළඟට කියනවා, ඉදිරියේදී අපනයනය ගොඩ නඟන්න අදහස් කරන්නේ කෘෂිකාර්මික සහ ගොවි නිෂ්පාදන මතයි කියලා. මේකත් යථාර්ථයක්ද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපි දන්නවා, පසුගිය කාලය පුරා අපේ කෘෂි කාර්මික අපනයනය දළ දේශීය ආදායමේ ඉතා සුළු පංගුවක් දක්වා පහත වැටුණු බව. අපට නිදහස ලැබෙන විට දළ දේශීය ආදායමින් සියයට 40ක ප්‍රමාණයකට දායකව තිබුණු කෘෂි කර්මාන්තය මේ වනවිට සියයට 4ක් දක්වා පහත වැටී තිබෙනවා. කෘෂිකාර්මික සහ ගොවි නිෂ්පාදන අපනයන කිරීම ගැන කථා කළාට, ඒක යථාර්ථයක්ද කියලා අපට විශ්වාස කරන්න අමාරුයි. මම පසුගිය දවසකත් මේ සභාවේදී point of Order එකක් අරගෙන කෘෂිකර්ම ඇමතිතුමාගෙන් මේ කාරණය ඇහුවාම එතුමා එය යටපත් කරමින් කථා කළා.

පසුගිය දවස්වල කැකිරාව ප්‍රදේශයේ ගොවි මහත්වරු සමඟ සාකච්ඡාවක් තිබුණා. එතැනදී ඉදිරිපත් කළා notice එකක්, ඒ ප්‍රදේශයේ කෘෂිකර්ම නිලධාරීන් ගිහිල්ලා ඒ ගෙවල්වල අලවන්න සකස් කළ, “2020-2021 මහ කන්නය සඳහා පොහොර සහනාධාර ලබා ගැනීම සඳහා ඔබ විසින් සපුරාලිය යුතු අවශ්‍යතා” කියලා. ඒකේ කරුණු වගයක් සඳහන් කර තිබෙනවා. පොහොර නිකම් දෙනවා කියලා කියපු නිසායි මම මේක කියන්නේ. ඒ notice එකේ තිබෙනවා, "ගොවි ජනතාව හා ඔවුන්ගේ පවුල්වල ආදායම් තත්ත්වය, සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය, සමාජ සුබසාධනය හා අධ්‍යාත්මික හර පද්ධතිය වර්ධනය කිරීම උදෙසා - ඒකට සීනි, බටර් ටිකකුත් ගානවා- හා 2020.03.30 නිකුත් කළ 7/1/3/2020 යල චක්‍රලේඛ මඟින් නයිට්‍රජන් කළමනාකරණය සම්බන්ධයෙන් 2020 යල කන්නයේ සිට ටී.එස්.පී. පොහොර 50% ක් අඩුකර නිකුත් කරන ලෙස දන්වා ඇත." කියලා. පොහොර නිකම් දෙනවා කියන රජය 2020 යල කන්නයේ සිට නයිට්‍රජන් කළමනාකරණය සම්බන්ධයෙන් කියලා TSP පොහොර සියයට 50ක් අඩු කරන්න යනවා.

ඊළඟට ඒකේ කියනවා, මහ කන්නයට ගොවි මහත්වරුන් සියයට 50ක් කාබනික පොහොර හදා ගන්න ඕනෑ කියලා. ඒක හදා ගත්තේ නැත්නම් නයිට්‍රජන් පොහොර දීමත් නැවැත්වීමට ක්‍රියා කරනවා කියා තර්ජනය කරනවා "කාබනික පොහොර සකස් කිරීමට කිසිදු උනන්දුවක් නොදක්වන ගොවි මහත්වරුන් වෙත මින් ඉදිරියට සහනාධාර මත ලබාදෙන රසායනික පොහොර ලබාදීම සම්පූර්ණයෙන්ම නැවැත්විය යුතු බවට දන්වා ඇත" කියාත් එමඟින් තවදුරටත් කියනවා.

මේක තමයි ඔබතුමන්ලා කරන්න යන්නේ. එහෙම කරන ගමන්, කෘෂි නිෂ්පාදන අපනයනය කරන්න, ගොවියාට නිකම් තමයි පොහොර දෙන්නේ කියලා කියනවා.

මේ අවස්ථාවේ ධීවර අමාත්‍යතුමා මේ ගරු සභාවේ නැහැ. මේ කියන්න යන්නේ මගේ මතයක්. මේ රටේ, අපට අපනයන ආර්ථිකයක් හදා ගන්න පුළුවන් කර්මාන්ත දෙකක් මම දකිනවා. එකක් තමයි, ධීවර කර්මාන්තය. අපේ රට වාගේ දහ ගුණයක මුහුදක් අපේ රට වටේ තිබෙනවා. ඒ මුහුදේත් වැඩි වශයෙන් ධීවර කර්මාන්තය කරන්නේ චීනයේ මිනිස්සු.

අනික් එක තමයි, සංචාරක කර්මාන්තය. සංචාරක කර්මාන්තයට සුදුසු භූමියක් අපට ස්වාභාවිකවම ලැබී තිබෙනවා. අපේ සංස්කෘතිය රැකගෙන තමයි ඒ කටයුතු කරන්න ඕනෑ. මේ කර්මාන්ත දෙක සාර්ථකව කරගෙන ගියොත්, මම හිතනවා, හැම දාම කියන එක එක බොරු, උපමා කථා, සුරංගනා කථාවලින් ඉවත්වෙලා රජයට යමක් කරන්න පුළුවන් වෙයි කියලා.

ඊළඟට, අගමැතිතුමා අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් කිව්වා, අපේ රජය රාජ්‍ය සේවකයන් හෙළා දැක්කා කියලා. අපේ රජය තරම් රජයේ සේවකයාට පඩි වැඩි කළ, දීමනා වැඩි කළ, සහන ලබා දුන් කිසිම රජයක් ඉතිහාසයේ තිබිලා නැහැ. අපි රජයේ සේවකයා හෙළා දැක්කේ නැහැ. මේ කියන්නේ, අපි රජයේ සේවකයන්ගෙන් පළි ගත්තා කියලායි. සිද්ධි එකක් දෙකක් සිදු වුණු බව අපි දන්නවා. තමුන්නාන්සේලාගේම රජයට ගැතිකම් කරපු, හෙංචයියලා වාගේ වැඩ කළ එක්කෙනකුට, දෙදෙනකුට අපේ කාලයේ හිරේ යන්න සිදු වුණා. ඒක වළක්වන්න බැහැ. යහ පාලනය කියන්නේ ඒක තමයි. මම අවුරුදු 40ක් රජයේ සේවයේ සිටියා. අපේ රාජ්‍ය සේවයේ අනිවාර්යයෙන්ම සියයට 25ක් පමණ ඉන්නවා දූෂණයට කැමැති අය; පගාවට, අල්ලසට කැමැති අය; පාන් ගෙඩියක්, කුකුළෙක් දුන්නත් කන්න කැමැති අය. ඒක බොරුවක් නොවෙයි. අපට ඒක පිළිගන්න වෙනවා. රජයේ සේවකයන් හුරතල් කරලා, ඔවුන් එක්ක එකතුවෙලා හොරකම් කරන එක රජයේ සේවකයා ආරක්ෂා කිරීමක් හැටියට මම දකින්නේ නැහැ.

[ගරු ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා]

ඊළඟට, ජාතික ආරක්ෂාව ගැන කථා කරලා තිබුණා. ඒ කියපු බොහෝ දේවල් මම පිළිගන්නේ නැහැ; අනුමත කරන්නේ නැහැ; ඇත්තයි කියලා පිළිගන්නේ නැහැ. අය වැය කාරක සභා අවස්ථාවේදී ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මම ඒ පිළිබඳව විස්තරාත්මකව කථා කරනවා.

අද රටේ මතු වෙලා තිබෙන කොවිඩ් - 19 වසංගතය ගැනත් මම කියන්න ඕනෑ. මේ සභාවේ වෛද්‍යවරු බොහෝදෙනෙක් ඉන්නවා. කොවිඩ් වසංගතය ගැන මම මීට පෙරත් කථා කළා. මේ තුළින් අපි කාලකණ්ණි සතුටක් ලබන්නේ නැහැ. මේකෙන් අපටත් පාඩුයි. අපටත් දුෂ්කරතා තිබෙනවා. අපේ ඡන්දදායකයන් අමාරුවේ වැටිලායි ඉන්නේ. කිසි කෙනෙක් සතුටක් ලබන්නේ නැහැ. නමුත් අපි කියන්නේ, දැන් ටිකක් දුර බලලා වැඩ කරන්න කියලායි. පොඩි පාලනයක් සිද්ධ වෙමින් යනවා. එය සතුටට කාරණයක්.

මම කලින් කථා කළා, එන්නතක් ගැන. මම අහගෙන සිටියා, අද නාමල් රාජපක්ෂ ඇමතිතුමා බොහොම සැහැල්ලුවෙන් කියනවා, "තවම එය පරීක්ෂණ මට්ටමේ තිබෙන්නේ, ඒ ගැන මොනවත් කරන්න ඕනෑ නැහැ, දැන්ම ඒක පාවිච්චි කරන්න බැහැ, අපේ අය guinea pigsලා කරන්න බැහැ" කියලා. එහෙම නොවෙයි. මම එදා මේ ගැන විස්තරාත්මකව කිව්වා. ඇමෙරිකාව වැනි රටවල තරු හතරේ ජනරාල් කෙනෙක් පත් කරලා තිබෙනවා, ඇමෙරිකානු යුද හමුදාවේ මානුෂීය සංවර්ධනය සඳහා තිබෙන දෙපාර්තමේන්තුවට. ඒ මුළු දෙපාර්තමේන්තුවම දමලා මැයි මාසයේ සිට ඒ ගොල්ලෝ වැඩ කරගෙන යනවා, කවදා හෝ දවසක ඒ එන්නත සාර්ථක වුණාම එය පාවිච්චි කරන්න. මිලියන 300ක ජනගහනයක් ඉන්න රටේ ඒ සඳහා ඩොලර් බිලියන 26ක් වෙන් කර තිබෙනවා. අපේ ජනගහනය එයින් පහළොවෙන් එකයි. අපටත් ඩොලර් බිලියන එකහමාරක්වත් අවශ්‍ය වෙයි. ඩොලර් බිලියන 1ක් කියන්නේ රුපියල් බිලියන 180ක්. තමුන්නාන්සේලාගේ අය වැයෙන් කොවිඩ් - 19 පාලනය කිරීම සඳහා රුපියල් බිලියන 16ක් වෙන් කර තිබෙනවා. ඒ කියන්නේ මේ අංශය ගැන හිතලා නැහැ කියන එකයි. ස්ථාන 1,000ක මේ එන්නත පාවිච්චි කරන්න පුළුවන්ද කියලා එදා වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ රාජ්‍ය ඇමතිතුමියගෙන් මම ඇහුවාම එතුමිය සැහැල්ලුවෙන් කිව්වා, "ඔව්, අපට පුළුවන්" කියලා. නමුත් මා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාට කථා කළාම එතුමා කිව්වා, සෘණ 80 උෂ්ණත්වයේ තබා ගැනීමේ පහසුකම් තිබෙන්නේ දැනට අපේ රටේ PCR කරන ස්ථානවල විතරයි කියලා. එතකොට ඒවා කියන තරම් ලේසි නැහැ. ඇමෙරිකාව කියන්නේ, එන්නත ලබා දීමේදී දුෂ්කරම දේ තමයි අවශ්‍ය තැනට වෙලාවට ජනතාව ගෙන්වා ගන්න එක කියලා. ඒවා සැලසුම් කර ගන්න ඕනෑ. එහෙම සැලසුම් නොකර ඉඳලා හරියට අම්මා කෙනෙකුට දරුවෙක් හම්බ වෙන්න ඉන්නවා වාගේ, එහෙම නැත්නම් අත දරුවෙකුට එන්නතක් ගහනවා වාගේ මේක කරන්න බැහැ. ඒ නිසා මේ කටයුත්ත හොඳින් සැලසුම් කරන්න ඕනෑ. ඒ බරපතළකම ගැන තේරුම් අරගෙන නොතිබීම ගැන අපි කනගාටු වෙනවා. අඩුම තරමින් රුපියල් බිලියන 200ක්වත් පන්නලා යන වැඩකට රුපියල් බිලියන 18ක් වෙන් කරගෙන තිබෙනවා. අපි දැන් හොඳට කකුල් දෙක වන වනා ඉන්නවා, එන්නත ආවාම ගහනවා කියලා. එහෙම බැහැ. මේ වෙනකොට අපි ඒකට සූදානම් වෙලා ඉන්න ඕනෑ. ඒ රටවල නම් ඒවාට හෙලිකොප්ටර් යොදවලා තිබෙනවා; නම් කරලා තිබෙනවා; ඒ බෙහෙත තැනින් තැනට බෙදන්න "FedEx" කියන ආයතනය ලෑස්ති වෙලා ඉන්නවා . ඒක විශාල කර්තව්‍යයක්. මෙතැන වාඩි වී සිටින වෛද්‍යතුමාත් සමඟ මම මේ ගැන කථා කළාම කිව්වා,"අපි දින දෙකක් සාකච්ඡා කළා" කියලා. දින දෙකක් සාකච්ඡා කරලා මේක කරන්න බැහැ වෛද්‍යතුමනි. ඒ රටවල් මාස 7, 8ක් තිස්සේ ලෑස්ති වෙනවා. තමුන්නාන්සේලාගේ ලේකම්තුමා මට කිව්වා, අගෝස්තු මාසයේ ඉඳලා මේ ගැන යම් කිසි සාකච්ඡාවක් කරගෙන යනවා කියලා. තමුන්නාන්සේලා මේවාට මුදල් වෙන් කිරීම තාත්විකද, ප්‍රායෝගිකද කියන එක ගැන අපට සැකයක් තිබෙනවා. නගර 20කින් හතරක් හදන්න යටිතල පහසුකම් සඳහා රුපියල් මිලියන 1000යි. යටිතල පහසුකම්වලට වෙන් කරපු මිලියන 1000කින් විශ්වවිද්‍යාල 4ක් හදන්න පුළුවන්ද? මේවා කොළයකට පමණයි සීමා වෙන්නේ. මහ නගර සහ නගර සභා ප්‍රදේශවලට ඇවිදින මංතීරු, බාහිර විවේකී පරිසර හදන්න රුපියල් මිලියන 2000යි. මහනගර සහ නගර සභා ප්‍රදේශ 65ක් තිබෙනවා. එතකොට එකකට රුපියල් මිලියන 30ක් විතර යනවා. තමුන්නාන්සේලා දන්නවා ව්‍යාපෘති කරන්න ගියාම ප්‍රාදේශීය සභා මට්ටමින් කොච්චර හොරකම් වෙනවාද, කොච්චර මුදල් නාස්තියක් වෙනවාද කියලා. මේ අවස්ථාවේදී, 2021 වර්ෂයේ අපේ රටට අවශ්‍ය මංතීරු ද, නැත්නම් විවේක ගන්න ස්ථානද? අපේ ජනතාවට ගෙයින් එළියට යන්න විධියක් නැහැ, පාරකට යන්න බැහැ. ඒ නිසා මෙහෙම මුදලක් මංතීරු හදන්න වැය කරනවාට වඩා කොවිඩ් වසංගතයෙන් පීඩාවට පත් වෙලා ඉන්න ජනතාවට මේ මුදල් දීලා සහන දෙනවා නම් හොඳයි. ඒ වාගේ නිවැරැදි තැනට මේ මුදල් යොමු කරන්න. බොරුවට මෙතැන සුරංගනා කථා කියන්න එපා.

ඊළඟට ගමට සහන දෙනවා, පාරවල් හදනවා කියනවා. කිලෝමීටර 50,000ට රුපියල් මිලියන 2000යි. ඒ කියන්නේ කිලෝමීටරයකට රුපියල් ලක්ෂ හතරයි. අඩි 8ක් පළල පාරකට මීටර 100කට කොන්ක්‍රීට් දාන්න රුපියල් ලක්ෂ හතරක් යනවා. එතකොට කිලෝමීටරයකට ලක්ෂ හතරයි. ඒ වාගේ සුරංගනා කථා කිව්වා. මේවා අගමැතිතුමාට ලියලා දෙන්නේ කවුද දන්නේ නැහැ. මේවා අගමැතිතුමාට කවුරු හෝ ලියලා දෙනවා. ඉතින් අගමැතිතුමා ඇවිල්ලා මේවා කියවනවා. අපරාදේ! මේවා කියලා තමුන්නාන්සේලාට මේ රටේ ජනතාව මුළා කරන්න බැහැ. ජනතාව මේවා අහගෙන ඉන්නවා. ජනතාව දන්නවා, ඒ ගොල්ලන්ගේ ගමේ පාරක් හදන්න කොච්චර මුදලක් ගියාද කියලා. රුපියල් ලක්ෂ හතරක් දුන්නත් අපි දන්නවා මීටර 100කට කොන්ක්‍රීට් දමන්නේ නැහැ, ඒකෙන් භාගයකටත් වඩා මුදලක් ප්‍රාදේශීය සභා මන්ත්‍රී හොරකම් කරනවා කියලා. කොන්ත්‍රාත් කරන්නේත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීලා. තමුන්නාන්සේලා යටතේ තමයි හුඟක් ප්‍රාදේශීය සභා තිබෙන්නේත්. මේක තමයි යථාර්ථය.

ඊළඟට, මගේ කථාව පොඩ්ඩක් වෙන පැත්තකට ගෙන යන්න ඕනෑ. අද රට තුළ "සෞභාග්‍යයේ දැක්ම" තමයි විශාල මාතෘකාවක් වෙලා තිබෙන්නේ. අපේ අගමැතිතුමා අය වැය කථාවේදී පැවසුවේත් සෞභාග්‍යයේ දැක්මට අනුකූලව ස්වාභාවික පරිසරයට සංවේදීව එය පෝෂණය කරමින් සංවර්ධන කටයුතු කළ යුතුයි කියන එකයි. ඒක තමයි අගමැතිතුමාගේ මතය. අපි ඒකට කැමැතියි. අපි ඒකට සහාය දෙනවා. නමුත් මම තව දෙයක් කියන්න ඕනෑ. රටක් ගොඩනඟනවා කියන්නේ, ජාතියක් ගොඩනඟනවා කියන්නේ අය වැය හරියට ඉදිරිපත් කරලා සංවර්ධන කටයුතු ටිකක් කරනවා කියන එක පමණක් නොවෙයි. ජාතියක් ගොඩනඟන්න නම්, මේ රටේ අපේ ආදරණීය ජනතාව ජීවත් වෙන්න නම්, ඉස්සෙල්ලාම ජනතාවට පරිසරයක් හදා දෙන්න ඕනෑ කියන කාරණය මම තරයේ විශ්වාස කරනවා. සත්‍යවාදීව, අවංකව, ආත්ම ගරුත්වය රැක ගෙන ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් ජනතාවට හදා දෙන්න ඕනෑ. ඒක ජාතිය ගොඩනැඟීමට තිබෙන මූලික අඩිතාලමක් හැටියටයි මම දකින්නේ. තමුන්නාන්සේලා දන්නේ නැහැ, එවන් පරිසරයක් අපේ රටේ නැති බව. ආර්ථිකයට සම්බන්ධ ගණන් හැදුවා කියලා ජාතියක් ගොඩනඟන්න බැහැ.

ලෝකයේ සමහර දියුණු රටවල පාසල්වල පළමුවැනි පන්තියේදී, දෙවැනි පන්තියේදී, තුන්වැනි පන්තියේදී විෂයන් උගන්වන්නේ නැහැ. ඒ ගොල්ලන් ඒ දරුවන්ට උගන්වන්නේ, ඇත්ත කථා කරන්නයි; හොරකම් නොකර ඉන්නයි. සදාචාරාත්මකව හැසිරෙන්නේ කොහොමද, සිරිත්-විරිත්

කොහොමද, අවංක ජීවිතයක් ගොඩනඟා ගන්නේ කොහොමද, වටිනා පුරවැසියෙක් වෙන්නේ කොහොමද කියන ඒවා විතරයි උගන්වන්නේ. අපේ රටත් එතැනට ගෙනියන්න ඕනෑ. එහෙම නැත්නම් හැම දාම ආණ්ඩු මාරු වෙනවා, අය වැය ඉදිරිපත් කරනවා, මෙතැනට ඇවිල්ලා කුණුහරුප කියා කියා බැණ ගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මීට කලින් කථිකයෙක් කථා කළා. එතුමා සජිත් ප්‍රේමදාස මැතිතුමාට බැණපු එක විතරයි කළේ. ඒ වාගේ වේලාව නාස්ති කරලා අපට රට හදන්න බැහැ. මෙතැනදී දේශපාලනඥයන් ජාතිය ගොඩනඟන්න ඉස්සෙල්ලා නායකත්වය දිය යුත්තේ පරිසරය හැදීමටයි. මම කියපු ආකාරයට අපේ රටේ ජනතාවට ජීවත් වෙන්න දේශපාලනඥයන් තමයි පරිසරය හදා දිය යුත්තේ. පරිසරය හැදීමේ වගකීම අපට ගන්න වෙනවා. අපි දැනට ඒක කරන්නේ නැහැ. අපි දන්නවා, එක එක දූෂණ කටයුතුවලට සම්බන්ධ හුඟ දෙනෙක් මේ පාර්ලිමේන්තුවේත් ඉන්නවා කියලා. නොයෙක් අපරාධ කරන, නොයෙක් ජාතියේ මිනිසුන් මෙතැනට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේ අයත් එක්ක අපට මේවා කරන්න බැහැ.

අපි දන්නවා ජනාධිපතිතුමා ජාතිය හැදීමට සෞභාග්‍යයේ දැක්ම තුළින් පොරොන්දු විශාල සංඛ්‍යාවක් දුන් බව. ඒකේ ආකර්ෂණීය පොරොන්දුවක් තිබුණා. අපි එකට හමුදාවේ හිටපු අය නිසා මාත් හිතුවා එතුමා ඒක කරයි කියලා. අපි නිල ඇඳුමක් ඇඳලා තිබෙනවා. එතුමා කිව්වා සැමට එක නීතියක්, රටට එක නීතියක් කියලා. නමුත් ඒවා එකක්වත් කෙරෙන්නේ නැහැ. ඒවා පුස්සක් වෙලා.

මෙතැනදී මම ප්‍රධාන වශයෙන් දෙයක් දකිනවා. පිල්ලෙයාන් මන්ත්‍රීතුමා ගැන ගරු මන්ත්‍රීවරයෙක් කථා කළා. ලෝකයේ මොන රටේද, රක්ෂිත බන්ධනාගාරයේ සිටින කෙනෙක් ගිහිල්ලා විවෘත කිරීමේ උත්සවවලට සහභාගි වෙන්නේ? ලෝකයේ මොන රටේද ඒ වාගේ කෙනෙක් ඔෆිස් එකකට වෙලා එළියේ දේශපාලනයක් කරන්නේ? තමුන්නාන්සේලාගේ රජය මේවා දැක දැක නිකම් ඉන්නවා. තමුන්නාන්සේලා මේවාට වග කියන්න ඕනෑ. ප්‍රේමලාල් ජයසේකර මන්ත්‍රීතුමා එක්ක මට පෞද්ගලිකව කිසි තරහක් නැහැ. නමුත් මිනී මැරුමකට මරණීය දණ්ඩනය නියම වුණා නම්, පාර්ලිමේන්තුවට ඇවිල්ලා වැඩ කරන්න දෙන්නේ මොන රටේද? මෙතැන ගරු කථානායකතුමා නැහැ. නමුත් මම මෙතැනදී යෝජනාවක් කරන්න කැමැතියි. අපි පාර්ලිමේන්තුවේ පිටුපස යකඩ පොලු දමලා කූඩු තුන-හතරක් හදමු, සිරකරුවන් තබන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පසුව අපි මෙතැනම පෝරකයකුත් සවි කරමු. ඕනෑ නම් ඒක වටපිට බලා හොඳින් පෙනෙන තැනකම සවි කරන්නත් පුළුවන්. එතකොට මිනීමරුවෝ ගෙනා ගමන් ඕනෑම වේලාවක 'ටක් ගාලා' වැඩේ දෙන්නත් පුළුවන්, හිටපු ගමන්ම. නමුත්, මම කලින් කියපු ආකාරයේ වැඩ කරන්න එපා. එහෙම කරන එකෙන් අපේ රටේ සදාචාරය කෙළෙසෙනවා.

තමුන්නාන්සේලාට ඕනෑ ජාතිය ගොඩගන්නයි. අපි උදාහරණාත්මකව, ආදර්ශවත්ව රටේ දරුවන්ට පෙනෙන්න ජීවත් වෙන්න ඕනෑ. ඒවා කරන්නේ නැතුව තමුන්නාන්සේලාට රට ගොඩනඟන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

පාස්කු ප්‍රහාරය සිදු කළ අයට ගරු ජනාධිපතිතුමා දඬුවම් දෙයි කියලා අපි බලාපොරොත්තු වුණා. ඒ කාලයේ බැඳුම්කරය විකුණුවා. අද වනතුරු ඒ සම්බන්ධව මොකුත් කරලා නැහැ. පාස්කු ප්‍රහාරයට සම්බන්ධයි කියලා කොහේද හිටපු දෙතුන්-දෙනෙක් පුහුණුවීම් කළා කියලා අල්ලා ගෙන ඇවිත් සිටින බව අපි දන්නවා. වෙන මොනවත් කරලා නැහැ. එක්කෝ තමුන්නාන්සේලා ජනතාව රැවටුවා. එහෙම නැත්නම් තමුන්නාන්සේලා එම පොරොන්දු ඉෂ්ට කරලා නැහැ. ඒ දෙකෙන් එකක් සිද්ධ වෙලා තිබෙනවා.

අපි දකිනවා, දැන් සංඝයා වහන්සේලා තමුන්නාන්සේලාගේ රජයට විරුද්ධව නැඟී සිටින බව. ඒ, තමුන්නාන්සේලා බලයට ගෙනෙන්න ඉදිරිපත් වුණු සංඝයා වහන්සේලා. අද වනවිට ජනතාව අභයාරාමය වට කර තිබෙනවා. මම දැක්කා, මුරුත්තෙට්ටුවේ හාමුදුරුවෝ කථා කරනවා. තමුන්නාන්සේලා වෙනුවෙන් කැප වුණු ඇල්ලේ ගුණවංශ, මුරුත්තෙට්ටුවේ ආනන්ද, මැඩිල්ලේ පඤ්ඤාලෝක වැනි සංඝයාවහන්සේලා කිහිපනමක් කළ ප්‍රකාශ 2020 ඔක්තෝබර් මස 17 වැනි සෙනසුරාදා "දිවයින" පුවත් පතේ 13 වැනි පිටුවේ තිබෙනවා. මම එය **සභාගත*** කරනවා.

ඊළඟට, 'වියත් මඟ' ගැන මම වචනයක් කියන්නම ඕනෑ. මෙතැන මා ඉදිරියේ 'වියත් මඟේ' බොහෝ අය වාඩි වෙලා ඉන්නවා. 'වියත් මඟ' කියන වචන දෙක දැක්කාම, තමුන්නාන්සේලා පාර්ලිමේන්තුවට එනකොට අපි හිතුවා, ඔබතුමන්ලා මොනවා හෝ වෙනසක් කරයි කියලා. නමුත් කනගාටුවෙන් වුණත් මේ කාරණය කියන්න වෙනවා. තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂියට කථා කරලා බලන්න. අද 'වියත් මඟ' පසුපස බංකුවේ වාඩි වෙලා ඉන්නවා. තමුන්නාන්සේලාට විනාඩි තුනක්-හතරක් කථා කරන්න හම්බ වෙනවා. අට පාස් කට්ටිය ඉස්සරහ පේළිවල ඉන්නවා. ඒ ගොල්ලන්ට විනාඩි තිහ- [බාධා කිරීමක්] මේකේ අට පාස් අය පෝලිමක් ඉන්නවා. ඒ ගොල්ලන්ට විනාඩි තිහ-හතළිහ කථා කරන්න හම්බ වෙනවා. 'වියත් මඟ' නමින් ඇවිල්ලා තමුන්නාන්සේලා කරපු වෙනස මොකක්ද?

ගරු අලි සබ්‍රි ඇමතිතුමාට මම පෞද්ගලිකව ගරු කරනවා. ජාති, ආගම් භේදයකින් තොරව එතුමා මේ රටට හම්බ වෙලා තිබෙන සම්පතක්. එතුමාට හොඳ ප්‍රතිරූපයක් තිබෙනවා. එතුමා රටට සේවයක් කරන්න පුළුවන් ඇමතිවරයෙක්; වටිනා චරිතයක්. නමුත් අද එතුමාත් 'වියත් මඟ' හරහා ඇවිල්ලා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වෙලා මෙතැන ඉන්නවා. එතුමාටත් කඩේ යන්න සිද්ධ වෙලා තිබෙනවා. කඩේ යෑමේ දේශපාලනයට එකතු වෙන්න එතුමාටත්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා]

සිද්ධ වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාට මේවා වෙනස් කරන්න පුළුවන් නම් හොඳයි. තමුන්නාන්සේලා මේවා හදා ගන්න. නැත්නම් තමුන්නාන්සේලාගේ ඉතුරු කාලයත් පසුගිය ආණ්ඩු වාගේම ගෙවිලා යයි.

ඊළඟට, පරිසර විනාශය ගැනත් කියන්න ඕනෑ. මට තව විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ජනාධිපතිතුමා කොච්චර කථා කළත් පරිසර විනාශය දිගටම සිදු වෙනවා. ඒක සිංහරාජයෙන් පටන් ගත්තා. ජනාධිපති කියනවා, ඒ සම්බන්ධ ඇමතිලා ඉන්නකොට කැලෑ කපන තැන්වල ගිහිල්ලා හිටගෙන ඉන්න මට බැහැ කියලා. ඒකද, ජනාධිපති කෙනෙකුගෙන් අපි බලාපොරොත්තු වුණේ?

කුණු කඳු සම්බන්ධයෙන් නම් ජනාධිපතිතුමා අතීතයේදී යමක් කළා, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හැටියට සිටියදී. අද වනකොට අලි ඇවිල්ලා රට හැම තැනම කුණු ගොඩවල් කන හැටි අපි දකිනවා. අලි මැරෙනවා. ඒවාට මොනවා හරි කරන්න කියලා අපි එතුමාට මතක් කරලා දෙන්න ඕනෑ.

ඊළඟට, එතුමා දිගටම MCC ගිවිසුම ගැන කථා කළා, තමුන්නාන්සේලාගේ මැතිවරණ ව්‍යාපාරවල. ඒක අවලංගු කරන්න තමුන්නාන්සේලා හිතලාවත් නැහැ. තමුන්නාන්සේලා අනිවාර්යයෙන් ඒ ගිවිසුම අත්සන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මට තව පොඩි වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

රාජ්‍ය දේපළ විකිණීම නැවතත් පටන් ගත්තා. යුද හමුදා මූලස්ථානයේ අක්කර තුනහමාරක් විකුණලායි ඒක පටන් ගත්තේ. ජනාධිපති පත් වෙලා මාසයක් ඇතුළත ඒක සිද්ධ වුණා.

ඊළඟට, ජනාධිපතිතුමා කමිටුවක් පත් කළා. ඒ, "ගුණරුවන් කමිටුව" අපි උත්සාහ කළා, ප්‍රවාහන තදබදය නවත්වා ගන්න. "ගුණරුවන් කමිටුව" කියලා කමිටුවක් පත් කරලා තමුන්නාන්සේලා කමිටුවලට හෙංචියෙන් දමා ගන්නවා. ගුණරුවන් කමිටුවේ ගුණරුවන් මහත්මයා කියපු දේවල් දැක්කාම අපට ලජ්ජයි. ඒ මහාචාර්යවරයෙක්ද? මොනවාද කිව්වේ? උඩින් යන line එක නිසා කන්ටේනර් පාරට දමන්න බැහැ කිව්වා. ලෝකයේ හැම තැනම ප්‍රධාන නගරවල ධාවනය වන දුම්රිය උඩින් තමයි යන්නේ. අඩු ගණනේ දිල්ලියට ගියා නම් බලා ගන්න පුළුවන්. කන්ටේනර් දමන්න බැහැ කිව්වා. රේල් ගේට්ටු දමන්න පුළුවන් කිව්වා, පහළට ගෙනැල්ලා. එතකොට වාහන තදබදය අඩු වෙනවාද?

ඊළඟට, එතුමා වෙලාව ගැන කථා කළා. එතුමාට තේරෙන්නේ නැහැ, එවැනි දුම්රියක් විනාඩි තුනකට විතර නවත්වනවා, ඊට පසුව වේගයෙන් කඩාගෙන යනවා කියන එක. එතුමා දැන් රූපවාහිනියට ඇවිල්ලා කියනවා, මා කථා කළේ ඒ ගැන නොවෙයි, Keleniweli Line එක ගැන කියලා. වල්ගෙ පාගාගෙන ඇවිල්ලා ජනාධිපතිට brief කරලා. ඒ වාගේ දේවල් කරලා ජනතාව හිනස්සවන්න එපා. තමුන්නාන්සේලා මේ විධියට වැඩ කළොත්, තමුන්නාන්සේලාගේ සෞභාග්‍යයේ දැක්ම, සෞභාග්‍යයේ හීන දැක්මක් බවට පත් වෙයි. දේශපාලනඥයෝ බොරු කරලා තිබෙනවා, ආණ්ඩු බොරු කරලා තිබෙනවා, තමුන්නාන්සේලා ඒවා ගැන කථා කර කර කාලය කාලා වැඩක් නැහැ. තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂියට එකඟව තමුන්නාන්සේලාට අවංකව වැඩක් කරන්න පුළුවන් නම් කරන්න. ජය වේවා!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රාමේෂ්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.22]

**ගරු එම්. රාමේෂ්වරන් මහතා**
(மாண்புமிகு எம். ராமேஷ்வரன்)
(The Hon. M. Rameshwaran)
நன்றி. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டினுடைய பிரதமரும் நிதியமைச்சருமான மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ அவர்கள் இந்நாட்டு மக்களுக்கு நல்லதொரு வரவு செலவுத்திட்டத்தைச் சபையிலே சமர்ப் பித்தார். அதிலே, மலையகம் தொடர்பான முக்கிய இரண்டு முன்மொழிவுகளைச் செய்திருக்கிறார். ஒன்று, பெருந்தோட்ட மக்களுக்கு 1,000 ரூபாய் சம்பளம்; மற்றது, மறைந்த தலைவர் ஆறுமுகன் தொண்டமான் ஐயா அவர்கள் கேட்டதற்கிணங்க, நுவரெலியா மாவட்டத்திற்கு ஒரு பல்கலைக்கழகம்! அதற்காக முதலிலே எனது நன்றியைக் கூறிக்கொள்கின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතුකරයේ ජනතාවගේ රුපියල් දහසක දෛනික වැටුප ගැන විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා තමයි වැඩිපුරම කථා කළේ, "අය වැය ලේඛනයේ මුදල් ඇමතිතුමා සඳහන් කරලා තිබෙනවා, රුපියල් දහසක් කොහොමද දෙන්නේ?" කියලා. අපි එතුමන්ලාට මතක් කරන්න කැමැතියි, යහ පාලන ආණ්ඩුවේ අය තමයි මැතිවරණය කාලයේ කිව්වේ, අපි බලයට පත් වුණාම වතුකරයේ ජනතාවට රුපියල් දහසක දෛනික වැටුපක් දෙනවා කියලා. අවුරුදු හතරහමාරක් බලයේ හිටියා, වතුකරයේ ජනතාවට රුපියල් පණහක්වත් වැඩිපුර දෙන්න ඒ ගොල්ලන්ට බැරි වුණා. රුපියල් දහසක් දෙනවා කිව්වා. භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 600ක් වෙන් කරලා තිබෙනවා කිව්වා, ඒ අයට රුපියල් පණහක් වැඩිපුර ගෙවන්න. 10වැනි දා දෙනවා කිව්වා, 15වැනි දා දෙනවා කිව්වා, අවුරුදු හතරහමාරක් ඉවර වනතෙක් ඒක දෙන්න එතුමන්ලාට බැරි වුණා.

ඒ වාගේම, අධ්‍යාපනය ගැන කථා කළා. ගුරු හිඟයක් තිබෙනවා කිව්වා, වතුකරයේ පාසල් පටන් ගන්න ඕනෑ කිව්වා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ වතුකරයට කියලා වෙනම මුදල් වෙන් කළේ නැහැ. අනෙක් පළාත්වලට වැඩ කරන විධියටම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා වතුකරයේ ජනතාවටත් විශේෂ සැලකිල්ලක් දැක්වූවා. මහින්දෝදය පාසල් ඇති කළා; ගුරු පත්වීම් දුන්නා. ඒ වාගේම, අනෙක් අයට මෙන්ම වතුකරයේ තරුණ තරුණියන්ටත් රාජ්‍ය සේවයට එන්න අවස්ථාවක් දුන්නා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ ගුරු පත්වීම් 3,000ක් දුන්නා. අවුරුදු හතරහමාරක් ගත වෙනකල් යහ පාලන ආණ්ඩුවට ගුරු පත්වීම් දෙන්න බැරි වුණා. අපේ ආණ්ඩුව කාලයේ, මීට මාස දෙකකට ඉස්සෙල්ලා ගරු ජීවන් තොණ්ඩමන් මැතිතුමා කථා කරලා ගුරු පත්වීම් අරගෙන දුන්නා.

එදා අපේ මුදල් ඇමතිතුමා වතුකරයේ ජනතාවට රුපියල් 1,000ක දෛනික වැටුපක් දෙනවා කිව්වා. නමුත්, මේ අයට ඒවා

කරන්න බැරි වුණා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ, එනම්, අපේ ආණ්ඩු කාලයේ තමයි වතුකරයේ ජනතාවට විශේෂ සැලකිල්ලක් දැක්වුවේ. එම නිසා අපි විපක්ෂයට කියන්න ඕනෑ, අපේ ආණ්ඩුව කාලයේ රුපියල් 1,000ක දෛනික වැටුපක් වාගේම, නිවාස වැඩසටහනත්, යටිතල පහසුකම් දියුණු කිරීමේ වැඩසටහනත් ක්‍රියාත්මක කරනවා කියලා. විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේ කාලයේ, අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ පළමු අවුරුදු 5 තුළ වතුකරයේ ජනතාව වෙනුවෙන් අපි ඒ විධියට වැඩ කරන බව කියමින්, මේ පිළිබඳව අපි වතු සමාගම් සමඟ සාකච්ඡා කර තිබෙන බවත් කියන්නට ඕනෑ. තොණ්ඩමන් ඇමතිතුමා ඉන්නකොට රුපියල් 1,000 ගැන කථා කළා. ඊට පස්සේ ජීවන් තොණ්ඩමන් මැතිතුමාගේ නායකත්වයෙන් අපි ගිහිල්ලා සාකච්ඡා කළා. විශේෂයෙන්ම ජනාධිපතිතුමා සහ අගමැතිතුමා කිව්ව විධියට අපි වතුකරයේ ජනතාවට ඉදිරියේදී රුපියල් 1,000ක දෛනික වැටුපක් අරගෙන දෙනවා.

පසුගිය අවුරුදු හතරහමාර තුළ වතුකරයේ ජනතාව වෙනුවෙන් මොන වගේ වැඩද කරලා දුන්නේ කියලා අපි එතුමන්ලාගෙන් අහන්න කැමැතියි. එහෙම වැඩ කරන්න යහ පාලන ආණ්ඩුවට අමතක වුණා. එතුමන්ලා කියපු ඒවායින් මොනවාද වතුකරයේ ජනතාවට කරලා තිබෙන්නේ කියලා මම අහනවා. වතුකරයේ ජනතාව ගැන කථා කරන්න හැමෝම ආසයි කියලා තමයි හැම දාම කියන්නේ. ඒ මිනිස්සු වෙනම ලෝකයක ඉඳලා ආපු මිනිස්සු නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය දැන් අවසන්.

**ගරු එම්. රාමේෂ්වරන් මහතා**
(மாண்புமிகு எம். ராமேஷ்வரன்)
(The Hon. M. Rameshwaran)
මට තව විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔවුන් මේ රටේම ජීවත් වන මිනිස්සු. ඒ අය තමයි මේ රටට වැඩිපුරම ආදායමක් අරගෙන දෙන්නේ. වතුකරයේ ජනතාවට කවුරුන් හෝ වැඩ කළා නම්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ තමයි වතුකරයේ ජනතාවට වැඩියෙන්ම වැඩ කරලා තිබෙන්නේ. එම නිසා කථා කරන්න ඕනෑ නිසා කථා කරනවා වෙනුවට, ඒ මිනිස්සු ගැන සැලකිල්ලෙන් කථා කරන්න කියමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.28]

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම පළමුවෙන්ම උත්තර දෙන්න ඕනෑ, ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා මගේ නම සඳහන් කරමින් කථා කළ දේ සම්බන්ධයෙන්. හම්බන්තොට වරාය එදා චීනයට විකුණන කොට අපි ගිහිල්ලා උද්ඝෝෂණ කළා. ඒ වෙලාවේ ඒකට අපට විරුද්ධව කථා කළා; ගැහුවා; වතුරවලින් ගැහුවා; කඳුළු ගෑස් ගැහුවා. එහෙම කරලා අපට සෑහෙන්න ප්‍රශ්න ඇති කළා. ඒක ඇත්ත. මම ඒක නැහැයි කියලා කියන්නේ නැහැ. නමුත්, එදා අපි කිව්වේ මොකක්ද? අපි කෑ ගහලා කිව්වා, "මේ වරාය ගන්න එපා, ගත්තොත් අපි නැවත ජනසතු කරනවා" කියලා. අපි ඒක නැවත ජනසතු කරනවා කියලා තමයි එදා අපි කෑ ගහලා කිව්වේ. අපි චීන එම්බසියට කෑ ගහලා කිව්වා, "හම්බන්තොට වරාය ගන්න එපා" කියලා. එදා අපි කඳුළු ගෑස් කෑවේ, එදා අපි වතුර පාරවල් කෑවේ, එදා අපි ගුටි කෑවේ ඒ වරාය විකුණන එක නවත්වාගන්නයි. නමුත්, දැන් එම වරාය ඊටත් වැඩිය හොඳට ක්‍රියාත්මක වෙනවා. මම දන්නවා, ගිවිසුමක් අත්සන් කළාට පස්සේ ඒක වෙනස් කරන්න අමාරුයි කියලා. ඒක අමාරු කාර්යයක්. ඒක අමාරුයි කියන එක මම දන්නවා. නමුත්, අපි එදා කෑ ගැහුවේ එහෙමයි. අඩු ගණනේ අපි ජනතාව මුළා කරන්න හරි කෑ ගහලා කිව්වා, "අපි බලයට ආවාම මේ වරාය ආපසු ගන්නවා" කියලා. නමුත්, අද ගන්නේ නැහැ. අද චීන්නු තවතවත් වැඩි වනවා. මේ රටේ චීන්නු ගොඩක් වැඩි වනවා. මම ඒකත් තමුන්නාන්සේලාට කියන්න ඕනෑ.

අපේ සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා කිව්වා, සැහැල්ලු දුම්රිය මාර්ග පිළිබඳ ලලිතසිරි ගුණරුවන් මහත්මයා කරපු සඳහනක් ගැන. හිටපු ප්‍රවාහන ඇමතිවරයා හැටියට මමත් ඒ ගැන යමක් කියන්න ඕනෑ. එතුමා ඒ කියන්නේ monorail ගැනයි. මා ප්‍රවාහන ඇමතිවරයා හැටියට හිටපු කාලයේත්, අපේ ඩලස් අලහප්පෙරුම මැතිතුමා ප්‍රවාහන ඇමතිවරයා හැටියට හිටපු කාලයේත් අපි monorail ගැන සාකච්ඡා කළා. Monorail එකේ කන්ටේනර් ගෙන යන්නේ නැහැ. මම ප්‍රවාහන ක්ෂේත්‍රය ගැන දන්නා කෙනකු හැටියටයි මේ කියන්නේ. නමුත් ඒවායේ කන්ටේනර් ගෙන යන කතන්දරයක් කියනවා. ඒවායේ කන්ටේනර් ගෙන යන්නේ නැහැ. ඒකේ සම්පූර්ණයෙන්ම යන්නේ මඟීන් විතරයි. ඒක සැහැල්ලු දුම්රියක්. මහා මාර්ගවල ගමනාගමනයේ තද බදයක් තිබෙන නිසා තමයි ඒවා උඩින් යන්නේ. ඒක pillarsවලයි යන්නේ. මම ඇත්තටම කනගාටු වෙනවා, ගුණරුවන් මහත්මයා වාගේ දක්ෂයෙක් එහෙම කියපු එක ගැන. එතුමා දක්ෂයෙක් කියලා මා කියන්න හේතුවක් තිබෙනවා. එතුමා රේල්ලුවේ සාමාන්‍යාධිකාරිවරයා හැටියට සිටියා. ඊට පස්සේ ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් හැටියට සිටියා. මම ප්‍රවාහන ඇමතිවරයා හැටියට සිටින කොටත් එතුමා එහි ලේකම් වශයෙන් සිටියා. ඊට පස්සේ විශේෂ උපදේශකයකු හැටියට සිටියා. එතුමා සෑහෙන කාලයක් මේ ක්ෂේත්‍රයේ සිටියා. එහෙම නම්, එතුමා සිටි කාලයේදී ඒවා කරන්න එතුමාට තිබුණා නේ. දැන් විවේචන එල්ල කරන්නේ ඇයි? ඒ කාලයේ ඒක කරන්න එතුමාට අවස්ථාව තිබුණා. මම ඒකත් තමුන්නාන්සේලාට කියන්න ඕනෑ.

වතුකරයේ ජනතාවට දෛනික වැටුප රුපියල් 1,000ක් දෙන එක ගැනත් දැන් කථා වුණා. ඒ යෝජනාව ගැන මම බෙහෙවින්ම සන්තෝෂ වනවා, හිටපු වතු අධිකාරිවරයකු හැටියට. අද රුපියල් 1,000ක් කියන එක ඇත්තටම වතු කම්කරුවාට මදි. අද මේ තිබෙන ජීවන තත්ත්වයත් එක්ක වතු කම්කරුවාට අඩු ගණනේ රුපියල් 1,500ක්වත් දෙන්න ඕනෑ. වතු කම්කරුවෙකු වත්තේ වැඩ කරන්නේ නැතිව පිට වැඩට ගියාම කන්නත් දීලා රුපියල් 1,500ක් දෙනවා. එම නිසා දෛනික වැටුප ලෙස රුපියල් 1,000ක් දෙන එක ඉතාම හොඳ වැඩක්. මම තමුන්නාන්සේලාට කියන්න ඕනෑ, මේ Budget එකේදි අපේ අගමැතිතුමා වතු කම්කරුවන්ට දෛනික වැටුප වශයෙන් රුපියල් 1,000ක් දෙන්න යෝජනා කරනවාය කිව්වාම share market එකේ වතු කොම්පැනිවලට අදාළව කොටස් අගය පහත වැටුණු බව. අපේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, එහෙම පහත වැටෙන්න හේතුව මා කියන්නම්. මිනිස්සු දැනගත්තා, දෛනික වැටුප ලෙස ඒ රුපියල් 1,000 දුන් ගමන් ඒ වතු පවත්වාගෙන යන්න බැහැ, ඒ වතු පාඩු ලබනවා කියලා. ඒ නිසා share market එක සම්පූර්ණයෙන්ම වැටුණා. මා ඒකත් තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. මම අගමැතිතුමාට

[ගරු කුමාර වෙල්ගම මහතා]

ගෞරව කරනවා. එතුමා මගේ හිටපු නායකයා. මම තවමත් එතුමාට ආදරය කරනවා. එතුමා හොඳ නායකයෙක්. මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අවුරුදු 40කට කිට්ටු වෙන්න සිටියා. මම එතුමාත් එක්ක සේවය කළා. එතුමාට තිබුණා, වතු හාම්පුතුන් එක්ක කථා කරගෙන ඇවිල්ලා ඒ යෝජනාව කරන්න. දැන් වතු හාම්පුත්තු කියනවා, අපට ඒ මුදල දෙන්න බැහැ කියලා. ඒක තමයි දැන් තිබෙන අලුත්ම තත්ත්වය. ඔවුන් එදාම කිව්වා, දෙන්න බැහැ කියලා. මොකද, ක්ෂේත්‍රය ගැන දන්නා නිසායි මා කියන්නේ. ගිවිසුම අනුව මේ මුදල දෙන්න පුළුවන්ද? වතු සමාගම් අත්සන් කරපු ගිවිසුමක් තිබෙනවා. ඒ ගිවිසුම අනුව ඒ ගොල්ලන්ට බලහත්කාරකම් කරන්න පුළුවන්ද? බලහත්කාරකම් කරන්න බැහැ. මම ඒකත් මේ වෙලාවේ තමුන්නාන්සේලාට කියනවා.

අනෙක් කරුණ තමයි, කළුතරට විශ්වවිද්‍යාලයක් ලබා දෙනවාය කියන කාරණය. මා හිතන විධියට, මම තමයි ගොඩක්ම සන්තෝෂ වන්නේ, කළුතරට විශ්වවිද්‍යාලයක් ගෙනෙන කොට. මම අවුරුදු ගණනාවක් තිස්සේ කළුතර නියෝජනය කරන පරණ මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම මම ඒ ප්‍රදේශයේ උපන් මනුස්සයෙක්. කළුතර ඉපදුණු කෙනකු හැටියට අපේ ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමාත් ඒ යෝජනාව ගැන සන්තෝෂ වෙයි. කළුතරට විශ්වවිද්‍යාලයක් ගේන්න කියලා පළමුවෙන්ම කිව්වේ මම. මම ඒකට සියයට සියයක් කැමැතියි. මම ඒකට අත් දෙකම උස්සනවා. අත් දෙක උස්සනවා විතරක් නොවෙයි, මගේ සම්පූර්ණ ශ්‍රමයත් ලබා දෙනවා. විශ්වවිද්‍යාලයක් හදනවා නම්, අඩු ගණනේ ඒකට ගල් අදින්න හරි මම යනවා. ඒ තරම් මම ඒකට කැමැතියි. නමුත්, ඒ සඳහා වෙන් කර තිබෙන මුදලින් ඒක කරන්න පුළුවන්ද? දැන් අපි හිතමු, ඒ සඳහා වහලා තිබෙන බිල්ඩිමක් ගන්නවා කියලා. එවැනි buildings කොහේද තිබෙන්නේ? අද වහපු buildings නැහැ. දැන් පරණ ඉස්කෝල එකක්වත් නැහැ. පරණ ඉස්කෝල දැන් නැවත ආරම්භ වෙලා. ඉස්සර වහපු ඉස්කෝලත් නැවත ආරම්භ කරලා. විශ්වවිද්‍යාලයක් හදනවා නම්, නමට තියන්නේ නැතිව හරියට හදන්න ඕනෑ.

යෝජනා කරන්නේ කාර්මික විද්‍යාලයක් නම්, ඒක කරන්න පුළුවන්. කාර්මික විද්‍යාලයක් නම් ඒ වෙනුවෙන් මොකක් හෝ කරන්න අපට පුළුවන්. නමුත්, මේක කාර්මික විද්‍යාලයක් නොවෙයි. විශ්වවිද්‍යාලයක් ගැනයි මේ කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීළඟට මා මේ කාරණයත් කියන්න ඕනෑ. මේ Budget එක හැම දාම හදන්නේ කවුද? එකම කණ්ඩායමක් නේ හදන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
අනෙක් කථිකයන්ගෙන් පොඩි වෙලාවක් අරගෙන හෝ පොඩි වෙලාවක් මට දෙන්න.

Budget එක හදන්නේ කවුද? අපේ කාලයේ හැදුවේ කවුද? "අපේ කාලයේ" කියලා මා කියන්නේ, මම යූඑන්පීකාරයෙකු නොවන හින්දායි. මම ඒක කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ හිත රිදුණත් මම කියන්න ඕනෑ, මම යූඑන්පීකාරයෙකු නොවන බව. මම දැන් ඉන්නේ සමගි ජන බලවේගය තුළ. ඒක යූඑන්පී එකට සම්බන්ධ නැහැ. ඒකේ රනිලුත් නැහැ, රවි කරුණානායකත් නැහැ. ඒකේ ඒ කවුරුත් නැහැ. ඒකේ ඉන්නේ අලුත්ම කණ්ඩායමක්. ඒක නිසා මම ඒ පක්ෂයට එකතු වෙලා ඉන්නවා. මම තමුන්නාන්සේලාට කියන්නේ, මේ Budget එක හදන්නේ එකම කණ්ඩායමක් බවයි. එදා මමත් කැබිනට් ඇමතිවරයකු හැටියට ආණ්ඩුවේ ඉන්න කොට විමල් වීරවංශ මහත්මයා කෑ ගහලා කිව්වා, "ආර්ථික ඝාතකයෙක් ගැන." ඒ ගොල්ලෝ තමයි Budget එක හදන්නේ. තමුන්නාන්සේලාගේ යහ පාලන ආණ්ඩුවේ Budget එක හැදුවේ කවුද? ඒ, පොළොවේ පය ගහපු අය නොවෙයි. එතැන නැහැ පොළවේ පය ගහපු අය. පිට රට අය ඇවිල්ලා තමයි මේ රටේ අය වැය හැදුවේ. අපට වැරදුණ තැන මෙතැනයි. අය වැය හදන්නේ හැම දාම එකම කණ්ඩායමක්. ඒ අය ලියලා දෙනවා; මහින්ද මහත්මයා මෙතැනට ඇවිල්ලා කියවනවා; අන්තිමේදී අමාරුවේ වැටෙනවා.

මම කියනවා, මීට වඩා ප්‍රායෝගික වෙන්න කියලා. අපි දැන් මේ රට ගැන හිතන්න ඕනෑ. කොවිඩ්-19 වසංගතය ගැන අපි හිතන්න ඕනෑ. කොවිඩ්-19 පළමු රැල්ල ආ වෙලාවේ ජනාධිපතිතුමාට කවුරුත් ප්‍රශංසා කළා, එය පාලනය කිරීම ගැන. ඒ කාලයේ මහ මැතිවරණය අත ළඟ. මිනිස්සු කිව්වා, "මේ ජනාධිපතිතුමා නිසා අපි මහ මැතිවරණයේදීත් ගෝඨා මහත්තයාට ඡන්දය දෙනවා" කියලා. මහ මැතිවරණයේදී! නමුත්, දැන් වෙලා තිබෙන්නේ මොකක්ද?

'බ්‍රැන්ඩික්ස්' ආයතනයට පිටරටින් -ඉන්දියාවෙන්ද කොහෙද- ආපු කට්ටියක් කොරෝනා අරගෙනමයි ආවේ. මෙහේ ආපු ඒ අය ගැන කිසිම සැලකිල්ලක් දැක්වූයේ නැහැ. ඒ අය දිහා බැලුවේ නැහැ. ඒ අය මෙහේට ගෙනැල්ලා රෝගය බෝ කළා. අද කී දෙනෙක් මැරෙනවාද? හැම දාම හතරක් පහක් මැරෙනවා. මේක, නොසැලකිලිමත්කමයි. මේකට නම් ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරන්නම වෙනවා. එදා කිව්වා, "ආණ්ඩුව හොඳයි" කියලා. අද අපි ඇඟිල්ල දිගු කරලා කියනවා, "මේක ඔයගොල්ලන්ගේ වැරැද්ද නිසා තමයි සිද්ධ වුණේ" කියලා. එදා තමන්ගේ යහළුවන්ගේ factoriesවලට ඉන්දියන්කාරයන් ජංගි මහන්න එක්කරගෙන ආ නිසායි, කොවිඩ්-19 අද මේ තත්ත්වයට ඇවිල්ලා මිනිසුන් මැරෙන්නේ කියලා මම ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට බොහොම ස්තුතියි, මට අවස්ථාව දුන්නාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සාරති දුෂ්මන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.37]

**ගරු සාරති දුෂ්මන්ත මහතා**
(மாண்புமிகுசாரதீதுஷ்மந்த)
(The Hon.Sarathi Dushmantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2021 අය වැය පිළිබඳ අදහස් දක්වමින් මගේ කථාව පටන්ගන්න කැමැතියි, අපේ හිටපු ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ගරු කුමාර වෙල්ගම මැතිතුමා සඳහන් කරපු කාරණයකින්ම. මම විශ්වාස කරනවා, මේ අය වැය ඉදිරියට ගෙන යන කොට වෙනස්වීම් සහිතව, වර්තමාන කාලයට ගැළපෙන අන්දමට අප ඉදිරි කාලය සැලසුම් කළ යුතුයි කියලා.

අපි වතු කම්කරුවන්ගේ ප්‍රශ්නය ගැන මුලින්ම කථා කරමු. ගරු කුමාර වෙල්ගම මැතිතුමනි, ඔබතුමාත් ඒ ගැන කථා කළා. රුපියල් 1,000 කියන මුදල අද කාලය ගත්තාම අප කාටවත් ජීවත් වෙන්න ප්‍රමාණවත් මුදලක් -ලොකු මුදලක්- නොවෙයි. පසුගිය ආණ්ඩුවේ සමහර දේශපාලන නායකයෝ කිව්වා මට මතකයි, රුපියල් 1,500ක් දෙන්නම් කියලා. ඒක කරන්න පුළුවන්ද?

කරන්න බැහැ. හැබැයි, රුපියල් 1,000ක මුදලක් දෙන්න කියලා බොහොම අහිංසක ඉල්ලීමක් තමයි කළේ. ඒක කරන්න පුළුවන්.

එදාට සාපේක්ෂව අද වතුකරයේ පාලකයෝ වතුකරයේ ඉන්න කම්කරුවන්ගේ සුබසාධනය වෙනුවෙන් මුදල් වැය කරන්නේම නැහැ. ගහක් වුණත් කපා ගත්තොත්, එය කොම්පැනිය ශක්තිමත් කරන්න තමයි ගන්නේ. ඒ වතුවල විවිධ අතුරු භෝග වගා කරන්න පුළුවන්. අද වන කොට ඉරිඟුවලට, කහවලට හොඳ මිලක් තිබෙනවා. ඒ නිසා මෙය 'අප වෙනස් වෙමින් යා යුතු කාලයක්' කියන කාරණාව අපට බැහැර කරන්න බැහැ. මම සතුටු වනවා, ඒ රුපියල් දහසේ යෝජනාව ගැන. ඒක ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරණයට යන විට වාගේම, මහ මැතිවරණයේදීත් අපි සියලුදෙනාගේම පොරොන්දුවක් වෙලා තිබුණා. වතු කම්කරුවාගේ දෛනික වැටුප වශයෙන් රුපියල් 1,000 ජනවාරි මාසයේ ඉඳලා ලබා දෙන බවට ආණ්ඩුවක් හැටියට වෙච්ච පොරොන්දුව අපි අකුරටම ඉෂ්ට සිද්ධ කරනවාය කියන එක මේ අවස්ථාවේ මා මතක් කරන්නට ඕනෑ.

පසුගිය කාල සීමාව තුළ රටේ තිබුණු විශාලතම ප්‍රශ්නය මොකක්ද? ඒ, දේශපාලන අස්ථාවරභාවයයි. ඇයි, දේශපාලන අස්ථාවරභාවය ඇති වුණේ? අපේ රටට ආයෝජකයෝ ආවාද? Volkswagen කොම්පැනිය ගැන අද කථා කළා. ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ හොරණ කර්මාන්ත ශාලාවක් ගැන අද උදේ කථා වුණා. ඇයි අපට ආයෝජකයෝ ආවේ නැත්තේ? පසුගිය කාලසීමාවේ බොහොම පැහැදිලි ප්‍රශ්නයක් තිබුණා. ජනාධිපති තනතුරට පත් වුණු තැනැත්තා නොමැතිව අගමැතිවරයා වෙනත් ක්‍රමෝපායන් මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා බලය ලබා ගන්න හදපු උත්සාහය නිසා දේශපාලන අස්ථාවරභාවයක් ඇති වුණා. පසුගිය කාලසීමාව තුළ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති තනතුරට පත්වෙලා තිබුණු ලොකුම අභියෝගය තමයි රටේ දේශපාලන අස්ථාවරභාවය නැති කිරීම. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් අපි ඒක කළා. ඒක ආර්ථිකයටත් බලපානවා. තමුන්නාන්සේලාට මතක ඇති ව්‍යවස්ථාදායක සභාව - Constitutional Council එක - තිබුණා. ඒ වාගේම ආර්ථික සභාවක් තිබුණා. ආර්ථික සභාවේ කවුද හිටියේ? ආර්ථික සභාවට තමුන්නාන්සේලාට ළං වෙන්න පුළුවන් වුණාද? ළං වෙන්න බැරි වුණා. ආර්ථික සභාවේ හිටියේ කාගේ මිනිස්සුද කියන එක තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂිය දන්නවා. රටේ තිබුණු දේශපාලන අස්ථාවරභාවය නිසා රටට ආයෝජනයක් ආවේ නැහැ. මේ වාගේ ප්‍රශ්න රාශියක් එක්ක තමයි මේ රට ඉස්සරහට ගියේ. ව්‍යවස්ථාදායක සභාව කියලා එකක් තිබුණා. ඔය ස්වාධීනයි කියලා කියපු හැම කොමිෂන් සභාවකටම ඒකෙන් තමයි නිලධාරින් පත් කරන්න කටයුතු කළේ. හැබැයි, ඒවායේ ස්වාධීනත්වය ගැනත් අපේ හෘදය සාක්ෂිය දන්නවා. ඒ තිබුණු ප්‍රධාන ගැටලුව අද වෙනකොට අවසාන කරලායි තිබෙන්නේ. ඒ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති වුණු ප්‍රශ්න කන්දරාව. අද ජනාධිපතිතුමාට බලය දීලා තිබෙනවා. එදා අගමැතිතුමාට, කථානායකතුමාට මේ පාර්ලිමේන්තුවට බලය දීලා තිබුණා. කථානායකතුමා සමහර වෙලාවට කැඳවපු පුද්ගලයෝ ගැන තමුන්නාන්සේලා දන්නවා. අද එක තැනකට බලය ගොනු කරලා තිබෙනවා. ඒ බලය ගොනු කිරීම තුළ රටේ දේශපාලන ස්ථාවරභාවයක් ඇති වෙලා තිබෙනවා. ඒ දේශපාලන ස්ථාවරභාවයත් එක්ක තමයි පැහැදිලිව අපට අපේ ඊළඟ වැඩ පිළිවෙළ ආරම්භ කරන්න තිබෙන්නේ.

කොවිඩ්-19 වසංගතය අපි කවුරුත් බලාපොරොත්තු වුණේ නැහැ. අද ජනතාවගෙන් අහන්න, අපේ ජනාධිපතිතුමා ඇතුළු මේ ආණ්ඩුව කොවිඩ්-19 වසංගතය මර්දනය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හරියට කරනවා ද, නැද්ද කියලා. අපට ජනතාවගෙන් හොඳම සහතිකයක් ලැබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිවරණය තියලා මාස 7කින්, 8කින් තුනෙන් දෙකක බලයක් ජනතාව අපට ලබා දුන්නේ අප කෙරෙහි, ජනාධිපතිතුමා කෙරෙහි තිබෙන විශ්වාසය නිසාය කියන එක අපි බොහොම පැහැදිලිව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම රටේ ඉදිරි ගමන් මාර්ගය පිළිබඳව හොඳ ක්‍රියා මාර්ග රාශියක් මේ අය වැයේ සඳහන් වෙනවා. අපි සියලුදෙනා දන්නවා, අද වෙනකොට රුපියල් ට්‍රිලියනයක මුදලක් ඉදිරි වසර කිහිපය තුළ ජලය ලබා දෙන්න විතරක් අපි වෙන් කරලා තිබෙන බව.

තව අපට කථා කරගෙන යන්න පුළුවන් කාරණා ගණනාවක් තිබෙනවා. වෘත්තීය අධ්‍යාපනයට අද යන්නේ සිසු සිසුවියන් ලක්ෂයයි. ඒ ප්‍රමාණය ලක්ෂ දෙකක් බවට පත් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ මේ අය වැය තුළ තිබෙනවා. ඒ නිසා රටේ ඉදිරි අනාගතය ගැන හිතන අය වැයක් හැටියට තමයි පැහැදිලිවම අපි මේ අය වැය දකින්නේ.

සමහරු අද මේ සභාවේ සමෘද්ධි සහනාධාරය ගැන කථා කළා. සමෘද්ධි සහනාධාරය වැඩිපුර දෙන්න නොවෙයි, අඩු කරන්න පුළුවන් නම් ඒක තමයි අපි හැමදෙනාගේම දක්ෂතාව. තමුන්නාන්සේලා පැහැදිලිවම දේශපාලන වශයෙන් තමයි ඒ සමෘද්ධිලාභින් තේරුවේ. මම බොහොම පැහැදිලිව මතක් කරන්න ඕනෑ, ජනතාව මේ ආණ්ඩුව පත් කරලා තවම මාස 3යි ගතව තිබෙන්නේ කියලා. ඒ මාස 3 ඇතුළත කරපු දේවල් තමුන්නාන්සේලා දන්නවා. විශේෂයෙන්ම අඩු ආදායම්ලාභින්ට රැකියා ලක්ෂයක් දුන්නා. ඔබතුමන්ලා කථා කළේ රැකියා ලක්ෂ 10ක් දෙන්නයි. ඒවා ඔක්කෝම කොහේද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு சாரதீ துஷ்மந்த)
(The Hon. Sarathi Dushmantha)
මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. මේක හොඳ අය වැයක්. අපි ප්‍රාර්ථනා කරනවා, අතිගරු ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත් මේ අය වැය යථාර්ථයක් බවට පත් කර ගන්න අවශ්‍ය ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.43]

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පළමුවෙන්ම ඔබතුමාට සුබ පතනවා. ඔබතුමා මූලාසනයේ සිටින වෙලාවක මට මේ කථාව කරන්න ලැබීම සතුටක්. මම ප්‍රාර්ථනා කරනවා අනාගතයේ දවසක නිල උරුමය තිබෙන පුද්ගලයා හැටියට මේ පුටුවේ ඔබතුමා වාඩි වෙනවා දකින්න අපට වාසනාව ලැබේවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කැමතියි, ඉස්ලාමීය ඉතිහාසයේ එන ඉතා වැදගත් ප්‍රකාශයක් උපුටා දක්වමින් මගේ කථාව ආරම්භ කරන්න. මේ ප්‍රකාශය කළේ නබිතුමන්ගේ අභාවයෙන් පස්සේ ඉස්ලාමීය ලෝකයේ පාලකයා බවට පත් වෙච්ච පළමු පාලකයන් දෙදෙනාගෙන් එක්කෙනෙක්. මට හරියටම මතක නැහැ, මේ ප්‍රකාශය කළේ පළමුවැනියා ද, දෙවැනියා ද කියලා. මම ඒක කියවා තිබෙනවා. මූලාසනාරූඪ ගරු

[ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා]

මන්ත්‍රීතුමනි, එම ප්‍රකාශය උපුටා දක්වන්න ඔබතුමාගෙන් අවසරයි. එතුමා ඒ පාලනය බාර ගනිමින් තමන්ගේ මංගල කථාවේදී තමයි මේ ප්‍රකාශය කළේ. එහිදී එතුමා මෙහෙම කියා තිබෙනවා: "සහෝදර ජනතාවනි, ඔබ සැම මගේ පාලනයේ අඩු ලුහුඬුකම් දැක්කොත්, අඩු ලුහුඬුකම් මට කිව යුතු වෙනවා. ඔබ සැම කට වසාගෙන ඒ කරුණු නොකියා සිටියහොත් ඔබ සැම යහපත් අය වන්නේ නැහැ. ඔබ සැම කියන අඩු පාඩුවලට උපේක්ෂාවෙන් සවන් නොදී කේන්තියෙන් ප්‍රතිචාර දැක්වුවහොත් මමත් යහපත් මිනිසෙකු වන්නේ නැහැ." මේ රටේ පුරවැසියන් තමන්ගේ අඩුපාඩු පෙන්වලා දෙන්න ඕනෑ. එහෙම කළොත් තමයි ඒ පුරවැසියන් යහපත් පුරවැසියන් වෙන්නේ. ඒ වාගේම පාලකයන් ඒවාට කේන්ති අරගෙන ප්‍රතිචාර දක්වන්නේ නැතිව, උපේක්ෂාවෙන් ඒවාට සවන් දෙන්න ඕනෑ. එහෙම වුණොත් තමයි පාලකයන් යහපත් පාලකයන් වෙන්නේ. අවුරුදු 1400කට පෙර ඉස්ලාමීය ඉතිහාසයේ ආරම්භක පාලකවරයෙකු කර ඇති මේ ප්‍රකාශය අද යුගයටත් වලංගු වන, අද යුගයේ අපේ පාලකයන්ටත් මගපෙන්වන ප්‍රකාශයක් කියලා මම විශ්වාස කරනවා. ඉස්ලාමීය ඉතිහාසය වාගේම, බෞද්ධ ඉතිහාසයේ තිබෙන දස රාජ ධර්මයේ මග පෙන්වීම මේ අවස්ථාවේ මගේ සිහියට එනවා. අපි අදහන මේ ආගම්වල තිබෙන මේ වටිනාකම්වලින් අපි පාඩම් උගත යුතුව තිබෙනවා.

අද මේ අය වැය ඉදිරිපත් කරන්නේ අපේ රට පමණක් නොවෙයි, මුළු ලෝකයම අර්බුදකාරි තත්ත්වයකට මුහුණ දීලා තිබෙන පසුබිමක. අද "කොරෝනාව" නිසා මුළු ලෝකයම අඩපණ වෙලා තිබෙනවා. ජාත්‍යන්තර ගමන් බිමන් බොහෝ දුරට නතර වෙලා. ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු නැවතිලා. කර්මාන්තශාලා වැසිලා. විරැකියාව වර්ධනය වෙලා. ලක්ෂ ගණන් මිනිස් ජීවිත අහිමි වෙලා. මේ තත්ත්වය අපේ රටට පමණක් සීමා වුණු ප්‍රශ්නයක් නොවන බව අපි පිළිගන්නවා. එහෙත් මේ ප්‍රශ්නය අපේ රටේ මිනිසුන්ගේ ජීවිතවලට බරපතළ බලපෑමක් ඇති කරලා තිබෙනවා. අපේ රටේ ආර්ථිකයට දායක වන, ආර්ථිකයට පණ පොවන දසදහස් ගණන් මිනිස්සු අද අසරණ වෙලා. ඒ උදවියගේ ජීවත්වන මාර්ග අහිමි වෙලා; රැකියා අහිමි වෙලා. කර්මාන්තශාලා වැහිලා. වෙළෙඳාම් වැටිලා. නිෂ්පාදන බිඳ වැටිලා. මැනිං මාර්කට් එකේ දවසේ පඩියට කුලී වැඩ කරන අයගේ ඉඳන් 'ලීස්' ක්‍රමයට ගත්ත ත්‍රිරෝද රථය පදවන මනුෂ්‍යයා දක්වා, මේසන් වැඩ කරන මේසන් බාසුන්නැහේගේ ඉඳන් මාළු වෙළෙඳ පොළේ වැඩ කරන මනුෂ්‍යයා දක්වා, බත් පැකට් විකුණන අයගේ ඉඳන් කුලී වැඩ කරන අය දක්වා ජන ජීවිත, පවුල් ආර්ථික අද කඩා වැටිලා. අනෙක් රටවලටත් මේ විධියට අභියෝග තිබෙනවා. රජයක් තිබෙන්නේ මේ අර්බුදවලදී නියම නායකත්වය දෙන්න; මඟ පෙන්වන්න.

මේ අවස්ථාවේදී 60 දශකයේ ඇමෙරිකාවේ හිටපු ජනප්‍රිය ජනාධිපතිවරයෙකුවන ජෝන් එෆ්. කෙනඩිගේ ප්‍රකාශයක් උපුටා දක්වන්න මම කැමතියි. කෙනඩි මෙහෙම කියනවා. "අර්බුදය කියන වචනය සඳහන් කරන්නට චීන ජාතිකයෝ පෑන් පාරවල් දෙකක් පාවිච්චි කරනවා. එක පෑන් පහරකින් කියන්නේ, 'භයානකයි' කියන අර්ථය. අනෙක් පෑන් පහරින් කියන්නේ, 'අවස්ථාව' කියන අර්ථය. අර්බුදකාරි තත්ත්වයකදී භයානක බව ගැන, අවදානම ගැන කල්පනාකාරීවීම අවශ්‍යයි. ඒ වාගේම අර්බුදය තුළින් මතුවන අවස්ථා ද අපි හඳුනා ගත යුතුව තිබෙනවා". කෙනඩි කියන්නේ, ලොකු අර්බුදයකදී, මුළු ලෝකයම අර්බුදයකට මුහුණ දී තිබෙන මොහොතක භයානක අවදානමක් තිබෙනවා වාගේම අවස්ථා ද මතු වන බවයි. මේ අර්බුදය තුළින් මතුවන අවස්ථා හඳුනා ගෙන අපි ඉදිරියට යන්නේ කොහොමද? අපට වඩා ඉදිරියෙන් සිටින රටවලට අපි කිට්ටු වෙන්නේ කොහොමද? අපි ඒ රටවල් අභිභවා ඉදිරියට යන්නේ කොහොමද? අපි ආර්ථික අතින් ඉහළට යන්නේ කොහොමද? අපට තිබෙන මානව සම්පත් -රට ඇතුළේ තිබෙන, පිටරටට ගිහිල්ලා තිබෙන- ප්‍රයෝජනයට අරගෙන දැනුම, පහසුකම් සියල්ල භාවිත කරලා කටයුතු කරන්නට මේ අර්බුදය අවස්ථාවක් කර ගත යුතුව තිබෙනවා. ඒ සඳහා අපට දැක්මක් අවශ්‍යයි. එහෙම දැක්මක හෝඩුවාවක්වත් අපට අවංකවම මේ අය වැය තුළින් දැක ගන්නට තිබෙනවාද?

ලක්ෂ ගණන් මිනිස්සු ගෙවල්වලට කොටු වෙලා ඉන්න දවස්වල ඔවුන්ගේ දැනුම, කුසලතා වර්ධනය කර ගන්නට නවසීලන්තයේ ඒ තරුණ අගමැතිනියගේ නායකත්වයෙන් නිර්මාණශීලි විධියට කටයුතු කරන හැටි අපි දකිනවා. ඉදිරියට යන්න වුවමනාව, අධිෂ්ඨානය තිබෙන රටවල් කටයුතු කරන්නේ එහෙම අලුත් සිතුවිලිවලින්. ලෝකයේ ඉදිරියට යන්නට උත්සාහ කරන රටවල් මෙවැනි අවස්ථාවලදී කොරෝනා උවදුරෙන් පීඩාවට පත් වුණු ජනතාවගේ දුක් වේදනාව ඇමතීමට වාගේම, මේ අර්බුදය තුළින් මතුවන අවස්ථා හඳුනා ගෙන ඉදිරියට යන්නට කල්පනා කරනවා. එවැනි ඇමතීමක් හෝ මේ අර්බුදය අපට ලබා දෙන අවස්ථා ප්‍රයෝජනයට ගෙන, හඳුනා ගෙන ඉදිරියට යන්නට ඇති අධිෂ්ඨානයක් හෝ උත්සාහයක් මේ අය වැයේ දකින්නට නැහැයි කියන එකයි මගේ අදහස. ඒක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. මේ වාගේ සන්ධිස්ථානයකදී අපේ රට සාම්ප්‍රදායික දේශපාලනයකට වඩා අලුත් ප්‍රවේශයකට අවතීර්ණ විය යුතුව තිබෙනවා. නූතනවාදී ධනාත්මක ප්‍රවේශයක් අපේ රටට අවශ්‍යව තිබෙනවා. අපි තවමත් අපේ රටේ දකිමින් ඉන්නේ සාම්ප්‍රදායික, යල් පැනපු දේශපාලනය තුළින් පැවැත්ම තහවුරු කර ගන්නට දඟලන උත්සාහයක්. ජනාධිපතිතුමා පෙරේදා කරපු කථාවෙනුත් අපි දැක්කේ ඒ සාම්ප්‍රදායික බෙදුම්වාදී දේශපාලන විෂමචක්‍රය තුළ එතුමා හිර කරලා තිබෙන ආකාරයයි. ඇත්තෙන්ම මේ තත්ත්වය ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. අපේ රටට මේ බෙදුම්වාදී ආකල්ප ඇතිවීම තුළින් අනාගතය ගොඩනඟන්න පුළුවන්කමක් නැහැ. ජනතාවගේ දැවෙන ප්‍රශ්න අමතනවා වෙනුවට, අවධානය වෙන පැත්තකට හරවමින් සිංහල- සිංහල කියලා, දෙමළ- දෙමළ කියලා, මුස්ලිම්- මුස්ලිම් කියලා හැඟීම් අවුස්සන කථා තුළින් ඒ ඒ ජන කොටස්වල ඡන්ද ඩැහැ ගැනීමේ කාලකණ්ණි දේශපාලනයේ නිමාවක් අපි දැන්වත් දැකිය යුතුව තිබෙනවා. මේ බෙදුම්වාදී දේශපාලනය ශ්‍රී ලාංකීය ජාතියට උරුම කළේ දහස් ගණන් ජීවිත අහිමි කිරීම, ආබාධිතයන් බිහි කිරීම, අහිංසක ජනතාව සරණාගතයන් බවට පත් කිරීම පමණයි. මේ බෙදුම්වාදී ආකල්ප වපුරපු දේශපාලනය නිසා ශ්‍රී ලාංකීය ජාතිය දශක පහක් තිස්සේ පරම්පරා කිහිපයක්ම ජීවිත ගෙවලා තිබෙන්නේ ප්‍රචණ්ඩත්වය, ගැටුම් වාගේම ලේ ගැලීම් එක්කයි. අපේ ඊළඟ පරපුරටවත් අභිමානයෙන් ජීවත් වෙන්නට පුළුවන් සමාජයක් භාර දෙන්නට නම් අපි ගැටුම්, බෙදීම් අවම කර ගත් සමාජයක් උදා කර ගත යුතුව තිබෙනවා.

1989දී අපේ රටේ ජන වාර්ගික ප්‍රශ්න උත්සන්නව තිබූ පසුබිමක ජනාධිපති ධුරයට පත් වූ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමන් කරපු ප්‍රකාශයක් මේ අවස්ථාවේ දී උපුටා දක්වන්න මම ඔබතුමාගේ අවසරය ඉල්ලනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. “ප්‍රේමදාස චින්තනය” පොතේ පිටු අංක 34 හා 35හි එතුමා කියා තිබෙනවා, “අපි සියලු දෙනාම මනුෂ්‍යයෝ. ශ්‍රී ලංකාව අපේ මව්බිම ලෙස සලකන අප හැම දෙනාම සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් කුමන ජන වර්ගයකට අයත් වුවත් මෙම වෙනස්කම් වටහා ගන්නේ අප ඉපදී තේරුම් යන වයසට ආ පසුවයි. එක් ජන වර්ගයක් අනෙක් එකකට වඩා ප්‍රමාණයෙන් ටිකක් ලොකු හෝ කුඩා විය හැකියි. නමුත් ඉතා වැදගත්ම කරුණ නම් අප සියලුදෙනාම මනුෂ්‍යයන් වීමයි. ඒ අර්ථයෙන් අප සියලුදෙනාම සමානය. බහුජන වාර්ගික ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තමයි ශ්‍රී ලංකාවේ අනාගතය සඳහා මා තුළ හැම විටම තිබුණු දර්ශනය. ඒ මඟ මිස වෙන මඟක් අපට විවෘතව නැහැ. මා කලින් නියෝජනය කළ මැද කොළඹ කොට්ඨාසය බහුජන වාර්ගික කොට්ඨාසයක්. බහුජන වාර්ගික ජීවිතයට ගැළපෙන

දේශපාලනයක් මා අනුගමනය නොකළා නම් පසුගිය අවුරුදු 35ක කාලය තුළ මට ඒ කොට්ඨාසය නියෝජනය කරන්නට ලැබෙන්නේ නැහැ. දැන් ජනාධිපතිවරයා ලෙස මුළු රටම මගේ කොට්ඨාසය වී තිබෙනවා. මම දැන් ශ්‍රී ලංකා සමාජය ගොඩ නැඟී තිබෙන සියලු ජන කොටස්වල ජනාධිපතිවරයා යි" කියලා.

රටක නායකයකු කල්පනා කරන්න ඕනෑ එහෙමයි. පුළුල් දැක්ම තමයි වැදගත් වන්නේ. බොහෝ රටවල් අය වැයක් ඉදිරිපත් කරන විට අවුරුදු දෙක තුනකවත් ඉදිරිය කල්පනා කරලා තමයි අය වැය සැලැස්මක් ඉදිරිපත් කරන්නේ කියා අපි දන්නවා. එහෙම කරනකොට මුළු රටටම, මුළු ආර්ථිකයටම, මුළු ලෝකයටම සහතිකයක් දෙනවා, රට යන්නේ මොන දිසාවකටද කියලා. රජයට සැලැස්මක්, සූදානමක් තිබෙන බවක් පෙන්වනවා.

අද අපි පශ්චාත් කොවිඩ් යුගයකට මුහුණ දී තිබෙනවා. මේ කොවිඩ් අනතුර අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට ලොකු කම්පනයක් ලබා දී තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයට වාගේම ආර්ථික, සමාජයීය අතිනුත් මෙය ලොකු බලපෑමක් ඇති කර තිබෙනවා. එහෙත් අය වැය යෝජනා දෙස බලන විට මෙවර අය වැයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයට ප්‍රතිපාදන ලබා දී තිබෙන්නේ ගිය වසරට වඩා අඩුවෙන්. කොවිඩ් අනතුරට පෙර පසුගිය අවුරුදු කිහිපයේදීම සෞඛ්‍ය ක්ෂේත්‍රයට වෙන් කළ මුදල් වසරින් වසර වැඩි වුණා. එහෙත් පශ්චාත් කොවිඩ් අභියෝගවලට මුහුණ දිය යුතුව තිබෙන පසුබිමක මේ වසරේ ප්‍රතිපාදන අඩු කර තිබෙනවා. 2018ට වෙන් කළ මුදලට වඩා 2019ට වෙන් කළ මුදල් ප්‍රමාණය වැඩි වෙලා තිබුණා. 2020ට ඊටත් වඩා වැඩි වෙලා තිබුණා. නමුත් 2021 මෙම අය වැයෙන් එය අඩු කර තිබෙනවා. මේ තත්ත්වය කනගාටුදායකයි. ලෝකයේ වෙනත් රටවල් මේ සෞඛ්‍ය අභියෝගය ඉදිරියේ වැඩි වැඩියෙන් ආයෝජනය කරන පසුබිමක අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ආයෝජනය අඩු කර තිබෙනවා. අපේ රටේ අතිබහුතරයක් ජනතාව ලෙඩක්, දුකක් හැදුණාම යන්නේ ආණ්ඩුවේ රෝහල්වලට. ඒ අයගෙන් බහුතරයකට PCR පරීක්ෂණවලට, බෙහෙත් හේත්වලට පෞද්ගලික රෝහල්වලට යන්න වත්කමක් නැහැ. නිදහස් සෞඛ්‍ය සේවාව සඳහා වන ආයෝජන කප්පාදු නොකර එයට ප්‍රමුඛතාව දෙන්න කියලා ඉල්ලන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. තමන්ගේ දේශපාලන පැවැත්ම සඳහාත්, රටේ ඉදිරි ගමනට කිසි ඵලදායිතාවක් නැති දේශපාලන පත්වීම් සඳහාත්, වෙනත් අනවශ්‍ය කටයුතු සඳහාත් ලබා දෙන ප්‍රමුඛතාවට වඩා අද අපේ ජනතාව මේ අසීරු අවස්ථාවේ මුහුණ දී සිටින අපහසුතාවන්ගෙන් මුදවා ගන්නට ගත යුතු පියවර සඳහා ප්‍රමුඛතාව දෙන්න කියා රජයෙන් ඉල්ලා සිටින්න මම කැමතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ආණ්ඩුව සහ අපි කඳවුරු දෙකක් බව ඇත්ත. වග කිව යුතු ආණ්ඩුවක් සහ වග කිව යුතු විපක්ෂයක් හැටියට රටේ අනාගතය වෙනුවෙන් අපි ගමන් කළ යුත්තේ එක් ඉලක්කයකටයි. අපි ගමන් කරන්න ඕනෑ, ඉදිරියට මිසක් ආපස්සට නොවෙයි. අපි ගමන් කරන්න ඕනෑ, ඉහළට මිසක ප්‍රපාතයකට නොවෙයි. ඒ නිසා අපි හැමෝටම එකඟ වෙන්න පුළුවන් දිසාවකට රට ගෙන යන්න ඕනෑ.

බලන්න, ඔබතුමන්ලා අද පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා - Sectoral Oversight Committees - අකර්මණ්‍ය කරලා තිබෙනවා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට පෙර ඒ අණපනත් පක්ෂ භේදයෙන් තොරව සලකා බලන ක්‍රමවේදයක් මේ ගරු සභාව තුළ තිබුණා. මේවා අකර්මණ්‍ය කරලා තිබෙන්නේ ඇයි? ඒකපාර්ශ්වික ගමනකට මඟ පාදන්නේ නැතිව රට වෙනුවෙන් පොදුවේ කල්පනා කර වැඩ කරන මේ ක්‍රමවේද අපි රැක ගත යුතුව තිබෙනවා. මේ කමිටු අකර්මණ්‍ය කිරීමෙන් දෙන්නේ වැරැදි සංඥාවක්.

අද ලෝකය දිහා බලන්න. අද ලෝකයේ ළිං මැඩි චින්තනවලට ඉඩක් නැහැ. චීනය, වියට්නාමය බලන්න. ලාභය තහනම් වචනයක් ලෙස සලකපු න්‍යාය අමතක කරලා, දැන් ඒ රටවල් ලාභය හඹා යනවා. අද තමන්ගේ ජනතාවට උසස් ජීවන තත්ත්වයක් දෙන්නට කල්පනා කරන ලෝකයේ රටවල් ඔක්කොම යන ගමන් මාර්ගයේ ලොකු වෙනසක් නැහැ. ඒ නිසා අපි අපේ දේශපාලන පැවැත්ම සඳහා අපේ සමාජය තුළ ගැටීම්, බෙදීම්, සතුරු ආකල්ප ඇති කරන ගමනකට නොගොස් නිවැරැදි මඟට අපේ රට යොමු කරන්නට දායක විය යුතුව තිබෙනවා. ළිං මැඩි චින්තනයට ගොදුරු නොවී ගජ මිතුරු ධනවාදී ප්‍රතිපත්තිවලින් බැහැර වී සාර්ථක ගමන් ගිය ලෝකයේ රටවල්වලින් පාඩම් ඉගෙන ගෙන අපි අපේ රට ඉහළට ඔසවා තබන්නට සාමූහිකව සිතන යුගයක් උදා කර ගත යුතුව තිබෙනවා.

අවසාන වශයෙන් මා කියන්න කැමැතියි, මහින්ද රාජපක්ෂ අගමැතිතුමා ඒ කාලයේ තරුණ මන්ත්‍රීවරයකු විධියට මානව අයිතිවාසිකම් ගැන නිර්භීතව කථා කරපු නායකයකු බව. ජාත්‍යන්තර තලයට පවා ඒ ප්‍රශ්න ගෙන ගිය නායකයකු බව අපි දන්නවා. නමුත් අද මොනවාද වෙන්නේ? අද අපේ මාධ්‍යවේදීන්, සමාජ ජාලවල ක්‍රියා කරන උදවිය ආණ්ඩුවට විරුද්ධව අදහස් පළ කිරීම නිසා කරන අත්අඩංගුවට ගැනීම් ඊයේ පෙරේදා වැඩිවෙලා තිබෙනවා. මෙය ඉතාම කනගාටුදායක තත්ත්වයක්. මට ආරංචි වුණා, අත්අඩංගුවට ගන්න කියලා දෙසිය ගණනක ලැයිස්තුවක් පොලීසියට දීලා තිබෙනවා කියලා. මෙහෙම කරන්න එපා. එතුමා විපක්ෂයේ සිටියදී මානව අයිතිවාසිකම් ගැන නිර්භීතව පෙනී සිටියා. එතුමා අපේ රටේ අගමැති ධුරය දරන ආණ්ඩුවකින් මෙවැනි තත්ත්වයක් සිදු නොවිය යුතුයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් භාෂණයේ අයිතිය සහතික කර තිබෙනවා. එයට ගරු කරන්න. ඒ අදහස්වලට ඉඩදීලා, ඒවා ඉවසාගෙන මේ ගමන යන්න සූදානම් වෙන්න. එහෙම නොකරපු ආණ්ඩුවලට අපේ රටේ ජනතාව කනගාටුදායක ඉරණම් උදා කරදීලා තිබෙනවා. මතක නේ, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව තුනෙන් දෙකේ බලය නිසා 1977 දක්වා පාලන කාලය දික්කර ගත් බව. එයට විරෝධතා දක්වනකොට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් දුන්නා, දේපොළ රාජසන්තක කළා, ගුවන් විදුලි නිවේදන නිකුත් කළා. අන්තිමේදී ජනතාව 1977 මැතිවරණයෙන් හයෙන් පහක බලයක් විපක්ෂයට ලබා දුන්නා. අධිපතිවාදී ගමන්වලට අපේ රටේ ජනතාව ආශීර්වාද කරන්නේ නැහැ. ලංකාවේ පමණක් නොවෙයි, ඉන්දියාව දිහා බලන්න. අධිපතිවාදී ගමනක් යන්නට ගිය නිසා 1976දී ඉන්දිරා ගාන්ධි මැතිනියගේ කොන්ග්‍රස් පක්ෂයට විශාල පරාජයක් ලබා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශානි අබේසේකර මහත්මයාගේ නඩුව ගැන මා කථා කරන්නේ නැහැ. එතුමාට අඩ වැටුප් ගෙවන්න කියලා පොලිස් කොමිසම පොලිස්පතිට දැනුම් දුන්නාද? නැහැ. ඒ පවුල ඉතාම දුෂ්කර ජීවිතයක් ගත කරන්නේ. උසස් අධ්‍යාපනයක් ලබන්න බලාපොරොත්තුවන දරුවෙක් ඒ පවුලේ ඉන්නවා. දේශපාලන පළිගැනීම්වලට යන්නේ නැතුව, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්ම ආරක්ෂා කර ගන්නට සද්භාවයෙන් කටයුතු කරන්නය කියා ආණ්ඩුවෙන් ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.56]

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම 2021 අය වැය යෝජනාවලිය රටට, ජනතාවට ආර්ථික හා සමාජයීය සංවර්ධනයක් උදෙසා වන ගුණාත්මක අය වැයක් බව පෙන්වා දීමට මේ ගරු සභාවේ අවසර පතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක පරිමාණයෙන් ලෝකයේම ජනතාව මහත් ව්‍යසනයකට මුහුණ පා ඇති තත්ත්වයක් තුළ රටක් ලෙස ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවිතයේ සුරක්ෂිතභාවයක්, සෞභාග්‍යවත් දේශයක්, නිවහල් පුරවැසියන් ලෙස අත්පත් කර ගත යුතු ආර්ථික ගොඩ නැඟීමක් සඳහා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති රාමුව තුළ ඉදිරිපත් කළ 2021 අය වැය යෝජනා ඉවහල් වන බව මූලිකව මේ සභාව හමුවේ ස්ථිර කර සිටිනවා.

ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ජනතාවක් වෙසෙන ශ්‍රී ලාංකීය භූමිය තුළ අප සැමගේ පැතුම නිවහල් සෞභාග්‍යවත් මිනිස් ජීවන වටපිටාවක් ගොඩ නඟා ගැනීමයි. ඒ සඳහා මුඛ්‍යතම සම්පත වන මිනිස් හැකියාව සතු අගය රටක ආර්ථික සුරක්ෂිතතාව සඳහා කොතරම් දායක කර ගන්නේද යන්න පිළිබඳව කිරා මැන බැලීමක් කළ යුතුයි.

අපි සැවොම පිළිගන්නා කාරණය වන්නේ, ලෝකයේ වෙනත් රාජ්‍යයන් සමඟ සංසන්දනය කර බලන විට, මේ රට කෘෂි කර්මාන්තයෙන් ඉහළ ස්වයංපෝෂිත ජීවන තත්ත්වයක් අත්පත් කර ගත හැකි වගා ක්‍රමවලින් පොහොසත්, ඒ සඳහා වන පාරිසරික හා භූගෝලීය තත්ත්ව සපුරා ඇති රාජ්‍යයක් බවයි. කන්න දෙකකින් සරුවන වී අස්වැන්නෙන් මෙන්ම හේන් ගොවිතැනින් හා නිශ්චිත විධිමත් වගා ක්‍රම මඟින්, අනෙකුත් භෝග වර්ග මඟින් එදා වේල සරිකර ගැනීමට මෙන්ම අතිරික්තය අපනයනය දක්වා වර්ධනය කළ හා වර්ධනය කළ හැකි කෘෂි කර්මාන්තයක් අප සතුවීම මොන තරම් භාග්‍යයක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි තත්ත්වයක් තුළ කෘෂි කර්මාන්තය සඳහා දක්වන රාජ්‍ය මැදිහත්වීම පසුගිය කාලයට අදාළව අතිශය ශෝකජනකයි. අපේ ගොවියා ණය ගෙවා ගැනීමට නොහැකිව, පොහොර ටික වගාවට යෙදවීමට නොහැකිව වස පානය කොට මියැදෙන තරම් අන්ත අසරණ තත්ත්වයකට මේ කෘෂි කර්මාන්තය ඇද දැමීමේ අභාග්‍ය සම්පන්න තත්ත්වයක් අපි දැක්කා.

2015ට පෙර ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් ගොවීන් සඳහා නිකුත් කළ පොහොර සහනාධාරය "යහ පාලනය" නමින් මහා උජාරුවෙන් කර පින්නාගෙන සිටි රජය විසින් කපා දමා, ගොවියාට යන එන මං නැති කළ තත්ත්වය අපට මතකයි. දේශීය ගොවියා එසේ වළ පල්ලට ඇද දමා, මුං ටික, කවුපි ටික පමණක් නොව ගම්මිරිස් පවා පිට රටින් ගෙන්වා ගම්මිරිස් ඇටයෙන් පවා අධික කොමිස් මුදල් ගසා කමින් ගොවීන් හා දේශීය සැපයුම්කරුවන් වළ පල්ලට යැවීමට ක්‍රියා කළ අයුරු ජනතාවට මතකයි. මෙවර මේ පාර්ලිමේන්තුව හමුවට ඉදිරිපත් කළ අය වැයෙන් ගොවීන්ට නැවත ජීවිතයක් ලබා දීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත් මුළු මහත් ජනතාවගේ ගෞරවය හිමි විය යුතුයි.

මෙවර අය වැයෙන් වී පොහොර නොමිලේ ලබා දීමට කටයුතු කිරීමත්, අනෙක් පොහොර කිලෝග්‍රෑම් 50ක් සඳහා රුපියල් 1,500ක සහන මිලක් සහතික කිරීමත් රටේ ගොවියාගේ සතුටට කරුණක්. මේ අය වැය යෝජනාවලියට වාගේම, ලංකාවේ අපනයන භෝග විවිධාංගීකරණ ක්‍රියාවලියට අදාළ විවිධ භෝග සහ ඖෂධීය අපනයන වගා සම්බන්ධයෙනුත් මම මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි.

ලංකාව සර්ම කලාපීය රටක් නිසා බොහෝ ඖෂධ වගා නිසි පරිදි සිදු කොට, ඒවා අපනයනයෙන් දේශීය ආර්ථිකයට විදේශීය විනිමය උපයා ගන්න පුළුවන්. ඒ අතර, ලංකාවේ මේ වනවිට නීතිවිරෝධී තත්ත්වයේ පවතින, එහෙත් ඖෂධයක් ලෙස නීත්‍යානුකූල බවක් සහිත කංසා හෙවත් ගංජා වගාව ඖෂධීය අපනයන වගාවක් ලෙස රාජ්‍ය මැදිහත්වීමෙන් ශක්තිමත් කොට විදේශ විනිමය උපයා ගැනීම සඳහා වන දායකත්වය ලබාදෙන ලෙස මම යෝජනා කරනවා. එක හෙළාම එයට රජයේ මැදිහත්වීමක් අවශ්‍යයි. මෙය, වෛද්‍ය විද්‍යාත්මක භාවිතය සඳහා සහ අපනයන ද්‍රව්‍යයක් ලෙස යොදා ගනිමින් අපට ආදායමක් උපයා ගත හැකියි. එම නිසා, මෙය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා වන යෝජනාවක් බව නැවත වරක් සභාව හමුවේ මම ප්‍රකාශ කර සිටිනවා.

රාජ්‍යයක් ලෙස අප ලෝක වෙළෙඳ පොළ වෙත මෙතෙක් අපනයනය කළ තේ, පොල්, රබර් වැනි ප්‍රධාන ආර්ථික භෝග අතරට ඖෂධ වගාව එකතු කර ගැනීම ඉතාම හොඳ යෝජනාවක් ලෙස මම දකිනවා. ලෝකයේ වෙනත් රාජ්‍ය සමඟ සැසඳීමේදී අපේ රට අත්කරගෙන තිබෙන්නේ අවම අපනයන වාර්තාවක්. ලෝකයේ වෙනත් රාජ්‍ය නීත්‍යානුකූල කංසා අපනයනයෙන් අතිවිශාල ආදායමක් ලබනවා.

මට මේ ගැන පුංචි හැඳින්වීමක් කරන්න පුළුවන්. යුරෝපා ආයෝජන බැංකුවට අනුව, ගෝලීය කංසා වෙළෙඳ පොළ ඊළඟ දශකයේදී සියයට දහසකින් ඉහළ යන බවත්, 2027දී ඩොලර් බිලියන 140ක ආදායමක් ලබන බවත් පුරෝකථනය කර තිබෙනවා. ඉන් ඩොලර් බිලියන 57ක් නීත්‍යානුකූල කංසාවලින් ලැබෙන බවත්, ඉන් වැඩි කොටස උතුරු ඇමෙරිකාව හා යුරෝපයෙන් සැපයෙන බවත් සඳහන් වෙනවා. 2017දී උතුරු ඇමෙරිකාව නීත්‍යානුකූල කංසා වෙළෙඳාමෙන් ඩොලර් බිලියන 9.2ක ආදායමක් ලැබුවා. 2027දී එය බිලියන 47.3ක් වනු ඇති බවට ගණන් බලා තිබෙනවා. ඒ නිසා කංසා වගා කිරීම අප වැනි සර්ම කලාපීය රටකට ඉතාම වැදගත් වෙනවා. අපට මේ තිබෙන ණය බරින් නිදහස් වෙන්නත් එය මාර්ගයක් වෙනවා. පිට රටවල අද මේ වගාව නීත්‍යානුකූල කර තිබෙනවා. ඖෂධයක් ලෙස අපේ රට තුළ කංසා වගා කිරීමෙන් අපේ ණය බරින් නිදහස් වෙන්නත් පුළුවන්. හැම දාම, "මේ රට ණයයි, ණයයි, බංකොලොත්" කියන විපක්ෂයේ අයටත් මට කියන්න තිබෙන්නේ ඒකයි.

පසුගිය කාලයේ ඇතැම් අය, "සර් ෆේල්, සර් ෆේල්" කියමින් විවිධ දේවල් කිව්වා. ඒක තමයි අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා "ෆේල්" නොවෙන්න සර්ට දැන් බලය දීලා තිබෙන්නේ. දැන් "සර් ෆේල්" කියන අය තව අවුරුදු හතරකිනුත් ඇවිල්ලා කියයි, "සර් ෆේල්" කියලා. සර්ගේ අත පය ගැට ගහලා, වැඩ කරන්න කියනවා. එහෙම වුණාම මේ රටේ ප්‍රශ්න ටික විසඳන්න සර්ට බැහැ. ඒ නිසා තමයි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කරලා සර්ට නැවත බලය ලබා දීලා හැම කටයුත්තක්ම සාර්ථකව කරන්න අපි අවස්ථාව හදා දුන්නේ.

අනෙක් කාරණය මේකයි. කොරෝනා සම්බන්ධයෙන් ක්‍රියා කරන්න අය වැයෙන් කිසිම මුදලක් වෙන් කරලා නැහැ කිව්වා. කොරෝනා කියන්නේ අමාත්‍යාංශයක් නොවෙයි; ආයතනයක් නොවෙයි. කොරෝනා කියන්නේ වයිරසයක්. එය මැඩ පැවැත්වීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාර්යභාරයක්. ඒ නිසා තමයි අපි අය වැයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයට මෙච්චර මුදලක් වෙන් කර තිබෙන්නේ. ඒ මුදල් වෙන් කර තිබෙන්නේ කොරෝනා මර්දනයටත් එක්කයි. නැත්නම් අපට පිළිකාවට, දියවැඩියාවට, වකුගඩු රෝගයට කියලා හැම දේටම මුදල් වෙන් කරන්න වෙයි; වර්ගීකරණය කරන්න වෙයි. එහෙම කරන්න බැහැ. ඒවා එන්නේ

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතටයි. ඒ නිසා තමයි එම අමාත්‍යාංශයට මුදල් වෙන් කර තිබෙන්නේ.

කොරෝනාවලට කියලා වෙනම මුදල් වෙන් කරන්න බැහැ. කොරෝනා වසංගතය මර්දනයටත් මුදල් වෙන් කරන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන්ම තමයි. ඒක නිසා හැම දේටම විරුද්ධ වෙච්, බොරුවට කෑගහන්න එපා. අද විපක්ෂයට කෑ ගහන්න පුළුවන් එකම දෙය මේ කොරෝනා වසංගතය පමණයි. එය අවසන් වුණාට පසුව විපක්ෂයට බොහොම ඉක්මනටම තව tagline එකක් හොයා ගන්න වෙනවා, මේ පාර්ලිමේන්තුව තුළ මේ ගමන යන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මගේ කථාවේ ඉතිරි කොටස **සභාගත*** කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.03]

**ගරු අජිත් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு அஜித் ராஜபக்ஷ)
(The Hon. Ajith Rajapakse)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් සාර්ථක අය වැයක් ඉදිරිපත් කර තිබෙන මේ වෙලාවේ, පාර්ලිමේන්තුවට පත් වුණු නවක මන්ත්‍රීවරයකු හැටියට ඒ සම්බන්ධව අදහස් දක්වන්න අවස්ථාව ලැබීම ගැන ඉතාම සතුටු වෙනවා.

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට සීමාසහිත කාලයක් තමයි අපට කථා කරන්න හම්බ වෙන්නේ.

එයට හේතුව, මේ රටේ ජනතාව මේ රටේ වෙන කිසිම දේශපාලන පක්ෂයක් කෙරෙහි තිබෙනවාට වඩා විශ්වාසයක් අපේ පක්ෂය කෙරෙහි තබලා, ලංකා ඉතිහාසයේ වැඩිම මන්ත්‍රීවරු පිරිසක් මහජන ඡන්දයෙන් පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයට තෝරා පත් කර එවීමයි. එහි ප්‍රතිඵලයක් හැටියට, අපට අද පාර්ලිමේන්තුවේ කථා කරන්න ලැබෙන කාලය ඉතාම සීමාසහිතයි. ඒ තරම් වටිනා පාර්ලිමේන්තුවක් නියෝජනය කරන්න අපට අවස්ථාව ලැබී තිබෙනවා.

අද වනකොට මේ රටේ ජනතාව විතරක් නොවෙයි, සමස්ත ලෝකවාසී ජනතාවම කොරෝනා වසංගතයත් එක්ක විවිධ අභියෝගවලට මුහුණ දෙනවා. එසේ වුවත්, අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ තුළ ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමා අපේ මුදල් ඇමතිවරයා හැටියට, මේ කාල පරිච්ඡේදයේ තිබෙන අභියෝගවලට මුහුණ දෙමින් ඉතාම සාර්ථකව රට ඉස්සරහට ගෙන යන්න පුළුවන් විධියේ අය වැය ලේඛනයක් ඉදිරිපත් කර තිබෙනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනතාවට දීපු නායකත්වය නිසාම, එතුමා ගොඩනඟා ගත් දේශපාලන විශ්වාසය නිසාම එතුමාගේ වැඩ පිළිවෙළ ගැන ජනතාව විශාල වශයෙන් බලාපොරොත්තු පොදි බැඳගෙන ඉන්නවා.

විපක්ෂය ඇතුළු දේශපාලන කණ්ඩායම් අද මේ අය වැය ලේඛනය මොන තරම් විවේචනය කළත්, මේකේ දුර්වලකම් පෙන්වන්න කොතරම් උත්සාහ කළත් සත්‍යය මොකක්ද කියලා රටේ ජනතාව දන්නවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා කියන්නේ මේ රටේ නායකයන්ට කරන්න බැරි වුණු බොහෝ දේවල් අපේ රටේ ජනතාවට  කර දුන් නායකයෙක්. මීට කලින් හිටපු නායකයන් ගණනාවකට මේ රටේ යුද්ධය අවසන් කරන්න පුළුවන් වුණේ නැහැ. මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා මේ රටේ ජනාධිපතිවරයා හැටියට පත් වුණේ, අභියෝග ගොඩක් මධ්‍යයේයි. එතුමා ඒ අභියෝග සියල්ල ජය ගත්තා. මේ රටේ හිටපු නායකයන් කිහිප දෙනෙකුටම අවසන් කරගන්න බැරි වුණු යුද්ධය නිමා කරලා, මේ රටට සාමය ගෙනෙන්න එතුමාට පුළුවන් වුණා. ඒ ගොඩනඟපු විශ්වාසය තුළ අපේ රටේ ජනතාව මහින්ද රාජපක්ෂ අගමැතිතුමා ගැන දැඩි විශ්වාසයක් තබාගෙන ඉන්නවා. එම නිසා, මොන තරම් අභියෝග තිබුණත්, මේ රටේ ජනතාවට යුතුකම් ඉෂ්ට කළ හැකි වැඩ පිළිවෙළක් මේ අය වැය ලේඛනය තුළ තිබෙනවාය කියන විශ්වාසය ගොඩනැඟිලා තිබෙනවා.

මහින්ද රාජපක්ෂ මැතිතුමා යුද්ධය අවසන් කරන්න කටයුතු කළ කාලයේත් විපක්ෂය මේ වාගේමයි කටයුතු කළේ. අපට මතකයි, එදා තොප්පිගල අල්ලනකොට විපක්ෂයේ හිටපු සමහර දේශපාලන නායකයන් කිව්වා, "ඒක කැලෑවක්" කියලා. එහෙම තමයි එදා රටේ ජනතාවට වැරදි මතයක් ගෙන යන්න විපක්ෂය උත්සාහ කළේ. සමහර වෙලාවට කිලිනොච්චියට යනකොට කිව්වා, "නැහැ, ඔය යන්නේ මැදවච්චියට" කියලා. එහෙම කථා කළ නායකයන් මේ විපක්ෂයේ ඉන්නවා. අදත් ඉන්නවා. ඒ නායකයන් තමන්ට දෙන පණිවුඩය මොකක්ද කියන එක මේ රටේ ජනතාව දන්නවා.

අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ගෙන යන වැඩ පිළිවෙළ තුළ එතුමා ෆේල් කියන්න මේ අය කොයි තරම් උත්සාහ කළත්, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත්, මහින්ද රාජපක්ෂ මැතිතුමාත් ගෙන යන වැඩ පිළිවෙළ පාස් කරන්න මේ රටේ ජනතාව සූදානමින් ඉන්නවා.

අද උදේ විපක්ෂ නායකතුමා විනාඩි 45ක් කාලය අරගෙන, තවත් විනාඩි දහයක් විතර වැඩිපුරත් අරගෙන මහා වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළා. අපි දැක්කා, පසුගිය කාලයේ එතුමන්ලා ආණ්ඩු බලය අරගෙන, ඇමතිකම් අරගෙන මේ රටේ ක්‍රියාත්මක වුණු හැටි. අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ නිවාස අධිකාරියේ කාර්යාලයක් තිබෙනවා. ඒක, පුංචි ඉඩක තිබෙන පුංචි කාර්යාලයක්. ඒක ඇතුළේ සේවකයන් 2,700ක් ඉන්නවා. ඒ සේවකයන් 2,700 දෙනාටම තිබෙන්නේ එක toilet එකයි. නිවැරදි වැඩ පිළිවෙළක්, විඥානයක් නැති අකාර්යක්ෂම පාලනයක් ගෙන ගිහිල්ලා, අද මෙතැනට ඇවිල්ලා සමහර වෙලාවට වෛද්‍යවරුන්ටත් එහා ගිය වෛද්‍යවරයෙක් වෙන්න හදනවා. සමහර වෙලාවට, මේ රටේ මීට පෙර පහළ නොවුණු ආකාරයේ පාලකයෙක් වෙන්න හදනවා. නමුත් ජනතාව ඒ හැම කෙනෙක් ගැනම අවබෝධ කරගෙනයි ඉන්නේ.

මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටට දුන් නායකත්වය, ඒ විශ්වාසය ගැන අද මේ රටේ ජනතාව දන්නවා. එම නිසා තමයි මේ රටේ ජනතාව මෙතරම් දැවැන්ත දේශපාලන බලවේගයක් හදලා දීලා තිබෙන්නේ. ඒ බලවේගය තුළ අපට පුළුවන්කම ලැබෙයි, මේ රටේ ජනතාව බලාපොරොත්තු වන සියලු යුතුකම් ඉෂ්ට කරලා, රට ඉස්සරහට ගෙන යන්න. අපේ රටේ ජනතාවට මේ තරම් අභියෝගයක් එල්ල වුණු වෙලාවක, මේ රටේ ගැලවුම්කරුවන් වෙන්න අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට හැකියාව ලැබී තිබෙන්නේ ඒ නිසායි කියලා අප විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමසර කන්ද නාය ගියාම, ඒ අහිංසක මිනිසුන්ට යුතුකම් ඉෂ්ට කරන්න බැරි වුණු පාලනයක්

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු අජිත් රාජපක්ෂ මහතා]

තමයි පසුගිය කාලයේ තිබුණේ. සාලාවේ හමුදා කඳවුර පුපුරා ගිය වෙලාවේ ඒ අවට මිනිසුන්ට යුතුකම් ඉෂ්ට කරන්න බැරි පාලකයෝ සිටියේ. එම නිසා, ඔබේ වගකීම්, යුතුකම් ඉෂ්ට කරන්න පුළුවන් පාලකයා මේ රටට පහළ වෙලා ඉන්න වෙලාවේ, ඒ යුතුකම් ඉතාම කෙටි කාලයකින් ඉෂ්ට කරන්න කටයුතු කරනවාය කියන පණිවුඩය මේ රටේ ජනතාවට ලබා දෙමින්, මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.09]

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தமிழர்களைப் பொறுத்தளவிலே நாளைய தினம் தமிழ் மக்களுடைய உரிமைக்காக உயிர்நீத்த மாவீரர்களை நினைவுகூர்கின்ற வாரம் ஆரம்பமாகின்றது. இந்த நேரத்திலே அந்த மாவீரர்களுக்கு என்னுடைய அக வணக்கங்களைத் தெரிவித்துக்கொள்கின்றேன். கோட்டாபய ராஜபக்ஷ அவர்கள் ஜனாதிபதியாகப் பதவியேற்ற பின்னர் சமர்ப்பிக்கப்படுகின்ற இந்த இரண்டாவது வரவு செலவுத்திட்டமானது சிங்கள தேசத்தையும் போரால் அழிக்கப்பட்ட வடக்கு, கிழக்குத் தமிழ்த் தேசத்தையும் அபிவிருத்திமூலம் சமத்துவமடையச் செய்யவேண்டும் என்ற நோக்கில் தயாரிக்கப்பட்டதாக இல்லை என்பதைக் கூறவிரும்புகின்றேன்.

2009 மே 18 வரை இடம்பெற்ற இன அழிப்பு யுத்தம்மூலம் ஒட்டுமொத்த வடக்கு, கிழக்கு மக்களின் கோடானுகோடி பெறுமதியான சொத்துக்களும் விவசாய, கைத்தொழில் உற்பத்தி மற்றும் வர்த்தகத் துறையும் அழிக்கப்பட்டுள்ளன என்பது இந்த ஆட்சியாளர்களுக்கு நன்றாகத் தெரியும். போரினால் கொல்லப்பட்டவர்களில் தங்கியிருந்த குடும்ப உறுப்பினர்களின் வாழ்வாதாரம், கல்வி உள்ளிட்ட நலன்கள், போரினால் காயமடைந்து பாதிக்கப்பட்டுள்ளவர்களதும் அவர்களில் தங்கியிருக்கின்ற குடும்பத்தினர்களதும் கல்வி உள்ளிட்ட எதிர்கால நலன்கள், போரில் பெற்றோரை இழந்து தவிக்கும் ஆதரவற்ற பிள்ளைகளது கல்வி, உணவு, தங்குமிடம் உள்ளிட்ட நலன்கள், பிள்ளைகளை இழந்து தவிக்கும் வயது முதிர்ந்த பெற்றோர்களது நலன்கள், இராணுவத்தினரிடம் சரணடைந்த போராளிகளினதும் இராணுவம் மற்றும் துணை இராணுவக் குழுக்களால் கடத்தப்பட்டவர்களினதும் மற்றும் வலிந்து காணாமலாக்கப்பட்டுள்ள நிலையில் அவர்களில் தங்கியிருந்த குடும்பங்களின், பிள்ளைகளின் எதிர்கால நலன்கள், முள்ளந்தண்டுவடம் பாதிக்கப்பட்டுச் சக்கர நாற்காலியில் மருத்துவ வசதிகள், உணவு, பராமரிப்பு போன்றவை இன்றித் தவிக்கும் பல நூற்றுக்கணக்கான முன்னாள் போராளிகள் மற்றும் பொது மக்களின் நலன்கள், யுத்தப் பாதிப்புக்களால் புற்றுநோய்த் தாக்கத்துக்கு உள்ளாகிவருகின்ற மக்களின் நலன்கள், புனர்வாழ்வு பெற்ற நிலையில் அரச புலனாய்வுப் பிரிவினரதும் பொலிசாரதும் திரைமறைவு நெருக்கடிகளால் சமூகத்தால் கைவிடப்பட்டுள்ள 12,000 இற்கும் அதிகமான முன்னாள் போராளிகள் மற்றும் அவர்களது மனைவி, பிள்ளைகளது நலன்கள் போன்றவற்றை மேம்படுத்துவதற்கான எந்தவிதமான நடவடிக்கைகளும் திட்டங்களும் இல்லாது, போரால் பாதிக்கப்பட்டவர்களை முற்றாகக் கைவிட்டு இந்த வரவு செலவுத்திட்டம் தயாரிக்கப் பட்டுள்ளது. மேற்படி பாதிப்புக்களை ஏற்படுத்தியவர்களே இந்த நாட்டினுடைய ஜனாதிபதியாகவும் பிரதமராகவும் நிதியமைச்சராகவும் இருந்து சமர்ப்பித்துள்ள இந்த வரவு செலவுத்திட்டத்தில் வடக்கு, கிழக்கு போரால் பாதிக்கப்பட்ட பிரதேசம் என்பது சுட்டிக்காட்டப்படாது முற்றாக மூடி மறைக்கப்பட்டுள்ளதுடன், போர் அழிவுகளிலிருந்து அப்பிரதேசத்தை மீளக்கட்டியெழுப்பும் வகையில் நிதி ஒதுக்கீடுகளும் மேற்கொள்ளப்படவில்லை. பாதிக்கப் பட்டவர்கள் அனைவரும் தமிழர்கள் என்ற ஒரே காரணத்துக்காகவே இவ்வாறு வடக்கு, கிழக்கு புறக்கணிக்கப்பட்டுள்து.

தேசியக் கொள்கை என்ற பெயரில் நாட்டின் தென்பகுதியையும் 30 வருடங்களாகப் போரால் அழிக்கப்பட்ட வடக்கு, கிழக்கையும் ஒரேவிதமான அணுகுமுறைகள்மூலம் ஒருபோதும் கட்டியெழுப்ப முடியாது. இலங்கையில் மிக மிக ஏழ்மையானவர்கள் வாழும் பகுதியாக இன்று வடக்கு, கிழக்குப் பிரதேசம் மட்டுமே காணப்படுகின்றது. இப்பிராந் தியம் பொருளாதாரரீதியாக முன்னேற முடியாதவாறு கடந்த 11 வருடங்களாக மாறி மாறி ஆட்சிபீடமேறிய அரசாங்கங்களும் அவர்களுடைய கொள்கைகளும் தடையாக இருந்து வந்துள்ளன. வடக்கு, கிழக்கிலே இன்று உள்நாட்டு உற்பத்தியை ஊக்குவிப்பது தொடர்பாகவும் அதற்காகச் சலுகைகள் வழங்கப்போவதாகவும் இந்த அரசாங்கம் அறிவிப்புக்களைச் செய்திருக்கின்றது. ஆனால், வடக்கு, கிழக்கிலே கடற்றொழில் அமைச்சின் அனுமதியுடன் பொலிஸ், கடற்படை, நீரியல் வளத் திணைக்களம் ஆகியவற்றின் துணையுடன் சட்டவிரோத முறைகளைப் பயன்படுத்தி மீன்பிடியில் ஈடுபடுகின்ற தென்னிலங்கையைச் சேர்ந்த மீனவர்களினால் வடக்கு, கிழக்கினுடைய நீண்ட கடற்கரையோரத்திலே தமிழர்களுடைய கடற்றொழில் பெரும் அழிவுகளைச் சந்தித்து வருகின்றது. இதனால், பல நூற்றுக்கணக்கான மீனவர்கள் கடற்றொழிலைக் கைவிட்டு வெளியேறவேண்டிய சூழ்நிலை தொடர்ந்து கொண்டிருக்கின்றது. அதேபோல, தமிழர்களது விவசாய நடவடிக்கைகள் மகாவலி அபிவிருத்தி அதிகாரசபை, வனசீவராசிகள் திணைக்களம், வன பரிபாலனத் திணைக்களம், தொல்லியல் திணைக்களம், ஸ்ரீலங்கா காவல்துறை என்பவற்றின் இனவாத நடவடிக்கைகளால் பாரிய வீழ்ச்சியையும் அழிவையும் சந்தித்துக் கொண்டிருக்கின்றது.

வர்த்தகத்துறையைப் பொறுத்தவரையிலே, போரால் அழிக்கப்பட்ட வர்த்தகத்தினை மேம்படுத்த விசேட திட்டங்கள் எதுவும் கடந்த 11 வருடங்களாக முன்வைக்கப்படவில்லை. அத்துடன், உங்களது தேசியக் கொள்கை காரணமாகத் தென்னிலங்கை வர்த்தகர்களுடன் போட்டியிட முடியாததால் நூற்றுக்கணக்கான தமிழ் வர்த்தகர்கள் தொழிலில் நட்டமடைந்து வெளியேறிவிட்டார்கள். 2009ஆம் ஆண்டு இன அழிப்பு யுத்தத்துக்குப் பிற்பாடு, ஆட்சியை ஏற்றுக்கொண்ட உங்களுடைய அரசாங்கம், 'பொருளாதார வர்த்தக வலயம்' என்ற போர்வையிலே மேற்கொண்ட பொருளாதார அபிவிருத்தி நடவடிக்கைகள் காரணமாக சர்வதேச இறக்குமதி வர்த்தகத்திலே கொடிகட்டிப் பறந்த பல தமிழ் வர்த்தகர்கள் இன்று தங்களுடைய இறக்குமதி வர்த்தகத்தைக் கைவிட்டு, அதிலிருந்து வெளியேறி இருக்கின்றார்கள். இன்று அந்த இறக்குமதி வர்த்தக உரிமம் சிங்களவர்களுடைய கைகளுக்கு மாற்றப்பட்டிருக்கின்றது.

அதேபோன்று, "விவசாயத்தை ஊக்குவிக்கின்றோம்; இறக்குமதியைக் கட்டுப்படுத்துகின்றோம்" என்ற பெயரிலே அரசாங்கம் பல விடயங்களைப் பேசிக்கொண்டிருக்கின்றது. 1950களிலிருந்து முல்லைத்தீவு மாவட்டத்தின் மணலாறு, வெலிஓயா போன்ற பகுதிகளில் அரச அனுமதிப் பத்திரங்கள் வழங்கப்பட்ட தமிழ் விவசாயிகள் 05 ஏக்கர் - 50 ஏக்கர் வரையான நிலங்களில் விவசாயத்தில் ஈடுபட்டு வந்தனர். 1984ஆம் ஆண்டு அரசின் உத்தரவின்பேரில், அப்பகுதியிலிருந்து தமிழர்கள் வெளியேறினார்கள். இந்த நிலையில், 2011ஆம் ஆண்டு முந்திரிகைக்குளம், ஆமையன் குளம், மணற்கேணி, சின்னக்குளம், சர்ப்பங்கிடந்தமடு, மயில்குளம், மண்கிண்டிமலை ஆகிய பிரதேசங்களைத் தமிழர்களுக்கு மீளப் பெற்றுத்தருமாறு கேட்டபொழுது, "அங்கு சிங்களவர்கள் குடியேற்றப்பட்டுவிட்டார்கள்; அவர்கள் வாழத் தொடங்கிவிட்டார்கள்; அவர்களை எழுப்ப முடியாது" என்று சொல்லப்பட்டது. எஞ்சியுள்ள 3,500 ஏக்கர் நிலத்தில் விவசாயம் செய்வதற்கு அனுமதிக்குமாறு அந்த மக்கள் கோரியபொழுது, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only one more minute.

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
Sir, please give me two more minutes.

"அந்த நிலம் வனபரிபாலனத் திணைக்களத்துக்கும் மகாவலி அபிவிருத்தி அதிகாரசபைக்கும் வனசீவராசிகள் திணைக்களத்துக்கும் சொந்தமானது" என்று கூறுகிறார்கள். 05 ஏக்கர் -10 ஏக்கர் வரையான காணியை வைத்திருந்தவர்களுக்கு 02 ஏக்கர் வீதம் காணி தரலாம் என்று சொல்கின்றார்கள்.

அதேபோன்று, மட்டக்களப்பு மாவட்டத்திலே மயிலத்தமடு பெரிய மாதவனைப் பகுதியிலே கிட்டத்தட்ட 03 இலட்சம் மாடுகளைத் தமிழர்கள் பராமரித்து வருகின்றார்கள். அந்தப் பகுதி சிங்கள மக்களுக்குச் சொந்தமானது என்று சொல்லி, மகாவலி அபிவிருத்தி அதிகாரசபையினால் அந்தப் பகுதியிலே சிங்கள மக்களுக்கு விவசாயம் செய்வதற்கு இப்பொழுது அனுமதி வழங்கப்பட்டிருக்கிறது. அந்தப் பகுதியிலிருந்து அனைத்துத் தமிழ் பண்ணையாளர்களும் உடனடியாக வெளியேற வேண்டுமென்று உத்தரவு இடப்பட்டிருக்கின்றது. நாங்கள் இந்த விடயம் தொடர்பாக பிரதமருக்கும் மகாவலி அபிவிருத்திக்குப் பொறுப்பான அமைச்சருக்கும் தெரியப் படுத்தியும்கூட, இன்று சிரேஷ்ட பொலிஸ் அத்தியட்சகரும் மகாவலி அபிவிருத்தி அதிகாரசபையின் அதிகாரிகளும் அங்கு சென்று நிலைமையைப் பார்வையிட்டுவிட்டு, தமிழ் பண்ணையாளர்களிடம், "நீங்கள் இங்கிருந்து வெளியேற வேண்டும்" என்று உத்தரவிட்டுவிட்டு வந்திருக்கிறார்கள். இந்த நிலைமைகள் தொடருமாக இருந்தால், ஒருபொழுதும் இங்கே சமத்துவமான அபிவிருத்தியைக் கட்டியெழுப்ப முடியாது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
Sir, please give me one more minute.

வடக்கு, கிழக்குப் பகுதிகள் தமிழீழ விடுதலைப் புலிகளின் ஆளுகையின் கீழிருந்த காலத்திலே எமது மக்கள் மிகவும் மகிழ்வாக வாழ்ந்தார்கள். ஆனால், இன்று அவர்கள் மிகுந்த அச்சத்தோடு வாழுகின்றார்கள். அரச திணைக்களங்களினால் எங்களுடைய வாழ்வு பறிபோய்விடுமோ? என்ற அச்சத்தில் அவர்கள் வாழ்ந்துகொண்டு இருக்கிறார்கள். பொலிசாருக்கோ, நீதிமன்றங்களுக்கோ தான் உத்தரவிடுவதில்லை என்று சனாதிபதி சொல்கின்றார். ஆனால், வடக்கு மற்றும் கிழக்கிலே தமிழர்களுடைய நினைவேந்தல் நிகழ்வைத் தடுப்பதற்கான உத்தரவை அங்குள்ள நீதிமன்றங்களைப் பிழையாக வழிநடத்தி பொலிஸார் பெற்றிருக்கிறார்கள். இது நீதித்துறையில் அரசியல் தலையீடுகள் இருப்பதைத்தான் காட்டுகின்றது. இந்த நிலை தொடர்ந்தால் ஒருபொழுதும் இந்தத் தீவை உங்களால் அபிவிருத்தி செய்ய முடியாது. மாறாக, இனவாதப் போக்கைக் கைவிட்டு, எங்களுடைய மக்களின் சுயநிர்ணய உரிமையை அங்கீகரித்து, தமிழ் தேசத்தை அங்கீகரித்து, தமிழர்களையும் உள்வாங்கிய ஓர் அபிவிருத்தியைச் செய்வதற்கு நீங்கள் முன்வரவேண்டுமென்று கேட்டுக்கொண்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன்.

[අ.භා. 2.17]

**ගරු ප්‍රසන්න රණවීර මහතා (වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணவீர - பிரம்புகள், பித்தளை, மட்பாண்டங்கள், மரப்பொருட்கள் மற்றும் கிராமியக் கைத்தொழில் மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Prasanna Ranaweera - State Minister of Rattan, Brass, Pottery, Furniture and Rural Industrial Promotion)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දිස්ත්‍රික්කයේ සහෝදර මන්ත්‍රීවරයෙක් මූලාසනයේ සිටින මොහොතේ අය වැය විවාදයට සහභාගි වෙමින් කථා කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා.

ඒ වාගේම, මෙවර පාර්ලිමේන්තුවට පත්වීමෙන් පසු මම කථා කරන පළමු දවස අද. ඒ නිසා මහ මැතිවරණය ජයග්‍රහණය සඳහා සහයෝගය ලබා දුන් ජනතාවටත් ස්තුති කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2021 වර්ෂය සඳහා වන අය වැය යෝජනාව විවාදයට ගන්නා මේ මොහොතේ මම කියන්න ඕනෑ, 2019 නොවැම්බර් 16වැනි දා අපි රජය භාර ගන්නා විට අපට ලැබුණේ ජාතික ආරක්ෂාව විනාශ කරපු රටක්, ආර්ථිකය විනාශ කරපු රටක් වාගේම ඒක පුද්ගල ආදායම අඩු කරපු රටක්. ආර්ථික, දේශපාලන හා සමාජයීය සෑම ක්ෂේත්‍රයකින්ම ගරා වැටුණු රටේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට පත්වෙලා, මේ රට නිවැරදි දිසාවකට ගමන් කරන මොහොතේ මාස 4ක පමණ කාලයක් අපේ කියලා ආණ්ඩුවක් තිබුණේ නැහැ. විපක්ෂ ආණ්ඩුවක් තිබුණේ. ඉන් පස්සේ අගෝස්තු මාසය වෙනකල් අපට කොරෝනා වසංගතයත් එක්ක කටයුතු කරන්න වුණා. එම නිසා අපි බලයට පත්වෙලා ගත වූ වර්ෂයෙන් මාස 9ක් අපට කටයුතු කරන්න ලැබුණේ නැහැ. ආණ්ඩුව ලබාගෙන මාස කිහිපයක් තුළ අපි 2021 වර්ෂය සඳහා අය වැය ලේඛනයක් ඉදිරිපත් කර තිබෙනවා. ආනයනය සීමා කරලා, නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීමටත් සෞභාග්‍යයේ දැක්ම වැඩ පිළිවෙළ මහ පොළොවේ සාක්ෂාත් කර ගැනීමටත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත්, මහින්ද රාජපක්ෂ මැතිතුමාත්, එම නිලධාරිනුත් ඉදිරිපත් කළ අය වැය ලේඛනය මා ඉතාම අගය කොට සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට සරුංගලයේ සිට, පහන් කූඩුවේ සිට සෑම භාණ්ඩයක්ම පිට රටින් ආනයනය කරන පරගැති මානසිකත්වයෙන් මිදිලා, ජනතාව තුළ දේශීයත්වය

[ගරු ප්‍රසන්න රණවීර මහතා]

නැවත ඇති කරවන්නට, දේශීයත්වය නැවත ගොඩනඟන්නට, රට තුළ ස්වයං ආර්ථික ක්‍රමයක් ඇති කරන්නට මේ වන විට අවස්ථාව ලැබී තිබෙනවා. ඒ වාගේම, ලෝක ජනගහනයෙන් සියයට හැටකට වඩා වැඩි පිරිසක් ආසියානු කලාපය තුළයි ජීවත් වෙන්නේ. කාටත් යට නොවී ආසියානු කලාපය තුළ ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙන්න අපට හැකියාව තිබුණා නම්, එය අපට ලොකු ජයග්‍රහණයක් වාගේම, රටක් විධියට එයින් ජයග්‍රහණ රාශියක් අත් පත් කර ගන්න පුළුවන්කම තිබෙනවා. දේශීය නිෂ්පාදකයා සහ දේශීය නිෂ්පාදන ආරක්ෂා කර ගනිමින්, රටේ ජනතාවට සියලු දේ නොමිලේ ලබා දෙන මානසිකත්වයෙන් මිදිලා ආත්ම විශ්වාසයෙන් නැඟී සිටින ජාතියක් බව පසක් කරමින්, දේශීයත්වයට මුල් තැන දෙමින්, ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකයක් සහ නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීම තමයි මෙම අය වැය යෝජනාවල මූලික පරමාර්ථය වෙලා තිබෙන්නේ. එවැනි අය වැය ලේඛනයක් ගෙන ඒම පිළිබඳව මාගේ ගෞරවනීය ස්තුතිය පිරිනමනවා.

නව දැක්මක්, ශක්තිමත් රටක්, අලුත් ආරම්භයක් සඳහා මුල පුරමින් සෞභාග්‍යයේ දැක්ම යථාර්ථයක් කිරීමට ගෙන ඇති ආර්ථික, ප්‍රතිපත්තිමය තීන්දු රසකින් පරිපූර්ණ වූ අය වැයක් ලෙස මම මෙය දකිනවා.

පසුගිය ආණ්ඩුව පාසල් සිසුන් සහ තරුණ තරුණියන්හට ටැබ් යන්ත්‍ර සහ බ්‍රේස්ලට් ලබාදෙන බවට මුළා කරමින්, දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කිරීම වෙනුවට මේ රටට ආදේශක භාණ්ඩ ආනයනය කරමින්, ඉදල, කොස්ස වාගේම කහ, තුනපහ පවා ආනයනය කරන තත්ත්වයට පත් කර තිබෙනවා. කාර් ආනයනය නොකිරීම නිසා පසුගිය මාස දෙක තුළ විතරක් රුපියල් කෝටි 150ක -මිලියන 1,500ක- මුදලක් අපේ රටට ඉතිරි වෙලා තිබෙනවා. අපි මේ දේවල් තුළින් කරන්න හදන්නේ එයයි.

මේ රටේ ආරක්ෂාව බින්දුවට ඇද දමමින් පාස්කු ප්‍රහාරයට උඩ ගෙඩි දුන්, පාස්කු ප්‍රහාරය ගැන දැන දැනත් තමන්ගේ ආරක්ෂාව වෙනුවෙන් සමහරු ආත්මාර්ථකාමී කුහක දේශපාලනයක නිරත වූ නිසා පසුගිය කාලයේ සමස්ත සංචාරක කර්මාන්තයම විනාශයට පත්වුණා. ඒ වාගේම අපේ රටේ සංචාරක කර්මාන්තය විශාල ලෙස විනාශ වෙලා ආර්ථික පසුබෑමකට ලක්වෙලා තිබුණු යුගයක තමයි, අපි මේ රජය භාර ගත්තේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කථාවේ අවසාන විනාඩියයි ගතවන්නේ.

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න. මේ අය වැයේ මම කරන පළමුවැනි කථාව මෙයයි.

'සෞභාග්‍යයේ දැක්ම' සැලසුම් කරමින් මේ රජය පිහිටුවීමේදී අතිගරු ජනාධිපතිතුමා ගම සමඟ පිළිසඳරක යෙදුණා. ඒ අවස්ථාවලදී රටේ ජනතාව අපෙන් ඉල්ලුවේ සහන නොවෙයි. නොමිලේ අපට කෑම බීම දෙන්න කියලා ඔවුන් ඉල්ලුවේ නැහැ. ඔවුන් කිව්වේ ඔවුන්ට දෙපයින් නැඟී සිටීමට, ඔවුන්ගේ කර්මාන්ත කරගෙන යෑමට අවශ්‍ය යටිතල පහසුකම් ටික සපයා දෙන්න කියලායි. ඒ වාගේම ඔවුන්ගේ නිෂ්පාදනවලට ආදේශක විධියට ආනයනය කරන භාණ්ඩ නවත්වා දේශීය කර්මාන්තයට ඉඩ දෙන්න කියලා ඔවුන් අපෙන් ඉල්ලුවා. ඒ අනුව ජනතා හිතවාදී අය වැයක් අපි මේ අවස්ථාවේ ඉදිරිපත් කරලා තිබෙනවා.

විපක්ෂය මහ ලොකුවට කිඹුල් කඳුළු හෙළවා ගෙවල් ගැන. ග්‍රාමීය දිළිඳු ජනතාව අන්ත අසරණ කරමින් ජලය නොමැතිව, විදුලිය නොමැතිව, පාරක් නොමැතිව අතිදුෂ්කර ගම්මානවල කුඩාරම් ගෙවල් තමයි විපක්ෂ නායකතුමා එදා හැදුවේ. ඒ වෙනුවට අංග සම්පූර්ණ සියලු පහසුකම් සහිත නිවාස යෝජනා වැඩ පිළිවෙළක් අපි ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම, සාමාන්‍ය මධ්‍යම පාන්තික ජනතාවට ඉතා සහනදායි පොලී පදනමක් මත නිවාස 50,000ක් ලබා දීමට මෙම අය වැයෙන් මුදල් වෙන්කර තිබෙනවා. ඒ පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමාට අපි ස්තුතිවන්ත වනවා.

අපේ විපක්ෂ නායකතුමාගේ කුඩාරම් නිවාස යෝජනා ක්‍රමය අහෝසි කරලා සැබෑ පහසුකම් සහිත නිවාස යෝජනා ක්‍රමයක් මේ රටට ගෙනෙන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම, දේශීය ආර්ථිකය නංවන්නට, දේශීය ව්‍යවසායකයා ශක්තිමත් කළ හැකි අය වැයක් අපි ඉදිරිපත් කර තිබෙනවා. ඒ සඳහා සියලුදෙනාගේ සහයෝගය හා ශක්තිය ලබා දෙන්න කියන ආදරණීය ඉල්ලීම මම කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මී ළඟට, ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.24]

**ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා**
(மாண்புமிகு இசுரு தொடன்கொட)
(The Hon. Isuru Dodangoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සම්බන්ධ වන පළමුවැනි අය වැය විවාදයට එකතු වීමට අවකාශය නිර්මාණය කර දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ඉතිහාසයේ බොහොම තීරණාත්මක අවධියක ඉදිරිපත් කරපු අය වැය විවාදයකට තමයි මෙවර අපි සම්බන්ධ වන්නේ. මේ වසරේ මුල් කාර්තුවේ අපේ රටේ ආර්ථිකය යම් සංකෝචනයකට ලක් වුණා. ලෝක ආර්ථිකය ගත්තත් 2019 වර්ෂයේදී පැවැති සියයට 2.8ක ආර්ථික වර්ධනයට සාපේක්ෂව 2020 වර්ෂයේදී ගෝලීය ආර්ථිකය සියයට 4.4කින් සංකෝචනය වනු ඇති බවට මේ වනකොටත් පුරෝකථන ඉදිරිපත් වෙලා තිබෙනවා. අපි උදාහරණයකට සංචාරක කර්මාන්තය ගත්තොත්, යුද්ධය කාලයේදීත්, පාස්කු ප්‍රහාරයෙන් අනතුරුවත් එය යම් කඩාවැටීමකට ලක් වුණාට මේ ආකාරයෙන් මාස ගණනාවක් තිස්සේ එකදු සංචාරකයෙකුවත් නොපැමිණි කාල සීමාවක් අපි දන්නා ඉතිහාසය තුළ තිබුණේ නැහැ. ඒ නිසා අපි විශ්වාස කරනවා, මින් පෙර මුහුණ නොදුන් තත්ත්වයක් යටතේ තමයි අපි මේ අය වැය ඉදිරිපත් කරන්නේ කියලා.

හැබැයි, අපි මෙහි යහපත් ලක්ෂණ දෙසත් බැලිය යුතුයි. උදාහරණයක් ලෙස වී නිෂ්පාදනය ගත්තාම, අපේ රටේ වී නිෂ්පාදනය වර්ධනය වෙලා තිබෙනවා. 2019දී පැවැති මෙට්‍රික්ටොන් මිලියන 4.6 සිට 2020 දී මෙට්‍රික් ටොන් මිලියන 5ක් දක්වා සියයට 9.7කින් අපේ වී නිෂ්පාදනය වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර තිබෙනවා. පසුගිය දශක 6ක කාලය ගෙන බැලුවාම මෙවර එය ඉහළම අගය වාර්තා කරනු ඇති බවට තමයි මේ වනකොට අපට පුරෝකථන ලැබෙන්නේ. ඒ අනුව, වී සඳහා පොහොර නොමිලේ ලබා දෙන එක මම විශ්වාස කරනවා, තවත් දිරිමත් කිරීමක් වනවා ඇති කියලා.

ආනයනය මතම පදනම් වූ ආර්ථික ක්‍රමවේදයෙන් බැහැර වෙලා ගොවි නිෂ්පාදන හා කෘෂි කාර්මික ආර්ථිකයක් කරා යොමු

වීම අපේ රටේ අනාගතයට ශක්තිමත් ක්‍රමවේදයක් යළි නිර්මාණය කිරීම සඳහා ඉවහල් වනු ඇතැයි අපි විශ්වාස කරනවා. 2020 ජනවාරි පටන් ස්ථිර බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම, බදු ගෙවන්නන්ට වාගේම බදු පරිපාලනයටත් පහසුවක් වනු ඇති.

මේ අය වැය ප්‍රකාශය තුළින් ඉදිරිපත් කර තිබෙන තවත් ඉතා වැදගත් කාරණාවක් තමයි, ඩිජිටල් ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීම. ඒ සඳහා යන ගමන් මඟට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. 4G තාක්ෂණය, ෆයිබර් තාක්ෂණය රට පුරා සිටින සියලුදෙනාට ලබා දීම සඳහා මිලියන 15ක මුදලක් වෙන් කිරීම අපි අගය කළ යුතුයි. විශේෂයෙන්ම කොවිඩ්-19 වසංගතය ආරම්භ වූ දවසේ පටන් රාජ්‍ය සහ පුද්ගලික ආයතනවල සේවකයන්ට නිවෙස්වල සිට වැඩ කිරීම -work from home- පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නිවසේ සිට කර ගැනීම සඳහා අන්තර්ජාලය හරහා පහසුකම් ලබා දෙන තැනට කටයුතු කෙරෙන ආකාරය අපි දැක්කා. මේ තාක්ෂණය නොමැති ගම්බිම් දක්වා මේ තාක්ෂණය රැගෙන යන්න 'ඩිජිටල් ශ්‍රී ලංකාවක්' වැඩ පිළිවෙළ සම්බන්ධ කරන එක අපි විශ්වාස කරනවා, අපේ රටේ ආර්ථිකයට ලොකු ශක්තියක් කියලා. රටේ අනාගතයට, දරුවන්ට සහ සියලු සේවකයන්ට තමන්ගේ වැඩකටයුතු කර ගැනීම සඳහා මේ හරහා විශාල දායකත්වයක් ලැබෙනු ඇතැයි අපි බලාපොරොත්තු වනවා.

ඊළඟට, තාක්ෂණික උද්‍යාන නිර්මාණය කිරීම. "Techno Parks" කියන ඉතා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. තාක්ෂණයත් එක්ක බද්ධ වෙච්ච නගර අපේ රටේ බිහි කිරීම ඉතා වැදගත්. තාක්ෂණය දිනෙන් දින අලුත් වනවා. අලුත් තාක්ෂණය, අලුත් තාක්ෂණ ක්‍රමවේද ලෝකයට දවසින් දවස මුදා හැරෙනවා. මේවා හැකි ඉක්මනින් අපේ රටවල් කරා ළඟා කරගෙන, අපේ දරුවන්ට හා අපේ සමාජයට මේවා ගෙන එන්නට මේ "Techno Parks" නිර්මාණය කරන්නට යෝජනා කිරීම ඉතා වැදගත්. මා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයට පළමු අදියර යටතේම තාක්ෂණික උද්‍යානයක් -Techno Park එකක්- ලබා දීමට යෝජනා වීම ගැන මම සතුටු වනවා. ඒ ගැන මා ස්තුතිවන්ත වනවා.

ඊළඟට, City Universities එහෙම නැත්නම් නගර විශ්වවිද්‍යාල. අද රැකියා වෙළෙඳ පොළේ රැකියා සඳහා ඉල්ලුම ඇති ක්ෂේත්‍ර හඳුනාගෙන, ඒ ක්ෂේත්‍රවලට ගැළපෙන පාඨමාලා මේ හරහා ක්‍රියාත්මක කරන්න කියන යෝජනාව මම මේ අවස්ථාවේ ගරු සභාවට කරන්න කැමැතියි. මේ වැඩකටයුත්ත කිරීමේදී ඒ ගැනත් සලකා බලන්න කියන ඉල්ලීම මම කරනවා. ඒ ගැන සලකා බැලීමට හැකියාව ලැබෙයි කියා මම විශ්වාස කරනවා.

ඊළඟට ක්‍රීඩා ක්ෂේත්‍රය. ජාත්‍යන්තරය ජය ගන්නා සාම්ප්‍රදායික ක්‍රීඩාවලින් ඔබ්බට ගිහිල්ලා, එක් එක් ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රවීණයන්ගෙන් සමන්විත නව ක්‍රීඩා හරහා ජාත්‍යන්තරය ජය ගන්න තැනට ඒ ක්‍රීඩාව යොමු කරන්න ක්‍රීඩා ඇමතිතුමා කටයුතු කරනවා. ක්‍රීඩා පාසල් ආරම්භ කිරීම සඳහා මේ වන විටත් වැඩකටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ ගැනත් අපේ ගෞරවය විශේෂයෙන්ම පළ කරන්න කැමැතියි.

කොවිඩ්-19 වසංගතය ආරම්භ වූ කාලයේ සිට මේ දක්වාම අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරගෙන යෑම සඳහා විදේශ රැකියාවල නියුතු ජනතාව අපට විශාල දායකත්වයක් ලබා දෙනවා. සාමාන්‍ය විනිමය අනුපාතයට වඩා වැඩි මුදලක් ඔවුන්ගේ තැන්පතු වෙනුවෙන් ලබා දීමට යෝජනා කිරීම ඔවුන් දිරිගන්වන සුළු වැඩකටයුත්තක් කියලා අපි සඳහන් කළ යුතුයි.

ඊළඟට, කහ සහ ඉඟුරු ආනයනය තහනම් කිරීම. මේ වනකොටත් දේශීයව කහ වගා කිරීම ආරම්භ කර තිබෙනවා. විශාල පිරිසක් පසුගිය කාලසීමාවේ ඉතා උනන්දුවෙන් ඒ වැඩකටයුතුවල යොමු වූ ආකාරය අපි දැක්කා. එම නිසා මේවා ආනයනය වෙනුවෙන් වියදම් කරපු විශාල මුදල නතර කරන්න අපට පුළුවන් වනවා. දේශීයව කහ, ඉඟුරු ආදී භෝග වගා කරලා අපේ රටේ ජනතාවට අවශ්‍ය කහ ටික, ඉඟුරු ටික අපට ලබා දිය හැකියි. ඉදිරි කාලසීමාවේදී මේ ඵලදාව ලැබීමත් එක්ක දැනට පවතින හිඟය නැති වී ජනතාවට එහි ප්‍රතිලාභ ලැබෙයි කියා අපි විශ්වාස කරනවා.

බොහෝ දෙනෙක් කථා කළා, වතු කම්කරුවන්ට රුපියල් 1,000ක දෛනික වැටුපක් ලබා දීම ගැනත්. රටේ මහා මාර්ග සංවර්ධනය හරහා විශාල ව්‍යාපෘති ගණනාවකට ආයෝජන කරනකොට, අපේ භෞතික සම්පත්වල වර්ධනයක් සිදු වනවා. රටක සංවර්ධනය මැනීමේ නිර්ණායකවලින් එකක් තමයි භෞතික සම්පත්. අපේ රටේ භෞතික සම්පත්වල සංවර්ධනයට මෙය විශාල දායකත්වයක්. පසුගිය කාලයේ අවධානය යොමු නොවුණු ක්ෂේත්‍රයක් තමයි, විදුලිබල ක්ෂේත්‍රය. නව බලාගාර ඉදි කරලා, රටේ ආර්ථික අංශවල වාගේම ගෘහස්ථ අංශවල අනාගත ඉල්ලුමට සරිලන ආකාරයේ සැපයුමක් ලබා දීම සඳහා නව බලාගාර ඉදි කරන්න කටයුතු කිරීම ගැනත් අපේ සතුට පළ කරන්න කැමැතියි.

අපට ස්වාභාවිකව ලැබෙන සූර්ය බලයෙන් ගෘහස්ථ විදුලි ඒකක සඳහා අවශ්‍ය විදුලිය ලබා දෙන්න කටයුතු කිරීම ඉතා වැදගත්. මොකද, ඒ වියදම් අඩුයි. මූලික වියදමක් දරලා අපට ස්වාභාවිකව ලැබෙන සූර්ය බලයෙන් හා සුළං බලයෙන් අපේ රටේ ජනතාවට සහ කර්මාන්තවලට අවශ්‍ය විදුලිය ලබා දෙන්නට කටයුතු කිරීම ඉතා වැදගත්.

ඒ වාගේමයි, පිරිසිදු පානීය ජලය. එය ජනතාවට අත්‍යවශ්‍යයි. මා නියෝජනය කරන බද්දේගම ආසනය ඇතුළු ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවටත් පානීය ජලය විශාල අවශ්‍යතාවක් වෙලා තිබෙනවා. සෑම නිවසකටම පානීය ජලය ලබා දෙන්න විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ජලය ඝන මීටර් මිලියන 4.4ක් තුළින් පවුල් ලක්ෂ 35කට ජලය ලබා දෙන්නට යෝජනා කිරීම ඉතා වැදගත් කටයුත්තක් කියන කාරණය විශේෂයෙන්ම සිහිපත් කරනවා.

රජයේ සේවකයන්ට තමන් පදිංචි ප්‍රදේශය ආසන්නයේ සේවය කරන්න අවස්ථාව ලබා දීම ඉතා හොඳ යෝජනාවක්.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව උපරිමාධිකරණයේ විනිසුරුතුමන්ලා සංඛ්‍යාව වැඩි කළා. නඩු කඩිනමින් විසඳීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනයට මෙහි යෝජනා කර තිබෙනවා. එමඟින්, නඩු ප්‍රමාදය අවම කිරීමේ සහනය ඉක්මනින් ලබාගන්නට ජනතාවට හැකියාව ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා.

අය වැයෙන් ලබා දී තිබෙන සහන මා කෙටියෙන් සඳහන් කරන්නම්. ග්‍රාමීය මාර්ග කිලෝමීටර 50,000ක් ඉදි කිරීමත්, ග්‍රාමීය පාලම් 10,000ක් ඉදි කිරීමත් ඒ යෝජනා අතර වනවා.

ජාතික පාසල් 1,000ක වැඩසටහනට සමගාමීව ග්‍රාමීය පාසල් ද හොඳ තැනකට ගෙන එන්නට යෝජනා කිරීම මඟින් ග්‍රාමීය පාසල්වල පහසුකම් වැඩි කරන්නට ඉදිරියේදී හැකියාව ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ කාරණයත් සිහිපත් කරමින්, මේ මව් පොළොව මින් පෙර මුහුණ නොදුන් මේ තීරණාත්මක අවස්ථාවේදී අපේ රට පෙරට ගෙන යන්න අවශ්‍ය ශක්තිය මේ අය වැය ලේඛනය හරහා ලබා දෙන බව මා කියනවා. ඒ සඳහා අප සියලුදෙනාගේ ශක්තිය, සහයෝගය ලබා දෙමු කියා ඉල්ලා සිටිමින්, මට කාලය ලබාදීම ගැන ඔබතුමාට ගෞරවය පළ කරමින් මගේ වචන කීපය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும்உறுப்பினர்அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.32]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினிகுமாரிவிஜேரத்ன)
(The Hon.(Mrs.) RohiniKumariWijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්තුතියි.

මීට මොහොතකට කලින් කථා කරපු ආණ්ඩු පක්ෂයේ වග කිවයුතු ඇමතිවරයෙකු සජිත් ප්‍රේමදාස නායකතුමාට අභූත චෝදනා නඟමින් මඩ ගහන තත්ත්වයක්, අභූත චෝදනා ගොනු කරන ආකාරයක් අපි දැක්කා. අපි වගකීමෙන් යුතුව කියනවා, ඒ දේවල් මුළුමනින් අසත්‍ය බව. අද මේ ආණ්ඩුව අලුත්ම ව්‍යාපාරයක් පටන්ගෙන තිබෙනවා. ඒ තමයි, විපක්ෂයේ නායකයන්, තෝරාගත් පුද්ගලයන් social media මඟින් මඩ ගහලා වට්ටන එක. එහෙම කළා කියලා ඔබතුමන්ලා පාස් වෙන්නේ නැහැ, ඔබතුමන්ලා ෆේල්ම තමයි කියලා අපි කියනවා. ඔබතුමන්ලා ආපසු විභාගය ලියලාම පාස් වෙන්න කියන එකත් අපි මේ වෙලාවේ මතක් කරනවා. [බාධා කිරීමක්] මීගමුව පැත්තේ ඉස්සෝත් ඔහොම කියන බව අපට කියන්න වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් ඇමතිතුමා ලෙස ගරු අග්‍රාමාත්‍යතුමා අය වැය කථාව ඉදිරිපත් කරමින් සඳහන් කළේ, රටේ සංවර්ධනය සඳහා දිගු කාලීන උපාය මාර්ගික දැක්මක් තිබෙන්න ඕනෑ කියලායි. මේ අය වැය ලේඛනය එවැනි සුන්දර වචන ගොන්නක් විතරයි කියා මම කියනවා. වැරදි සංඛ්‍යා ලේඛන, නොමඟ යවනසුලු ප්‍රකාශන රාශියක් විතරමයි ඒකේ තිබෙන්නේ කියන එක අපි කියන්න ඕනෑ.

අපට අහන්න වෙනවා, දැන් මේ රටේ කොවිඩ්-19 වසංගත තත්ත්වය ඉවරද කියලා. ඒ සඳහා වන යෝජනා මේ අය වැය ලේඛනයේ කොහේද තිබෙන්නේ කියලා අහන්න වෙනවා. ඒ සඳහා වෙන් කරපු ප්‍රතිපාදන මොනවාද කියලාත් අපට අහන්න වෙනවා. ආණ්ඩු පක්ෂයෙන් කියනවා අපි දැක්කා, "විපක්ෂය කොවිඩ්-19 එල්ලිලා ඉන්නවා" කියලා. අපි කියනවා, මේ ආණ්ඩුව මේ රටේ ජනතාව කොවිඩ්-19 වසංගතය ඇතුළේ ගිල්වලා ඉවරයි, නහයටත් උඩින් වතුර ගිහිල්ලා ඉවරයි කියලා. මේ වෙලාවේ කළ යුතුව තිබූ ප්‍රධානම දේ තමයි කොරෝනාවෙන් රටත්, ජනතාවත් බේරාගන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කරන එක. එවැනි වැඩ පිළිවෙළක අවශ්‍යතාව තමයි තිබෙන්නේ. කොරෝනාවට මුහුණ දෙන කටයුත්ත කළමනාකරණය කරන්නේ කොහොමද, ප්‍රතිකාර කරන්නේ කොහොමද, කොරෝනාවෙන් පසු ජන ජීවිතය නඟා සිටුවන්නේ කොහොමද, කොරෝනාව අතරේ ආර්ථිකය ගොඩ නඟන්නේ කොහොමද කියන ප්‍රශ්නවලට පිළිතුරු මොකවත් මේ අය වැය ලේඛනයේ නැති බව අපි කියන්න ඕනෑ.

කොරෝනාවට එරෙහිව එන්නතක් නිෂ්පාදනය වනතෙක් අද ලෝකයම බලාගෙන ඉන්නවා. සමහර රටවල් මේ වන කොට ඒ වෙනුවෙන් ගිවිසුම්ගත වෙලා තිබෙනවා; එන්නත හඳුන්වා දුන් ගමන්ම ඒවා මිලදීගන්න අවශ්‍ය ප්‍රතිපාදන, යටිතල පහසුකම් සලසාගෙන තිබෙනවා. හැබැයි, ඒවා ලංකාවේ නොවෙයි, වෙනත් රටවල සිද්ධ වන දේවල් බව කියන්න ඕනෑ. [බාධා කිරීමක්] එවැනි වගන්තියක් මේ අය වැය ලේඛනයේ තිබෙන්නේ කොහේද කියලා අපි අහනවා.

'මුට්ටි' ගහට දැම්ම පමණින් ඔක්කෝම හරි ගිහිල්ලාද, දැන් කොරෝනා වසංගතය ඉවර ද කියලා අපට අහන්න වෙනවා. අනෙක් අතට, කොවිඩ්-19 වසංගතය නිසා පීඩා විඳින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට, ව්‍යවසායකයන්ට දීලා තිබෙන සහන මොනවාද කියලා අපි අහන්න ඕනෑ. සංචාරක ව්‍යාපාරය අද කඩා වැටිලා තිබෙනවා. දඹුල්ල, සීගිරිය, නකල්ස් ආශ්‍රිත ප්‍රදේශ, නුවරඑළිය, මහනුවර, අනුරාධපුරය, පොළොන්නරුව, බදුල්ල, බණ්ඩාරවෙල විතරක් නොවෙයි, ගාල්ල, මාතර ප්‍රදේශවලත් බැංකු ණය අරගෙන සංචාරක කර්මාන්තයට සම්බන්ධ ව්‍යාපාර ආරම්භ කළ අයගේ ණය වාරික ගෙවාගන්න බැරිව ඉන්නවා. මූල්‍ය ආයතන, එහෙම නැත්නම් බැංකු ඔවුන්ගෙන් එම ණය වාරික ඉල්ලා සිටිනවා. බතික් කර්මාන්තය කරන අයට, homestay කරන අයට, සුළු ව්‍යාපාරික ස්ථාන පවත්වාගෙන යන අයට, ත්‍රිරෝද රථ හිමිකරුවන්ට අද බෙල්ලේ වැලලාගන්න සිද්ධ වන තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ අයට සහන දීම සඳහා මේ අය වැය තුළ ප්‍රතිපාදන නැහැ. [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හඬපටයක් එළියට දැම්මා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඔබතුමා කට වහගෙන ඉන්න. එතැන හඬ පටයක් ඇත්තේ නැහැ. මේවා එක්ක fail වෙච්ච ඔබතුමන්ලා එහෙම නොකියා වෙන මොනවා කියන්න ද කියලා අපට අහන්න වෙනවා. [බාධා කිරීමක්] පොදු ජනතාව පිළිබඳ හැඟීමක් නැතිව ගජ මිතුරන් පෝෂණය කිරීමක් පමණයි මේ අය වැය මඟින් අංක එකටම කර තිබෙන්නේ කියන එක අප මේ වෙලාවේ කියනවා.

පොහොර ගැන කථා කළොත්, ආණ්ඩුවේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ කෘෂිකර්මය ගැන සඳහන් එකම වාක්‍යය තමයි, "පොහොර නිකම් දෙනවා" කියන එක. ඒත් පසුගිය කාලයේ පොහොර නිකම් දුන්නා ද කියලා අපට අහන්න වෙනවා. අද පොහොර ගන්න තිබෙනවාද කියලාත් අහන්න වෙනවා. අද කුඹුරු වැඩ පටන් ගෙන තිබෙනවා. අපි අහනවා, කුඹුරු ගොවීන්ට අවශ්‍ය මඩ පොහොර සම්පූර්ණ ප්‍රමාණය නොමිලේ ගන්න තිබෙනවාද කියලා. අවශ්‍ය ප්‍රමාණය මිලදී ගන්නවත් තිබෙනවාද කියලා අහන්න වෙනවා. ඒ විතරක් නොවෙයි. අපට තේ පොහොර මිටි පහක් ගන්න පුළුවන් තැනක් කියන්න කියලාත් කියනවා. ගාල්ල, මාතර, වැලිමඩ ආදි ප්‍රදේශවල පොහොර ගන්න තිබෙන්නේ කොහේද කියලාත් අපට අහන්න සිද්ධ වෙනවා.

ඊළඟ කාරණාව මේකයි. අලුත් කන්නයේ එළවලු වගාව පටන්ගත්තා. අනුරාධපුරයේ, දඹුල්ලේ ඉඳන් ගිරාඳුරුකෝට්ටේ දක්වා වූ ප්‍රදේශවල, එහෙම නැත්නම් නුවරඑළිය, වලපනේ, බදුල්ල ආදි පැතිවල ගොවීන්ට අද අවශ්‍ය තරම් මඩ පොහොර තිබෙනවාද කියලා අපට අහන්න සිද්ධ වෙලා තිබෙනවා.

එළවලු ගොවියා ගත්තත් එහෙමයි. නොමිලේ දෙනවා කියපු පොහොරත් නැතිව, බීජත් වැඩි මිලට අරගෙන වවා දුන් එළවලුවලට සාධාරණ මිලක් එළවලු ගොවියාට පසුගිය කාලයේ දෙන්න පුළුවන් වුණාද කියලා අපි ආණ්ඩුවෙන් අහනවා. තක්කාලි, වැටකොලු, පතෝල, බණ්ඩක්කා, වට්ටක්කා, රාබු, පිපිඤ්ඤා, බටුවලට රුපියල් 30ක මිලක්වත් පසුගිය කාලයේ ගන්න බැරි වුණා. හැබැයි, පාරිභෝගික අධිකාරිය ගිහිල්ලා පොඩි වණ්ඩි පාට් එකක් දැම්මා. ඒ වණ්ඩි දැන් කොහේද කියලා අපි අහනවා. අද ආර්ථික මධ්‍යස්ථානවල ගජ මිතුරන්ගේ මාෆියාවක් ඇති වෙලා තිබෙනවා කියන එකත් කියන්න ඕනෑ. කොරෝනා රැලි දෙකෙන්ම ඒ තැරැව්කාරයෝ හොඳ ගණනක් සොයාගත්තා. බස්නාහිර පළාතේ මිනිස්සු බඩගින්නේ ඉන්නවා. එළවලු මිල ගිනි

ගණන්. ඒ කියපු 'සැපයුම් ජාලය කෝ' කියලා අපි හැම දාම අහන්නේ ඒ නිසායි. අද එය බිඳ වැටිලා තිබෙනවා. මේ අය වැය තුළ ඒවා යළි ගොඩනහන්න අවශ්‍ය ප්‍රතිපාදන, එහෙම නැත්නම් සැලසුම් ඇතුළත් වාක්‍ය තිබෙන්නේ කොතැනද කියලා අපි දැක්කේ නැහැ. ගොවියාත්, පාරිභෝගිකයාත් රකිනවා වෙනුවට මේ ආණ්ඩුව අතරමැදි ගජ මිතුරන් පෝෂණය කළාය කියන එක කියන්න ඕනෑ. මේ අය වැය මඟින්, පනින රිළවුන්ට ඉණිමං බැඳලා තිබෙනවා. හාල් ගැන කියමින්, "සහන මිලට හාල් දෙන්න" කියනවා. ඒ පාලන මිලට හාල් තිබෙන්නේ කොහේද කියලා අපි අහන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. බඩ ඉරිඟු ගැනත් කථා කරනවා. ත්‍රිපෝෂ මල්ල දෙන්න බඩ ඉරිඟු නැහැ කියනවා. නමුත්, බඩ ඉරිඟු කිලෝ එක රුපියල් 4ට වත්, 5ට වත් දීගන්න බැරිව දඹුල්ලේ බඩ ඉරිඟු ගොවියා අද ළතැවෙන බව අපි දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බීජ අර්තාපල් ගෙන්වන්නේ මේ රටේ ආණ්ඩුව හදන්න මුදල් යහමින් දීපු සමාගම්. ආනයනික බීජ අර්තාපල් කිලෝ 50ක පෙට්ටියක කිලෝ 4ක, 5ක අඩුවක් තිබෙනවා. එතැනත් තිබෙන්නේ වංචාව. කිලෝ 50ක් රුපියල් 25,000යි. එහෙම නම් කිලෝ එකක් රුපියල් 500ක් වෙනවා. බීජ අර්තාපල් පෙට්ටියකින් රුපියල් 2,000ක්, 2,500ක් විතර වංචා කරනවා. මේ ආණ්ඩුව ගජ මිතුරන්ට හොරකම් කරන්න ඉඩ දීලා බලාගෙන ඉන්නවා කියන එක අපි බොහොම අවධාරණයෙන් කියනවා. ඉතින්, 'පාස්' කියන්නේ කොහොමද?

වතු කම්කරුවන් වෙනුවෙන් මම ඉල්ලා සිටිනවා, කරුණාකර, අතිශය දුක් විඳින වතු කම්කරුවන්ට කැරට් අලයක් දික් කරලා ඔවුන් බූරුවෝ කරන්න තව දුරටත් ලැස්ති වෙන්න එපා කියලා. මේ ආණ්ඩුවම හතර වතාවක් කිව්වා, වතු කම්කරුවන්ට දෛනික වැටුප වශයෙන් රුපියල් 1,000ක් දෙනවා කියලා. මේ, එහෙම කියපු හතරවන වතාව. අද ඒ ගෙවීම කරන්න වතු සමාගම්වලට පවරා තිබෙනවා. වතු සමාගම්වලට බෝලය පාස් කරලා තිබෙනවා, ඒ රුපියල් 1,000 ගෙවන්න කියලා. වතු සමාගම් මේ රජයත් එක්ක තිබෙන ගිවිසුම ලබන මාර්තු වන කොට අවසාන වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අය වැයෙන් වතු සමාගම්වලට තර්ජනයක් කරනවා, "රුපියල් 1,000 දෙන්න. නොදුන්නොත් ගිවිසුම අහෝසි කරනවා." කියලා. මේකේ නොලියැවුණු වාක්‍ය තමයි, 'ඒක නොදුන්නොත් අපි ඒකත් ගජ මිතුරන්ට දෙනවා' කියන එක. රුපියල් 1,000 පෙන්වලා, අපේ රජයෙන් වතු කම්කරුවන්ට පර්චස් 7ක් බැගින් ලබා දුන් බව, වතු පාසල් සංවර්ධනය කළ බව මකා දමන්න, යට කර දමන්න කොහොමටවත් බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩියක් දෙන්න. රජයේ සේවකයා ගැනත් කථා කරන්න ඕනෑ. මේ ආණ්ඩුව හදන්න වැඩිම බරක් කරගහපු රජයේ සේවකයා, එහෙම නැත්නම් වැඩ කරන ජනතාව සම්පූර්ණයෙන් අමතක කරලා තිබෙනවා. සේවා කාලයෙන් පසුව පෞද්ගලික අංශයේ සේවය කිරීමට අවස්ථාව දීම, අනාගතයේ සංයුක්ත දීමනාව, අතිකාල දීමනාව ඇතුළු වෙනත් දිරි දීමනා අහෝසි කරන්න ගත් මුල් පියවරක්. විශ්‍රාම ගන්න වයස් සීමාව ඉදිරියට ගෙන යෑම EPF, ETF කොල්ලයකට සූදානමක් ද කියලා අපට අහන්න වෙනවා. මොකද, මීට කලිනුත් එවැනි පෙර පුරුද්දක් ඔබතුමන්ලාට තිබෙනවා. එහෙම නැතිනම්, ඊළඟ ආණ්ඩුව ගන්න එක අත් හැරලා, ඉදිරියේදී එන ආණ්ඩුවට ඒ බර පවරන්න ලැස්ති වෙලා ඉන්නවාද? EPF මුදල් අරගෙන බැංකුවලට දීලා ණය දෙන යෝජනාවක් වග කිවයුත්තෙකු කරනවා මම දැක්කා. විශ්‍රාමිකයන්ට මොකද කළේ? වැඩි කරපු දීමනාව හංගාගත්තා. 2021 අය වැයෙන් එය දෙනවා කිව්වා. නමුත් ඒක මේ අය වැයේ නැහැ. ඒ නිසා මේ අය වැයෙනුත් ජීවිතයේ සැඳෑ භාගය ගෙවන අහිංසක ජනතාව රැවැට්ටුවා. විශ්‍රාමිකයන් අතරිනුත් මේ ආණ්ඩුව ෆේල්.

වැටුප් විෂමතාව ගත්තොත්, ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව ගැන කියලා ඡන්දය ගත්තා. ඊත් මේ අය වැය තුළ ඒ ගැන එක වචනයක්වත් නැහැ. ඒ වාගේම, විශ්‍රාමික වැටුප් විෂමතාව ගැනත් කිව්වා. ඒ අයගේ ඡන්දයත් ගත්තා. නමුත් ඒ ගැන මෙවර අය වැයේ ඉස්පිල්ලක්වත් නැහැ. ඒ වාගේම ලස්සන බොරු කීපයක් මේ අය වැය තුළ තිබෙනවා. හැමෝම කථා කරපු City Universities හතරට වෙන් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 1,000යි. එකකට රුපියල් කෝටි 25යි. මේ මුදලින් university එකක් තියා ගොඩනැඟිල්ලක්වත් හදා ගන්න පුළුවන්ද?

හැම ගමක්ම ආවරණය වන පරිදි මාර්ග කිලෝමීටර් 50,000ක් හදන්න රුපියල් මිලියන 20,000ක් වෙන් කර තිබෙනවා. එතකොට කිලෝමීටරයකට රුපියල් ලක්ෂ 4යි. කාපට් පාරක් හදන්න RDA එකේ ඇස්තමේන්තුව ඊට වඩා වැඩියි.

ධන සෘණ ආර්ථිකයක් ගැන කියනවා. පළමුවැනි කාර්තුවේ ආර්ථික වර්ධන වේගය සෘණ 1.6යි. දෙවැනි හා තුන්වැනි කාර්තුවල ඒ වාර්තා ඉදිරිපත් කරලාත් නැහැ. කිසිම ආදායමකුත් නැතිව සෘණ හැටියට තිබුණු එකක් ධන 6ට ගෙනෙන්න නම් ධන 7.6කින් එය වැඩි කර ගන්න ඕනෑ. ඒක කරන්නේ කොහොමද කියන කාරණය අපට කියන්න ඕනෑ. මේ බොරුවලින් හොඳම බොරුව තෝරා ගන්න කියලා අපි ජනතාවට ආරාධනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට ලැබී ඇති කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

රුපියල් බිලියන 2,900ක් ණයට ගන්නවාලු. මෙවර රුපියල් බිලියන 1,564ක අය වැය හිඟයක් තිබෙනවා. අය වැයේ රුපියල් බිලියන 1,724ක්ම බදු ආදායම්. රුපියල් බිලියන 227ක් බදු නොවන ආදායම්. පොදුවේ ගත්තාම සියයට 88ක්ම බදු.

"කොරෝනාව" අමාත්‍යාංශයක් නොවෙයි කියලා මීට කලින් මේ සභාවේ කිව්වා. නමුත් කියන්න ඕනෑ, සෞඛ්‍ය අමාත්‍යාංශයට මෙවර වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 159ක් බව. 2019 අවුරුද්දේ අපි සෞඛ්‍ය අමාත්‍යාංශයට රුපියල් බිලියන 188ක් වෙන් කළා. ඒ අනුව රුපියල් බිලියන 29ක් කපලා තිබෙනවා. "කොරෝනාව" අමාත්‍යාංශයක් නොවෙයි කියපු අයට අපි කියන්න ඕනෑ, කොරෝනාවට වග කියන සෞඛ්‍ය අමාත්‍යාංශයෙන්ම රුපියල් බිලියන 29ක් කප්පාදු කරලා තිබෙන බව. මාතලේ, මම නියෝජනය කරන දිස්ත්‍රික්කයේ PCR යන්ත්‍රයක් නැහැ. මාතලේ දිස්ත්‍රික්කයෙන් ඒ පරීක්ෂාව කරන්න යවන්නේ නුවරටයි. මේවාට මුදල් වෙන් කරන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා.

මේ අය වැය විස තවරපු රෝස මලක් එහෙම නැත්නම් සීනි තවරපු සයනයිඩ් කරලක් කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ.

[අ.භා. 2.43]

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට කලින් කථා කරපු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය කිව්වා, විපක්ෂ නායකතුමාට මඩ ගහනවා කියලා. එතුමාට මඩ ගහන්න අපට වුවමනාවක් නැහැ. එතුමා පසුගිය

[ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා]

අවුරුදු හතරහමාර තුළ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කරපු දේවල් දිහා බලන කොට එතුමා ෆේල් බව අපේ දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාත් දන්නවා. එතුමා නිවාස 7,000ක් හැදුවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම කිව්වා. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ෆේල් කියන්න බැහැ. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා තමයි හම්බන්තොට දිස්ත්‍රික්කයට වැඩ කළේ.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
ඒක point of Order එකක් නොවෙයි. මම කියන එක පොඩ්ඩක් අහගෙන ඉන්න. එතුමා පසුගිය අවුරුදු හතර හමාරේ නිවාස 7,000ක් හැදුවා. ඒ නිවාස 7,000 හදන්න රුපියල් බිලියන 1.3ක් වියදම් කරලා තිබෙනවා. නමුත් ඒකෙන් බිලියනයක් වෙනම වියදම් කරලා තිබෙනවා, ඒවායේ advertisementsවලට, පෝස්ටර්, කටවුට්වලට. හම්බන්තොට, ලුණුගම්වෙහෙරේ හදන නිවාස යෝජනා ක්‍රමයට කොළඹ පෝස්ටර් ගහන්නේ මොකටද? අනුරාධපුරයේ පෝස්ටර් ගහන්නේ ඇයි? එතුමා, එතුමාගේ ප්‍රතිරූපය නංවන්නට තමයි ඒ මුදල් වියදම් කළේ. නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාගේ press එකේ තමයි සියලු මුද්‍රණ කටයුතු සිද්ධ වුණේ. මම හිතන හැටියට ඒ ගැනත් දැන් සාකච්ඡාවක් තිබෙනවා. එතුමා හම්බන්තොට දිස්ත්‍රික්කයේ තරුණ ළමයින්ට නිවාස සංවර්ධන අධිකාරියේ රැකියා ලබා දීලා, අවුරුදු තුනක් ගත වුණත් ඔවුන්ගේ රැකියා ස්ථිර කළේ නැහැ. ඒ ළමයි විනාශ කරලා දැම්මා. අවුරුදු තුනක් තිස්සේ රුපියල් 10,000ක්, රුපියල් 15,000ක් තමයි ඒ ළමයින්ට දුන්නේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජීවත් වන අපි හොඳටම දන්නවා, ඒ ළමයි දැන් ඉන්නේ ගෙදර. ඒ නිසා කවුද ෆේල් කියලා අහන්න දෙයක් නැහැ. විපක්ෂ නායකතුමා ෆේල් නිසා තමයි හම්බන්තොටින් ඡන්දය ඉල්ලන්නේ නැතිව කොළඹට ආවේ. "පාස්" නම් එතුමාට හම්බන්තොටින් ඡන්දය ඉල්ලන්න තිබුණා.

අතිගරු ජනාධිපතිතුමාගේ රට හදන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුවම අපේ රජය සැලසුම්ගතව, ඉලක්කයක් ඇතිව තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ අය වැයෙන් 2021 - 2023 දක්වා ඉලක්කගත සැලසුමක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ ඉලක්කගත සැලසුමේ ප්‍රධාන ඉලක්ක දෙකක් තිබෙනවා. එකක් තමයි, ආර්ථික පුනර්ජීවනය. අනික් එක තමයි, දිළිඳුකම පිටු දැකීම. ඒ සඳහා තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. සියයට 60ක් වන ආසියානු ජනගහනය ඉලක්ක කරගෙන වෙළෙඳ පොළ ආක්‍රමණය කරන සැලසුම තමයි මේ හරහා සකස් කර තිබෙන්නේ. එහිදී දේශීයත්වයට මුල් තැන දෙනවා, දේශීය ව්‍යාපාරිකයන් ශක්තිමත් කරනවා. ඒ වාගේම පරිසරය සුරක්ෂිත කරමින් තිරසාර යෝජනා තමයි මේ අය වැයෙන් ඉදිරිපත් කර තිබෙන්නේ.

විපක්ෂය කරන්නේ අඳෝනාවක්. ඒ අඳෝනාව මොකක්ද? බදු අඩු කරලා ආණ්ඩුවක් ගෙන යන්නේ කොහොමද කියලා අහනවා. එහෙම කියන ගමන් අනික් පැත්තෙන් කියනවා, ජනතාවට සහන දුන්නේ නැහැයි කියලා. විපක්ෂයේ දෙකොන මාරුවෙලායි තිබෙන්නේ. දෙකොන මාරුවෙලා තිබෙන විපක්ෂය කියන අඳෝනාව තමයි, බදු අඩු කරලා රජයක් පවත්වාගෙන යන්න බැහැයි කියන එක. අපි දැන් ඍජු සහ සරල බදු ක්‍රමයකට පැමිණ තිබෙනවා. ඒක තමයි ජනතාව විශ්වාස කරන්නේ. එතැනින් එහාට ගිහින් ජනතාව ගෙවන බදුවලින් මේ සරල සිල්ලර දේශපාලනය කරන්න අපේ රජය කටයුතු කරන්නේ නැහැ. ජනතාව ගෙවන බදු වෙනුවෙන් ඒ බදු ගෙවන ජනතාවගේ දරුවන්ට හොඳ අනාගතයක්, හොඳ රටක්, සුරක්ෂිත රටක් ඇති කිරීම තමයි අපේ ප්‍රතිපත්තිය. ඒක තමයි අපි කලින් කිව්වේ. ඒකට තමයි තුනෙන් දෙකේ බලයක් ලැබුණේ; ජනාධිපතිතුමාට හැටනවලක්ෂයක් ඡන්දය දුන්නේ. ඒ නිසා විපක්ෂයට ඕනෑ විධියට නොවෙයි අපි බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්නේ. මේ රටේ ජනතාව වෙනුවෙන් තමයි ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නේ.

ඒ විතරක් නොවෙයි. ජනතාවට ඒ සහන ලබා දෙන ගමන්ම අපි මාර්ග කිලෝමීටර් ලක්ෂයේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා. එතැනින් එහාට ගිහින් ඉදිරි වසර තුන, හතර ඇතුළත ජල නළ කිලෝමීටර් 40,000ක් එළන්න කටයුතු කරනවා. ඒ හරහා සැමට බීමට පිරිසිදු ජලය ලබා දෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මා කියන්නේ, හම්බන්තොට දිස්ත්‍රික්කයත් දැනට වකුගඩු රෝගීන් බහුල කලාපයක් බවට පත්වෙලා තිබෙන්නේ, පිරිසිදු ජලය නොමැතිකම නිසා කියලායි. දැනට සියයට 50කට පමණ ලබා දෙන පිරිසිදු ජලය ඉදිරි අවුරුදු තුන, අවුරුදු හතර ඇතුළත සියයට 100 දක්වා වැඩි කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බලයට පත් වුණු පසුගිය කාලය තුළ රැකියා 1,61,000ක් ලබාදීලා තිබෙනවා.

රජයේ සේවකයා ගැනත් මතක් කරන්න ඕනෑ. රජයේ සේවකයාට කිසිම සහනයක් දුන්නේ නැහැයි කියලා එතුමන්ලා කියනවා. රජයේ සේවකයකු හැටියට මා දන්නවා, අපේ ඉලක්කය නිවසක් තනා ගැනීමයි කියලා. පසුගිය කාලයේ රජයේ සේවකයෝ personal loans වශයෙන් නිවාස ණය ගත්තා. ඒ සඳහා වූ පොලිය සියයට 18යි, සියයට 20යි. ඒ පොලී අනුපාතය අපි තනි ඉලක්කමකට ගෙනාවා. රජයේ සේවකයාට නිවසක් තනා ගැනීමට සියයට 7ක අඩු පොලියට ණය ලබා දෙනවා. ඊට අමතරව විදේශ රැකියා සඳහා අවුරුදු දෙකක නිවාඩුවක් ලබා දෙනවා. ඒ වාගේම රජයේ සේවකයාට අමතර රැකියාවක් කරන්නත් මේ අය වැයෙන් යෝජනා කරලා තිබෙනවා. එසේ කර තිබෙන්නේ රජයේ සේවකයාගේ ආර්ථිකය ශක්තිමත් කරන්නයි.

ඒ විතරක් නොවෙයි. ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් ගැන නැවත සමාලෝචනය කරන බව කියන්න ඕනෑ. පසුගිය යහ පාලන ආණ්ඩුව වෙළෙඳ ගිවිසුම් තුනක් ගෙනාවා. ඒ වෙළෙඳ ගිවිසුම් තුන තමයි, සිංගප්පූරු, ඉන්දියානු සහ ඇමෙරිකානු වෙළෙඳ ගිවිසුම්. මේ ඇමෙරිකානු වෙළෙඳ ගිවිසුම, MCC ගිවිසුම, පාස්කු ප්‍රහාරයට සම්බන්ධතාවක් තිබෙනවාද නැද්ද කියලාත් අපට සැකයක් තිබුණා. මොකද, පාස්කු ප්‍රහාරය සිදුවෙලා පැය 12ක් ඇතුළත CIA එක මේ රටට පැමිණ තිබුණා. රජයේ සේවකයන් විධියට, වෛද්‍යවරුන් විධියට අපි පාරට බැහැලා සටන් කළේ මෙන්න මේ වෙළෙඳ ගිවිසුම් ගෙන ඒම වළක්වා ගන්නයි. අපි ඒක වළක්වා ගත්තා. එහෙම වළක්වා ගත්තේ නැත්නම් අද ඒ ජාතිකයෝ මේ රටට පැමිණ වැඩ කරන්න පටන් ගෙන. අපි ඒක වැළැක්වූවා. ඒ සන්තෝෂය අපට තිබෙනවා.

පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ගැන කථා කරනකොට විපක්ෂ නායකතුමාගෙන් මා සාකච්ඡාවක් ඉල්ලුවාම ඒ සාකච්ඡාව දුන්නේත් නැහැ. හැබැයි එතුමා කථා කරන්නේ, දුගී දුප්පත්, අන්ත අසරණ ජනතාව ගැනයි. එතුමා දුගී දුප්පත්, අන්ත අසරණ ජනතාව ගැන කථා කරනවා. නමුත් සෞඛ්‍යය, අධ්‍යාපනය, පෞද්ගලීකරණය කරනකොට ඒ ගැන සාකච්ඡා කරන්න අපි සාකච්ඡාවක් ඉල්ලුවාම අපට සාකච්ඡාවක් දුන්නේ නැහැ. රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය විධියටත්, පෞද්ගලිකවත් අපි සාකච්ඡාවක් ඉල්ලුවා. නමුත් සාකච්ඡාවක් ලබා දුන්නේ නැහැ. ඒ

නිසා ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් ගැන නැවත සමාලෝචනය කිරීම අප විසින් කළ යුත්තක්. ඒ වාගේම අපට කිසි වාසියක් ලැබෙන්නේ නැති වෙළෙඳ ගිවිසුම් අපි අහෝසි කරන්න ඕනෑ. සියයට 50ට, 50 දෙපැත්තට යන විධියට වෙළෙඳ ගිවිසුම් සමාලෝචනය කරන්න ඕනෑ. ඒ සඳහා තමයි අපි ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ගෙනාවේ. ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ගෙනෙන සැලසුම වෙළෙඳ ඇමතිතුමා ක්‍රියාත්මක කරගෙන යනවා.

කොරෝනා වසංගතය ගැන කථා කරනකොට එතුමන්ලා කිව්වේ vaccine එක ගැන.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ vaccine එක ගැන WHO එක තවම ලෝකයට කියලා නැහැ. දැනට එය පරීක්ෂණ මට්ටමේ තිබෙන්නේ. දැනට vaccine දහයක් විතර පරීක්ෂණ මට්ටමේ අවසන් අදියරේ තිබෙනවා. WHO එක කියනවා ඒක අපට දෙනවා කියලා. WHO එක කොහොමත් දියුණු වෙමින් පවතින අපි වාගේ රටවල ජනගහනයෙන් සියයට 20කට ඒ vaccine එක දෙනවා. ඒ නිසා WHO එක කියනවා නම් අපට ඒක දෙනවා කියලා, එතැනින් එහාට කරන්නේ මොකක්ද කියලා අපි දැනට සැලසුම් සකස් කරමින් ඉන්නවා.

අපි හිටපු සෞඛ්‍ය ඇමතිතුමා වාගේ අද රට හිතෙන දෙයක් පසුව දා උදේට කරන්නේ නැහැ. අපි සාකච්ඡා කරලා, විශේෂඥයන්ට භාර කරලා, ඔවුන් හරහා තමයි ඒ ක්‍රියාමාර්ග ගන්නේ. ජනාධිපතිතුමා හැම තිස්සේම කියන්නේ ඒකයි, වැඩිපුර වේලාවක් වැය කර මේ කොරෝනා වසංගතයට මුහුණ දෙන ගමන් ආර්ථිකය ශක්තිමත් කරන වැඩ පිළිවෙළකටත් යන්න කියලා. WHO එක අදටත් අපේ සැලසුම් තමයි ලෝකයටම ලබා දෙන්නේ. ඒ ගැනත් මතක් කරන ගමන් මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 2.52]

**ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**
(மாண்புமிகு எம். டப்ளியு. டீ. சஹன் பிரதீப் விதான)
(The Hon. M. W. D. Sahan Pradeep Withana)
2021 අය වැය ලේඛනය පිළිබඳව කථා කරන මේ වේලාවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මගේ බොහොම හිතවත් දක්ෂ මන්ත්‍රීවරයකු මූලාසනාරූඪව සිටින අවස්ථාවේ මට කථා කරන්න ලැබීම පිළිබඳව මා ඉතාම සතුටු වෙනවා.

අපි දන්නවා, 2014 අපි අද විපක්ෂයේ ඉන්න අයට රට භාර දෙන කොට අය වැය හිඟය තිබුණේ සියයට 5.7ක් බව. හැබැයි, 2019 අපි රට නැවත භාර ගන්න කොට අය වැය හිඟය සියයට 9.6ට වැඩි කරලා තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි 2019 අය වැය ලේඛනය දිහා බැලුවාම, ඒ යහපාලන ආණ්ඩුව පට්ටපල් බොරුවක් කර තිබෙන බව අපි දැක්කා. ආදායම රුපියල් බිලියන 2,497කට ඇස්තමේන්තු කර තිබෙනවා අපි දැක්කා. හැබැයි, 2019 දෙසැම්බර් මාසයේ 31 වැනි දා වෙනකොට සත්‍ය ආදායමට එකතු කර තිබෙන්නේ රුපියල් බිලියන 1,898යි. ඒ අනුව රුපියල් බිලියන ගණනාවක් පිළිබඳ බොරුවක් මේ රටේ ජනතාවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම, ඇස්තමේන්තු වියදම විධියට රුපියල් බිලියන 4,544ක් පෙන්වා, සත්‍ය ලෙස වියදම් කර තිබෙන්නේ රුපියල් බිලියන 2,915යි. එතැන දීත් මේ රටේ ජනතාවට බිලියන 1,628ක් පිළිබඳ යහපාලන ආණ්ඩුව බොරුවක් කර තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලාගේ එදා හිටපු මැති-ඇමතිවරුන්ට අපි පැහැදිලිවම කියන්න ඕනෑ, 2019 අය වැය ලේඛනයෙන් අමාත්‍යාංශවලට මූලධන, පුනරාවර්තන වියදම් කියලා බොරුවට පුම්බා මුදල් වෙන් කළාට, ඒ අමාත්‍යවරුන් පවා ඒ රජය විසින් රවටා තිබුණු බව.

2019 අය වැය ලේඛනය තුළ පුනරාවර්තන වියදමට වෙන් කර තිබුණේ බිලියන 2,350යි. හැබැයි, 2021 වෙනකොට පුනරාවර්තන වියදම 2,677ට ඉහළ දමන්න අපි කටයුතු කර තිබෙනවා. 2019දී මූලධන වියදම් බිලියන 865යි. අපි බිලියන 951ක් අපේ අමාත්‍යාංශවලට සහ රාජ්‍ය අමාත්‍යාංශවලට ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ඒ නිසා සමස්තයක් හැටියට බලනකොට බිලියන -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේ දී කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මියගේ නම යෝජනා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා (බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - பத்திக், கைத்தறி துணிகள் மற்றும் உள்நாட்டு ஆடை உற்பத்தி இராஜாங்க அமைச்சர்)
The Hon. Dayasiri Jayasekara - State Minister of Batik, Handloom and Local Apparel Products)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. HARSHANA RAJAKARUNA *left the Chair, and* THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA *took the Chair.*

**ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**
(மாண்புமிகு எம். டப்ளியு. டீ. சஹன் பிரதீப் விதான)
(The Hon. M. W. D. Sahan Pradeep Withana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2019ට සාපේක්ෂව රුපියල් බිලියන 413කින් අපේ 2021 අය වැය ලේඛනයෙන් ලබා දෙන ප්‍රතිපාදන වැඩි කරන්න අපේ ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් කටයුතු කර තිබෙනවාය කියන එක මේ අවස්ථාවේ දී මා මතක් කරන්න ඕනෑ. ඒ වාගේම මම මුලින් කිව්වා වාගේ අමාත්‍යාංශවලට මූලධන වියදම් සඳහා රුපියල් බිලියන 951ක් වෙන් කර තිබෙනවා. ඊට අතිරේකව විෂයයන් 18ක් සඳහා ප්‍රතිපාදන වශයෙන් රුපියල් බිලියන 87ක් වෙන් කරන්න අපේ රජය කටයුතු කර තිබෙනවා. ඒ තුළින් විශේෂිත වූ විෂයයන් කෙරෙහි දැඩි අවධානයක් මෙවර අපේ රජය යොමු කර තිබෙනවාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

ඒ වාගේම අපි දන්නවා, 2020 සඳහා වූ අතුරු සම්මත ගිණුම් හතරකින් තමයි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට මේ රට පාලනය කරන්න සිදු වුණේ. අතුරු සම්මත ගිණුමකින් රජයේ වියදම් සහ ඇස්තමේන්තුගත වියදම් පමණයි කරන්න පුළුවන්කම තිබෙන්නේ කියලා අපි දන්නවා. නමුත් කියන්න සතුටුයි, අපේ ජනාධිපතිතුමාට, අපේ අගමැතිතුමාට, අපේ රජයට පුළුවන්කම ලැබුණා, සියයට 15ක්ව තිබුණු VAT එක සියයට 8 දක්වා අඩු කරන්න. රැකියා ලක්ෂයේ ව්‍යාපෘතිය තුළ හතළිස්දහසකට රැකියා ලබා දෙන්න පුළුවන්කම ලැබුණා. මේ රටේ සෑම ග්‍රාම නිලධාරි වසමකටම එකක් බැගින් නිවාස 14,000ක් හදන්න පුළුවන්කම ලැබුණා. උපාධිධාරින් හැටදහසකට රැකියා දෙන්න පුළුවන්කම ලැබුණා. කිලෝමීටර ලක්ෂයේ මාර්ග ව්‍යාපෘතිය ආරම්භ කරන්න පුළුවන්කම ලැබුණා. පාලම් ව්‍යාපෘතිය ආරම්භ කරන්න පුළුවන්කම ලැබුණා. කොවිඩ්-19 වසංගතයෙන් මේ රටේ අහිංසක මිනිසුන් රෝගී වනකොට ඒ සඳහා රුපියල් මිලියන 70,000ක් වියදම් කරන්න පුළුවන්කම ලැබුණා. මත්ද්‍රව්‍ය, පාතාලය මේ රටෙන් තුරන් කරන්න පුළුවන්කම ලැබුණා. ජාතික ආරක්ෂාව තහවුරු කරන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගේම, ශිෂ්‍යත්ව විභාගය පවත්වන්න පුළුවන්කම ලැබුණා. ඒ දරුවන්ට ඉක්මනින් ප්‍රතිඵල ලබා දෙන්න පුළුවන්කම ලැබුණා. උසස් පෙළ විභාගය කලට වේලාවට පවත්වන්න පුළුවන්කම ලැබුණා. සියලු බාධක හමුවේ අපේ ජයග්‍රහණ රටට ලබා දෙන්න පුළුවන්කම ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අතිරේක ප්‍රතිපාදනවලට අමතරව මූලධන වියදම් වශයෙන් ජාතික ආරක්ෂාව වෙනුවෙන් රුපියල් බිලියන 38ක්, සෞඛ්‍ය අමාත්‍යාංශයට රුපියල් බිලියන 30ක්, අධ්‍යාපන ක්ෂේත්‍රයට රුපියල් බිලියන 23ක්, වාරිමාර්ග ක්ෂේත්‍රයට රුපියල් බිලියන 42ක්, ප්‍රවාහන ක්ෂේත්‍රයට රුපියල් බිලියන 24ක්, මහාමාර්ග අමාත්‍යාංශයට රුපියල් බිලියන 330ක් වශයෙන් විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

2021 කියන්නේ මේ රටේ තරුණ තරුණියන්ට රැකියා ලබා දෙන වර්ෂය බව අපි පැහැදිලිවම කියන්න ඕනෑ. ඒ වාගේම අ.පො.ස. උසස් පෙළ සමත් තරුණ තරුණියන්ට රැකියා ලක්ෂයක් ලබා දීමේ වැඩ පිළිවෙළ 2021 වර්ෂයේදී ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, අපේ ආර්ථිකයේ නවෝදයක් ගොඩනැඟෙන වර්ෂය තමයි 2021 වර්ෂය. එම නිසා අපි පැහැදිලිවම කියනවා, 2021 වර්ෂය තුළ මේ රටේ ජනතාවට විශාල ශක්තියක් ලබා දෙන්න පුළුවන් යුගයක් බිහි කරන්න අපේ අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත්, අපේ රජයත් සූදානම් බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන් මේ කාරණයත් මම කියන්න ඕනෑ. එදා තිස් අවුරුදු යුද්ධය පවතින වෙලාවේ රටවල් අතර සහසම්බන්ධය ඇති කරගෙන, උතුරු වසන්තය, නැඟෙනහිර උදානය හරහා රටේ ආර්ථික සංවර්ධනය ඇති කරලා, මේ රට දියුණු කරන්න ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා විශාල වශයෙන් ශක්තිය ලබා දුන්නා. එතුමා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හදලා, අපේ රටට අගමැතිවරයෙක්, ජනාධිපතිවරයෙක් දායාද කරලා, මන්ත්‍රීවරු හැටියට පත් වන්න අපට අවස්ථාව උදා කර දුන්නා. නමුත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නිර්මාතෘවරයා අද පාර්ලිමේන්තුවේ නැහැ. එම නිසා බැසිල් රාජපක්ෂ මැතිතුමනි, නවක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා පුළුවන් ඉක්මනට පාර්ලිමේන්තුවට ඇවිල්ලා අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත් ශක්තියක් වෙන්න; ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ශක්තියක් වෙන්න කියලා අපි ආයාචනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.00]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකාවේ 75 වැනි අය වැය සම්බන්ධව අද වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වනවා. මෙවර අය වැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාව වන විට රටේ තිබෙන තත්ත්වය මොකක්ද කියලා පළමුවෙන්ම අපි සියලුදෙනා බුද්ධිමත්ව කල්පනා කරලා බැලුවොත් හොඳයි කියා මා විශ්වාස කරනවා. අවුරුදු ගණනාවකට පසුව ඇති වුණු දැවැන්ත ව්‍යසනයකට අද මුළු ලෝකයම මුහුණ දෙමින් සිටිනවා. අද ලෝක ජනගහනයෙන් පන්කෝටි පනස්හයලක්ෂයකට කොරෝනා රෝගය වැලඳිලා තිබෙනවා. අතේ ඇඟිලි ගණනටත් අඩු සංඛ්‍යාවක් තමයි රෝගය ව්‍යාප්ත නොවූ රටවල් තිබෙන්නේ. ඉතාම දැවැන්ත ව්‍යසනයක් විධියට මේ කොවිඩ් වසංගතය ලෝකයේ හැම තැනකටම ව්‍යාප්ත වෙමින් පවතින තත්ත්වයක් තමයි තිබෙන්නේ.

මරණ සංඛ්‍යාව 1,340,000ක්. මීට කලිනුත්, ලෝකයටම බලපාන අයුරින් මේ වාගේම තත්ත්වයක් ඇති වුණා. ඒක තමයි, 1929 සිට 1930 අග භාගය වන තෙක් ඇති වුණු, 20වන සියවසේ මහා පරිහානිය, නැත්නම් Great Depression කියන තත්ත්වය. ඒ කාලයේ ලෝකයේ හැම රටකම අර්බුද රාශියක් ඇති වුණා. ලෝකයේ දළ ජාතික නිෂ්පාදනය සියයට 15කින් කඩාගෙන වැටුණා. ඇමෙරිකාවේ දළ දේශීය නිෂ්පාදනය සියයට 1ක් දක්වා පහළ ගියා. අන්තර්ජාතික වෙළෙඳාම සියයට 50කින් කඩා වැටුණා. සේවා වියුක්තිය නිසා ලක්ෂ ගණනක් ජනතාව පාරට ඇද වැටුණා. ඇමෙරිකා එක්සත් ජනපදයේ විතරක් රැකියා වියුක්තිය සියයට 23ක් දක්වා ඉහළ ගියා. සමහර රටවල සේවා වියුක්තිය සියයට 33 දක්වා වැඩි වුණා. අදත් එවැනි සුළඟකට මුළු ලෝකයම හසුවෙලා තිබෙනවා කියලායි මට හිතෙන්නේ.

1929ත්, 1930ත් අතර කාලයේ ලෝකයේ ඇති වුණු Great Depression වාගේ තත්ත්වයක් අදත් ලෝකය පුරාම පැතිරී තිබෙනවා. එහි වගකීම එක ආණ්ඩුවකට පමණක් භාර කරන්න බැහැ. කොරෝනා ව්‍යසනය නිසා ලෝකයම කඩා වැටිලා තිබෙන වෙලාවක තමයි අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාටත්, මහින්ද රාජපක්ෂ අගමැතිතුමා ඇතුළු අපේ ආණ්ඩුවටත් අද අර්බුද රැසකට මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ. මෙම තත්ත්වය තුළ අපට උඩුගම් බලා පීනන්න පුළුවන් වාතාවරණයක් නැහැ. මේ ව්‍යසනයට අපි සියලුදෙනාම මුහුණ දෙන්න ඕනෑ. මෙක ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ

ප්‍රශ්නයක්වත්, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ප්‍රශ්නයක්වත්, එහෙම නැත්නම මේ ආණ්ඩුවේ ප්‍රශ්නයක්වත් නොවෙයි. ඒ විධියට කල්පනා කළොත් පමණයි, අපට රටක් විධියට මේ තත්ත්වයෙන් ගොඩ එන්න පුළුවන් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, McKinsey & Company එකෙන් සමීක්ෂණයක් කළා. ඒ සොයා බැලීම තුළ ඔවුන් සඳහන් කරනවා, ලෝකයේ හැම රටකම ආර්ථිකයන් සියයට 50කින් කඩා වැටෙන තත්ත්වයට පත් වෙයි කියලා. පසුගිය දිනක ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා රටේ ආර්ථිකය සම්බන්ධයෙන් කරුණු 7ක් ඉදිරිපත් කළා. එතුමා බොහොම පැහැදිලිව කිව්වා, වසර 70කට පසු ලංකාවේ අඩුම ආර්ථික වර්ධන වේගය දැන් වාර්තා වෙලා තිබෙනවා කියලා. ඒක අපි කවුරුවත් කියන්න ඕනෑ නැහැ. එතුමා කියන්න ඕනෑත් නැහැ. ලංකාවේ විතරක් නොවෙයි, ඒක තමයි ලෝකයේම තත්ත්වය. ඒක අපි සියලුදෙනාම දවස ගණනේ අත් දකිමින් තිබෙනවා.

චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුව කාලයේ ලංකාවේ ආර්ථික වර්ධන වේගය සියයට සෘණ 1.2ක් වුණා. අද එය සියයට සෘණ 4.5ක් වැනි අගයකට ගිහින් තිබෙනවා. ලංකාවේ විතරක් නොවෙයි, ලෝකයේ හැම රටකම තත්ත්වය මේක තමයි. මම උදාහරණයක් කියන්නම්. කැනඩාවේ ආර්ථික වර්ධන වේගය සියයට සෘණ 7.1යි. චීනයත්, වියට්නාමයත් විතරයි යන්තම් බේරුණු රටවල් විධියට තිබෙන්නේ. චීනයත්, වියට්නාමයත් ආර්ථික වර්ධන වේගය සියයට 1.9ක මට්ටමේ පවත්වාගෙන යනවා. ඉතාම දියුණු රටක් වන ප්‍රංශයේ ආර්ථික වර්ධන වේගය සියයට සෘණ 9.8යි. ජර්මනියේ සෘණ 6යි. ඉන්දියාවේ ආර්ථික වර්ධන වේගය සෘණ 10.3යි. තායිලන්තයේ සෘණ 7.1යි. එක්සත් රාජධානිය වාගේ දැවැන්ත රටකත් ආර්ථික වර්ධන වේගය සියයට සෘණ 9.8යි. ඇමෙරිකා එක්සත් ජනපදයේ සියයට සෘණ 4.3ක් වාගේ දැවැන්ත කඩා වැටීමක් වෙයි කියා පුරෝකථනය කරලා තිබෙනවා. මේක තමයි තත්ත්වය. එම තත්ත්වය අවබෝධ කර ගන්නේ නැතිව අපට මේ ගමන යන්න බැහැ.

අද විපක්ෂය කථා කරන මූලිකම කාරණය තමයි, විදේශීය ණය පිළිබඳ ප්‍රශ්නය. එතුමන්ලා දිගින් දිගටම කිව්වා, "රට කඩාගෙන වැටෙනවා, රටට ණය ගෙවන්න බැරුව යනවා, රට විශාල ආර්ථික අර්බුදයකට යනවා, ඒ හේතුවෙන් රටේ මිනිසුන්ට විශාල කඩා වැටීමකට මුහුණ දෙන්න වෙනවා" කියලා. හැබැයි, අපි කවුරුත් දන්නවා, 2015, 2016, 2017 ඉඳලා අපි පුරෝකථනය කළ විධියට 2019, 2020, 2021, 2022 අවුරුදුවලදී ණය වශයෙන් අපට ඇමෙරිකානු ඩොලර් බිලියන 4.5 ගණනේ ගෙවන්න සිද්ධ වෙන බව. ඔබතුමන්ලාගේ පැත්තේ ඉන්න අයත්, අපේ පැත්තේ ඉන්න අයත්, ආණ්ඩු කරපු අයත්, විපක්ෂයේ හිටපු අයත්, මේ රටේ සියලුදෙනාත් ඒක දැනගෙන සිටියා. දැන් ඒක තවත් වර්ධනය වෙන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. හේතුව, අපි ණය ගන්න, ගන්න අපේ ගෙවුම්වල ප්‍රමාණය තව දුරටත් වැඩි වෙන නිසා. ඒක තමයි, යථාර්ථය. ලංකාව විතරක් නොවෙයි, අද ලෝකයේ හැම රටක්ම ණයවලින් තමයි ඉදිරියට යන්නේ. ආදායම් මාර්ග අඩු වෙනකොට ණය අරගෙන තමයි රටේ සියලු සංවර්ධන කටයුතු සිද්ධ කරන්නේ.

මම කලින් සඳහන් කළ පරිදි, 2020 සිට 2023 දක්වාම ණය සඳහා ඇමෙරිකානු ඩොලර් බිලියන 4.5 ගණනේ අපට ගෙවන්න වෙනවා. එවැනි තත්ත්වයක් තමයි දැන් ඇතිවෙලා තිබෙන්නේ. අවුරුදු ගණනාවක් තිස්සේ දිගින් දිගටම අපි මේ කාරණය මතක් කළා. 2025 දක්වා, ආසන්න වශයෙන් ඩොලර් බිලියන 4.5 ගණනේ අපට ගෙවන්න වෙනවා. 2009දී අපේ විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 7.6යි. අද ඒ ප්‍රමාණයේ යම් අඩු වීමක් තිබුණත්, එය ඩොලර් බිලියන 5.9ක් වැනි අගයක තබාගෙන ඉදිරියට යා හැකි වැඩ පිළිවෙළ අපි දැන් සකස් කර තිබෙනවා. 2020 අවුරුද්දේ ගෙවන්න තිබෙන ඩොලර් බිලියන 4.5න් විශාල මුදලක් මේ වන විට අපි ගෙවා අවසානයි. තවත් ඩොලර් මිලියන 300ක් ගෙව්වාම මේ අවුරුද්දේ අපට ගෙවන්න තිබෙන විදේශ ණය ප්‍රමාණය අවසන් වෙනවා. එම නිසා, අපට ණය ගෙවන්න බැහැ කියලා කියපු විපක්ෂයට මම මේ කාරණය මතක් කරන්න කැමැතියි. ඔබතුමන්ලා කලබල වෙන්න ඕනෑ නැහැ, ඒකට අවශ්‍ය සියල්ල ආණ්ඩුවක් විධියට අපි සකස් කර තිබෙනවා. අපි ණය ගෙවීම අතින් ඉතාම ඉහළ තැනක සිටින රාජ්‍යයක්; ණය නැවත ගෙවන ආණ්ඩුවක්. ඒ ගැන අපි සන්තෝෂ විය යුතුයි.

අනික් කාරණය මෙයයි. 2021 අවුරුද්දේ අපට තවත් ඩොලර් බිලියන 4.3ක් ණය ලෙස ගෙවන්න වෙනවා. මේ විධියට, අවුරුද්දෙන් අවුරුද්ද මේ ක්‍රියාදාමය වැඩි කරන්න, නැත්නම් මේ ණය ගෙවාගන්න අවශ්‍ය නම් අපි කළ යුතු කාර්යයන් ගණනාවක් අද තිබෙනවා.

අපේ හර්ෂ ද සිල්වා මැතිතුමා ආර්ථිකය පිළිබඳව කළා. කියන කොටම එතුමා මේ සභාවට එනවා. ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා ඉතාම හොඳ කෙනෙක්; අපේ ළඟම මිත්‍රයෙක්. එතුමා ආර්ථික විශේෂඥයෙක්. එතුමා අහන්නේ අපේ ආර්ථික දර්ශනය මොකක්ද කියලායි. අපි බොහොම පැහැදිලිව කියා තිබෙනවා, අපි නිෂ්පාදන ආර්ථිකයක් කරා යන රාජ්‍යයක් හදා තිබෙන බව. ඒ වාගේම, නිෂ්පාදන ආර්ථිකය වැඩිදියුණු කරලා, ඉපැයීම් වැඩි කර ගන්නා වැඩ පිළිවෙළකට අපි ගමන් කරමින් ඉන්නවා. භාණ්ඩ හා සේවා අපනයනය වැඩි කර ගැනීමේ වැඩ පිළිවෙළකුත් අපි ක්‍රියාත්මක කරනවා.

අපි ආනයන ආදේශන ප්‍රතිපත්තියක් හදා තිබෙනවා. විපක්ෂය පසුගිය කාලයේ කියපු කාරණා නිසා අද ලෝක ප්‍රජාව විතරක් නොවෙයි, යුරෝපා සංගමයත් අපි ආනයන තහනම් කිරීම ගැන අපේ රටට විරුද්ධව විශාල ප්‍රශ්නයක් මතු කරනවා. ඇත්තටම, විපක්ෂය ගෙන ගිය වැඩ පිළිවෙළේ ප්‍රතිඵලයක් විධියටයි මේක පටන් ගත්තේ. අපේ රටේ හදා ගන්න පුළුවන් දේ ඇයි අපි පිට රටින් ගෙනෙන්නේ කියලා ඒ ගොල්ලන් කල්පනා කළේ නැහැ. 'ලංකාව ආනයන තහනම් කර තිබෙනවා, ලෝකයේ තිබෙන වෙළෙඳ ගිවිසුම් සම්පූර්ණයෙන් කඩාකප්පල් කරන තැනකට මේ ආණ්ඩුව තල්ලුවෙලා තිබෙනවා' කියන වැරදි මතය ලෝකයේ රාජ්‍යයන්ට යවා ඒ තුළ අපේ රට විශාල හිරවීමකට තල්ලු කරන්නයි මේ අය උත්සාහ කළේ.

ආණ්ඩුවේ ඇමතිවරයකු විධියට මම පැහැදිලිව කියන්න කැමැතියි, අපි ඉන්නේ ආනයන ආදේශන ප්‍රතිපත්තියක බව. රට ඇතුළේ හදාගන්න පුළුවන් හැම දෙයක්ම අපි හදා ගන්නවා. පිට රටින් ගෙන්වන්න තිබෙන ඒවා අපි කිසි වෙලාවක නවත්වා නැහැ. පිට රටින් ගෙන්වන්න තිබෙන හැම දෙයක්ම අපි අනිවාර්යයෙන්ම ලංකාව තුළට ගෙන්වනවා. ලංකාව තුළ අපට හදා ගැනීමට පුළුවන් ටික හදා ගන්නා වැඩ පිළිවෙළට අපි යනවා. ඒකට කවුරුත් අලගු තියන්න අවශ්‍ය නැහැ.

2018 අවුරුද්ද ගත්තොත්, ඒ වසරේ සංචාරක කර්මාන්තයෙන් අපි ඩොලර් බිලියන 4.3ක ආදායමක් ලැබුවා. හැබැයි මේ වැඩ පිළිවෙළ තුළ, 2020 අවුරුද්දේ පළමුවැනි මාස තුනේදී ඩොලර් මිලියන 900ක ආදායමක් අපට ලැබුණු බව තමුන්නාන්සේලාත් දන්නවා. නමුත් මේ කොවිඩ් තත්ත්වයත් එක්ක අද වනකොට සංචාරක ව්‍යාපාරයේ ආදායම සම්පූර්ණයෙන් බින්දුවට වැටී තිබෙන බව අපි සියලුදෙනාම දන්නවා. අපට ගිය අවුරුද්දේ මේ ආදායම හම්බ වුණා; 2015දී, 2016දී, 2017දී, 2018දී මේ ආදායම හම්බ වුණා. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට අවුරුද්දේ පළමුවැනි මාස තුනෙන් පස්සේ සංචාරක ව්‍යාපාරයෙන් ශත පහක් හම්බ වුණේ නැති වාතාවරණයක් තුළ තමයි අපට රටේ ආර්ථිකය ගෙන යන්න වෙන්නේ. හැබැයි, මේ ගැන කවුරුත් කථා කරන්නේ නැහැ.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ඊළඟට, අපේ අපනයන පිළිබඳව බලමු. විශේෂයෙන්ම, ඇඟලුම් අපනයනය ගත්තොත්, මේ කොවිඩ් වසංගතයත් එක්ක අද ලංකාවේ ඇඟලුම් කර්මාන්තශාලා විශාල සංඛ්‍යාවක් වැහිලා තිබෙනවා. නැත්නම් තාවකාලිකව ඒවායේ වැඩ කටයුතු නවත්වා තිබෙනවා. එම නිසා, ඩොලර් බිලියන 3 සිට 4.5 දක්වා වැඩි වූ ඒ ආදායම් මාර්ග සැහෙන ප්‍රමාණයක් අද කඩා වැටී තිබෙනවා. මේ සියලු අර්බුද මැද තමයි අප මේ අය වැය ඉදිරිපත් කරන්නේ. ඉදිරි කාලය තුළ කොවිඩ් vaccine එක ලබා ගෙන අපට ඉදිරියට යන්න පුළුවන් නම්, සංචාරක ව්‍යාපාරය දියුණු කර ගෙන මේ ආර්ථික ක්‍රමවේදය තවත් ශක්තිමත් කරන වැඩ පිළිවෙළකට අපට යන්න පුළුවන්.

ඊළඟට මම කියන්න කැමැතියි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගැන. මට මතකයි පසුගිය කාලයේ අපේ රවි කරුණානායක මැතිතුමා බොහොම පැහැදිලිව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අයත් එක්ක කථා කළ බව. ඒ වැඩපිළිවෙළ තුළ ප්‍රශ්න ගණනාවක් ඇති වුණා. දේශීය නිෂ්පාදකයන්ට බදු සහන දීලා, දේශීය නිෂ්පාදන වර්ධනය කරන එක නොවෙයි, ඒ අය කළේ. මේ රටේ දේශීය නිෂ්පාදකයන්ට, දේශීය ව්‍යාපාරිකයන්ට අවශ්‍ය ශක්තිය දෙන වැඩ පිළිවෙළ වෙනුවට, ඔවුන් වෛරක්කාරයන් විධියටයි සැලකුවේ. ඔවුන්ගෙන් අය කරන බදු ප්‍රතිශතය වැඩි කළා. සියයට 15 දක්වා වැට් එක වැඩි කරලා, මේ රටේ ගමක කුඩා කඩයක් කරන මිනිහාගේ සිට සාමාන්‍ය ව්‍යාපාරිකයා පවා පාරට බහින තත්ත්වයට පත් කළා. ඒ කාලයේ අපි අමාත්‍යවරු විධියට අපේ ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් එක්ක සාකච්ඡා කරලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපි මේකට මැදිහත් වුණා. අපි ගිහිල්ලා කිව්වා, "මේක කරන්න එපා. මේකෙන් රට ඇතුළේ විශාල අර්බුදයක් ඇති වනවා" කියලා. මේ ආර්ථික සංකෝචනය තමයි දිගින් දිගටම අපි දැක්කේ.

දේශීය ව්‍යාපාරිකයන්ට බදු සහන දීලා, දේශීය ව්‍යාපාරිකයන් ශක්තිමත් කරලා, දේශීය ව්‍යාපාරිකයන්ට අලුත් ආයෝජනවලට යන්න අවස්ථාව දීම පැත්තක තියලා ක්‍රියා කිරීමේ ප්‍රතිඵලය තමයි ඔබතුමන්ලා අපි සියලුදෙනාම අත් වින්දේ. ඒකේ ප්‍රතිඵලය මොකක්ද? කෘෂිකර්මය ගනිමු. 2014 වනකොට සියයට 4ට තිබුණු කෘෂිකර්මය, 2017 වනකොට සියයට 0.8ට වැටුණා. ඒක තවත් පහළට වැටිලා, 2019 අන්තිම වනකොට සියයට 0.6 වනතෙක් වැටිලා තිබෙනවා. ඊළඟට කාර්මික අංශය 2014 සියයට 4.7 ඉඳලා, 2017 වනකොට සියයට 3.9ට වැටුණා. සේවා අංශයත් පහළට වැටුණා. 2014 සියයට 4.8 ඉඳලා 2017 වනකොට සියයට 3.2 දක්වා පහත වැටුණා. ඒ වැඩපිළිවෙළ තුළ Super Gain Tax එක ගෙනාවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩි කීයක්ද තිබෙන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි දෙකක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට විනාඩි 15ක් තිබුණා.

ඒ ක්‍රියාදාමය අපි අත්දකිමින් තිබුණා. Super Gain Tax එක ගහලා, මන්දිර බද්ද ගහලා විශාල අර්බුදයක් රට ඇතුළේ ඇති කළා. එතැනින් පස්සේ ආර්ථික වර්ධනය සියයට 2.3 වැටුණා. එතැනින් පස්සේ තමයි රට ඒ තත්ත්වයට පත් වුණේ.

අද අපි වැඩ පිළිවෙළ රාශියක් ගෙනැල්ලා තිබෙනවා. දේශීය නිෂ්පාදකයන්ට බදු සහන දීලා, ඔවුන් ආයෝජනවලට පොලඹවන වැඩපිළිවෙළ අපි සකස් කරලා තිබෙනවා. ඉදිරි වසරේ අපේ ප්‍රාග්ධන වියදම සියයට 6.1යි. එය 2020 තිබුණේ සියයට 2.6යි. ප්‍රාග්ධන වියදම වැඩි වනකොට අපේ අය වැය හිඟය වැඩි වන එක අහන්න දෙයක් නොවෙයි. නමුත්, අපි කෙටිකාලීන වැඩ පිළිවෙළක් සකස් කරලා, ඒකට මුහුණ දීලා අලුත් වැඩ පිළිවෙළ රාශියක් ක්‍රියාත්මක කරනවා.

තාක්ෂණ උද්‍යාන 5ක් හදන්න අපි රුපියල් මිලියන 10,000ක් වෙන් කරලා වැඩ පිළිවෙළක් සකස් කරනවා. ඉදිරි වසරේ සෞඛ්‍ය සේවයට රුපියල් මිලියන 18,000ක අතිරේක ප්‍රතිපාදන සැපයීමට අපි බලාපොරොත්තු වනවා. වැවිලි අතිරේක ප්‍රතිපාදනවලට රුපියල් මිලියන 2,000ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම තමයි පුනර්ජනනීය බල ශක්තියට. මෙගාවොට් ලක්ෂයකට වොට් 5ක පුනර්ජනනීය බල ශක්තිය ගෙනෙන්න අපි වැඩ පිළිවෙළ සකස් කරනවා. කවදාවත් අපි අහලා තිබුණේ නැහැ බිංදු ජල සම්පාදනය - drip irrigation - ගැන. ඒ හරහා ව්‍යවසායකයන් 10,000ක් බිහි කරන්න සියයට 4 පොලියට ණය දෙන වැඩ පිළිවෙළක් අපි සකස් කරලා තිබෙනවා. මේ විධියට ගත්තාම විශාල වැඩ පිළිවෙළක් අපි සකස් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ කාරණය කියලා කථාව අවසන් කරන්නම්. මුදල් විශුද්ධිකරණය පිළිබඳව ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා විශාල හා හුවක් මේ පාර්ලිමේන්තුවේ ගෙනිච්චා. මතක තබා ගන්න, කිසි විටෙක විදේශ රටවල තිබෙන මුදල් ලංකාවට ගෙනෙන්න අපි ඉඩ තබන්නේ නැහැ. අපි කියන්නේ ලංකාව ඇතුළේ හංගගෙන ඉන්න මුදල් ටික ව්‍යාපාරවලට ආයෝජනය කරන්න කියලා. ඒවාට සියයට 1ක බද්දක් අය කරලා ආයෝජනය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි සකස් කරලා තිබෙනවා.

මංගල සමරවීර මහත්මයා එළියේ ඉඳලා කියනවා, "ලංකාව අළු ලේඛනයට ඇතුළත් වෙන්න පුළුවන්" කියලා. එදා අළු ලේඛනයට ඇතුළත් වුණේ වෙන හේතුවක් නිසා නොවෙයි. යහ පාලනයෙන් මුදල් විශුද්ධිකරණ පනත ගෙනාවා. ඊළඟට, රවි කරුණානායක මහත්මයා විනිමය පාලන පනත අහෝසි කරලා, විදේශ විනිමය පනත ගෙනැල්ලා තමයි ඒ වැඩ පිළිවෙළ සකස් කළේ.

අද ආණ්ඩුවේ අසමත්කම ගැන හරින් ප්‍රනාන්දු මැතිතුමා කථා කරලා තිබුණා. 2015 - 2019 යනතෙක් ගුගල් බැලුම අරින්න බැරිව හරින් ප්‍රනාන්දු මැතිතුමා ෆේල් වුණා. තාත්තා කිව්ව දේ එදා ඇහුවේ නැත්නම්, එතුමා ජීවිතයෙන්ම ෆේල් වෙන්න තිබුණා. නමුත් හරින් ප්‍රනාන්දු මැතිතුමා, ජනතාවගෙන් ෆේල් වුණා. බ්‍රිතාන්‍යයේ ඉඳලා ලංකාවට කුණු ලොරි ගෙනාපු වැඩ පිළිවෙළින් හරින් ප්‍රනාන්දු මැතිතුමන්ලා ෆේල් වුණා. රටේ ජාතික අවශ්‍යතාව පාවා දීලා, සිංගප්පූරු ගිවිසුම අත්සන් කරලා, හරින් ප්‍රනාන්දු මැතිතුමන්ලා ෆේල් වුණා. මහ බැංකුව කඩලා, හරින් ප්‍රනාන්දු මැතිතුමන්ලා ෆේල් වුණා. හම්බන්තොට වරාය විකුණලා ෆේල් වුණා. මත්තල ගුවන් තොටුපොළ විකුණලා ෆේල් වුණා. ජිනීවාවලට ගිහින් හමුදාව පාවා දීලා හරින් ප්‍රනාන්දු මැතිතුමන්ලා ෆේල් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ෆේල් වන මිනිස්සු හැම දාම පාස් වන මිනිසුන් කෙරෙහි ඊර්ෂ්‍යායි. ඒ නිසා හරින් ප්‍රනාන්දු මැතිතුමන්ලාට මම කියනවා, ඔබතුමන්ලාගේ අසමත්කම තවදුරටත් පෙන්වන්න එපා කියලා. අපේ මේ වැඩ පිළිවෙළ තුළ අවුරුදු 5කින් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සහ මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු ආණ්ඩුව පාස් ද, ෆේල්ද කියන එක ජනතාව තීන්දු කරයි කියන එකත් මතක් කරමින්, ශක්තිමත් මේ අය වැය හරහා රටේ අනාගතය ශක්තිමත් කරන්න අපි වැඩ කරනවාය කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.16]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை வரலாற்றிலே அதிக முறை பாதீட்டைச் சமர்ப்பித்த பெருமைக்குரியவரான மாண்புமிகு பிரதமர் மஹிந்த ராஜபக்ஷ அவர்களினால் சமர்ப்பிக்கப்பட்ட 2021ஆம் ஆண்டுக்கான பாதீடு தொடர்பான விவாதத்திலே உரையாற்றுவதையிட்டு உண்மையிலே மகிழ்ச்சியடைகின்றேன். இந்த அரசு ஆட்சிக்கு வந்த ஒரு வருடத்திலேயே "Sir" fail என்பதை மக்கள் உணரத் தொடங்கிவிட்டனர். ஒரு தசாப்த காலத்திற்கும் மேலாக மஹிந்த ராஜபக்ஷ சகோதரர்களினால் நாட்டில் சமர்ப்பிக் கப்பட்ட பாதீட்டின்மூலம் நாட்டின் கடன் தொகை அதிகரித்துக்கொண்டே வருகின்றது.

இந்தப் பாதீடானது, கோட்டாபய ராஜபக்ஷ அவர்களின் தலையில் கிரீடத்தை அணிவித்த 69 லட்சம் மக்களுக்காக உருவாக்கப்பட்டதா? இல்லை. தம்முடைய நண்பர்கள், வியாபாரிகள், அரசியல்வாதிகளுக்காக உருவாக்கப்பட்டது. கொவிட்-19ஆல் பாதிக்கப்பட்ட மக்களின் வாழ்க்கைத்தரத்தை முன்னேற்றுவது பற்றி இதிலே எதுவும் குறிப்பிடப் படவில்லை. உலகப் பொருளாதாரமே கொவிட்-19ஆல் பாதிக்கப்பட்டிருக்கின்றது. அதை மீட்டெடுக்க உலக நாடுகள் போராடிக்கொண்டிருக்கின்ற நேரத்தில் சமர்ப்பிக்கப்பட்ட இந்தப் பாதீட்டில் கொவிட்-19 தொடர்பாக மிகச் சிறிய அளவிலே குறிப்பிடப்பட்டுள்ளது. உண்மையிலே இது ஆச்சரியத்திற்குரிய விடயமாகக் காணப்படுகின்றது. கொவிட்-19இலிருந்து மீட்சி பெறுவது பற்றிக் குறிப்பிடப்படாதது கவலைக்குரிய ஒரு விடயமாகக் காணப்படுகின்றது. இதைத் தயாரித்தவர்கள் இலங்கையிலிருந்துதான் இதனைத் தயாரித்தார்களா? அல்லது வேறு உலகில் அல்லது வேறு கிரகணத்திலிருந்து இதனைத் தயாரித்தார்களா? என்று தெரியவில்லை.

வீட்டு வாடகை செலுத்த, தண்ணீர் மற்றும் மின்சாரக் கட்டணம் செலுத்த, மருத்துவத் தேவைகளுக்குப் பணம் இல்லாமல் தவிக்கும் மக்களுக்கான நிவாரணம் பற்றி இதிலே என்ன கூறப்பட்டுள்ளது? ஆனால், ஒன்றைக் கூறிக்கொள் கின்றார்கள். கறுப்புப் பணத்தை வெள்ளைப் பணமாக மாற்றுவது பற்றி! நாட்டைக் கட்டியெழுப்ப எங்கிருந்தாவது, எவ்வாறாவது பணம் கொண்டுவர வேண்டும் என்று 'வியத்மக' அமைப்பினர் கூறினார்கள். வெளிநாட்டிலுள்ள கறுப்புப் பணத்தை வெள்ளைப் பணமாக மாற்றும் முறை பற்றித்தான் இவர்கள் கூறியிருக்கின்றார்களென்பது இப்பொழுது தெரிகின்றது. யாரின் தேவைக்காகக் கறுப்புப் பணத்தை வெள்ளைப் பணமாக மாற்ற முயற்சிக்கின்றார்கள்? நாட்டைக் கட்டியெழுப்பவா? மக்களுக்கு நிவாரணம் வழங்கவா? இல்லை. அரசை ஆட்சிக்குக் கொண்டுவந்த தமது நண்பர்களுக் காகவும் அரசியல்வாதிகளுக்காகவும் வெளிநாடுகளிலுள்ள கறுப்புப் பணத்தை இங்கு கொண்டுவருவதற்கான முயற்சியைச் செய்கின்றார்கள். இதோ, இந்தப் பாதீட்டை வாசித்துப் பாருங்கள்! இதில் எங்காவது அரசின் வருமானம் தொடர்பில் குறிப்பிடப்பட்டிருக்கின்றதாதவென்பதைப் பாருங்கள்! இலங்கை வரலாற்றிலே அதிக பணம் அச்சடிக்கப்பட்ட காலப்பகுதியாகவும் நாட்டில் வருமானம் குறைந்த காலப்பகுதியாகவும் இக்காலப்பகுதி இருக்கின்ற அதேநேரம், நாட்டுக்கு வருமானம் கிடைக்கும் முறைகள் பற்றிய எந்தவொரு தகவலும் இதிலே உள்வாங்கப்படாதது வேடிக்கையான விடயமாகும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தப் பாராளுமன்றத்திலே ஆளும் தரப்பினைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்கள் பேசுகின்றபோது, ஏதோ அவர்கள் இன்றுதான் அரசாங்கத்தை அமைத்தவர்கள்போன்ற எண்ணப்பாட்டுடன் கருத்துக்களை முன்வைத்தார்கள். இங்கேயிருக்கின்ற சில உறுப்பினர்கள், அமைச்சர்கள் 20 வருடத்திற்கும் மேலாக அரசிலே இருக்கின்றார்கள். எங்களுடைய நல்லாட்சி அரசாங்கத்தின் 51 நாட்களைக் களவாக வைத்திருந்தவர்கள்தான், இன்று இந்த இடத்திலே அப்படிப் பேசுகிறார்கள். ஆட்சியைப் பிடிப்பதற்காக அவர்கள் மத்திய வங்கிக் கொள்ளை பற்றிப் பேசினார்கள்; ஈஸ்டர் தாக்குதலைப் பற்றிப் பேசினார்கள்.

இன்று அரசாங்கத்திலிருக்கின்ற அமைப்பாளர்கள் அல்லது அமைச்சர்கள் மத்திய வங்கிக் கொள்ளை சம்பந்தமாக இதுவரை என்ன நடவடிக்கைகளை எடுத்திருக்கிறார்கள்? மத்திய வங்கிக் கொள்ளையிலே முன்னைய அரசாங்கம் சம்பந்தப்பட்டிருக்கின்றதென்று சொல்கின்றார்கள்; முன்னாள் பிரதமர் சம்பந்தப்பட்டிருக்கின்றாரென்று சொல்கின்றார்கள்; எத்தனையோ பாராளுமன்ற உறுப்பினர்கள் சம்பந்தப் பட்டிருக்கின்றார்கள் என்றெல்லாம் கூறுகின்ற நீங்கள், இன்று அரசாங்கத்திலே இருந்துகொண்டு ஏன், அதற்கான நடவடிக்கையை எடுக்கமுடியாமல், அந்த விடயத்தை மாத்திரம் சொல்லிக்கொண்டிருக்கின்ற ஒரு நிலைப்பாட்டில் இருக் கின்றீர்கள்? இந்த அரசாங்கத்தை உருவாக்குவதற்கு மிகவும் முக்கியமான ஒரு பிரச்சாரக் கருப்பொருளாகக் காணப்பட்ட ஈஸ்ரர் தாக்குதல் சம்பந்தமாக இன்று என்ன விடயங்கள் முன்னெடுக்கப்பட்டிருக்கின்றன? ஈஸ்ரர் தாக்குதலுக்குப் பின்னர் ஒட்டுமொத்த முஸ்லிம்களும் தீவிரவாதிகள் என்றும் அதற்குப் பிரதான காரணமாக இருந்தவர்கள் முஸ்லிம் அமைச்சர்களும் பாராளுமன்ற உறுப்பினர்களும்தான் என்றும் சொன்னார்கள். இதற்குப் பின்னால் இருந்தவர்களைக் கைது செய்வதாகச் சொன்னார்கள்; அவர்களைச் சட்டத்தின் முன்னால் கொண்டுவருவதாகவும் சொன்னார்கள். ஆனால், அதுசம்பந்தமாக எதுவித நடவடிக்கையையும் எடுக்க முடியாமலிருக்கின்றது.

கடந்த நல்லாட்சியைக் குற்றஞ்சொல்லியே இந்த 5 வருடங்களையும் முடித்துக்கொள்வதற்குத் தயாராக இருக் கின்றார்கள். அதுமாத்திரமல்ல, கடந்த நல்லாட்சி அரசாங் கத்தில் ஏற்பட்ட பின்னடைவுதான் அந்த அரசாங்கத்தின் தோல்விக்குக் காரணம் என்று சொல்கின்றார்கள். மஹிந்த ராஜபக்ஷ அவர்கள், யுத்தத்தை முடிவுக்குக் கொண்டுவந் ததாகவும் எத்தனையோ அபிவிருத்தித் திட்டங்களை இந்த நாட்டிலே முன்னெடுத்ததாகவும் சொன்னார்கள். மஹிந்த ராஜபக்ஷ அவர்கள் 2015ஆம் ஆண்டு தோற்ற சந்தர்ப்பத்திலே மக்கள் ஏன், அவரைப் புறக்கணித்தார்கள்? என்ற கேள்வியை ஏன் நீங்கள் கேட்கவில்லை. அந்த நேரத்திலே அவற்றை மறந்துவிட்டு, அந்த அரசாங்கம் செய்த தவறுகளை இன்று மீண்டும் செய்வதற்கு முயலுகின்ற விடயம், உண்மையிலே வேதனைக்குரிய ஒரு விடயமாகக் காணப்படுகின்றது. அரசாங்கத்தின் பதவிக் காலத்தின்போது நல்ல விடயங்களும் நடைபெறுகின்றன; கெட்ட விடயங்களும் நடைபெறுகின்றன. ஆகையால், தவறுகளைத் திருத்திக்கொள்கின்ற அரசாங்கமாக இந்த அரசாங்கம் இருக்க வேண்டும்.

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

இன்று இந்த அரசாங்கத்திற்கு 2/3 பெரும்பான்மை காணப்படுகின்றது. ஆளும் கட்சியில் அநேக உறுப்பினர்களை கொண்ட ஒரு பாராளுமன்றமாக இது காணப்படுகின்றது. இதன்மூலமாக வரலாற்றிலே எடுத்துக் காட்டக்கூடிய செயற்பாடுகளை முன்னெடுக்க வேண்டும். இன்று சஜித் பிரேமதாஸ அவர்களின் குறைகள் பற்றிப் பேசப்படுகின்றன; நல்லாட்சியிலே செய்யப்பட்ட குறைகள் பற்றிப் பேசப் படுகின்றன. வெறுமனே குறைகளை மாத்திரம் பேசிவிட்டு, இந்த 5 வருடங்களையும் முடித்துக்கொள்வதுதான் உங்களுடைய இலக்காக இருக்கப்போகின்றதா? அல்லது அந்தக் குற்றங்கள் உண்மையாக இருந்தால், குற்றவாளிகளைக் கண்டுபிடிக்கப்போன்றீர்களா? அப்படியாயின், அந்த விடயத்தில் கவனம் செலுத்துங்கள்! ஆகையால், இவ்வாறான விடயங்களைத் தொடர்ச்சியாக இந்தப் பாராளுமன்றத்திலே பேசிக்கொண்டிருக்காமல், மக்களுக்குத் திருப்திகரமான, பயனுள்ள நல்ல விடயங்களை முன்னெடுக்க வேண்டும். நல்லாட்சி அரசாங்கத்தில்கூட எத்தனையோ நல்ல விடயங்கள் முன்னெடுக்கப்பட்டிருக்கின்றன; எத்தனையோ அபிவிருத்தி வேலைகள் முன்னெடுக்கப்பட்டிருக்கின்றன. ஆனால் தப்புகள், தவறுகள் நடந்திருக்கின்றன. அதற்கான ஒரு பிராயச்சித் தமாகத்தான் ஆட்சி மாற்றம் அமைந்திருக்கின்றது. அவ்வாறான தவறுகளைச் செய்யாமல், உங்களுடைய ஆட்சிக் காலத்திற்குள் மக்களால் போற்றக்கூடிய செயற்பாடுகளை முன்னெடுக்க வேண்டும் என்று இந்த உயரிய சபையிலே கேட்டு, வாய்ப்புக்கு நன்றி கூறி, எனது உரையை முடித்துக்கொள்கின்றேன்.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Madam Presiding Member, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද උදේ අපි ගරු නියෝජ්‍ය කථානායකතුමාට ප්‍රශ්නයක් ඉදිරිපත් කළා, ඊයේ මේ පාර්ලිමේන්තුවේ කථා මාධ්‍යයට ඉදිරිපත් කරලා නැහැ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමා කිව්වා, ඒ වැඩේ කරනවා කියලා. අපි දැනගන්න කැමතියි, ඒ කථා දැන් මාධ්‍යයට නිකුත් කරලාද කියලා.

අනෙක් කරුණ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මාධ්‍යයට මේ පාර්ලිමේන්තුවට එන්න ඉඩ දෙන්නේ නැත්තේ ඇයි? මාධ්‍යවේදීන්ට ඔවුන්ගේ ගැලරියේ ඈතින් ඈතින් වාඩි වෙන්න පුළුවන්. ඊයේ යම් කාල පරිච්ඡේදයක් ඇතුළතදී මේ සභාවේ මොකක්ද වුණේ කියලා රට දන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවට මාධ්‍යවේදීන්ට එන්න දෙන්න බැරි ඇයි? එක්කෝ, මාධ්‍යයට එන්න දෙන්න. එහෙම නැත්නම්, මේ සභාවේ වෙන දේවල්වලට අදාළ tape එක මාධ්‍යයට ලබා දෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Live බලා ගන්න පුළුවන් නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Live බලන්න බැරිව කැඩිච්ච නිසානේ මේ කියන්නේ. ඒකනේ මේ කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අපි ගරු කථානායකතුමාට ඒ බව දැනුම් දෙමු.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Madam, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මතක් කළා වාගේ, COVID-19 වසංගතය නිසා මේ අය වැයේදී මාධ්‍යවේදීන්ට ඔවුන්ගේ ගැලරියට එන්න දෙන්න බැහැයි කියන එක පිළිගන්න බැරි කාරණාවක්. මොකද, අගමැතිතුමා මුදල් ඇමතිවරයා විධියට ඒ අය වැය කථාව කරනකොට මේ රටේ ඉන්න තානාපතිවරු, සම්භාවනීය අමුත්තන් සියලුදෙනාටම ආරාධනා කරලා ගෙන්වාගෙන ඔවුන් මීටරයේ පරතරයකින් කථානායක ගැලරියේ වාඩි කෙරෙව්වා. එතකොට මාධ්‍යවේදීන්ටත් ඒ මීටරයේ පරතරය මත මාධ්‍යවේදී ගැලරියේ ඉන්න පුළුවන්. මාධ්‍යයට එන්න දෙන්නේ නැත්තේ මොකද කියන එක ඇත්තටම ලොකු ගැටලුවක්. අය වැය වාගේ වැදගත් විවාදයකදී ඇයි එහෙම කරන්නේ? මේක අපට විතරක් නොවෙයි, ආණ්ඩුවටත් වැදගත් විවාදයක්. ආණ්ඩුවේ පණිවුඩයත් ගමට යන්න ඕනෑ; ආණ්ඩුවේ පණිවුඩයත් ජනතාවට යන්න ඕනෑ. ඇත්තටම මේක විපක්ෂයේ ප්‍රශ්නයක් නොවෙයි. ඒ හින්දා අනිවාර්යෙන්ම මාධ්‍යයට එන්න ඉඩ දෙන්න. ඔබතුමිය ගරු කථානායකතුමාට මේ බව දැනුම් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ පිළිබඳව මම ගරු කථානායකතුමා දැනුවත් කරන්නම්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Madam, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට දැනගන්න ඕනෑ ඊයේ මේ පාර්ලිමේන්තුවේ කළ කථා අදවත් මාධ්‍යයට නිකුත් කරලාද කියලායි. අපට ඔව් ද, නැද්ද කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කථානායකතුමා මූලාසනය ගත්තාම ඒ ගැන ඔබතුමා දැනුවත් කරාවි.

ගරු ජගත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.26]

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම අපේ රටේ ආර්ථිකය විනාශ කරපු අවස්ථාවේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත්, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාත් මේ රට බාර ගෙන රට නැවත ගොඩනැඟීම සඳහා ඉමහත් බලාපොරොත්තු සහගතව කටයුතු කරන බොහොම අපහසු අවස්ථාවක තමයි මේ අය වැය ඉදිරිපත් කරන්නේ. මහජනතාවට හැකි පරිදි සුබසාධන ලබා දෙමින් ඒ කටයුතු කිරීම ගැන අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත් ස්තුතිය හා ගෞරවය පළ කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ අය වැය සම්බන්ධයෙන් අදහස් රාශියක් ඉදිරිපත් කළා. ඒ වාගේම මම මතක් කරන්න ඕනෑ, මේ ආර්ථික විනාශයට වගකිව යුතු අය කවුරුන්ද කියන එක. ඒක මේ

රටේ ජනතාව දැන ගන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂ රජය මහ බැංකු කොල්ලය තුළින් විශාල වංචාවක් කරලා මේ රටේ ආර්ථිකය කාබාසිනියා කරන්න කටයුතු කළා. එපමණක් නොවෙයි, ජනතා විමුක්ති පෙරමුණත් දීර්ඝ කාලයක් තිස්සේ - 1971-1981 කාලය තුළ - විශාල විනාශයක් මේ රටට ඇති කළා. ඒ වාගේම, එල්ටීටීඊ සංවිධානයට මුක්කු ගහපු පිරිසකුත් ඒකරාශී වෙලා මේ රටට දැවැන්ත විනාශයක් කළා. මේ සියලු අපහසුතා මැද්දේ තමයි අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත් කටයුතු කරන්න වෙලා තිබෙන්නේ.

එදා, 2015 වර්ෂය වන විට හොඳ ආර්ථික වර්ධන වේගයක් ගෙනෙන්න, ඒක පුද්ගල ආදායම වැඩි කරන්න, අපේ රටේ ණය බර අඩු කරන්න, දැවැන්ත පියවර රාශියක් ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම දැන් සරල උදාහරණයක් කියන්නම්. ඔබතුමිය ගමේ යනකොට බොහොම පහසුවෙන් යන්න තිබුණා, මධ්‍යම අධිවේගී මාර්ගයේ. ඔබතුමිය මූලාසනය ඉන්න අවස්ථාවේ දී මේවා මතක් කිරීමට ලැබීම ගැන මම සතුටු වනවා.

දැන් බලන්න, කඩවත සිට ගලගෙදර දක්වා මාර්ගය. මීරිගම සිට පොතුහැර දක්වා කොටස තමයි දැනට සියයට 80කින් විතර වැඩ නිම වෙලා තිබෙන්නේ. කඩවත සිට මීරිගම කොටස තවම ආරම්භ කරලා නැහැ, කුරුණෑගල සිට ගලගෙදර කොටස ආරම්භ කරලා නැහැ. දැන් මේක හරියට කඩවත ඉඳලා මීරිගමට පයින් දුවලා ගිහිල්ලා, ඊළඟට වාහනයක නැඟලා ගිහිල්ලා කුරුණෑගලින් බැහැලා ආයෙත් ගලගෙදරට පයින් දුවගෙන යන්න ඕනෑ වාගේ දෙයක්. මේ වාගේ තත්ත්වයක් තමයි තිබුණේ. මේවායේ ගැහිලි සම්බන්ධව, අප්පොච්චිලා දූලා කොහොමද ගැහුවේ කියලා එදා හොඳට කිව්වා. හැබැයි ඒවා යට ගැහුවා.

ආර්ථිකය ගැනයි මේ කථා කරන්නේ. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා යහ පාලන රජයේ හිටපු ඇමතිතුමෙක්. තමුන්නාන්සේ ආර්ථික ඔස්තාර් කෙනෙක්. දැන් බලන්න පොතුහැර-ගලගෙදර මාර්ගයේ ඇස්තමේන්තුව රුපියල් බිලියන 134.9ක්. මේ මාර්ගය හදලා අවසන් කරන්න වර්තමානයේ රුපියල් බිලියන 151ක් වැය වෙනවා. හර්ෂ ද සිල්වා මැතිතුමනි, දැනට රුපියල් බිලියන 17ක් වැඩිවෙලා තිබෙනවා. ඒ කියන්නේ, මිලියන 17,000ක් නැත්නම් රුපියල් කෝටි 1,700ක්. කවුද මේවාට වග කියන්නේ? ආර්ථික ඔස්තාර්ලාගෙන් මම අහන්නේ. කවුද මේවාට වග කියන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මීරිගම-පොතුහැර මාර්ගයට රුපියල් බිලියන 137යි; දැන් වියදම රුපියල් බිලියන 157ක්. රුපියල් බිලියන 20ක් වැඩිපුර යනවා. රුපියල් මිලියන 20,000ක්! රුපියල් කෝටි 2,000ක් ගරු මන්ත්‍රීතුමියනි. කුරුණෑගල ඉතිරි කොටසට රුපියල් බිලියන 134.9ක්. දැන් වියදම් වෙනවා, බිලියන 148.9කට ආසන්න ප්‍රමාණයක්. වැඩිපුර රුපියල් බිලියන 16ක් වැය වෙනවා. ඒ කියන්නේ රුපියල් මිලියන 16,000ක්; කෝටි 1600ක්. මේ පාරට විතරක් වැඩිපුර මුදල් යනවා, රුපියල් කෝටි 5,300ක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමියට මාතලේට යන්න තව කොයි තරම් වියදමක් දරන්න වෙයිද? මේ පාර අවසන් කරන්න තව අවුරුදු 5ක් යනවා. හැබැයි, පටන් ගත්තේ කොහොමද?

දූෂණ හෙළි කරන්න හිටපු ඇමතිතුමා විනිසුරුතුමන්ලා විවේචනය කරගෙන ගියා. හැබැයි, ඔබතුමන්ලාට ඔබතුමන්ලාගේ කැබිනට් එකේ හොරු ටික ගැන විවේචනය කරන්න කොන්දක් තිබුණේ නැහැ.

මම කිව්වේ ආර්ථිකය විනාශ කරපු ආකාරය.

මේ මොන බාධක තිබුණත් විශේෂයෙන් ඉදිරි වසර තුළ කෘෂිකර්ම, සත්ව පාලන, ධීවර කටයුතු ආදායම් බදුවලින් නිදහස් කරන්න; ආයෝජකයන් පොළඹවන්න කටයුතු කරනවා. සමෘද්ධිලාභින්ගේ සල්ලි ටික ඉතිරි කරලා මහජන බැංකුවෙන්, ලංකා බැංකුවෙන්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් ණය දුන්නාම, ඒ සල්ලි ටික ණයට ගත්තේ මහා පරිමාණ ව්‍යාපාරිකයෝ. ඒ මුදල් ටිකෙන් සමෘද්ධිලාභීන්ට යම් ශක්තියක් ඇති කරන ආකාරයට කටයුතු කිරීමට මෙම අය වැය තුළින් යෝජනා කරලා තිබෙනවා.

සුබසාධන සමිතිවලින්, සුබසාධන ආයතනවලින් පොලී අය කරන්න එදා කටයුතු කළා. පින් කැටයටත් බදු ගහන්න ලෑස්ති වුණා. පින් කැටයට බදු ගහන එක නතර කරන්න ගරු අග්‍රාමාත්‍යතුමා කටයුතු කරලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ තමුන්නාන්සේලාගේ යහ පාලන රජයත්, අපේ රජයත් අතර වෙනස පැහැදිලියි. ඒ කාලයේ පින් කැටයටත් බදු ගහන්න කටයුතු කළා. 2014 නොවැම්බර් මාසයේ ඉදිරිපත් කළ අය වැයේදී ගරු මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යතුමා උක් ගොවියාට උක් ටොන් එකකට රුපියල් 5,000ක සහතික මිලක් දුන්නා. අපි විශ්වාස කරනවා, එතුමා මෙවර රුපියල් 6,000ක සහතික මිලක් ලබා දෙන්න තීන්දුවක් අරගෙන ඒ බව දැනුවත් කරයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශ්වවිද්‍යාලයට යන්නේ ඉතාම සීමිත දරුවන් සංඛ්‍යාවක්. ඉතිරි පිරිසට -අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහ අ.පො.ස. (උසස් පෙළ) විභාග අසමත්- වෘත්තීය අධ්‍යාපනය සඳහා ආකර්ෂණය ඇති කරන්න රුපියල් 4,000ක මාසික දීමනාවක් දෙන්න මෙහි යෝජනා කරනවා.

අපේ රටින් විදේශ රටවලට ගිය විශාල පිරිසක් ඉන්නවා. පිලිපීනයෙන් යන්නේ පුහුණු කම්කරුවන්. ලංකාවෙන් යන්නේ නුපුහුණු කම්කරුවන්. හැබැයි, වෘත්තීය අධ්‍යාපන සහතිකය තිබුණොත්, වැඩි පඩියක් ලබා දෙනවා. හෙද හෙදියන් සඳහා කැනඩාව ආදි රටවල විශාල ඉල්ලුමක් තිබෙනවා. මම යෝජනා කරනවා, පෞද්ගලික අංශයත් සම්බන්ධ කරගෙන ලංකාවේ හෙද සේවයට පමණක් නොව විදේශගත වන අය සඳහාත් නිසි පුහුණුවක් ලබා දීලා, ඒ පිළිබඳ සහතිකයක් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා.

මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, එතනෝල් ආනයනය සම්පූර්ණයෙන් නතර කිරීම ගැන. ඒ නිසා අද අපේ පළාතේ උක් වගාවෙහි නිරත ගොවි ජනතාවට යම් ආදායමක් ලැබෙනවා. සීනි සමාගම් ලාභයක් ලබනවා. ඒ සහන ගොවීන්ටත් ලබාදෙන වැඩසටහනක් කෙරේ අවධානය යොමු කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகுதலைமைதாங்கும்உறுப்பினர்அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසාන කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகுஜகத்புஷ்பகுமார)
(The Hon. JagathPushpakumara)
මට තවත් විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මම තවත් විනාඩියකින් කථාව අවසන් කරන්නම්.

අපේ පළාතේ ජනතාවට එදා තිබුණු සිහිනයක් තමයි, විදුලිය සහ අධ්‍යාපන පහසුකම් ලබාගැනීම. මේ අය වැය මඟින් ඒවාට මුදල් ලබා දීලා තිබෙනවා. අපේ ප්‍රදේශයේ සියයට 50කට පමණයි පානීය ජල පහසුකම් දීලා තිබෙන්නේ. ඉතිරි ටිකටත් එම පහසුකම ලබා දෙන්න, අපේ ප්‍රදේශවල ග්‍රාමීය මාර්ග විශාල ප්‍රමාණයක් සංවර්ධනය කරන්න ගරු අග්‍රාමාත්‍යතුමා කටයුතු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කාලය අවසානයි" කියන නිසා මට මීට වඩා කථා කරන්න අවස්ථාව නොලැබී යනවා. කෙසේ වෙතත්, අපේ ප්‍රදේශයේ ජනතාව ඇතුළුව මේ රටේ ජනතාව වෙනුවෙන් ගසා කෑමෙන් තොර දැවැන්ත සංවර්ධනයක් ඇති කරන්න අපේ ආණ්ඩුව කටයුතු කරනවා. මධ්‍යම අධිවේගී මාර්ගය උදාහරණයක් විධියට අරගෙන ගසා කෑම් වන හැටි මම පැහැදිලිව ඔප්පු කර පෙන්නුවා. ඒවා තමයි ගසා කෑම් කියන්නේ.

[ගරු ජගත් පුෂ්පකුමාර මහතා]

ගසා කැමෙන් තොරව කටයුතු කරලා, මේ රට සමෘද්ධිමත් රටක් බවට පත් කරන්න අවශ්‍ය ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகுதலைமைதாங்கும்உறுப்பினர்அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජයන්ත කැටගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.34]

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகுஜயந்தகெட்டகொட)
(The Hon. JayanthaKetagoda)
ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" යටතේ අපේ ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළ අපේ රජයේ මෙම අය වැය මෑත ඉතිහාසයේ ජාතික ආර්ථිකය පදනම් කරගත් සුවිශේෂ අය වැයක්. මෙහි බොරු පොරොන්දු නැහැ; තරුණ තරුණියන් රවටලා නැහැ. ඒක තමයි ප්‍රධානම කාරණය.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තමයි, මේ රටේ තිබෙන ප්‍රධානම, විශාලම දේශපාලන පක්ෂය. අපි මේ රටේ ආණ්ඩු බලය ලබාගන්නට පෙර සෑම ගමකටම ගිහිල්ලා, අපේ පක්ෂයේ නිර්මාතෘ බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් අනුව "ගම සමඟ පිළිසඳරක්" කියන වැඩසටහන කළා. අපි සෑම ගමකින්ම යෝජනා ලබාගත්තා. එලෙස යෝජනා ගෙනැල්ලා, ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන මේ අය වැය මඟින් සැලැස්වුවා. අපි මේ ආණ්ඩුව අරගෙන අදට මාස තුනයි. තුන්වැනි මාසය මේ ගෙවෙන්නේ. දෙසැම්බර් 10වන දාට පස්සේ අපේ අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන්, ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන්, නගරාධිපතිවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන් සියලුදෙනා නැවත වතාවක් ගමට ගිහිල්ලා, මේ අය වැයෙන් ලැබුණු ප්‍රතිපාදන අනුව "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහනේ යෝජනා ක්‍රියාත්මක කිරීමේ කටයුතු කරන්න අපි තීන්දු කරලා තිබෙනවා.

මාස තුනට මදිද, උපාධිධාරින් 60,000කට රැකියා ලබා දුන්න එකම? අ.පො.ස. (සාමාන්‍ය පෙළ) අසමත් තරුණ තරුණියන් ලක්ෂයක් තෝරාගෙන රැකියා ලබා දීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. මේ වන කොට ඒ අය අතරින් 40,000කට ආසන්න තරුණ තරුණියන් පිරිසක් ඒ රැකියාවල යෙදෙනවා; පුහුණුවීම්වල නිරත වනවා. මාස තුනට ඒ මදිද? මේ අය වැය ඉතාම ප්‍රායෝගික අය වැයක්.

අපි දැක්කා, යහ පාලන රජය ඉදිරිපත් කළ අය වැය. හැම තැනටම free Wi-Fi දෙනවා කියලා එදා කිව්වා. අනේ, මේ රටේ තරුණ තරුණියෝ smartphones අරගෙන පාරක් ගානේ, හන්දියක් ගානේ බලාගෙන සිටියා, free Wi-Fi ලැබෙන කල්. හරින් ප්‍රනාන්දු හිටපු ඇමතිවරයා අන්තිමට මොකද කළේ? තමුන්නාන්සේලාගේ නායකතුමා කිව්වා, free Wi-Fi හරහා කෙල්ලන්ට කොල්ලන්ට love කරන්න අවස්ථාව සලසා දෙනවා කියලා. අන්තිමට dataවලට සියයට 40ක් බදු ගැහුවා.

එදා අහිංසක නංගි කෙනෙකු අරගෙන වෙළෙඳ දැන්වීමක් කළා. ඒ නංගිට කියනවා, "නංගි, පාරේ තෙමෙන්න එපා. අපි දෙන්නම් පුංචි කාර් එකක්" කියලා. අනේ, ඒ නංගි advertisement එකේ කිව්වා, "යහ පාලනය ආවාම අපි තෙමෙන්නේ නැහැ" කියලා. මොකද වුණේ ඒ නංගිට? නංගි තවමත් තෙමෙනවා. අපි තමයි, ඒ තෙමෙන අයට සහනයක් දෙන්න අවශ්‍ය වැඩ කටයුතු නිර්මාණය කරන්නේ.

එදා තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කිව්වා, දරු උපතක් වෙනුවෙන් රුපියල් 20,000ක් දෙනවා කියලා. මුහුදේදී හදිසියේ ධීවරයකු මැරුණොත්, රුපියල් ලක්ෂ 10ක රක්ෂණයක් දෙනවා කිව්වා. දුන්නාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகுஉறுப்பினர்ஒருவர்)
(An Hon. Member)
දුන්නා.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகுஜயந்தகெட்டகொட)
(The Hon. JayanthaKetagoda)
කොහේද දුන්නේ? ඒ මුදල ලබාගත් කෙනෙකු ඉන්නවා නම් එක්කරගෙන එන්න මෙහේට. යන්තම් හරි බේරුණේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමායි, ගිලන් රථ ටිකක් ගෙන්වා දීලා. එතුමා හොඳ වැඩක් කළා. අපි එය අගය කරනවා. එතුමා බලාගෙන ඉන්නවා, ඊළඟට මුදල් ඇමති හෝ අගමැති හෝ වෙන්න, ඒ පක්ෂයේ නායකයා හෝ වෙන්න. අපි එතුමාට ශුභ පතනවා. ඒක වෙනම කාරණයක්. තමුන්නාන්සේලා එවැනි සිහින දැකපු නිසා තමයි ජනතාව තමුන්නාන්සේලා ඔය පැත්තට එවා තිබෙන්නේ. තමුන්නාන්සේලා දන්නවා, තමුන්නාන්සේලා පසු ගිය අවුරුදු 5 තුළ කරපු දේවල්. ගජබින්නාලංකාරය වාගේ කෙප්ප ගහපු වෙනත් ආණ්ඩුවක් මේ රටේ ඉතිහාසයේ තිබිලා නැහැ. රුපියල් ට්‍රිලියන 7කට තිබුණු ණය බර රුපියල් ට්‍රිලියන 13 දක්වා නග්ගලා දැන් කියනවා, රට ණය උගුලක හිර කරලා කියලා.

තමුන්නාන්සේලා එදා මොනවාද කළේ? හම්බන්තොට වරාය විකුණා cheque එක ගෙනැල්ලා, ඒ cheque එක පෙන්වා-පෙන්වා තමුන්නාන්සේලා සතුටු වුණා. එදා අඩුම වශයෙන් වී ගබඩාවක්වත් හදාගන්න පුළුවන් වුණේ නැහැ. ඒ තරම්වත් වැඩ පිළිවෙළක් තමුන්නාන්සේලාගේ ඒ ආණ්ඩුවට තිබුණේ නැහැ. තමුන්නාන්සේලා වී ටික මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ තැන්පත් කරන්න පටන්ගත්තා. එහෙව් අය තමයි අහන්නේ, "කෝ, මේ අය වැයේ සහනාධාර. මොකක්ද මේකේ වැඩ පිළිවෙළ" කියලා. මේ ආණ්ඩුව පත් වෙලා දැනට මාස තුනයි. දැන් ක්‍රියාත්මක වන්නේ අය වැය යෝජනාවලින් ටිකයි. අපි දෙසැම්බර් 10වන දාට පස්සේ පටන්ගන්නවා, ඉතිරි වැඩ කටයුතු ටික.

එක පැත්තකින්, මාර්ග කිලෝමීටර් ලක්ෂයේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා. අනික් පැත්තෙන්, හැම ග්‍රාම නිලධාරි වසමකම ගෙයක් බැගින් හදාගෙන යනවා. මේ රට එක් සේසත් කරලා, මේ රටේ ආර්ථිකයේ පුනර්ජීවනයක් ඇති කරලා, දරිද්‍රතාව තුරන් කරලා, සෑම කෙනකුටම හොඳින් ජීවත් වෙන්න පුළුවන් වාසනාවන්ත රටක් බවට මේ රට පත් කරන්නට අපේ ආණ්ඩුව මේ වන කොට ක්‍රියා කරගෙන යනවා. හැම තිස්සේම කොරෝනා ගැන කිය-කියා තමුන්නාන්සේලා කාලකණ්ණි සතුටක් ලබනවා. නමුත් අපි කියනවා, ඉදිරි සති කිහිපය තුළ කොරෝනා වසංගතයත් මර්දනය කරනවා කියලා. මේ රටේ ජනතාවට "රට හදන සෞභාග්‍යයේ දැක්ම" විඳින්නට අවස්ථාව සලසනවා කියා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகுதலைமைதாங்கும்உறுப்பினர்அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කුමාරසිරි රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.41]

**ගරු කුමාරසිරි රත්නායක මහතා**
(மாண்புமிகு குமாரசிறி ரத்நாயக்க)
(The Hon. Kumarasiri Rathnayaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි අය වැය ප්‍රකාශය පිළිබඳව විවාද කරන මේ වේලාවේ, ඒ ගැන අදහස් ඉදිරිපත් කරන්න මටත් අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

ලෝකයේ රටවල් වැඩි ප්‍රමාණයක් ගෝලීය කොරෝනා වසංගත තත්ත්වය නිසා දැඩි ආර්ථික අපහසුතා රැසකට මුහුණ දෙමින් එම රටවල මූල්‍ය කළමනාකරණය සහ ඉදිරි ආර්ථික සැලසුම් සකස් කිරීමේදී අභියෝග රාශියකට මුහුණ දෙමින් සිටින මොහොතක, ඉදිරි වසර සඳහා සාර්ථක අය වැය ලේඛනයක් ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු අග්‍රාමාත්‍ය වාගේම මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාට අපගේ ගෞරවනීය ස්තුතිය ප්‍රථමයෙන් පිරිනමනවා.

වසර 50ක දේශපාලන අත්දැකීම් ඇති පරිණත දේශපාලන නායකයකු විධියට ආර්ථිකයේ වර්ධනය මෙන්ම ආර්ථිකයේ පසුබෑම් ඇතිවන අවස්ථාවලදීත් මූල්‍ය කළමනාකරණය කළ යුතු ආකාරය පිළිබඳව නිවැරදි අවබෝධයක් ඇති එතුමා, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කළ සෞභාග්‍යයේ දැක්ම තුළ ඇති ආර්ථික සංවර්ධන වැඩසටහනේ ඉලක්ක සපුරා ගැනීමට ඉදිරිපත් කළ අය වැයක් හැටියටයි අපි දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කොරෝනා වසංගත තත්ත්වය රටේ ආර්ථිකයට විශාල බලපෑමක් ඇති කර තිබුණත්, සෞභාග්‍යයේ දැක්ම තුළ සඳහන් කළ බොහෝ කාරණා යථාර්ථයක් බවට පත් කරන්නට මේ අය වැය ලේඛනය තුළ ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා.

ඒ වාගේම, අපේ ජනාධිපතිතුමා බලයට පත් වෙලා පසුගිය ජනවාරි මාසයේදී මේ රටේ ජනතාවට ලබා දුන් බදු සහන ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන යන්නට මේ අය වැය ලේඛනය තුළට එය ඇතුළත් කර තිබීමත් සුවිශේෂී ලක්ෂණයක් හැටියට අප දකිනවා.

අපට මතකයි, යහපාලන ආණ්ඩුව බලයට පත් වෙලා එදා තිබුණු බදු විශාල වශයෙන් වැඩි කරලා ජනතාව වාගේම ව්‍යාපාරිකයනුත් දැඩි පීඩනයකට පත් කර තිබුණ බව. ඒ අය වෙනුවෙන් විශේෂ බදු සහන ලබා දෙමින් එදා සියයට 28ට තිබුණු නිෂ්පාදන ව්‍යාපාර මත අය කරන ආදායම් බද්ද සියයට 18 දක්වා අඩු කරන්න අපේ රජය කටයුතු කළා. ආර්ථික සේවා ගාස්තු සහ රඳවා ගැනීමේ බද්ද අහෝසි කළා. එදා යහපාලන ආණ්ඩුව කාලයේ ආගමික සිද්ධස්ථාන මත පනවා තිබුණු බදු සම්පූර්ණයෙන්ම අහෝසි කළා. විශේෂයෙන් විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ගිණුම්වලට සහ ළමා ඉතුරුම් ගිණුම්වලට පනවා තිබුණු රඳවා ගැනීමේ බදු සම්පූර්ණයෙන්ම අහෝසි කළා. මේ ආකාරයට බදු සහන ලබා දෙමින් රටේ නිෂ්පාදන ආර්ථිකය ඉහළ තැනකට ගෙන එන්නට පසුගිය වසරක කාලය තුළ කටයුතු කිරීම පිළිබඳව විශේෂයෙන්ම අපි අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙන්නට ඕනෑ.

ඒ වාගේම, මේ අය වැය ලේඛනයේ සඳහන් ප්‍රතිපාදන වෙන් කිරීම් අපේ දිස්ත්‍රික්කයට වැදගත් වන ආකාරය පිළිබඳව මගේ අවධානය යොමු කරන්න කැමැතියි. පිරිසිදු පානීය ජලය නොමැතිකම නිසා අද වනවිට අපේ දිස්ත්‍රික්කයේ පවුල් විශාල සංඛ්‍යාවක් පීඩා විඳිනවා. එම නිසා එම පවුල් වෙනුවෙන් පානීය ජල යෝජනා ක්‍රම අලුතින් ආරම්භ කරන්නටත්, දැනට ආරම්භ කර ඇති ජල යෝජනා ක්‍රම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දෙමින් ඒ පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කරන්නටත්, මුළු රටේම පානීය ජල අවශ්‍යතාව වෙනුවෙන් රුපියල් බිලියන 1,000ක් වෙන් කරද්දී, අපි විශ්වාස කරනවා අපේ දිස්ත්‍රික්කයේ තිබෙන පානීය ජල ගැටලුව විසඳන්න අපට පුළුවන්කම ලැබෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මොණරාගල දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් සියයට 90ක් කෘෂිකර්මාන්තයෙන් ජීවත් වන අය. හේන් ගොවිතැන ඔවුන්ගේ ප්‍රධාන ජීවිකාව බවට පත් වී තිබෙනවා. එදා වෙල් ලක්ෂයක් තිබුණු වෙල්ලස්සේ නටබුන් වුණු වැව් විශාල සංඛ්‍යාවක් තිබෙනවා. එයින් වැඩි ප්‍රමාණයක් පසුගිය කාලය තුළ සංවර්ධනය කළත්, ඉදිරි වසර කිහිපය තුළ ඉතුරු වැව් අමුණු ටික ප්‍රතිසංස්කරණය කරලා එයින් ගොවි ජනතාවට අවශ්‍ය වාරි ජල පහසුකම් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා ඉදිරි වර්ෂයට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර දීම පිළිබඳව අපි ගරු අග්‍රාමාත්‍යතුමන්ට මේ අවස්ථාවේදී අපේ ස්තුතිය පිරිනමනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි අධ්‍යාපනයේ සම අවස්ථා ගැන කොපමණ කථා කළත්, පසුගිය රජය අධ්‍යාපනයට විශාල මුදලක් ලබා දෙනවා කිව්වත් ඒ අවශ්‍ය ප්‍රතිපාදන අපේ දිස්ත්‍රික්කවලට ලැබී තිබුණේ නැහැ. ඒ නිසා මේ අය වැය තුළින් අධ්‍යාපනයට විශාල මුදලක් වෙන් කර දීලා හැම පාසලකටම අවශ්‍ය පහසුකම් ලබා දෙන්නට කටයුතු කිරීම පිළිබඳව අපේ ගරු අග්‍රාමාත්‍යතුමාට අපි ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම උසස් අධ්‍යාපනය ලබන දරුවන් සඳහා විශ්වවිද්‍යාලවල පහසුකම් වැඩි කරන්න, වෘත්තිය අධ්‍යාපනය ලබන දරුවන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න මෙවර අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබීම පිළිබඳවත් විශේෂයෙන්ම අපි ස්තුතිවන්ත වෙනවා. සෞභාග්‍යයේ දැක්ම යථාර්ථයක් බවට පත් කරමින්, මේ රටේ සමස්ත ජනතාවට, සිංහල, දමිළ, මුස්ලිම් සියලු ජන කොටස්වලට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දෙමින්, මේ රට සංවර්ධනය කරා ගෙන යන්නට අතිගරු ජනාධිපතිතුමා වාගේම ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය ගෙන යන්නා වූ වැඩ පිළිවෙළ සාර්ථකව ඉදිරියට කරගෙන යැමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මිලාන් ජයතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.47]

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ පොදු ජනතාවගේ සිතුම් පැතුම් සැබෑ කිරීමේ වගකීම වෙනුවෙන්, අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" වැඩ පිළිවෙළ ක්‍රියාවට නංවමින් ඉදිරිපත් කර තිබෙන 2021 අය වැය ලේඛනය පිළිබඳව අදහස් දක්වන්න ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා.

හැමදාම කොළඹ ශීත කාමරවලට වෙලා නායකයන් හදපු අය වැය ලේඛන වාගේ නොවෙයි, "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහනත් එක්ක ගමේ ජනතාවගේ අදහස් ඒකරාශි කරගෙන, රටේ දියුණුව ගැන හිතලා හදපු සාර්ථක අය වැය ලේඛනයක් මෙය. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගෙන් පසුව ජේ.ආර්.

[ගරු මිලාන් ජයතිලක මහතා]

ජයවර්ධන මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා වශයෙන් පත් වුණා. දේශීය ආර්ථිකයට මුල් තැන දුන්, අපේකම තිබුණු ආර්ථිකය විනාශ වෙන්න පටන් ගත්තේ, එදා පටන්. මහින්ද රාජපක්ෂ යුගයේ යුද්ධය අවසන් කරලා, මේ රටේ ආර්ථික මර්මස්ථාන ගොඩනඟලා, ආසියාවේ ආශ්චර්යයේ සිහිනය ගොඩ නැඟුවා. නමුත් 2015දී මේ රට භාර ගත්ත යහපාලන ආණ්ඩුව රට විනාශ කරලා දැම්මා. දැන් ඉන්න විපක්ෂයට මේවා කියලා වැඩක් නැහැ; තේරුම් ගන්න බැහැ. මොකද, නොදියුණු ජන කොටසක් හා සමාන පිරිසක් තමයි ඉන්නේ. අමුවෙන් මස්-මාළු කනවා. ඒ විතරක් නොවෙයි. පිරිමි-පිරිමි කසාද බඳිනවා. ඔක්කෝටම වැරදුණත් කමක් නැහැ තමන් බේරිලා කියලා හිතාගෙන, බෝම්බ ගහලා තුන්සියයක් පමණ පිරිස මරණයට පත් වෙද්දී, ඒ ගැන දැනගෙනත්, ගෙවල්වලට ගිහිල්ලා නිදාගෙන හිටපු මන්ත්‍රීවරු ඉන්න විපක්ෂයක් අද තිබෙන්නේ. අද විපක්ෂය run කරන්නේ social media වලින් විතරයි. සැලසුමක් නැහැ. අයාලේ යන්නේ. ඒකට හේතුව, විපක්ෂයට හොඳ නායකයෙක් නොමැති වීමයි. සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා අද ෆේල්. එතුමාට අද ඉන්න මන්ත්‍රීවරු ටික තියා ගන්න බැහැ. අද විපක්ෂය මන්ත්‍රීවරු ටික තියා ගන්න බැරි තත්ත්වයකට පත් වෙලා ඉවරයි. මේ විපක්ෂ කල්ලිය අද දන්නේ, ආණ්ඩුවට "ෆේල්, ෆේල්" කිය කියා ඇවිදින්න විතරයි. ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ කාලයේ "උතුමාණන්" කියන්න කිව්වා. රණසිංහ ප්‍රේමදාස මහත්මයාගේ කාලයේ "ශ්‍රීමත්" කියන්න කිව්වා. අපේ ජනාධිපතිතුමාට අද "සර්, සර්" කියමින්, "ඒකාධිපතියා" කියලා අපහාස කරන්න ලෑස්ති වෙනවා. හැබැයි, ඒවා කරන්න බැහැ. විපක්ෂය ඒක හොඳට මතක තබා ගන්න.

වී ගොවිතැන සඳහා නොමිලේ පොහොර ලබා දීමත්, අනෙක් භෝග සඳහා පොහොර මිටියක් රුපියල් 1,500කට ලබා දීමටත් මේ රජය කටයුතු කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් මාගේ විශේෂ ස්තුතිය පුද කරනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ වාගේම දොම්පේ ආසනයේ ජනතාව වැඩි වශයෙන් අන්නාසි, මඤ්ඤොක්කා වැනි කෘෂි භෝග වගාව තුළින් මේ රටට විශාල විදේශ විනිමයක් ගෙනෙනවා. එම නිසා වී සඳහා ලබා දෙන පොහොර සහනාධාරයම එම වගා සඳහාත් ලබා දෙන්න කියලා මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

පසුගිය වසර හතරහමාර පුරාවට ඉදිකිරීම් කර්මාන්තය නැවතිලා තිබුණා. ඉදිකිරීම් කර්මාන්තය ජාතික ආර්ථිකයට සියයට 10ක පමණ දායකත්වයක් දැක්වුවා. එය නැවත නඟා සිටුවීම සඳහා සියයට 90ක් දක්වා බැංකු ණය ලබා දීමේ යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක් හැටියට අද මා දකිනවා.

විදේශ විනිමය කළමනාකරණය කර ගැනීම සඳහා වාහන ආනයනය කිරීම නවතා ඇති බැවින්, එම ව්‍යාපාර මඟින් දැනට යැපෙන ව්‍යාපාරිකයන් සහ එම ආයතනවල සේවකයන් සඳහා විධිමත් වැඩ පිළිවෙළක් යටතේ ඔවුන් නැවතත් ආර්ථික ප්‍රවාහයට සම්බන්ධ කර ගැනීම විශේෂ අවශ්‍යතාවක් හැටියට මා දකිනවා. ඒ පිළිබඳව දැඩි අවධානය යොමු කරන ලෙස මා ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ඒ වාගේම, ඔවුන්ගේ දැනුම හා මේ වන විට ගොඩනැඟී ඇති සම්බන්ධතා මඟින් වාහන එකලස් කරන කර්මාන්ත ආයතනයක් අරඹා, ඒ කොටස් සඳහා ආයෝජන ලබා ගැනීම මඟින් "Made in Sri Lanka" වාහනයක් නිෂ්පාදනය කර විකිණීමේ ආඩම්බරය ඔවුන්ට හිමිකර දිය හැකි බව මා ගෞරවයෙන් සිහිපත් කරනවා.

ඒ වාගේම තමයි කොළඹ නගරයට සීමා වුණු පාසල් සංවර්ධනය සහ ක්‍රීඩා පිටි සංවර්ධනයෙන් එහාට ගොස් ග්‍රාමීය පාසල් හා ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය සඳහා රුපියල් මිලියන 3,000ක අතිරේක ප්‍රතිපාදනයක් වෙන් කිරීම තුළින් අද ගමට එම ප්‍රතිලාභය යනවා වගේම, මත් ද්‍රව්‍ය වැනි විනාශකාරී උවදුරුවලින් අපේ තරුණ පරපුර බේරා ගන්න පුළුවන් වට පිටාවක් ගොඩනැඟී තිබෙනවා. ඒ වාගේම, සෞඛ්‍ය සේවාව වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 18,000ක අතිරේක මුදලක් වෙන් කිරීම සඳහා යෝජනාවක් තිබෙනවා. වර්තමාන කාල සීමාව දෙස බලනකොට එම යෝජනාව ඉතා සුවිශේෂී යෝජනාවක්. ඒ වාගේම සේවක සංඛ්‍යාව අනුව රක්ෂණ දායක මුදලක් අය කරගෙන සියලු ශ්‍රමිකයන්ට කොවිඩ්-19 වැනි වසංගත රෝග සඳහා රක්ෂණාවරණයක් ලබා දීමට ක්‍රියා කිරීම ඉතා කාලෝචිත කටයුත්තක්. ඒ සඳහා මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

අද කොවිඩ්-19 වසංගතය හමුවේ පාසල් අධ්‍යාපනය නඟා සිටුවීමට "ගුරු ගෙදර" අධ්‍යාපන නාලිකාවටත් රුපියල් මිලියන 3,000ක් පමණ වෙන් කරන්න කටයුතු කිරීම කලෝචිත කටයුත්තක් හැටියට මා දකිනවා. අනාගතයේ අපේ රට ගොඩනඟන පළමුවැනි අය වැය හැටියට, මෙම අය වැය ශක්තිමත්ව ඉදිරියට අරගෙන යන්න වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්. උදයකුමාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[පි.ව. 3.52]

**ගරු එම්. උදයකුමාර් මහතා**
(மாண்புமிகு எம். உதயகுமார்)
(The Hon. M. Udayakumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நமது நாட்டின் 75ஆவது வரவு செலவுத் திட்டத்தை கௌரவ பிரதமரும் நிதியமைச்சருமான மஹிந்த ராஜபக்ஷ அவர்கள் தனது 75ஆவது பிறந்த தினத்திலே சமர்ப்பித்திருக்கின்றார். இது ஜனாதிபதி அவர்களின் பதவியேற்பின் பின்பு சமர்ப்பிக்கப்படும் முதலாவது வரவு செலவுத் திட்டமாகும். அதேபோல, புதிதாகப் பதவியேற்ற அரசாங்கத்தின் முதலாவது வரவு செலவுத்திட்டமாகவும் இது கணிக்கப்படுகின்றது. அத்தோடு, நாட்டின் முக்கியமான இரண்டு தேர்தல்கள் நிறைவு செய்யப்பட்ட பிறகு சமர்ப்பிக்கப்படும் வரவு செலவுத் திட்டமாகவும் இது கணிக்கப்படுகின்றது. அந்த வகையிலே, இது மிக எதிர்பார்ப்புகளுக்கு மத்தியிலே சமர்ப்பிக்கப்பட்ட ஒரு வரவு செலவுத்திட்டமாகும். அவ்வாறான நிலையில், முன்வைக்கப்பட்டுள்ள இந்த வரவு செலவுத் திட்டத்தில், அரச வருமானத்திற்கும் அரச செலவினத்திற்கும் இடையிலே பாரிய வேறுபாடு இருப்பதை நாம் காணக்கூடியதாக இருக்கின்றது. இதனை நிவர்த்தி செய்வதற்காக அரசாங்கம் கடன் பெறும் நிலைக்குத் தள்ளப்பட்டுள்ளது. எமது நாடு ஏற்கனவே கடன் சுமையில் இருக்கின்றது. மத்திய வங்கி அறிக்கையின்படி, நாட்டின் கடன்தொகை தற்போதைய நிலையிலே 13 ரில்லியனாக உள்ளது. அத்தோடு 2021ஆம் ஆண்டுக்காகப் பெறப்படவிருக்கும் கடன்தொகை 5 ரில்லியனாக இருக்குமென எதிர்பார்க்கப்படுகின்றது. அந்த வகையிலே, நாட்டின் மொத்தக் கடன் தொகை 18 ரில்லியனாக அதிகரிக்கக்கூடிய சூழ்நிலை உருவாக்கப்பட்டிருக்கின்றது.

தற்போது உள்நாட்டு உற்பத்தி குறைந்துள்ளது. மொத்தத் தேசிய உற்பத்தியிலே 90 சதவீதம் கடனாகக் காணப்படுகின்றது. அத்தோடு, பொருளாதார வளர்ச்சி வீதம் மிக மந்த கதியிலே இருக்கின்றது. தற்போது சமர்ப்பிக்கப்பட்டுள்ள வரவு செலவுத்திட்டத்தில், மொத்த வருமானம் 1,961 மில்லியனாகவும், மொத்தச் செலவினம்

3,525 மில்லியனாகவும் உள்ளது. அந்த வகையிலே, துண்டுவிழும் தொகை 1,564 மில்லியனாக இருக்கின்றது. இந்த துண்டுவிழும் தொகையையும் கடனாகப் பெறவேண்டிய சூழ்நிலைக்கு எமது நாடு தள்ளப்பட்டிருக்கின்றது. சர்வதேச 'மூடீஸ்' அமைப்பின் கணிப்பின்படி கடன் செலுத்தும் நாடுகளின் பட்டியலிலே இலங்கையின் தரம் குறைக்கப் பட்டுள்ளது. மேலும் மேலும் கடன் பெறும் நிலை ஏற்படுமாயின், அது ஆபத்தான ஒரு சூழ்நிலையாகக் காணப்படும். அத்தோடு, ஒவ்வொரு வருடமும் நான்கு பில்லியன் டொலருக்கும் அதிகமான தொகையைச் செலுத்தவேண்டிய சூழ்நிலையில் இலங்கை இருக்கின்றது. இந்தத் தொகை மேலும் அதிகரிக்கக்கூடிய வாய்ப்பும் இருக்கின்றது. ஆகவே, இந்த வரவு செலவுத்திட்டத்திலே வருமானத்தை ஈட்டும் முறையும் கடனை அடைக்கும் முறையும் தெளிவாகக் குறிப்பிடப்படவில்லை. கடன் சுமை அப்பாவி மக்களின் தலையிலே சுமத்தப்படுமோ என்ற அச்சம் நிலவுகின்றது. மேலும் கடன் பெறும் முயற்சிகளில் ஈடுபடாமல், முதலீடுகளை ஊக்குவிப்பதற்கான நடவடிக் கைகள் எடுக்கப்பட வேண்டும். அதன்மூலம் மட்டும்தான் இதற்கு முழுமையான ஒரு தீர்வை எம்மால் பெற்றுக்கொள்ள முடியும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தற்போது நாட்டிலுள்ள மிக முக்கியமானதொரு பிரச்சினை கொரோனா பிரச்சினையாகும். இந்தப் பிரச்சினை மேலும் இரண்டு வருடங்களுக்கு நீடிக்குமென்று உலக சுகாதார ஸ்தாபனம் கூறியிருக்கிறது. கொரோனாவுடன் வாழப் பழகிக்கொள்ளவேண்டுமென்று அரசாங்கமும் கூறுகிறது. ஆனால், கொரோனாவால் பாதிக்கப்பட்ட நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கும் அதனால் பாதிக் கப்பட்ட மக்களின் வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்கும் எந்த விதமான நிரந்தரத் தீர்வும் இந்த வரவு செலவுத்திட்டத்தில் முன்வைக்கப்படவில்லை. அத்தோடு, அத்தியவசியப் பொருட்களின் விலைகளும் அதிகரித்திருக்கின்றன. அதனால் மக்கள் அன்றாட வாழ்க்கையைக்கூடப் பூர்த்தி செய்யமுடியாத நிலைக்குத் தள்ளப்பட்டுள்ளார்கள். அந்த வகையில், இந்த வரவு செலவுத்திட்டத்திலே பாமர மக்களுக்கு எந்தவிதமான நிவாரணமும் வழங்கப்படவில்லை; அரசாங்க ஊழியர்களுக்கு சம்பள உயர்வு இல்லை.

அத்தோடு, இந்த வரவு செலவுத்திட்டத்திலே மலையக மக்கள் பற்றி எந்தவிதமான விடயங்களும் குறிப்பிடப்படாதது மிகவும் கவலைக்குரிய விடயமாகும். இந்த நாட்டிலே அன்றுதொட்டு இன்றுவரை மலையக மக்கள் பொருளாதாரத் திற்கு முதுகெலும்பாக இருந்து தோள்கொடுத்திருக்கிறார்கள். அப்படிப்பட்ட மலையக மக்களுடைய வாழ்வில் எந்தவிதமான ஏற்றமோ, மாற்றமோ ஏற்படுத்தப்படவில்லை. அவர்கள் தொடர்ந்தும் ஏமாற்றத்தை மட்டுமே சந்தித்துக்கொண்டு இருக்கின்றார்கள். அவர்களுக்குத் தனி வீட்டுத் திட்டம் பற்றியோ அல்லது காணி உரிமைகள் வழங்குவது பற்றியோ எதுவும் குறிப்பிடப்படவில்லை. மலையக மக்கள் சார்பாக எந்த விதமான அபிவிருத்தித் திட்டங்களும் இதில் உள்வாங் கப்படவில்லை. இதனை மூடிமறைப்பதற்காக மலையக மக்களின் சம்பள உயர்வு முன்மொழிவை மட்டுமே இந்த வரவு செலவுத்திட்டத்தில் உள்வாங்கியிருக்கிறார்கள். அவர்களுக் குரிய சம்பள உயர்வை வரவு செலவுத்திட்டத்தின் மூலமாகக் கொடுக்க முடியாது. இது 2015ஆம் ஆண்டு முன்வைக்கப்பட்ட ஒரு கோரிக்கையாகும். ஐந்து வருடங்கள் கழிந்தும், 1,000 ரூபாய் என்ற தொகைக்குள் எங்களது மலையக மக்களை முடக்க நினைக்கிறார்கள். இன்றுள்ள விலைவாசி உயர்வு, வாழ்க்கைச் செலவு மற்றும் நாணய மதிப்பு போன்றவற்றுடன் ஒப்பிடும்போது 1,300 ரூபாய் வழங்கப்பட வேண்டும்.

ஆகவே, பிரதமர் அவர்கள் உறுதியளித்தபடி அடிப்படைச் சம்பளம் 1,000 ரூபாய் என்று இந்த வரவு செலவுத்திட்டத்தில் முன்வைக்கப்பட்டிருக்க வேண்டும். எப்படியிருந்தாலும், பிரதமர் அவர்கள் இந்தச் சபையிலே கூறிய பிறகு பெருந்தோட்டக் கம்பனிகள் 1,000 ரூபாய் சம்பளத்தைக் கொடுக்க முடியாதென்று கூறியிருக்கின்றன. வரவு செலவுத் திட்டத்தின்மூலமாக அழுத்தத்தை அல்ல! பிரதமர் அவர்கள் நேரடியாகத் தலையிட்டு அவர்களுக்கு 1,000 ரூபாய் சம்பளத்தைக் கொடுக்குமாறு அந்தக் கம்பனிகளுக்குக் கட்டளையிட்டு, அந்தச் சம்பளத்தைப் பெற்றுக்கொடுக்க வேண்டும். இனிவரும் காலங்களிலே, வரவு செலவுத் திட்டத்தின்மூலமாகச் சம்பளத்தினை நிர்ணயித்து பெருந்தோட்டக் கம்பனிகளுக்கு உத்தரவு பிறப்பித்து 1,000 ரூபாய் அடிப்படைச் சம்பளம் வழங்கப்படவேண்டுமென மீண்டும் இச்சபையிலே உறுதியாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இந்த வரவு செலவுத்திட்டத்தின்மூலமாகவும் பாராளுமன் றத்தின் மூலமாகவும் மட்டுந்தான் மலையக மக்களுக்கு ஒரு நிரந்தரமான தீர்வு கிடைக்கும். இந்த 1,000 ரூபாய் என்ற சம்பளத்திற்குள் மலையக மக்களை முடக்கவேண்டாம். இதனைத் தாண்டி, மலையக மக்களுக்குப் பல தேவைகள் இருக்கின்றன; குறைகள் இருக்கின்றன. அவைகள் நிச்சயமாக நிவர்த்தி செய்யப்படவேண்டும். மலையக மக்கள் தொடர்ந்து ஏமாற்றப்பட்ட சமூகமாக இருக்கமுடியாது. அதற்கு என்றைக்கும் நாங்கள் இடமளிக்கமாட்டோம். இந்த நாட்டின் பொருளாதாரத்திற்கு உந்து சக்தியாக இருக்கும் மலையக மக்களை யாரும் புறந்தள்ள முடியாது என்றும் அவர்களின் எதிர்கால வாழ்வுக்கு அனைவரும் ஒன்றுபட்டுக் குரல் கொடுக்கவேண்டும் என்றும் நான் இந்தச் சபையிலே அனைவரிடமும் தாழ்மையுடன் கேட்டுக்கொண்டு விடைபெறுகின்றேன். நன்றி வணக்கம்.

[අ.භා. 3.58]

**ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා**
(மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட)
(The Hon. Nalaka Bandara Kottegoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ දිස්ත්‍රික්කයේ සහෝදර මන්ත්‍රීතුමිය වශයෙන් ඔබතුමිය මූලාසනයේ සිටියදී මට කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම මුලින්ම සන්තෝෂ වෙනවා.

අපි මෙවර අය වැය ඉදිරිපත් කරන්නේ අභියෝග රාශියකට මුහුණ දෙමින්. එක පැත්තකින් පසුගිය ආණ්ඩුවේ අදූරදර්ශී ප්‍රතිපත්ති නිසා මේ රටේ ආර්ථිකය කඩා වැටිලා තිබුණා. තවත් පැත්තකින් පසුගිය ආණ්ඩුවේම අදූරදර්ශී ආරක්ෂක ක්‍රියාවලිය නිසා පාස්කු ප්‍රහාරයට ලක් වෙලා මේ රටේ ආර්ථිකය කඩා වැටිලා තිබුණා. තවත් පැත්තකින් මහ බැංකු කොල්ලයත් එක්ක මේ රටේ ආර්ථිකය කඩා වැටිලා තිබුණා. ඒත් එක්කම, මෑතකදී අපි රටක් විධියට මුහුණ දෙන කොවිඩ්-19 වසංගතය නිසා අපේ රටේ ආර්ථිකය පසුබෑමකට ලක්වෙලා තිබෙනවා. මෙන්න මේ අභියෝගත් එක්ක තමයි ගරු අග්‍රාමාත්‍යතුමා විසින් 2021 වර්ෂය සඳහා වන අය වැය ඉදිරිපත් කරනු ලැබුවේ.

විශේෂයෙන්ම මේ වෙනකොට අපේ රටේ ප්‍රධාන ආදායම් මාර්ග අහිමි වෙලා තිබෙනවා. සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා තිබෙනවා. ඒත් එක්කම අපේ රටට විදේශ විනිමය විශාල වශයෙන් සොයා දුන් විදේශ ශ්‍රමිකයන්ගෙන් ලැබුණු ආදායම අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම, ඇඟලුම් කර්මාන්තය හරහා අපට ලැබුණු ආදායම කොවිඩ් වසංගතය නිසා ක්‍රම ක්‍රමයෙන් අහිමි වෙලා තිබෙනවා.

[ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා]

එවැනි විශාල අභියෝග රාශියක් හමුවේ තමයි අපට මෙම අය වැය ඉදිරිපත් කරන්න වුණේ. නමුත් අපට හොඳ අවස්ථාවක් තිබෙනවා. සමස්ත ලෝකයම කොවිඩ් වසංගතයට භාජන වෙලා ආර්ථිකමය වශයෙන්, ඒත් එක්කම සමාජයීය වශයෙන් කඩා වැටෙමින් තිබෙන වෙලාවේ උපක්‍රමශීලිව අපට අපේ අපනයන ආර්ථිකය සංවර්ධනය කරගන්න පුළුවන් නම්, උපක්‍රමශීලිව අපේ නිෂ්පාදන ආර්ථිකය සංවර්ධනය කරගන්න පුළුවන් නම්, ඒ සඳහා අවශ්‍ය ක්‍රමවේද සකස් කරගන්න පුළුවන් නම්, කොවිඩ්වලින් පසු එළැඹෙන කාලයේදී ඉතාම ශක්තිමත් ආර්ථිකයක් තිබෙන රටක් විධියට අපට ලෝකය ඉදිරියට යන්න පුළුවන් කියා මා විශ්වාස කරනවා. ඒ සඳහා අවශ්‍ය සැලසුම් මෙම අය වැය තුළ අපි දකිනවා. එම සැලසුම් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ශක්තිය, අවශ්‍ය බලය අපේ ආණ්ඩුවට තිබෙනවා.

මාතලේ දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා විධියට මම විශේෂයෙන්ම ගරු අග්‍රාමාත්‍යතුමාටත්, සියලු අමාත්‍යවරුන්ටත් ස්තුතිවන්ත වෙනවා. මෙම අය වැය හරහා මාතලේ දිස්ත්‍රික්කයට, අපේ ජනතාවට විශාල ප්‍රතිලාභ ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම මුළු ලංකාව පුරාම ග්‍රාමීය මාර්ග කිලෝමීටර් ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වෙද්දී, 2021 වසරේදී පමණක් මාතලේ දිස්ත්‍රික්කයේ මාර්ග කිලෝමීටර් 1,170ක ග්‍රාමීය මාර්ග සංවර්ධනය කරන්න අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම, "ඒ" ශ්‍රේණියේ සහ "බී" ශ්‍රේණියේ මාර්ග කිලෝමීටර් 154ක් සංවර්ධනය කරන්න අවශ්‍ය ප්‍රතිපාදන මෙම අය වැය තුළ අන්තර්ගත වෙලා තිබෙනවා. එම "ඒ" ශ්‍රේණියේ සහ "බී" ශ්‍රේණියේ මාර්ග අතරට, මාතලේ දිස්ත්‍රික්කයේ ජනතාව පුල-පුලා බලා සිටි ගලේවෙල සිට කලා වැව දක්වා මාර්ගයත්, මාතලේ සිට ගලේවෙල දක්වා මාර්ගයත් ඇතුළත් වෙලා තිබෙනවා. නාඋල සිට දඹුල්ල දක්වා ඒ - 9 මාර්ගය සංවර්ධනය කරන්නත් මෙම අය වැයෙන් රුපියල් මිලියන 700ක් වෙන්කර තිබෙනවා.

ඊළඟට, කෘෂි කර්මාන්තය පැත්තෙන් බැලුවොත්, මාතලේ දිස්ත්‍රික්කයේ බී ලූනු ගොවියාට ඉදිරි වසර දෙක තුන ඇතුළතදී අක්කර 50,000ක් වගා කරන්න අවශ්‍ය සහනාධාර ලබාදෙන්න මෙම අය වැයෙන් මුදල් වෙන්කර තිබෙනවා. විශේෂයෙන්ම, බී ලූනු බීජ ආනයනය නවත්වා, ඉදිරි වසර දෙක තුන ඇතුළත බී ලූනු බීජ නිෂ්පාදනය කරන්න මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල හා කිඹිස්ස ප්‍රදේශවල විශේෂ මධ්‍යස්ථාන දෙකක් ඇති කරන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලංකාවේ සියලු දිස්ත්‍රික්ක ආවරණය කරමින් අලුතින් විශ්වවිද්‍යාල 10ක් පිහිටුවන්න රජය කටයුතු කරනවා. එම වැඩ පිළිවෙළේදී මාතලේ දිස්ත්‍රික්කයට සුවිශේෂී තැනක් දීලා, "මාතලේ පුරවර විශ්වවිද්‍යාලය" හදන්න අවශ්‍ය ප්‍රතිපාදන මෙම අය වැය තුළින් වෙන්කර තිබෙනවා. මාතලේ දිස්ත්‍රික්කයේ පිරිවෙන් අධ්‍යාපනයටත්, මැණික් කර්මාන්තය, ඛනිජ කර්මාන්තය ආදී විවිධ කර්මාන්තවලටත් අවශ්‍ය ප්‍රතිපාදන මෙම අය වැයෙන් වෙන් කර තිබෙනවා.

මාතලේ දිස්ත්‍රික්කයේ තිබෙන ක්‍රීඩාංගණ ගැන මම විශේෂයෙන්ම කථා කරන්න ඕනෑ. පසුගිය ආණ්ඩුව ගෙන ගිය සාහසික ක්‍රියාවලියක් තුළ, ලංකාවේ සියලු ක්‍රීඩාංගණ ඇතුළත්ව ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රතිඵලයක් විධියට මාතලේ දිස්ත්‍රික්කයේ සියලු ක්‍රීඩාංගණ මේ වෙද්දී අකර්මණ්‍ය වෙලා තිබෙනවා. වසර හතරක් තිස්සේ කිසිම ක්‍රීඩකයෙකුට මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රධාන ක්‍රීඩාංගණ කිසිවක් පාවිච්චි කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අපේ වාසනාවට, පසුගිය දවසක ක්‍රීඩා අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා මාතලේ දිස්ත්‍රික්කයට ඇවිල්ලා එම ක්‍රීඩාංගණවලට ගිහිල්ලා ඒවා අධීක්ෂණය කරලා සිදු වී ඇති අකටයුතුකම් ගැන නිසි පරීක්ෂණයක් කරන්න කියලා අදාළ බලධාරින්ට නියෝග කළා. ලබන වසර මුලදීවත් මෙම ක්‍රීඩාංගණ සියල්ල නැවතත් මාතලේ දිස්ත්‍රික්කයේ ජනතාවට ලබා දෙන්න, ඒ අවශ්‍ය මුදල් එතුමා ලබා දුන්නා.

මම තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. "වාරි සෞභාග්‍යා" වැඩ පිළිවෙළ හරහා ලංකාවේ වැව් 500ක් ප්‍රතිසංස්කරණය කරන වෙලාවේ මාතලේ දිස්ත්‍රික්කයට විශේෂ ප්‍රමුඛතාවක් ලබා දීලා වැව් සහ අමුණු සංවර්ධනය කරන්න කටයුතු කර තිබෙනවා. මේ සියලු දේවල් දිහා බැලුවාම අපට පෙනෙනවා, මෙවර අය වැයෙන් ක්‍රීඩා පිටි, වාරි මාර්ග සහ අධ්‍යාපනයට විශාල මුදලක් වෙන් කර තිබෙන බව.

අපි 2015දී පසුගිය ආණ්ඩුවට මේ රට භාර දෙනකොට මේ රටේ ඉහළ ආර්ථික වර්ධන වේගයක් තිබුණා. නමුත්, ඔවුන්ගේ අදූරදර්ශී ක්‍රියා පිළිවෙත නිසා රටේ ආර්ථිකය කඩා වැටුණා. ඔවුන්ගේ ක්‍රියා පිළිවෙතත්, කොවිඩ් වසංගතයේ ප්‍රතිඵලත් එකට එකතු කරලා, ඒවාට මුහුණ දෙමින් තමයි අපට මේ හැම අර්බුදයක්ම ජයගන්න වෙන්නේ. 2021 වසර සඳහා ඉදිරිපත් කර තිබෙන මේ අය වැය යෝජනා ක්‍රියාත්මක කරලා, ඉදිරි වසර දෙක තුන තුළ මේ රට ස්ථාවර තැනකට ගෙන එන්න අපි බලාපොරොත්තු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ස්තුතියි.

[අ.භා. 4.04]

**ගරු සම්පත් අතුකෝරල මහතා**
(மாண்புமிகு சம்பத் அதுகோரல)
(The Hon. Sampath Athukorala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත්, ආර්ථික පුනර්ජීවන කමිටුවේ සභාපති ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාත් මේ වන විට අපේ මාතෘ භූමිය ඉතා ඉහළ තැනකට ඔසවා තබන්න කටයුතු කරමින් සිටිනවා. එවන් මොහොතක ඉදිරිපත් කළ මේ අය වැය පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම ගැන මා ඉතාම සතුටු වෙනවා.

උසාවියක් වුණත් දඬු නියම කරද්දි පෙර වැරදි පිළිබඳව බලා තමයි දඬු නියම කරන්නේ. විපක්ෂ නායකතුමා ඇතුළු මේ කණ්ඩායමටත් සිදුවෙලා තිබෙන්නේ එතුමන්ලාගේ පෙර වැරදි ටික වහගන්නයි. ඒ සඳහා එතුමන්ලා මේ සභාවේ කාලය කා දමමින් ජනතාව නොමඟ යවන බවක් අපි දකිනවා. ගරු ඉන්දික අනුරුද්ධ රාජ්‍ය ඇමතිතුමා, විපක්ෂ නායකතුමාට විපක්ෂ නායක කාර්යාලයේ සිට මෙතැනට එන්න කියලා ආරාධනා කළේ එතුමා පිළිබඳව ඉතා පැහැදිලි කාරණා ටිකක් මේ සභාවේ සඳහන් කළ අවස්ථාවේදීයි. මා හිතන විධියට, ඉන්දික අනුරුද්ධ රාජ්‍ය ඇමතිතුමා කථා කරද්දි විපක්ෂ නායක කාර්යාලයේ සිට මේ ගරු සභාවට එන්න එතුමාගේ ඩයිනමෝව වැඩ කළේ නැහැ. දැන් නම් එතුමා මේ සභාවට ඇවිල්ලා ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අමතක කරන්න බැරි පෙර වැරදි රැසක් පසුගිය යහ පාලන ආණ්ඩුව සිදු කළා. මහ බැංකු කොල්ලය අපට, මේ රටේ ජනතාවට අමතක කරන්න බැහැ. මහ බැංකු කොල්ලය තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමා ගොඩ නැඟූ ආර්ථිකය, ඒ සමෘද්ධිමත් රට බිඳ වට්ටන්න අවශ්‍ය මූලික අඩිතාලම දැම්මේ.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා, එතුමාගේ ධුර කාලයේ පළමු වසර ගත කරපු විධිය බලන්න. එතුමා කොවිඩ් වසංගතය සමඟ සටන් කරමින්, මේ රටේ ජනතාව රකින්න මහන්සි ගනිමින් තමයි ඒ කාලය ගත කළේ. එවැනි කිසිදු උපද්‍රවයකින් තොර මාතෘ

භූමියක් තමයි අපි 2015දී යහ පාලන ආණ්ඩුවට භාර දුන්නේ. ඒ ගෙවුණු කාලය ගත කළ විධිය අපට අමතක කරන්න බැහැ; මේ රටේ ජනතාවට එය අමතක කරලා ඉස්සරහට යන්න හැකියාවක් නැහැ.

එදා දේශපාලන බලය පාවිච්චි කරලා, දේශපාලන නායකයන් සිරගත කළා. මේ කථා කරන මා ඇතුළු දේශපාලන නායකයන් රැසක් යහ පාලන රජය විසින් සිරගත කළා. එතුමන්ලාගේ පාලන කාලයේ පළමු අවුරුද්ද ඇතුළතම මහ බැංකුව කොල්ල කාලා රුපියල් බිලියන ගණනක් ඒ ගජ මිතුරන් අතර බෙදා ගත්තා. එවකට ආණ්ඩුව නියෝජනය කළ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර ඒ මුදල් බෙදී ගියා. එය අපට සාක්ෂි ඇතිව, පැහැදිලිව ඔප්පු කරන්න පුළුවන්. ඒ වසරේ පැවැති මහ මැතිවරණය වෙනුවෙන් මහ බැංකු කොල්ලයේ මුදල් පාවිච්චි කළා.

ඊළඟට, එතුමන්ලා අධිකරණ පද්ධතියට අත තිබ්බා. අධිකරණ පද්ධතියට අත තියපු බව රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ දුරකථන ඇමතුම් පටිගත කිරීම්වලින් මේ ගරු සභාවට හෙළි වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමන්ලාට පෙර වැරදි වසා ගන්න කිසිදු හැකියාවක් නැහැ. ජාතික ආරක්ෂාවට තර්ජනයක් වුණු, අන්තවාදයට හිස ඔසවන්න ඉඩ දුන්නා. බුද්ධාගමට පහර පිට පහර ගැහුවා. ස්වාමීන් වහන්සේලා සිරගත කළා පමණක් නොවෙයි, උද්ඝෝෂණවලදී පසුගිය රජය ස්වාමීන් වහන්සේලාගේ ඔළු පළලා, සිවුරු ගලවලා, උන්වහන්සේලාට පහර දුන්නා.

ජාත්‍යන්තරය හමුවේ මේ රට දණ ගැස්සුවා. ජිනීවා කවුන්සලයේදී මේ රටේ ආණ්ඩුව අපේ රණ විරුවන්ට විරුද්ධව සම අනුග්‍රහය දැක්වූවා. මේ රට බේරා ගත්ත රණ විරුවන්ට විරුද්ධව ඒ රජය සම අනුග්‍රහය දැක්වූවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම අපරාධ රැල්ල වර්ධනය වුණා. හැම දවසකම වාගේ කෙනෙක් වෙඩි තබා මැරුවා. රාජ්‍ය ආරක්ෂාව ඇතිව තමයි පාතාල කල්ලි නායකයන්ට මේ රටේ මිනී මරන්න අවස්ථාව ලැබුණේ. පසුගිය රජයට මේ කිසිදු දෙයකින් ගැළවෙන්න හැකියාවක් නැහැ.

එතුමන්ලා මේ මොහොත වෙද්දි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා "ෆේල්", "ෆේල්" කියමින් කරන්නේ ජනතාව නොමඟ යවන එකයි.

මේ රටේ සංවර්ධනය වෙනුවෙන් හා මේ රටේ අනාගතය වෙනුවෙන් විශාල වැඩ කොටසක් ඉටු කරමින් ඉස්සරහට යන්න පුළුවන් අය වැයක් අද ඉදිරිපත් කර තිබෙනවා. මහා මාර්ග පද්ධතිය වෙනුවෙන්, ජල සම්පාදනය වෙනුවෙන්, ක්‍රීඩාව වෙනුවෙන් වර්තමාන රජය විශාල වියදමක් දරනවා. ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මම අද වඩාත්ම සතුටු වන්නේ ඒ ගැනයි.

විපක්ෂය බලාපොරොත්තුවෙන් සිටියා, උපාධිධාරී තරුණයා මහ මහ පෙළපාළි යනතුරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලාගෙන ඉඳීවි කියලා. එතුමා ඒ 51,000කට රැකියා දුන්නා. ලබන සතිය වෙනකොට ඉතිරි උපාධිධාරීන් සියලුදෙනාටත් රැකියා දීම සිදු වනවා. ඒ ඊළඟ ලැයිස්තුව තව සති දෙකක් ඇතුළත එනවා. ඒ විතරක් නොවෙයි, රැකියා බලාපොරොත්තුවෙන් සිටිය අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් 34,000කට රැකියා දුන්නා. මේ රජය ලබන වසරේ මුල් මාස කීපය ඇතුළත රැකියා ලක්ෂයේ ඉලක්කය සම්පූර්ණ කරනවා. අපි මේ යන ගමන බලාගෙන ඉන්න බැරි අයට කරන්න තිබෙන්නේ අඳෝනා නැඟීම පමණයි. විපක්ෂයට කරන්න තිබෙන්නේ අඳෝනා නැඟීම පමණයි. වෙන කළ හැකි කිසිවක් නැහැ.

අද උදේ විපක්ෂ නායකතුමා මේ ගරු සභාව තුළදී මේ රටේ ආණ්ඩුවේ ආත්ම ගෞරවය ගැන කථා කළා; ජනාධිපතිතුමාගේ ආත්ම ගෞරවය ගැන කථා කළා. එතුමාට ආත්ම ගෞරවයක් තිබුණා නම් ගරු ඉන්දික අනුරුද්ධ මැතිතුමා කථා කරද්දී මේ සභා ගර්භයට එන්න තිබුණා නේ. ඇවිල්ලා කියන්න තිබුණා, එතුමාගේ නිවැරදිභාවය. එතුමා, සමාජ මාධ්‍යවල සාමාජිකයන් දිවි හිමියෙන් රකිනවා කිව්වා. ඒ විතරක් නොවෙයි, එන්නත ලබා ගන්න සටන් කරනවා කිව්වා. හැබැයි, ඉන්දික අනුරුද්ධ මැතිතුමාට උත්තර දෙන්න මෙතැනට එන්න එතුමාගේ ඩයිනමෝව වැඩ කළේ නැහැ. අපි කනගාටු වනවා, විපක්ෂය මේ වෙලාවේ රටේ ජනතාව නොමඟ යවන්න උත්සාහ ගැනීම ගැන. අපි එයට විරුද්ධ බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 4.10]

**ගරු මුදිතා ප්‍රශාන්ති මහත්මිය**
(மாண்புமிகு (திருமதி) முதிதா பிரிஸாந்தி)
(The Hon. (Mrs.) Muditha Prishanthi)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ගරු මන්ත්‍රීතුමියක් මූලාසනයේ ඉන්න අවස්ථාවේ කථා කරන්න ලැබීම ගැන මා සතුටු වෙනවා. ඒ වාගේම ආඩම්බර වෙනවා.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති රාමුව තුළ, 2021 සිට 2023 මැදි කාලීන ආර්ථික පුනර්ජීවන හා දිළිඳුකම පිටු දැකීමේ කඩිනම් වැඩසටහන ශක්තිමත් කරන 2021 අය වැය කථාව මේ උත්තරීතර සභාවට අපේ ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළා.

දිවංගත රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා උගුර ලේ රහ වනතුරු කෑ ගහලා මේ රජය බිහි කරන්න මුල් වෙච්ච කෙනෙක්. එතුමා අද අප අතර නැති වුණත් එතුමා කොහේ හෝ ඉඳලා සතුටු වෙනවා ඇති, මේ රටේ සමස්ත ජනතාව වෙනුවෙන් එතුමා බලාපොරොත්තු වුණු සහන රැසක් එක්ක මෙවර අය වැය ඉදිරිපත් කිරීම පිළිබඳව. ගරු ජනාධිපතිතුමනි, ජනතාව ඉල්ලා සිටියේ මේ වාගේ සහන තමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනාධිපතිවරණයේදී ජනතාව ඉල්ලා සිටියේ මේ රට බේරා දෙන්න කියලයි. ඒ නිසා තමයි එක්සත් ජාතික පාක්ෂිකයන් පවා අපිත් එක්ක අත්වැල් බැඳගෙන 69 ලක්ෂයක් දෙනා ඡන්දය දීලා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා හැටියට පත් කර ගත්තේ. කොවිඩ්-19 ව්‍යසනය ආපු වෙලාවේ අතිගරු ජනාධිපතිතුමා ක්‍රියා කරපු ආකාරය ප්‍රශංසනීයයි. එච්චර ව්‍යසනයක් තිබුණු මොහොතක වුණත් පක්ෂ පාට භේදයකින් තොරව එතුමා ඇතුළු මේ ආණ්ඩුව අසරණ වූ පවුල්වලට රුපියල් 5,000ක දීමනාව ලබා දුන්නා. ඉන් පසුව පවත්වපු මහ මැතිවරණයෙන් අපේ ජනාධිපතිතුමාට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයකුත් මේ රටේ ජනතාව ලබා දුන්නා. "සෞභාග්‍යයේ දැක්ම" තමයි එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වුණේ. ඒ අනුව මේ වන විට කාපට් මාර්ග ලක්ෂයේ වැඩසටහන යටතේ කිලෝමීටර 10,000ක ව්‍යාපෘති 3ක් ආරම්භ කරලා තිබෙනවා. ජනතාව කවදාවත් බලාපොරොත්තු වුණේ නැහැ, තමන්ගේ ග්‍රාමීය පාරවල් ටික කාපට් කරයි කියලා. නමුත් ඒ සිහිනය අද සැබෑ වෙලා තිබෙනවා.

රත්නපුර දිස්ත්‍රික්කයේ අලුත් මන්ත්‍රීවරියක් හැටියට මම සතුටු වෙනවා, අපේ ආණ්ඩුව පත් වෙලා අවුරුද්දක් යන්නත් මත්තෙන් මේ වාගේ දැවැන්ත සංවර්ධන වැඩ කටයුතු මේ රටට ලබා දීම පිළිබඳව. අපේ ඡන්දදායකයන්ගේ ඡන්දයට වටිනාකමක් දෙන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, රැකියා නොමැති උගත් බුද්ධිමත් උපාධිධාරීන් 60,000කට රැකියා ලබා දෙන්නටත්, රටට ඵලදායි සේවයක් කිරීමට පුහුණුවක් ලබා දෙන්නටත් අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. සෑම පවුලකටම

[ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය]

පානීය ජලය ලබාදීමේ සැලැස්ම යටතේ දිවයින පුරා 429,000කට ජල සැපයුම ලබාදීමට අවශ්‍ය මූලික කටයුතු අවසන් කරලා තිබෙනවා. ඒ වාගේම, නිවාස නැති අඩු ආදායම්ලාභී පවුල්වලට නිවාස ලබා දෙන්න අවශ්‍ය වැඩ කටයුතුත් අපි කරලා තිබෙනවා. මේ වාගේ ව්‍යාපෘති පසුගිය යහ පාලන ආණ්ඩුව යටතේ සිදු වුණත්, ඒවා ඉතා අසාර්ථක බවට පත් වුණා. ජනතාව රැවටුණා. තිබුණු පැල්පතත් ඔවුන්ට අහිමි වුණා. ඔවුන් ණය උගුලක තමයි පැටලුණේ. දුප්පත් ජනතාව කබලෙන් ලිපට වැටුණා. ජනතාව භය වුණා, මේ ව්‍යාපෘතියත් ඒ වාගේ ව්‍යාපෘතියක් වෙයිදෝ කියලා. නමුත් අපේ අතිගරු ජනාධිපතිතුමා මේ නිවාස ව්‍යාපෘතිය ඉතාම සාර්ථක ව්‍යාපෘතියක් බවට පත් කළා. නිවාසවලට මුල් ගල් තියලා දවස් 60ක් යන්නත් මත්තෙන් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරලා ඉතා අලංකාර, ඉතා ශක්තිමත් නිවාසයක් ඒ ජනතාවට ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ දිස්ත්‍රික්කය තුළ වතුකරයේ ජනතාව ජීවත් වෙනවා. මේ වතු කම්කරුවන්ගේ දෛනික වැටුප 2021 වර්ෂයේ සිට රුපියල් 1,000ක් දක්වා වැඩි කරන්න යෝජනා කරලා තිබීම පිළිබඳව අපි සතුටු වෙනවා. මේ දෛනික වැටුප වැඩි කරන්න කියලා යහ පාලන ආණ්ඩුව කාලයේ මන්ත්‍රීවරයෙක් ගිනි තියා ගන්නත් හැදුවා. අපි එතුමාට කියනවා, දැන් ගිනි තියා ගන්න අවශ්‍ය නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කිසිම රජයක්, කිසිම කෙනෙක් අවධානය යොමු නොකළ දෙයක් තමයි අධ්‍යාපනය අඩු තරුණ තරුණියන් වෙනුවෙන් රැකියා ලබා දීම. නමුත්, අතිගරු ජනාධිපතිතුමා ඒ තරුණ තරුණියන් ගැන අවධානය යොමු කරලා රජයේ රැකියාවක් ලබා දෙන්න ක්‍රියා කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂය අද කටමැත දොඩවනවා, ආණ්ඩුවේ අය අසාර්ථකයි; ආණ්ඩුව "ෆේල්" කියලා. එහෙම කියන ආර්ථික ඔස්තාර්ලා පසුගිය අවුරුදු 5ක කාලය තුළත් යහ පාලන ආණ්ඩුවේ හිටියා. නමුත් මේ රටට වෙච්ච සෙතක් නැහැ. එතුමන්ලා කළේ අපේ ආණ්ඩුව පැවැති කාලයේ අතිගරු ජනාධිපතිතුමා වැඩබිමක් බවට පත් කරපු රට මුඩු බිමක් බවට පත් කරපු එකයි. ඒ විතරක් නොව බැංකු මහ කොල්ලය කරපු එක විතරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

[අ.භා. 4.17]

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අභාග්‍ය සම්පන්න, අනපේක්ෂිත සිදුවීම්වලින් අපේ රටේ ආර්ථිකය මෙන්ම ජන ජීවිතය ද දණ ගස්සලා තිබෙන අවස්ථාවක තමයි 2021 වසර සඳහා අය වැය ඉදිරිපත් කරන්නේ. මෙවර අය වැය පිළිබඳව විපක්ෂය අසතුටු වෙනවා වාගේම, අය වැයේ දුර්වලකම් විධියට බොහෝ කරුණු කාරණා පෙන්වලා දුන්නා. ණය උගුලක සිරවීම පිළිබඳවත්, ජනතාවට සහන නොදීම පිළිබඳවත්, ධනපතියන්ට සහන සැලසීම වැනි සාම්ප්‍රදායික, අතාර්කික විවේචන විපක්ෂය එල්ල කළා. මේ ආර්ථික පසුබෑමට විශේෂයෙන්ම විපක්ෂයත් වගකිවයුතු වෙනවා. මොකද, මහ බැංකු කොල්ලයෙන් ආර්ථිකයට විශාල හානියක්, පාඩුවක් සිදු වුණා. රුපියල් බිලියන ගණන් මුදල් විනාශ වුණා විතරක් නොව, මෙරටේ වැඩ කරන ජනතාවගේ ශ්‍රමය, දහදිය, කඳුළු මුසු වුණු ජීවන ආරක්ෂක ව්‍යාපෘතියක් විධියට පැවැතුණු සේවක අර්ථසාධක අරමුදලටත් පසුගිය යහ පාලන ආණ්ඩුව බරපතළ හානියක් කළා. ඒ විනාශය මැද්දෙන් තමයි මේ රට පාලනය කරපු යහ පාලන ආණ්ඩුව අවසානයේ දී පාස්කු ප්‍රහාරයකටත් මේ රට ගොදුරු කළේ. මේවායේ අනිසි ප්‍රතිඵල තමයි ආර්ථික පසුබෑමකට ලක් වීමට ප්‍රධාන වශයෙන් හේතු වුණේ.

COVID-19 වසංගතයත් සමඟ ඉතා අසීරු තත්ත්වයකට පත් වෙලා ඉන්න මොහොතක තමයි මෙවර අය වැය ඉදිරිපත් කළේ. මේ රටේ පවතින අසීරු තත්ත්වය මත අය වැයක් ඉදිරිපත් කරලා හැමෝම සතුටු කරන්න බැහැ. ඒ නිසා ආර්ථිකය ඵලදායී විධියට ඉස්සරහට ගෙන යන්නට, ආර්ථිකය වර්ධනය කරන්නට, විදේශ වත්කම් ප්‍රමාණය වැඩි කරන්නට, දේශීය නිෂ්පාදනය වැඩි කරන්නට, තිරසර, කල් පවතින ආර්ථික දියුණුවක් සඳහා තමයි අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්නේ. සාම්ප්‍රදායිකව ආර්ථිකයක් හසුරුවන මූලික සැලැස්ම තමයි අය වැය ලේඛනය. ඊළඟ අවුරුද්දට වියදම් කරන මුදල, ඒ වියදම් කරන මුදල උපයා ගන්න බලාපොරොත්තු වෙන ආදායම පිළිබඳව එහි දැක්වෙනවා. ඒක තමයි අය වැය ලේඛනය කියන්නේ. ආදායමට වඩා වියදම වැඩි නම් හිඟ අය වැයක් ඇති වෙනවා. එතකොට අය වැය හිඟය පියවා ගන්න දේශීය සහ විදේශ වශයෙන් අරමුදල් සොයා ගන්නේ කොහොමද කියන කාරණාත් අය වැය ලේඛනයට ඇතුළත් කරනවා. මම හිතන්නේ ඉතිහාසය තුළ අතිරික්ත අය වැය ඉදිරිපත් කරලා තිබුණා. සාම්ප්‍රදායිකව හිඟ අය වැයක් තමයි මෙතෙක් කාලයක් ඉදිරිපත් වෙලා තිබුණේ. හැබැයි, සමස්ත අය වැයෙන් ඉදිරි කාලයේ වියදම් කිරීමට බලාපොරොත්තු වුණු වියදම් පිළිබඳව අපි විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. ආරක්ෂාව වෙනුවෙන් සියයට 10.7ක් වෙන් කරලා තිබෙනවා. සෞඛ්‍ය අංශය සඳහා සියයට 4.52ක් වාගේම, රටේ අනාගත ආයෝජනය වෙනුවෙන් රුපියල් බිලියන 126ක්, එහෙම නැත්නම් සියයට 3.58ක් වෙන් කරලා තිබෙනවා.

අපට මතකයි පසුගිය ආණ්ඩුව මුල් කාලයේදී සියයට 6ක් අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරනවා කිව්වා. හැබැයි, එහෙම වියදම් කරන්න මුදල් වෙන් කරන්න බැරි වුණා. 2018 වසරේ යහ පාලන ආණ්ඩුව සියයට 1.9යි වෙන් කළේ. හැබැයි, කොච්චර අර්බුදකාරි තත්ත්වයක තිබුණත් 2021 වර්ෂය වෙනුවෙන් සියයට 3.58ක මුදල් ප්‍රමාණයක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන්න අපට පුළුවන්කම ලැබුණා.

මේ රටේ දියුණු මානව සම්පතක් නිර්මාණය කර ගන්න පුළුවන්කම ලැබුණොත් අපේ රටේ අනාගත ප්‍රශ්නවලට විශාල වශයෙන් විසඳුම් සොයන්න පුළුවන්කම ලැබෙන බව අපි දන්නවා. අනික් පැත්තෙන් ආනයන-අපනයන ආර්ථික ක්‍රමයකට මුල් තැන දෙනවාට වඩා දේශීය නිෂ්පාදනය මත පදනම් වුණු ජාතික ආර්ථික ක්‍රමයකට මුල් තැන දීම තමයි වැදගත් වන්නේ. අත්‍යවශ්‍ය නොවන ආනයන වියදම් සීමා කරලා, අත්‍යවශ්‍ය වන අමුද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ නැත්නම් මේ රටේ නිෂ්පාදනය කරන්න බැරි දේවල් ආනයනය කරලා, අපේ විදේශ විනිමය ඉතුරු කර ගත යුතු වනවා.

මේ රටේ කෘෂි කර්මාන්තය දියුණු කරලා, ජාතික ආර්ථිකය ශක්තිමත් කර ගත්තොත් මේ රට මුහුණ දීලා තිබෙන, ඉදිරියේදී මුහුණ දෙයි කියලා අපි හිතන බොහෝ ප්‍රශ්නවලට විසඳුම් ලබා ගන්න අපට පුළුවන්කම ලැබෙනවාය කියා මම හිතනවා. මේ අය වැය තුළින් හැමෝම සතුටු කරන්න බැරි වුණත්, අනාගතය ගැන හිතන්න පුළුවන්, ආර්ථිකය ඵලදායිතාවෙන් ඉදිරියට ගෙන යන්න පුළුවන් සාර්ථක අය වැයක් විධියට අපි මෙය දකිනවා. මෙවර අය වැය "ගෝඨාභය රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට සමගාමීව ඉදිරිපත් කළ අය වැයක් කියන කාරණය මේ මොහොතේ මම සිහිපත් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.22]

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අය වැය ලේඛනය පිළිබඳ විවාදයේදී මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් පළමුවෙන්ම ඔබතුමියට ස්තුතිවන්ත වනවා.

අය වැය විවාදය පුරාම බොහෝ කථිකයන් කිව්වේ, 'ෆේල්' කථාව. ඒක තමයි ජනතාවට ජනප්‍රියම ප්‍රස්තුතය බවට පත් වුණේ. බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, මේ පාර්ලිමේන්තුවේ O/L ෆේල් අය 95ක් ඉන්නවා, A/L ෆේල් අය 125ක් ඉන්නවා කියලා. ඒ කථාව අහලා මම මගේ වයස ගැන හිතන්නේත් නැතිව O/L සහ A/L විභාග දෙකම කරලා පාස් වුණා. ආගම විතරක් ෆේල් වුණා. ෆේල්, පාස් ගැන කථා කරපු නිසා මට මේ අවස්ථාවේදී ඒ කාරණයත් කියන්න හිතුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අය වැය විවාදයේදී සමහරු අසත්‍ය ප්‍රකාශ කරනවා අපි දැක්කා. සමහරු ඇත්ත කිව්වා; සමහරු අතිශයෝක්තියෙන් කථා කළා. සමහරු තාර බර, වැලි බර එක්ක එක එක විධියට තමුන්ගේ මුඛරිකම, කථිකත්වය පෙන්වන්න බොහෝ දේවල් පෙන්නුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නමුත් සමස්තයක් වශයෙන් මම දැක්ක දේ තමයි, බොහෝ අය මාධ්‍යයට, publicityවලට, අර channel එකට, මේ channel එකට, "හිරු" එකට යන කැල්ල මොකක්ද, "දෙරණ"ට යන කැල්ල මොකක්ද, "සිරසේ" යන කැල්ලට මොකක්ද හිතලා ඒවාට තමයි කථා කළේ. සමහර අය මේ ගරු සභාවේ හිටපු ජනාධිපතිතුමා, අගමැතිතුමා සන්තෝෂ කරලා, ඊළඟට කැබිනට් ධුරයක් ගන්න අවස්ථාවක් උදා කර ගන්න ඒ කථාව පාවිච්චි කළා. සමහර අය එක් එක්කෙනාගේ පෞද්ගලික මතිමතාන්තර ජනතාව අතරට යවන්න කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නමුත් ඒ අය අමතක කරපු එක දෙයක් තිබෙනවා. මේ පාර්ලිමේන්තු රැස්වීම් පවත්වන්න දවසකට රුපියල් ලක්ෂ 80ක් ගෙවන ජනතාව ගැන කථා කරන්න බොහෝ අයට අමතක වුණා. රුපියල් ලක්ෂ 80ක් එක දවසකට වැය වනවා. නමුත් එතුමන්ලා කථා කළේ එක් එක්කෙනාට ඉන්න කාන්තාවන් ගැනයි, එක් එක් කෙනාගේ භාර්යාවන් වාගේ පෞද්ගලික දේවල් පිළිබඳවයි. අපේ නායකතුමාට අපහාස කරලා කථා කරනවා අදත් අපි දැක්කා. ජනතාව ගැන අඩුවෙන් කථා කළ නිසා පක්ෂ, පාට, නායක, වර්ග, ගෝත්‍ර, ආගම්, භාෂා භේදයකින් තොරව මම අද ජනතාව ගැන කථා කරන්න මේ අවස්ථාව යොදා ගන්න තීරණය කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනතාව ගැන කථා කරනවා නම් පසුගිය ඉතිහාසයේ ශ්‍රී ලංකා දේශපාලනයේදී ජනතාව තෝරලා තිබෙනවා, 1994 සිට විධායක ජනාධිපතිවරු. ඒ කියන්නේ Executive Presidentsලා. 1994 චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ සමයේ සිට 2020 වනතුරු ඉඳලා තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනාධිපතිවරු. අපේ ජනාධිපතිවරු හිටියේ නැහැ. අපට 2002 - 2004 ලැබුණේ භාග ආණ්ඩුවක්. ඒ කියන්නේ, ජනාධිපතිවරයා මහින්ද රාජපක්ෂ මහත්තයා; අගමැති රනිල් වික්‍රමසිංහ මහත්තයා. ඒ, 2002 - 2004 කාලයේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

චන්ද්‍රිකා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

සමාවෙන්න, නිවැරදි කිරීම්වලට යටත්වයි කිව්වේ. ඔව්, චන්ද්‍රිකා මැතිනිය. 2015දී අගමැති රනිල් වික්‍රමසිංහ මහත්මයා, විධායක ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. එතකොට මේ වෙලා තිබෙන විනාශයට වග කියන්න ඕනෑ කවුද? 1994 සිට අපට ජනාධිපතිවරයෙක් සිටියේ නැහැ. හිටිය එකම විධායක ජනාධිපතිවරයා සිටියේ ඔය පැත්තේ. එතකොට මොනවාද ඒ කාලයේ වෙලා තිබෙන්නේ? ආදරණීය ජනතාවටයි මම මේ කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 1994 සිට වෙලා තිබෙන්නේ, රට රුපියල් ට්‍රිලියන දහහතරහමාරක් ණයවෙලා තිබෙන එකයි. උපදින දරුවා රුපියල් 7,13,000ක් ණයයි. මේ රට තවම දියුණු වෙමින් පවතින රටක්. දූෂක දර්ශකයේ අංක 4. මෙන්න කෙරුවාව! මේ අය බණිනවා, අපි ෆේල් කියලා. 1994 සිට මෙච්චර කල් විධායක ජනාධිපති ධුරය දරමින් ආණ්ඩු කරලා දැන් කියනවා, "විපක්ෂය ෆේල්" කියලා. ඉතින් අපි තේරුම් ගන්න ඕනෑ, කවුද ෆේල් කියලා.

වර්තමාන ආණ්ඩුව අහනවා, "ඒ කාලයේ හොරු ඇල්ලුවාද" කියලා. එතකොට අපි කියනවා, "අපට හොරු අල්ලන්න බැරි වුණා" කියලා. අපට හොරු අල්ලන්න බැරිවෙලා, එතුමන්ලා නැවත පත්වුණු නිසා අපට පිළිගන්න වෙනවා, අපිත් ෆේල් කියලා. ඒ වාගේම, හොරුන් නැවත පත් කර ගත්තේ කවුද? හිටපු ගරු ජනාධිපතිතුමා මේ සභාවේ සිටියා. එතුමා ඒ දවස්වල රත්‍රන් අශ්වයන් ගැන කිව්වා, ලැම්බෝගිනි වාහන ගැන කිව්වා, නෙළුම් කුලුනෙන් රුපියල් කෝටි 200ක් ගැහුවා කිව්වා, එතුමා පැරදුණොත් අඩි 6ක් පොළොව යට කිව්වා, මුන් ලෝක හොරු කිව්වා. ඒ සියලු දේවල් කිව්ව හිටපු ජනාධිපතිතුමාගේ විධියට කවුද ෆේල්? හොරුන් නැවත පත් කර ගන්නේ කවුද? මෙච්චර හොරකම් කරපු හොරුන් නැවත පත් කර ගත්තේ කවුද? ජනතාව. මට ඡන්ද නැති වුණත්, මට කියන්න වෙනවා, ජනතාවත් ෆේල් කියලා. තිත්ත ඇත්ත ඒකයි. ජනතාවත් ෆේල්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා නම් අවංකව පෞද්ගලිකව හොරු අල්ලන්න හොඳ 'ට්‍රයි' එකක් දුන්නා. මම ඉස්සෙල්ලාම ට්‍රයි කළේ අපේ හොරු අල්ලන්නයි. මට ඒකට ලැබුණු තෑග්ග තමයි, නඩු 36ක් පැවරීමත්, තුන් වරක් රිමාන්ඩ් කිරීමත්. ඒ තමයි මට ලැබුණු තෑග්ග. ඒක තමයි ලංකාවේ හොරු අල්ලන්න යන අයට සිද්ධවන දේ. ඒ කාරණය ලංකාවේ ජනතාවට විශේෂයෙන් කියන්න ඕනෑ.

මේ ආණ්ඩුව බලයට පත් වුණේත් හොරු අල්ලන්න කියලායි. අන්තිමට ඇල්ලුවේ කවුද? හොරු අල්ලනවා වෙනුවට අද මගේ යාළුවා, විල්සන් කරු අල්ලාගෙන තිබෙනවා. රුපියල් 5,000 ගන්න ගිහින් සිටි, මගේ "වන් ෂොට්" චිත්‍රපටයේ "වලිසුන්දර" කියන නළුවා, විල්සන් කරු මාස්ක් එකක් දැම්මේ නැහැයි කියලා අල්ලාගෙන තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ කාරණය කියන්න අවසර දෙන්න. ලෝකයේම ආර්ථිකය සෘණවෙලා තිබියදී, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියනවා, මේ අය වැය ලේඛනය ලංකාවේ

[ගරු රන්ජන් රාමනායක මහතා]

ආර්ථිකය පමණක් ධනවෙලා තිබෙන, ආර්ථික උත්තේජනයක් නැති අය වැයක් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට අපහාස කරපු ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන ඒ ඇමතිතුමාගේ කථාවට උත්තරයක් දෙන්න මගේ අන්තිම විනාඩි කිහිපය යොදා ගන්නවා. එතුමා කියනවා, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා නිවාස අමාත්‍යාංශයෙන් රුපියල් බිලියනයක් ගැහුවා; හොරකම් කළා කියනවා. දැන් තිබෙන්නේ, ස්වාධීන අධිකරණයක් කියලා එතුමන්ලාම කියනවා. නමුත් රුපියල් කෝටි 60ක සිල් රෙදි බෙදූ අය ස්වාධීන අධිකරණයෙන් නිදොස් කොට නිදහස් කරනවා. ජනක බණ්ඩාර තෙන්නකෝන් ඇමතිතුමාගේ නඩුව නිෂ්ප්‍රභ වෙනවා. එතකොට පසුගිය කාලයේ හැංගිලා ගිහින් මවුන්ට් එලිසබෙත් එකේ සිටිය anticipatory bail ගත්ත වුදිතයෝ අද රජ පුටුවේ වාඩිවෙලා ඉන්නවා. ස්වාධීන අධිකරණයක් තිබෙනවා නම් මෙන්න ඉන්නවා, වුදිතයා. කවුද? ඒ මන්ත්‍රීතුමා කියන විධියට වැඩිම හොරකම් කරපු පුද්ගලයා සජිත් ප්‍රේමදාස මහත්මයායි. අනේ, ඉතින් කුදලාගෙන ගිහින් දමන්න. විනාඩි විසි ගණනක් මෙහෙම බැණ-බැණ ඉන්න එපා, නිවාස අමාත්‍යාංශයේ මෙවැනි හොරකම් කළා කියලා කියනවා නම් කුදලාගෙන ගිහින් දමන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනතාවට දැන ගන්නයි මම මේ කියන්නේ. එතුමා ආදර්ශ ගම්මාන 337ක් හදලා තිබෙනවා, 9,586කට නිවාස හිමිකම් දීලා තිබෙනවා. එතුමා නිවාස ණය ප්‍රතිලාභ 51,254ක්, නිවාස ආධාර ප්‍රතිලාභ 7,233ක්, රණ විරුවන්ට 'විරු සුමිතුරු' සහන 161ක් දීලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පෝස්ටර්වලට?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මොකක්ද කිව්වේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කටවුට්, පෝස්ටර්වලට?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Publicity එකට වෙන් කරපු මුදල් තමයි බොහොම නීත්‍යානුකූලව ඒ සඳහා යොදාගෙන තිබෙන්නේ. එහෙම නැතුව ඔබතුමන්ලාගේ විමල් වීරවංශ ඇමතිතුමා වාගේ ඥාතීන්ට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ ගණන කියන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගණන වැරැදි නම්, මෙතුමා හොරෙක් නම් මාංචු කුට්ටමක් දමලා අල්ලාගෙන යන්නකෝ. ඇයි කැගහමින් ඉන්නේ? [බාධා කිරීමක්] අධිකරණය ඔබතුමන්ලාගේනේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ වියදම කියන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඒ ගණන CID එකට කියන්න. මට කියලා වැඩක් තිබෙනවාද?

මම දැන් අභියෝග කරනවා, නිවාස අමාත්‍ය ධුරය දරපු කාලයේ හොරකම් කළා කියා චෝදනාවට ලක් කරන සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා පුළුවන් නම් අරගෙන ගිහින් හිරේ දමන්න කියලා. බොරුවට චෝදනා කර කර ඉන්න එපා. ඔය සේරම අතේ පැළ වෙන අසත්‍ය බව කියමින් මම ඒ චෝදනා සියල්ල ප්‍රතික්ෂේප කරනවා.

මම හැම දාම තිත්ත ඇත්ත කථා කළා. ජනතාව මා කියන කථාව ඔය පස්හොරු කියන ඒවාට වඩා විශ්වාස කරනවා ඇතැයි මම සිතනවා. ඔය චෝදනා කරන අය තමයි ඉඩම් අරගෙන, තාත්තා, අයියා ඇතුළු සියලුදෙනා එක්ක පස් කපලා "පස්හොරා" යන අන්වර්ථ නාමයෙන් පෙනී සිටින්නේ. ඒ අය තමයි දිවා රෑ නැතිව නිවාස අමාත්‍යාංශයේ වැඩ කරපු සජිත් ප්‍රේමදාස කියන පුද්ගලයාට මඩ ගහන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මට තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මා තමුන්නාන්සේලාට කියන්නේ මේකයි. එච්චර චෝදනා කරන්න අවශ්‍ය නැහැ. අද තිබෙන්නේ, තමුන්නාන්සේලාගේ අධිකරණය. තමුන්නාන්සේලාට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලය තිබෙනවා; ඒකාධිපති විධායක ජනාධිපති කෙනෙක් ඉන්නවා; අගමැති කෙනෙක් ඉන්නවා; full powers තිබෙනවා. ලොක්කා මේවා කියන මාත් ළඟදී හිරේ දමන්න යනවා. නමුත්, හිරේ දැම්මා කියලා මේ 'වන්ෂොට්ලා' second වෙන්නේත් නැහැ; බය වෙන්නේත් නැහැ; කට වහන්නේත් නැහැ. මේ විධියට කථා කළා කියලා දැනට තුන් පාරක් මා හිරේ දමා තිබෙනවා. මා ඉස්සෙල්ලාත් කිව්වා වාගේ, මට නඩු 36ක් තිබෙනවා. අපි නඩුවලට බය නැහැ. දිගටම නඩු දමන්න. පුළුවන් තරම් නඩු දමන්න. ලංකාවේ තිත්ත ඇත්ත කථා කරන මිනිහා හැම දාම හිරේ. මගේ මාමා තිත්ත ඇත්ත කථා කරලා, හිරේ වැටුණා; වෙඩි කෑවා. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද හිරේ දැම්මේ? [බාධා කිරීම්]

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
තමුන්නාන්සේලා තමයි- [බාධා කිරීම්]

අපේ පක්ෂයේ අය හොරකම් කළා කියනවා නම්, ඒ අයට විරුද්ධව නඩු දමන්න, ඒ අය හිරේ යවන්න කියලා මම නැවත නැවතත් කියනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තිබෙනවා; CID එක තිබෙනවා; FCID එකත්

තිබෙනවා. ඒ හැම තැනටම අරගෙන ගිහිල්ලා නඩු දමා අප හිරේ දමන්න. හිරේ දැම්මත් අපි දන්නවා, අපට චෝදනා නැහැ කියන එක. ඒකයි මෙහෙම තිත්ත ඇත්ත කථා කරන්නේ කියමින්, මට අවස්ථාව දුන්නාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව නතර කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නලින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා.

[අ.භා. 4.33]

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2021 අය වැය විවාදය පැවැත්වෙන මේ වෙලාවේ මම කියනවා, කොවිඩ්-19 වසංගතය නිසා ගම්පහ දිස්ත්‍රික්කයේ මා නියෝජනය කරන ජා-ඇල ආසනයේත්, එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයත් අද වන විට දවස් 45ක් තිස්සේ lock down කර තිබෙන බව. පොලිස් වසම් තුනම lock down කරලා තිබෙන මේ වෙලාවේ මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, රුපියල් 5,000ක දීමනාව ලබා දීලා, නිරෝධායනය වන පවුල් සඳහා රුපියල් 10,000ක බඩු මල්ලක් ලබා දීලා රජය විධියට සහන සලසමින් එම ජනතාව වෙනුවෙන් කළ සේවය ගැන. ඒ වෙනුවෙන් කැප වූ පොලිස් නිලධාරින්, ප්‍රාදේශීය ලේකම්තුමා, ග්‍රාම නිලධාරින් ඇතුළු සියලු රාජ්‍ය නිලධාරින්ට -සියලුදෙනාට- මගේ ස්තුතිය පුද කරනවා.

තමුන්නාන්සේලා දන්නවා, අපි 2021 අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ අපට වාගේම මුළු ලෝකයටම කොවිඩ්-19 වසංගතය බලපා තිබෙන වෙලාවක බව. යහපාලන රජය මේ රට පාලනය කළ පසුගිය අවුරුදු හතරහමාරක කාලය තුළ මේ රටේ ආර්ථිකයට මොන තරම් පීඩනයක්, මොන තරම් බලපෑමක් සිදු කළාද කියන එක අපි කවුරුත් දන්නවා. මේ අය වැය ගැන කථා කරන්න ඉස්සර වෙලා, මේ විපක්ෂය එදා ආණ්ඩු පක්ෂයේ සිටිද්දී, මේ රට පාලනය කරද්දී අපේ ආර්ථිකය මෙහෙයවූයේ කොයි විධියටද කියන එක ගැන දැනුවත් කරන එක හොඳයි. ඒවා දන්නේ නැතිව වාගේ විපක්ෂය නඟන චෝදනාවලට අපි පිළිතුරක් දෙන්න ඕනෑ කියා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි දැන් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ දත්ත සසඳා බලමු. අපේ ආණ්ඩුව 2014 වර්ෂයේ යහපාලන ආණ්ඩුවට රට භාර දෙන කොට ආර්ථික සංවර්ධන වේගය සියයට 7.4ක් ලෙසයි තිබුණේ. අපි 2019 වර්ෂය අවසානයේ ආණ්ඩුව භාරගනිද්දී එය සියයට 2.3යි. අපි රට භාර දෙන කොට ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 3,853යි. ආපසු අපි රට භාරගනිද්දී ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 3,852යි. කෘෂි කර්මාන්තයේ වාර්ෂික වර්ධන වේගය අපි ආණ්ඩුව භාර දෙන කොට සියයට 4.6යි. අපි ආණ්ඩුව නැවත භාර ගනිද්දී එය සියයට දශම 6යි. සේවා අංශයේ වාර්ෂික වර්ධන වේගය අපි රට භාර දෙනකොට සියයට 4.8යි; අපි ආණ්ඩුව බාර ගනිද්දී සියයට 2.3යි. දළ ජාතික නිෂ්පාදනයට සාපේක්ෂව රටේ ආර්ථික වර්ධනය අපි රට භාර දෙනකොට සියයට 5.1යි; අපි ආණ්ඩුව භාර ගනිද්දී සියයට 2.2යි. අපි රට භාර දෙනකොට මේ රට තුළ තිබුණු විදේශ වත්කම් ප්‍රමාණය ඩොලර් බිලියන 8.3යි; අපි භාර ගනිද්දී ඩොලර් බිලියන 7.8යි. අපේ ආණ්ඩුව බලයට පත් වුණාම පසු ගිය රජයේ අවුරුදු පහක කාලය තුළ ඒ රජය ගෙන ගිය වැඩ පිළිවෙළ අධීක්ෂණය කර බලද්දී, සමාලෝචනය කර බලද්දී අපේ රට පහළට වැටිලා තිබෙන බව පෙනෙනවා නම්, රටක් විධියට අපි ඒ වගකීම භාරගන්න ඕනෑ. කෘෂි කර්මාන්තය කඩා වැටිලා නම්, ඒ අවුරුදු පහ තුළ කෘෂි කර්මාන්තය සංවර්ධනයක් වෙලා නැත්නම්, කාර්මික අංශයේ වාර්ෂික වර්ධනයක් වෙලා නැත්නම්, සේවා අංශයේ වර්ධනයක් වෙලා නැත්නම්, ඒ රජය ගෙන ගිය වැඩ පිළිවෙළ ගැන අපට කියන්න දෙයක් නැහැ. එවැනි ආර්ථිකයක් භාර අරගෙන, ඉදිරි අවුරුදු පහක කාලයක් සඳහා බලයට පත් වූ අපේ ආණ්ඩුවේ පළමුවන අවුරුද්ද වෙනුවෙන් වන අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන අවස්ථාවක තමයි අද අපි මේ කථා කරන්නේ. අද විපක්ෂය අහනවා, ජනතාවට ලබා දෙන සහන මොනවාද කියලා. අපි ජනතාවට සහන ලබා දෙන්නේ, දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් එක්කයි. එහෙම නැතිව අය වැයක් ගෙනෙන කොට, ලූනු කිලෝ එක රුපියල් 25කින් අඩු කළා, සැමන් ටින් එකක් රුපියල් 5කින් අඩු කළා, සීනි කිලෝ එකක් රුපියල් 10කින් අඩු කළා කිව්වාට වැඩක් නැහැ. මොකද, ලෝක වෙළෙඳ පොළේ මිලත් එක්ක, එහෙම නැත්නම් රටේ තිබෙන බදු ප්‍රතිපත්තියත් එක්ක මාසයක් යන කොට ඒ මිල ගණන් අඩු වෙනවා; එහෙම නැත්නම් වැඩි වෙනවා. එම නිසා අපට අවශ්‍ය වන්නේ, දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක්. අපි උදාහරණයක් ගනිමු. 2019 අවුරුද්දේ කෘෂි නිෂ්පාදන ආශ්‍රිත භාණ්ඩ ආනයනය කිරීමට අපි ඩොලර් මිලියන 750ක් වියදම් කරලා තිබෙනවා. ඒවා අපේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් දේවල්. නමුත්, අපි ඒවා නිෂ්පාදනය කළේ නැහැ. එම නිසා තමයි අපි බී ලූනු සඳහා, රතු ලූනු සඳහා, අල සඳහා, වියළි මිරිස් සඳහා, අමු මිරිස් සඳහා සහතික මිලක් ලබා දුන්නේ. සහතික මිලක් ලබා දීලා, නොමිලේ බීජ ලබා දීලා, පොහොර ලබා දීලා ගොවියා ශක්තිමත් කිරීම තුළින් ආනයනය සඳහා අපේ රටින් විදේශයට යන මුදල ඉතිරි කරගන්න අපට පුළුවන්.

මේ රටේ එළවලු සහ පලතුරුවලින් සියයට 40ක් නාස්ති වෙනවා. ඒ නාස්තිය වළක්වාගන්න නම්, ශීතාගාර හදන්න ඕනෑ. අපි ඒ ගැන අවුරුදු ගණනක් තිස්සේ කථා කළා. නමුත්, කිසිම රජයකින් ඒකට පිළියමක් යෙදුවේ නැහැ. අපි මෙවර අය වැයෙන් ඒ සඳහා මුදල් ලබා දෙන්න තීන්දු කළා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපි ඒක දඹුල්ලේ පටන් ගෙනයි තිබෙන්නේ.

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
දඹුල්ලේ පටන් ගත්තේ ශීතාගාරයක් නොවෙයි නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම නේ ඒක පටන්ගත්තේ.

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
ඒක ශීතාගාරයක් නොවෙයි, ලූනු විතරක් ගබඩා කරන්න පුළුවන් තැනක්. මම ඒ ගැන කියන්නම්. මම අවුරුදු දොළහක් සතොසේ ඉඳලා ඔබතුමාට වඩා අල-ලූනු ගැන දන්නවා. ඔබතුමා දන්නේ පොතෙන් නේ. මම ප්‍රායෝගිකව දන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඒක ශීතාගාරයක් නොවෙයි. Moisture එක අඩු කරලා, ලූනු විතරක් ගබඩා කරලා තබාගන්න පුළුවන් තැනක්. ඒකේ අල ගබඩා කරලා තියන්න පුළුවන්ද? එළවලු ගබඩා කරලා තියන්න පුළුවන්ද? අල ගබඩා කරලා තියන්න බැහැ ඒකේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඕනෑ දෙයක් තියන්න පුළුවන්. ඒකේ, උෂ්ණත්වය වෙනස් කරලා,-

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
හරි ඉතින්, උෂ්ණත්වය වෙනස් කරන විධියට- [බාධා කිරීමක්] ඔබතුමා ඒක හැදුවේ නැහැ නේ. [බාධා කිරීමක්] හදලා නැහැ. හදලා ඉවරද? [බාධා කිරීමක්] අද ගොවියාට ගිහිල්ලා එතැන ගබඩා කරන්න පුළුවන්ද? [බාධා කිරීමක්] අද ගොවියාට ගිහිල්ලා එතැන ගබඩා කරන්න පුළුවන්ද? [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපි තමයි ඒකේ වැඩ පටන්ගත්තේ.

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
අද ගොවියාට ගිහිල්ලා එතැන ගබඩා කරන්න පුළුවන්ද? [බාධා කිරීමක්] හරි, මගේ වෙලාව අරගෙන ඔබතුමා ගොවි මහත්වරුන්ට කියන්න, අද ඉඳලා ගිහිල්ලා එතැන ගබඩා කරන්න කියලා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අදම ගොවියාට කියන්න, ගිහිල්ලා එතැන ගබඩා කරන්න කියලා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Madam Chairperson, I rise to a point of Order.

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
ඔබතුමා ගිහිල්ලා ගොවියාට කියන්න, මේ මම හදපු ශීතාගාරය -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු මන්ත්‍රීතුමා, මෙතැනට ඇවිල්ලා අසත්‍ය කියන්න එපා. අපි තමයි ලංකාවේ පළමුවැනි කෘෂි ශීතාගාරය "ප්‍රභාෂ්වර" නමින් දඹුල්ලේ පටන්ගත්තේ. ඒ නිසා ඔබතුමා මෙතැනට ඇවිල්ලා "කළේ නැහැ" කියලා කියන්න එපා. අපි ආරම්භ කරපු දේ කරලා අවසන් කරන්න, ඒ වැඩ මහ නවත්වන්න එපා. [බාධා කිරීමක්]

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
කරලා නැහැ නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මගේ වෙලාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාට ඔබතුමිය ගොඩක් වෙලාව දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මෙහෙමයි. එතකොට, ඒ මන්ත්‍රීතුමාගේ පක්ෂයේ කාලයෙන් ඒ කාලය අඩු වෙනවා.

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා "ශක්ති" කියලා ව්‍යාපෘතියක් කරලා අන්තිමේදී ඒක "ෆේල්" වුණා. මගෙන් ඒ ගැන අහගන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සහල් හොරා කෑවා.

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
සහල් හොරා කෑවේ නැහැ. එහෙම කියන්න නම් බැහැ. මම කියන්නේ නැහැ එහෙම. හැබැයි, ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා "ෆේල්" වුණා. ඔය ආර්ථික න්‍යාය practically කරන හැටි පොඩ්ඩක් ඉගෙනගන්න. ඒ ඉගෙනගන්න එකත් කරන්න වෙන්නේ ආණ්ඩුවෙන්මයි. අපි ව්‍යාපාර කරලා ඒවා ඉගෙනගෙනයි තිබෙන්නේ. ඒ නිසා මට ඒවා ගැන කියන්න එන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
කිරි පිටි ආනයනය සඳහා 2019 අවුරුද්දේ අපි රුපියල් මිලියන 320ක් වැය කළා. ඒ වාගේම සීනි ආනයනය කිරීම සඳහා අපි ඇමරිකානු ඩොලර් මිලියන 206ක් වැය කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න. මිනිත්තු දෙකක කාලයක් වැඩිපුරත් අරන් තිබෙනවා.

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
මට තව මිනිත්තුවක කාලයක් දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දේශීය ආර්ථිකය හදන්න, දේශීය කෘෂි කර්මාන්තය හදන්න, දේශීය නිෂ්පාදකයා ශක්තිමත් කරන්න ගෙනාපු වැඩ පිළිවෙළට අපේ සහයෝගය දීලා, ඉදිරි අවුරුදු 5 තුළ අපේ ආර්ථික සංවර්ධන වේගය සියයට 5.5 ඉලක්කයට අරගෙන යන්න පුළුවන් කියන කාරණය ප්‍රකාශ කරමින්, සියලුදෙනාටම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 4.41]

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ඔබතුමිය මූලාසනයේ ඉන්න වෙලාවේ, 2021 අය වැය විවාදයේදී වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

විශේෂයෙන්ම ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා කිව්වා, "1994න් පස්සේ හොඳ වෙලාවට අපේ ජනාධිපතිවරයෙක් සිටියේ නැහැ, ඔබතුමන්ලාගේ ජනාධිපතිවරු තමයි සිටියේ" කියලා. එතුමාගේ ජනාධිපතිවරයෙක් නොහිටපු එක ජනතාවගේ වාසනාවක් වශයෙන් අපි කල්පනා කරනවා. මහ බැංකු කොල්ලය ආදි යහ පාලන ආණ්ඩුව කාලයේ සිද්ධ වුණු දේවල් දිහා බලනකොට, අගමැතිවරයෙක් තියාගෙන එහෙම දේවල් කළා නම්, ජනාධිපතිවරයෙක් සිටියා නම් කොහොම වෙයිද කියලා අපට හිතාගන්න පුළුවන්, ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි. ඔබතුමා හොඳ නළුවෙක්; ශිල්පියෙක්. ඔබතුමාට හොඳට රඟපාන්න පුළුවන්. ඒ කාලයේ ඉඳලා අපිත් ඔබතුමාගේ චිත්‍රපට බලලා තිබෙනවා. ඔබතුමා රඟපාන්න හොඳයි. ඔබතුමාට හාස්‍යජනක චරිත, ඒ වාගේම ප්‍රේම චරිත, ගස් වටේ දුවන චරිත වාගේ ඕනෑම චරිතයක් රඟපාන්න පුළුවන්. හැබැයි, ඔබතුමා හොඳ දේශපාලනඥයෙක් නොවෙයි. ඒ නිසා තමයි නඩු 36ක් දමාගෙන තිබෙන්නේ. එහෙම කරලා තිබෙන්නේ ජනතාව වෙනුවෙන් කියලා අපි විශ්වාස කරන්නේ නැහැ.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා කියනවා මම හොඳ නළුවෙක්, රඟපානවා හොඳයි කියලා. හැබැයි, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තමයි කිව්වේ, මහින්ද රාජපක්ෂ යුගයේ බැඳුම්කර වංචාව රුපියල් බිලියන 889යි, අපේ වංචාව රුපියල් බිලියන 11යි කියලා. ඒක කිව්වේ අපි නොවෙයි, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. ගරු රෝහණ දිසානායක මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒවාට උත්තර දෙන්න මම මේ වෙලාව ගන්නේ නැහැ. නමුත්, එතුමා කියන කරුණු කාරණා ගැනත්, අපි කියන කරුණු කාරණා ගැනත් මේ රටේ ජනතාව බොහොම අවදියෙන් ඉන්න බව එතුමාට අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. එතුමාත් එක්ක වාදයකට යන්න මම උත්සාහ කරන්නේ නැහැ.

ඇඩම් ස්මිත්, ආර්ථික විද්‍යාවේ පියා ලෙස තමයි අපි සලකන්නේ. එතුමාටවත් ආර්ථික විද්‍යාව ගැන විග්‍රහයක් කරන්න බැරි අවස්ථාවක තමයි COVID-19, එහෙම නැත්නම් කොරෝනා වසංගතයත් එක්ක අය වැයක් - Budget - ඉදිරිපත් කරන්න අපට සිදු වුණේ. මාර්තු මාසයේ 11වැනි දා තමයි ලංකාවේ පළමුවැනි කොවිඩ් ආසාදිත රෝගියා හමු වුණේ. අද වන විට ලෝකයේ කෝටි පහමාරකට වඩා වැඩි පිරිසක් කොරෝනා වසංගතයට ගොදුරුවෙලා තිබෙනවා. ඒ වාගේම කොරෝනා රෝගය නිසා ලක්ෂ දහතුනහමාරක් පමණ මිය ගිහිල්ලා තිබෙනවා. ලෝක ආර්ථික අවපාතය ඉදිරියේ ආර්ථික විද්‍යාවේ පියාටවත් Budget එකක් හදන්න බැරි ආකුල, ව්‍යාකුල, අවිනිශ්චිත තත්ත්වයක මුළු ලෝකයම ඉන්න වෙලාවක තමයි 2021 වර්ෂය සඳහා අපේ ගරු අගමැතිතුමා විසින් මෙම අය වැය ලේඛනය ඉදිරිපත් කළේ. ආර්ථික විද්‍යාවේ විශේෂඥයකු වන ඩඩ්ලි සියර්ස් කියනවා, අය වැයක් හදන අතරතුර මේ වාගේ දෙයක් එනකොට තුන්කල් බලන්න ඕනෑ කියලා. අතීතය, වර්තමානය, අනාගතය දෙස බලන්න ඕනෑ කියනවා. 2021 අය වැය ලේඛනය හදනකොට අපි අඩු ගණනේ 2001, 2002 ඉඳලා බලන්න ඕනෑ. ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, එතකොට ඔබතුමන්ලාගේ අගමැතිවරු සිටියා.

මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු වන මට මතකයි, මාතලේ දිස්ත්‍රික්කයේ තිබෙන ලෝක උරුමයක් වන සීගිරිය "Regaining Sri Lanka" යටතේ විකුණන්න උත්සාහ කරපු රජයක් තමයි එදා තිබුණේ. ඔබතුමන්ලාට ඒක මතක ඇති. ඒ වාගේම, පසුගිය යුගයේ රටට වුණු සෙතක් නැහැ. දඹුල්ලේ ශීතාගාර ගැන කිව්වා. ඇත්තටම ඒවා ෆේල්. ශීතාගාරය හදලා තිබෙනවා කිව්වා. ශීතාගාර ෆේල්. බීජ රැකගන්න, එහෙම නැත්නම් එළවලු තියාගන්න තවමත් දඹුල්ලට ශීතාගාර නැහැ. ඒ දේ කරන්න මෙවර අපි අය වැය ලේඛනයෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවාය කියන එක මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

විශේෂයෙන්ම ප්‍රබුද්ධ ආර්ථික විශේෂඥයෙකු වන ඩඩ්ලි සියර්ස් ප්‍රකාශ කර තිබෙනවා, ප්‍රමාණාත්මක වර්ධනයක් සලකමින් මූල්‍ය ස්ථාවරත්වය ඇති කිරීමට අවශ්‍ය විකල්ප හඳුනා දිය යුතු බව. අපි මේ තිබෙන ප්‍රශ්න, ගැටලු, අභියෝග හමුවේ අය වැය ලේඛනය හදා තිබෙනවා. මේ තිබෙන තත්ත්වය තුළ ඉදිරිපත් කරපු 2021 අය වැය ඉතාම ප්‍රශස්ත අය වැයක් බව පැහැදිලිව මම කියනවා. මෙවර අය වැය මේ රටේ ඉදිරි අනාගතය බලා ගත් තීන්දුවක් බව මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. මේ අය වැය තුළ ඇති එක් එක් අමාත්‍යාංශවල වැය ශීර්ෂවල ඇති ඇස්තමේන්තු දෙස බැලීමෙන් මෙහි සැබෑ ආර්ථික දර්ශනය හෝ අනාගතය උදෙසා වන රජයේ සැලැස්ම අවබෝධ කර ගත නොහැකියි. රටට ආදරය කරන සෑම කෙනෙක්ම රට තුළ උද්ගත වී ඇති අපහසුතා හා මෙම තත්ත්වය හේතුකොටගෙන ඇති විය හැකි අනාගත අභියෝග දෙස බැලිය යුත්තේ තම දේශපාලන න්‍යාය හෝ පටු අවස්ථාවාදය මත නොවන බව මම සිහිපත් කරන්න ඕනෑ. මේ අවස්ථාවේදී දේශපාලනය දෙස නොබලා රට පවතින තත්ත්වය පිළිබඳව බලන්න කියන ඉල්ලීම මම කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආර්ථික මෙන්ම තවත් බරපතළ අර්බුදයක් ගෝලීය මට්ටමින් අද ඇති වී තිබෙනවා. ඒ,

[ගරු රෝහණ දිසානායක මහතා]

කොවිඩ් -19 වසංගතයයි. ඒ නිසා අපි මේ වෙලාවේ ඒ තිබෙන තත්ත්වය අනුව අය වැය ලේඛනය හදා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන්කර ඇති කාලය අවසානයි.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு றோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තව විනාඩියක් ලබා දෙන්න කියලා ඔබතුමියගෙන් මම ඉල්ලීමක් කරනවා.

ඊයේ ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කියා තිබෙනවා, අපේ ආණ්ඩුව මිලිටරිකරණය වෙනවා, ජනාධිපතිතුමා මිලිටරිකරණයකට යනවා කියලා. මම මේ වෙලාවේ ඒ ගැන කියන්න ඕනෑ. මට ඒකට විතරක් අවසර දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී කාලය පිළිබඳ ලොකු ගැටලුවක් තිබෙනවා.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு றோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට විනාඩියක් දෙන්න. ඔබතුමිය විශේෂයෙන් මාතලේට සලකන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.
ගරු මන්ත්‍රීතුමනි, මම එහෙම කිව්වේ නැහැ.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு றோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එහෙම නොකිව්වා නම් ප්‍රශ්නයක් නැහැ. මම දැක්කා, පුවත් පතක එහෙම තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පාර්ලිමේන්තුවට එන මන්ත්‍රීවරයෙක් පුවත් පත් බලන්න ඕනෑද? ඔබතුමා මෙතැන හිටියා නේ? පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් පුවත් පත් බලන්න ඕනෑද? මෙතැන ඉන්න එපායැ. මම එහෙම දෙයක් කිව්වේත් නැහැ. මම මිලිටරිකරණයක් ගැන කථා කළේත් නැහැ.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு றோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)
ඔබතුමා එහෙම කථා කරන්න එපා. අද උදේ ඉඳලා ඔබතුමාත් මෙතැන හිටියේ නැහැ නේ? ඒක නිසා ඔබතුමා ප්‍රායෝගික වෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு றோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සූදානම් කර ගෙන ආ සම්පූර්ණ කථාව මම **සභාගත*** කරනවා.

විශේෂයෙන් අපි කියනවා, ගෝඨාභය රාජපක්ෂ වර්තමාන ජනාධිපතිතුමා, අගමැතිතුමා ප්‍රධාන මේ රජය 2021 අය වැය ලේඛනය තුළින් මේ රට ඉදිරි ගමනකට යොමු කරන්න සැබෑ ලෙසම සූදානම් වෙලා සිටින බව. ඒ තුළින් අපි ජනතාවගේ අවශ්‍යතා හා බලාපොරොත්තු සැබෑ ලෙසම ඉෂ්ට කරනවාය කියන එක ඉතා පැහැදිලිව ප්‍රකාශ කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මී ළඟට, ගරු සමන්ප්‍රිය හේරත් මහතා.

එතුමාගේ කථාව ආරම්භ කිරීමට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු වසන්ත යාපාබණ්ඩාර මහතාගේ නම යෝජනා කරන්න.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, (மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வசந்த யாப்பாபண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA *left the Chair, and* THE HON. WASANTHA YAPABANDARA *took the Chair.*

[අ.භා. 4.49]

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පක්ෂයේ ආදරණීය නායකයා වන මහින්ද රාජපක්ෂ මැතිතුමා, අපේ රටේ ජනාධිපතිතුමා වන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය පෙරදැරි කර ගෙන ඉදිරිපත් කර තිබෙන අය වැය ලේඛනය සම්බන්ධයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මට අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වනවා.

ඊයේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල හිටපු අමාත්‍යතුමා -විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා- කිව්වා, 70-77 යුගය ගැන. ඒ වාගේම විදේශ විනිමය සම්බන්ධයෙනුත් එතුමා සඳහන් කළා. 70-77 යුගය ගැන කථා කරද්දී සිරිමාවෝ ආර්.ඩී. බණ්ඩාරනායක මැතිනියගේ රජය කාලයේ සංවෘත ආර්ථික රටාවක් තිබුණු බව කියන්න ඕනෑ. එවක පැවැති සම්පූර්ණ සංවෘත ආර්ථික රටාව

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කුඩුපට්ටම් කරමින් 1977දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විවෘත ආර්ථිකය මෙරටට හඳුන්වා දීමත් සමඟ මේ රටේ දේශීයත්වය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ගියාය කියන එක මම මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ. හැබැයි, දේශීයත්වය ගැන කථා කරන්න අපේ ආණ්ඩු ආ හැම අවස්ථාවකදීම අපට ඉඩ ලැබුණේ නැහැ. අපි දේශීයත්වයට ගරු කරමින් නිෂ්පාදන ආර්ථිකයකින් තමයි හැම වෙලාවේම ඉදිරියට ගියේ.

මේ අවස්ථාවේදී මම තවත් කරුණක් සඳහන් කරන්න ඕනෑ. එනම්, අද ලෝකයම වසංගත තත්ත්වයකට මුහුණ දීලා තිබෙනවා. ඒ වසංගත තත්ත්වයත් එක්ක තමයි ගරු අග්‍රාමාත්‍යතුමා විසින් මේ අය වැය ඉදිරිපත් කරනු ලැබුවේ.

විපක්ෂය අද කොවිඩ් වසංගතය ගැන කථා කරනවා. කොවිඩ් වසංගතය නිසා අද ලෝකයම බරපතළ මූල්‍ය අර්බුදයකට ලක්වෙලා තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යතුමිය විධියට ගරු පවිත්‍රා දේවි වන්නිආරච්චි මැතිනිය කළ එක් ක්‍රියාවක් පිළිබඳව අද මේ රටේ කථා කරනවා. විශේෂයෙන්ම 'මුට්ටියක්' ගැන කථා කරනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැම වෙලාවේම එතුමියට ඒ ගැන ඔච්චම් ස්වරූපයෙන් කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුට්ටි ගැන කථා කරද්දී අපට ඉතිහාසය මතක් වෙනවා. 1991 වර්ෂයේ ආර්. ප්‍රේමදාස මැතිතුමාට විශ්වාසභංගයක් ගෙනාවා. ඒ වෙලාවේ කන්‍යාවියෝ හත් දෙනෙකුගෙන් කිරි කළ හතක් නාවා ගත්තා, අපේ විපක්ෂ නායකතුමාගේ පියාණන්. හැබැයි, එක්කෙනෙක් කන්‍යාවියක් නොවෙයි ලු. ඒ ඉතිහාසය අපි අහලා තිබෙනවා.

අද රන්ජන් රාමනායක අපේ හිතවත් ගරු මන්ත්‍රීතුමා කථා කළා, අපේ ගරු ඉන්දික අනුරුද්ධ මැතිතුමා ගැන. හැබැයි, මට තිබෙන සැකය මේකයි. ඉන්දික අනුරුද්ධ මැතිතුමා අහපු ප්‍රශ්නයට එතුමා උත්තර දුන්නා. විපක්ෂ නායකතුමා උත්තර දුන්නේ නැහැ. මේ අවස්ථාවේ එතුමා ගරු සභාවේ හිටියා නම් හොඳයි. අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමා ඒකට උත්තර දුන්නා නම් හෙඳයි. එතුමා වැට පැන්නාදෝ කියන සැකය අපට තිබෙනවා.

ඇත්තටම දේශීයත්වයට මුල් තැන දෙමින් ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් මේ අය වැය ඉදිරිපත් කර තිබෙන බව අපි සිහිපත් කරන්නට ඕනෑ. අද මේ අවස්ථාව මුළු ලෝකයම බරපතළ අර්බුදයකට ලක් වෙලා තිබෙන අවස්ථාවක්. පසුගිය ආණ්ඩු කාලයේ තමුන්නාන්සේලා ගෙනාපු යෝජනා අපට ඉතා හොඳින් මතකයි. විශේෂයෙන්ම වොක්ස් වැගන් කර්මාන්තශාලාව ආරම්භ කරනවා කියලා, කුලියාපිටිය ආසනයේ සශ්‍රීක පොල්වතු අක්කර 85ක් සම්පූර්ණයෙන් විනාශ කළා. ඒ පොල් ගස්වලට වෙච්ච දෙයක් නැහැ. අද වන තුරු ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් නැහැ. අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ සම්බන්ධව පරීක්ෂණයක් ආරම්භ කරන්න කියලා. එය මහා භාරකාර දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක්. Trust එකකට තමයි අයිතිය තිබුණේ. මම හිතන්නේ, ඒ වාගේ සශ්‍රීක වත්තක් පවාර ගැනීම සම්බන්ධ බරපතළ අර්බුදයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොරු කරපු, ප්‍රෝඩාකාරි ආණ්ඩුවක් තමයි පසුගිය යහ පාලන ආණ්ඩුව. එදා විවිධ පුද්ගලයන් හිරේ දැම්මා. රාජපක්ෂ පවුලට විවිධ අඩන්තේට්ටම් කළා. යහ පාලන ආණ්ඩුව නිසා අපිත් සිරගත වූ අය බව මා ගරු සභාවට ප්‍රකාශ කරන්න අවශ්‍යයි. "කන්න දුන්නා" කියලා අප හිරේට දැම්මා. ඒ වාගේ කැත පාලනයක් තමයි යහ පාලන ආණ්ඩුව ගෙන ගියේ කියන එක මා මතක් කරන්න ඕනෑ.

මේ වැඩ බැරි විපක්ෂයක්. වැඩ බැරි විපක්ෂයේ බොහෝ දෙනෙකුට අමතක වෙලා තිබෙනවා මේ අය වැය ඉදිරිපත් කරන්නේ, වසංගත තත්ත්වයක් එක්ක කියලා. කොවිඩ්-19 වසංගතයේ පළමු රැල්ල ගරු ජනාධිපතිතුමා ඉතා දක්ෂ ආකාරයෙන් කළමනාකරණය කළ බව මා මතක් කරන්න ඕනෑ. සෞඛ්‍ය අංශවල සහ ත්‍රිවිධ හමුදාවේ සහයෝගය ලබාගෙන එතුමා ඉතා දක්ෂව එය කළමනාකරණය කළා. මේ වනකොට කොවිඩ්-19 දෙවැනි රැල්ල නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා අද විශාල අභියෝගයකට අපි මුහුණ දීලා තිබෙනවා. වර්තමාන රජය ඒ අභියෝගයත් භාරගෙන, ඒකට අවශ්‍ය සැලසුම් සකස් කරමින් තමයි අද මේ අය වැය ඉදිරිපත් කරන්නට දායකත්වය ලබා දීලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ අවස්ථාවේ විශේෂ කාරණයක් මතක් කරනවා. ඒ තමයි, ඉන්දියාවේ මහ ඇමතිවරයෙක් හිටියා රෙඩ්ඩි කියලා. මීට අවුරුදු 13කට කලින් එතුමා ගුවන් අනතුරකින් මිය ගියා. එතුමා මිය ගිය අවස්ථාවේ එම ප්‍රාන්තයේ හිටපු 14දෙනෙක් සිය දිවි නසා ගත්තා.

පරිගණක තාක්ෂණය අපට ආවේ 1981 වර්ෂයේ. අල්ලපු රට වන ඉන්දියාවට ආවේ 1984 වර්ෂයේ. හැබැයි, අද අපි පරිගණක තාක්ෂණය අතින් කොතැනද ඉන්නේ කියලා දෙවරක් විමසා බැලිය යුතු වනවා. අද තාක්ෂණයට මුල් තැන දෙමින් අපේ අග්‍රාමාත්‍යතුමා තාක්ෂණික උද්‍යාන ආරම්භ කරන්නට රුපියල් මිලියන 10,000ක් වෙන් කර තිබෙනවා. ඒක පැසසුමකට ලක් කළ යුතු කාරණයක්.

ඒ වාගේම අද හැම වෙලාවේම චෝදනා කරනවා, ජනාධිපතිතුමා ෆේල්, ජනාධිපතිතුමා ෆේල් කියලා. එතුමා ෆේල් ද කියලා අපි පෙන්නන්ට ඕනෑ. විශේෂයෙන්ම වැට් බද්ද, අපි සියයට 15 සිට සියයට 8 දක්වා අඩු කරලා තිබෙනවා. NBT බද්ද අහෝසි කරලා තිබෙනවා. ආර්ථික සේවා බද්ද අහෝසි කරලා තිබෙනවා. මේ වාගේ විශාල සහන රැසක් මේ රටේ ජනතාවට අත් වුණේ මේ ආණ්ඩුව බලයට පත් වීමත් සමඟයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් එක කාරණයක් කියනවා. ඉස්සර රජ මාළිගාවල හිටියා සට්ටන්රාළ කියලා කෙනෙක්. ඔහුගේ ප්‍රධාන කාර්යය තමයි, රජතුමා වැසිකිළියට ගිහිල්ලා ආවාට පස්සේ ඒ වැඩේ හරියට කරලා තිබෙනවාද කියලා, සට්ටන් දෙක ලෙව කාලා බලන එක. අද විශේෂයෙන්ම විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයට වෙන්නේ, එදා අර සට්ටන්රාළ කරපු ඒ කාර්යය කරන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සු. නෝගරාදලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක් තිබෙනවා.

[පි.ව. 4.55]

**ගරු සු. නෝගරාදලිංගම් මහතා**
(மாண்புமிகு சு. நோகராதலிங்கம்)
(The Hon. S. Noharathalingam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டினுடைய 75ஆவதும் இந்தப் புதிய அரசாங்கத்தினுடைய இரண்டாவதுமான வரவு செலவுத்திட்ட விவாதத்திலே நாம் கலந்துகொண்டிருக்கின்றோம். இந்த வரவு செலவுத்திட்டம் தோல்வியடையப்போகின்ற ஒரு வரவு செலவுத்திட்டமென பெரும்பான்மையான எதிர்க்கட்சி உறுப்பினர்கள் கூறுகின்றார்கள். அதிமேதகு ஜனாதிபதி அவர்கள் அடிக்கடி, மூச்சுக்கொரு தடவை தான் பௌத்த சிங்கள வாக்குகளால் ஜனாதிபதியாகியதையும் அவர்களை முன்னுரிமைப்படுத்தி, அவர்களுக்குச் சேவை செய்வதற்கும் அவர்களுக்காக உழைப்பதற்கும் தயாராக இருப்பதாகவும் அவர் சொல்லிக் கொண்டிருக்கின்றார். அவருடைய அந்தக் கொள்கைக்கிணங்க பௌத்த அலுவல்கள் திணைக்களத்துக்கு 153 கோடியே 80 இலட்சம் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்ற

[ගරු සු. නෝගරාදලිංගම් මහතා]

வேளையிலே, யானைப் பசிக்குச் சோளப்பொரி போடுவதுபோல் இந்து சமய மற்றும் பண்பாட்டலுவல்கள் திணைக்களத்துக்கு 31 கோடியே 80 இலட்சம் ரூபாயும் கிறிஸ்தவ சமய அலுவல்கள் திணைக்களத்துக்கு 27 கோடியே 90 இலட்சம் ரூபாயும் முஸ்லிம் சமய பண்பாட்டு அலுவல்கள் திணைக்களத்துக்கு 19 கோடியே 60 இலட்சம் ரூபாயும் ஒதுக்கீடு செய்யப்பட்டு, மிகவும் ஒரு பாரபட்சமான ஆட்சிமுறையைச் சான்றுகளோடு நிரூபித்துக் கொண்டிருக்கின்ற ஒரு வரவு செலவுத்திட்டமாகத்தான் நாங்கள் இதைப் பார்க்கின்றோம்.

இந்தச் சபையிலே மூன்றிலிரண்டு பெரும்பான்மையைப் பெற்று நிறைவேற்றதிகாரங்கள் அனைத்தையும் தன்னகத்தே கொண்டு இந்த நாட்டை ஆட்சி செய்வதற்குத் துணைபுரிந்த சிங்கள, தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்களையும் வைத்துக்கொண்டு, முதுகெலும்பில்லாத அந்தப் பாராளுமன்ற உறுப்பினர்களோடு அதிமேதகு ஜனாதிபதி அவர்கள் ஆட்சி செய்துகொண்டிருக்கின்றார். அதாவது. அவர்களுடைய தயவிலே மூன்றிலிரண்டு பெரும்பான்மையைப் பெற்றதன் மூலம் நிறைவேற்றதிகாரம்கொண்ட - அதியுச்ச அதிகாரங்களைக்கொண்ட ஒரு நாட்டினுடைய தலைவராக இருந்துகொண்டு ஜனாதிபதி அவர்கள் ஆட்சி செய்துகொண்டிருக்கின்றார். அதிகாரங்கள் குவிக்கப்படுவதற்குக் காரணமாகவிருந்தவர்கள் மௌனிகளாக்கப்பட்டுள்ளனர். குறிப்பாக, அங்கஜன் இராமநாதன், வியாழேந்திரன், காதர் மஸ்தான், நஸீர் அஹமட் போன்றவர்கள் வெட்கமில்லாமல் இந்த ஆட்சிக்கு ஒத்தாசை வழங்கிக்கொண்டிருக்கின்ற பரிதாபகரமான நிலையை எண்ணி நாங்கள் வருத்தப்படுகின்றோம். எங்களுடைய இந்த நாட்டிலே குறிப்பாக வடக்கு, கிழக்குப் பிரதேசம் யுத்தத்தினால் மிக மோசமாகப் பாதிக்கப்பட்ட பிரதேசமாகும்.

**ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

கௌரவ பாராளுமன்ற உறுப்பினர் கூறுகின்ற கருத்துக்கு நான் பதிலளிக்க விரும்புகின்றேன். எம்மைப் பொறுத்தளவுக்கு நாம் அரசாங்கத்தோடு இணைந்து எமது மக்களுக்குச் செய்யவேண்டிய, எமது மக்கள் மத்தியிலே குவிந்து காணப்படுகின்ற மலை போன்ற பிரச்சினைகளைத் தீர்க்கின்ற வேலைத்திட்டங் களைத்தான் நாங்கள் செய்துகொண்டிருக்கின்றோம். ஆகவே, இந்த இடத்திலே இவ்வாறான கருத்துக்களைக் கௌரவ பாராளுமன்ற உறுப்பினர் முறையற்ற விதத்திலே பதிவிடுவதை நான் எதிர்க்கின்றேன். அதனை அவர் திருத்திக்கொள்ள வேண்டும் என்று நான் இந்த இடத்திலே பணிவாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු සු. නෝගරාදලිංගම් මහතා**
(மாண்புமிகு சு. நோகராதலிங்கம்)
(The Hon. S. Noharathalingam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டிலே சாதாரணமாக நடந்துகொண்டிருக்கின்ற விடயங்களைத்தான் இங்கே நான் குறிப்பிட்டிருக்கின்றேன். நேற்று முன்தினம்கூட அதிமேதகு ஜனாதிபதி அவர்களினால் அதிவிசேட வர்த்தமானி அறிவித்தலொன்று வெளியிடப்பட்டிருக்கின்றது. எதிர்வரும் 22ஆம் திகதியிலிருந்து இந்த நாட்டிலே சமாதானத்தைப் பேணுவதற்காக, அமைதியை நிலைநாட்டுவதற்காக முப்படையினருக்கும் அதிகாரங்கள் வழங்கப்படுவதாக அந்த அதிவிசேட வர்த்தமானியில் சொல்லப்பட்டிருக்கின்றது. அமைதி, சமாதானம் என்பன இங்கே இல்லையா? எங்கே யுத்தம் நடைபெறுகின்றது? வடக்கு, கிழக்கிலே ஆயுத யுத்தம் நடைபெறுகின்றதா? அல்லது இந்த நாட்டிலே அகிம்சைவழி யுத்தம் நடைபெறுகின்றதா? எதற்காக, அமைதியை நிலைநாட்டுவதற்கென இந்த அதிவிசேட வர்த்தமானி வெளியிடப்பட்டிருக்கின்றது என்பதை நான் இங்கே கேட்க விரும்புகின்றேன்.

வரவு செலவுத் திட்ட விவாதமாக இருக்கலாம்! ஏனைய விவாதங்களாக இருக்கலாம்! இங்குதான் யுத்தம் நடக்கின்றது. இங்கேதான் படையினர் குவிக்கப்பட்டிருக்க வேண்டும். சமாதானத்தை விரும்புகின்ற எங்களுடைய மக்கள் ஓரளவுக்கேனும் இந்த மண்ணிலே அமைதியாக இருக்கின்ற இச்சந்தர்ப்பத்தில், இந்த நாட்டிலே யுத்தத்தை முடிவுக்குக் கொண்டுவந்தவர்களால் இந்த விசேட வர்த்தமானி அறிவித்தல் வெளியிடப்பட்டிருக்கின்றது. உயிர்த் தியாகம் செய்த எங்களுடைய போராளிகளுக்கு அஞ்சலி செலுத்துவதைத் தடுப்பதற்காக, பொலிஸார் நீதிமன்றத்தினூடாகத் தடையுத்தரவு பெறுவதற்காக இது வெளியிடப்பட்டிருக்கின்றது. நாளை மறுதினத்திலிருந்து முப்படையினரைப் பாவித்து எங்களுடைய மக்களை ஓர் அடக்கு முறைக்குள் கொண்டுவருவதற்கு அரசாங்கம் முயற்சிக்கின்றது என்றே நாங்கள் நம்புகின்றோம் என்றுகூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன்.

*එකල්හි වේලාව අ.භා. **5.00** වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.*
*එතැන් සිට විවාදය **2020** නොවැම්බර් මස **21**වන සෙනසුරාදා පවත්වනු ලැබේ.*

*அப்பொழுது பி. ப. 5.00 மணியாகிவிடவே அலுவல்கள் இடைநிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*விவாதம், 2020 நவம்பர் 21, சனிக்கிழமை மீளத் தொடங்கும்.*

*It being 5.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.*
*Debate to be resumed on Saturday, 21st November, 2020.*

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

## කල්මුණේ උතුර දෙමළ උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස උසස් කිරීම

## கல்முனை வடக்குத் தமிழ் உப பிரதேச செயலகத்தை பிரதேச செயலகமாகத் தரமுயர்த்தல்

## UPGRADING OF KALMUNAI NORTH TAMIL SUB-DIVISIONAL SECRETARIAT TO A DIVISIONAL SECRETARIAT

[பி.ப. 5.02]

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி.

" அம்பாறை மாவட்டத்தில் கல்முனை வடக்குத் தமிழ் உப பிரதேச செயலகம் 1989ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்டது. 1993ஆம் ஆண்டு ஜுலை மாதம் 28ஆம் திகதி, 28 உப பிரதேச செயலகங்களை முழுமையான பிரதேச செயலகங்களாகத் தரமுயர்த்துவதற்கு அமைச்சரவை அனுமதி வழங்கியது. இதில் கல்முனை வடக்குத் தமிழ் பிரதேச செயலகமும் ஒன்றாகும். இவற்றில் 27 உப பிரதேச செயலகங்கள் முழுமையான பிரதேச செயலகங்களாகத் தரமுயர்த்தப்பட்டபோதிலும் இன்றுவரை கல்முனை வடக்குத் தமிழ் பிரதேச செயலகம் முழுமையான பிரதேச செயலகமாகத் தரமுயர்த்தப்படவில்லை. 29 கிராம அலுவலர் பிரிவுகளை உள்ளடக்கிய இவ்வுப பிரதேச செயலகத்தில் இலங்கை நிர்வாக சேவை தரம்-1 நிலை கொண்ட பிரதேச செயலாளரும் சுமார் 215 அரச பணியாளர்களும் கடமையாற்றுகின்றபோதிலும், இன்றுவரை அதற்கு நிதி அதிகாரமும், காணி அதிகாரமும் வழங்கப் படவில்லை. கடந்த அரசாங்கத்தினால் உறுதிமொழி வழங்கப்பட்டும் அது நடைமுறைப்படுத்தப்படவில்லை. மேதகு சனாதிபதி அவர்கள், "ஒரே நாடு, ஒரே சட்டம்" என்ற கொள்கையைப் பிரகடனப்படுத்திய நிலையில், கல்முனை வடக்குத் தமிழ் உப பிரதேச செயலகத்தை நிதி மற்றும் காணி அதிகாரங்களுடன் கூடிய ஒரு முழுமையான பிரதேச செயலகமாகத் தரமுயர்த்தித் தரவேண்டும்"

என்ற பிரேரணையை நான் முன்வைக்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, கல்முனை வடக்குத் தமிழ் உப பிரதேச செயலகத்துக்கு வழங்கப்படவேண்டிய நிதி அதிகாரமும் காணி அதிகாரமும் 1993ஆம் ஆண்டிலிருந்து ஒருசில அரசியல்வாதிகளினுடைய அழுத்தத்தின்பேரில் தொடர்ச்சியாக மாறி மாறி ஆட்சிக்கு வருகின்ற அரசாங்கங் களால் தடுத்து நிறுத்தப்பட்டுக்கொண்டு வருகின்றன. எனவே, அதனை முழுமையான ஒரு பிரதேச செயலகமாகத் தரம் உயர்த்தித் தரவேண்டுமென்று எங்களுடைய கட்சியான தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பில் நான் இந்த நேரத்தில் கேட்டு நிற்கின்றேன்.

குறிப்பாக, 2019ஆம் ஆண்டு சனாதிபதித் தேர்தலின் போது, தற்போதைய பிரதமர் மஹிந்த ராஜபக்ஷ அவர்களும் அமைச்சர் நாமல் ராஜபக்ஷ அவர்களும் அந்தப் பிரதேசத்துக்குச் சென்று, தாங்கள் ஆட்சிக்கு வந்தால், கல்முனை வடக்குத் தமிழ் உப பிரதேச செயலகத்தை முழுமையான பிரதேச செயலகமாகத் தரமுயர்த்தித் தருவதாக வாக்குறுதி வழங்கியிருந்தார்கள். தற்போது அரசாங்கத்தில் பொறுப்புவாய்ந்த பதவிகளில் உள்ளவர்களினால்தான் இந்த உறுதிமொழி வழங்கப்பட்டது.

கிழக்கு மாகாணத்தின் மட்டக்களப்பு மாவட்டத்திலிருந்து இரண்டு தமிழ் உறுப்பினர்கள் பாராளுமன்றத்துக்கு வந்திருக்கிறார்கள். அம்பாறை மாவட்டத்திலிருந்து ஒரு தமிழ் உறுப்பினர்கூட பாராளுமன்றத்துக்கு வர முடியாத சூழ்நிலை ஏற்பட்டதற்கு அங்கு போட்டியிட்ட தமிழ் வேட்பாளர்களே காரணமாகும். 'கருணா' என்கின்ற விநாயகமூர்த்தி அவர்கள், "இந்தப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்தித் தருவேன்; ஆகவே, எனக்கு வாக்களியுங்கள்" என்று கூறி, அங்கு தேவையில்லாமல் போட்டியிட்டடு, அந்த மக்களுடைய வாக்குகளைப் பிரித்து, கடைசியில் அம்பாறை மாவட்டத்துக்கு ஒரு தமிழ் பாராளுமன்ற உறுப்பினர்கூட வரமுடியாத சூழ்நிலையை உருவாக்கியிருந்தார்.கிழக்கு மாகாணத்திலும் சரி; வட மாகாணத்திலும் சரி! இப்படியான பிரச்சினைகளை அரசாங்கம் தீர்த்து வைக்கும் என்ற ஒரு நம்பிக்கையில்தான் தமிழ் மக்கள் உங்களுக்கு வாக்களித்தார்கள்.

கௌரவ அமைச்சர் அவர்களே, நேர்மையான முறையில் இதற்குச் சரியானதொரு பதிலை நீங்கள் தரவேண்டும். இந்த விடயத்தைக் கட்சிரீதியாகப் பார்க்க வேண்டாம்! ஆளும்கட்சி, எதிர்க்கட்சி என்று பார்க்க வேண்டாம்! 1993ஆம் ஆண்டிலிருந்து இன்றுவரை தொடர்ச்சியாக அந்தப் பிரதேச மக்களை அடக்கிக்கொண்டிருக்கின்ற ஒரு சில அரசியல் வாதிகளிடமிருந்து அந்த மக்களையும் அந்தப் பிரதேசத்தையும் காப்பாற்றித் தருமாறு உங்களைக் கேட்டுக்கொள்கின்றேன். நன்றி.

[பி.ப. 5.07]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු තවරාජා කලෛයි අරසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු තවරාජා කලෛයි අරසන් මහතා**
(மாண்புமிகு தவராஜா கலை அரசன்)
(The Hon. Thavaraja Kalai Arasan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் சாள்ஸ் நிர்மலநாதன் அவர்களால் கொண்டுவரப்பட்ட ஒத்திவைப்புவேளைப் பிரேரணையை நான் வழிமொழிகின்றேன். கல்முனை வடக்கு உப பிரதேச செயலகமென்பது கிட்டத்தட்ட 30 வருடங்களாக 215 உத்தியோகத்தர்களைக் கொண்டு இயங்கிவருகின்ற உப பிரதேச செயலகமாக இருக்கின்ற அதேவேளை, இதனோடு ஆரம்பிக்கப்பட்ட ஏனைய பிரதேச செயலகங்களெல்லாம் தற்பொழுது அதிகாரமுள்ள பிரதேச செயலகங்களாகச் செயற்பட்டுக்கொண்டிருக்கின்றன. ஆனால், இற்றைவரைக் குமாகத் தரமுயர்த்தப்படாமல் இயங்குகின்ற ஒரேயொரு உப பிரதேச செயலகம் இதுவாகும். இது தமிழ் மக்களும், முஸ்லிம் மக்களும் நிறைந்து வாழுகின்ற ஒரு பிரதேசமாகும். இந்தப் பிரதேசங்களை மையமாக வைத்து, 2001ஆம் ஆண்டிலே சாய்ந்தமருதுப் பிரதேச செயலகம் உருவாக்கப்பட்டிருக் கின்றது. ஆனால், தமிழ் மக்கள் தங்களுடைய கருமங்களைச் செவ்வனே செய்யவேண்டுமென்பதற்காகப் பல காலமாகப் போராடிக் கிடைக்கப்பெற்ற இந்தக் கல்முனை வடக்கு உப பிரதேச செயலகமானது, அரசியல்வாதிகளின் கூடுதலான தலையீடு காரணமாக இற்றைவரைக்கும் தரமுயர்த்தப்படாமல் இருப்பதுதான் மனவேதனைக்குரிய ஒரு விடயமாகவிருக் கின்றது. அதனைத் தரமுயர்த்துகின்ற விடயத்திலே, அரசியல் வாதிகள் பல வாக்குறுதிகளை வழங்கியிருக்கின்றார்கள்.

[ගරු තවරාජා කලෛයි අරසන් මහතා]

அவ்வாறு வாக்குறுதிகள் வழங்கப்பட்டும், இற்றைவரைக்கும் அது பிரதேச செயலகமாகத் தரமுயர்த்தப் படாமல் இருப்பதை, அந்தப் பிரதேச மக்களை இன்னொரு மாற்றுச் சமூகம் அடக்கியாளவேண்டுமென்ற அடிப்படையில் செயற்படுகின்ற ஒரு விடயமாகவே அங்குள்ள தமிழ் மக்கள் பார்க்கின்றனர். இந்த இலங்கைத் திருநாட்டிலே அவ்வாறு இன்னல்களுக்கு முகங்கொடுக்கின்ற ஓர் இனம் வாழுகின்ற ஓரிடமாக கல்முனை வடக்கு தமிழ் உப பிரதேச செயலகப் பிரிவுதான் இருக்கின்றதென்று நிச்சயமாக, நான் நினைக்கின்றேன். ஆகவே, இந்த உயரிய சபையினூடாக இந்த உப பிரதேச செயலகத்தைத் தரமுயர்த்தி அந்த மக்களும் இந்த அரசினால் வழங்கப்படுகின்ற சகல பலாபலன்களையும் அனுபவிக்கக்கூடிய வகையிலே, ஏற்பாடுகளைச் செய்துகொடுக்க வேண்டும். குறிப்பாக, பல புதிய பிரதேச செயலகங்கள் உருவாக்கப்பட்டிருக்கின்றன. புதிய பிரதேச சபைகள் உருவாக்கப்பட்டிருக்கின்றன. கல்முனையில் வாழுகின்ற தமிழ் மக்களுக்கு மாத்திரம் இவ்வாறு ஏன் அநீதி இழைக்கப்படுகின்றதென்பதை நான் இந்த உயரிய சபையிலே கேள்வியாகத் தொடுக்க விரும்புகின்றேன்.

கடந்த தேர்தலின்போதுகூட, தற்போது பிரதமராகவிருக் கின்ற மஹிந்த ராஜபக்ஷ அவர்கள், "எங்களுக்கு வாக்களியுங்கள்! அந்த உப பிரதேச செயலகத்தைத் தரமுயர்த்தித் தருகின்றேன்" என்று அங்கு நேரடியாகச் சென்று அந்த மக்களிடம் கூறியிருந்தார். நாங்கள் ஒவ்வொரு முறையும் நடைபெறுகின்ற தேர்தலிலே அம்பாறை மாவட்டத்திலே ஒரு பிரதிநிதித்துவத்தைப் பெற்று வந்திருக்கின்றோம். ஆனால், இம்முறை அந்த மாவட்டத்தில் நாங்கள் ஒரு பிரதிநிதியை இழந் திருக்கின்றோம். ஏனென்றால், நீண்டகாலமாக எங்களுடைய மக்களை ஏமாற்றியதன் விளைவாக, அந்த மக்கள் எங்களுக்கெதிராகத் திகழக்கூடிய ஒரு சூழல் உருவாகியது.

கல்முனை வடக்குப் பிரதேசத்திலே தமிழ், முஸ்லிம், சிங்கள மக்களென மூவின மக்களும் வாழ்கின்றார்கள். இரண்டு பிரதேச செயலகங்கள் தனியே முஸ்லிம் மக்களுக்காகப் பிரித்துக் கொடுக்கப்பட்டிருக்கின்றன. எனவே, எந்த விதமான பாகுபாடும் காட்டாது அந்த உப பிரதேச செயலகத்தைத் தரமுயர்த்திக் கொடுக்கவேண்டியது இந்த அரசின் பொறுப்பாக இருந்துகொண்டிருக்கின்றது. அந்த மக்களின் அன்றாட நடவடிக்கைகளைச் சீராக முன்னெடுப்பதற்கு உதவி செய்யவேண்டும். குறிப்பாக, இந்த நாட்டிலே கூடுதலான அதிகாரங்கள் செலுத்தப்படுகின்ற ஓர் இடமாக இந்த கல்முனைத் தமிழ்ப் பிரதேசம் இருந்து கொண்டிருக்கின்றது. அங்கே எங்களுடைய மக்கள் சொல்லமுடியாத துன்பங்களை அனுபவித்துக்கொண்டிருக்கிறார்கள். அங்கிருக்கின்ற சமூகங் களை நான் இனரீதியாகப் பார்க்கவில்லை. குறிப்பாக, 2015ஆம் ஆண்டு அங்கே வர்த்தக சந்தையொன்றையும் மைதானமொன்றையும் நூல்நிலையமொன்றையும் உருவாக் குவதற்கென தமிழ் மக்களுடைய கிட்டத்தட்ட 500 ஏக்கர் காணிகளை நகரத் திட்டமிடல் அமைச்சினூடாக அரச உடைமையாக்குவதற்கான முயற்சிகள் மேற்கொள்ளப்பட்டன. அந்த மக்கள் கிளர்ந்தெழுந்து அதற்கெதிரா ஆர்ப்பாட்டங்களை நடத்தியிருந்தார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up. Please wind up.

**ගරු තවරාජා කලෛයි අරසන් මහතා**
(மாண்புமிகு தவராஜா கலை அரசன்)
(The Hon. Thavaraja Kalai Arasan)
அந்தப் பிரதேசத்திலிருக்கின்ற மக்களின் காணிகளை இவ்வாறு அரச உடைமையாக்குவதற்கு எடுக்கப்பட்ட தீர்மானமானது முஸ்லிம் அரசியல்வாதிகளால் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you. The next speaker is the Hon. Rauff Hakeem. You have four minutes.

[பி.ப. 5.13]

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ சாள்ஸ் நிர்மலநாதன் அவர்கள் முன்மொழிந்து, நண்பர் கலை அரசன் அவர்கள் வழிமொழிந்திருக்கின்ற இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணை தொடர்பாக ஒருசில விடயங்களைக் கூற விரும்புகின்றேன். உண்மையில், யதார்த்தபூர்வமான சில பரஸ்பர பிரச்சினைகள் இருக்கின்றன என்பதை நாங்கள் இங்கு அடையாளம் காணவேண்டும். இந்த கல்முனை வடக்கு உப பிரதேச செயலகத்தைத் தரமுயர்த் துகின்ற விவகாரம் அரசியல்வாதிகளின் தலையீட்டின் காரணமாகத் தடைப்பட்டிருக்கின்றது என்று சொல்வதை விடவும், அதிலேயிருக்கின்ற எல்லைப் பிரச்சினைக்கான சரியான, சுமுகமான தீர்வைக் காண்பதற்கான முயற்சியில் பலவருடங்களாக நாங்கள் தமிழ்த் தேசியக் கூட்டமைப் பினரோடு சிநேகபூர்வமாகப் பேச்சுவார்த்தை நடத்தி வந்திருக்கின்றோம். இரண்டு இனங்களும் - இரண்டு தமிழ் பேசும் சமூகமும் ஒற்றுமையாக இந்தப் பிரச்சினைக்குத் தீர்வு காணவேண்டுமென்ற முயற்சியை மிகத் தீவிரமாக முன்னெடுத்து வந்திருக்கின்றோம்.

கடந்த ஆட்சிக் காலத்தின் இறுதிக் கட்டத்தில் முன்னாள் அமைச்சர் வஜிர அபேவர்தன அவர்களுடைய தலைமையில் தமிழ்த் தேசியக் கூட்டமைப்பினரும் நாங்களும் சேர்ந்து இதுசம்பந்தமாகப் பல பேச்சுவார்த்தைகளை நடத்தியிருந் தோம். ஈற்றிலே அதற்கென ஓர் அமைச்சரவைப் பத்திரத்தின்மூலம் எல்லை நிர்ணயக் குழு உருவாக்கப்பட்டது. என்னைப் பொறுத்தமட்டில், இந்த எல்லைப் பிரச்சினைகள் சம்பந்தமாக மிகச் சுருக்கமாகச் சொல்ல வேண்டும். கல்முனை வடக்கு தமிழ் உப பிரதேச செயலகப் பிரிவிலும் முஸ்லிம்களுக்கான கல்முனைப் பிரதேச செயலகப் பிரிவிலும் சம அளவாக 29 கிராமசேவகர் பிரிவுகள் இருக்கின்றன. இந்த இரண்டு பிரிவுகளிலுமுள்ள நிலத்தை எடுத்துக்கொண்டால், 70 சதவீதமாக இருக்கின்ற முஸ்லிம்களுக்கு வெறுமனே 29 கிராமசேவகர் பிரிவுகள்தான் இருக்கின்றன. இந்த விவகாரத்தோடு, முக்கியமான எல்லைப் பிரச்சினைகள் குறித்த சிக்கல்களையும் நாங்கள் மிகத் தீவிரமாக ஆராந்து இதற்குச் சுமுகமான ஒரு முடிவைக் காண வேண்டும். குறிப்பாக, இரண்டு தமிழ் பேசும் சமூகங்களுக்கிடையிலே இதைவிடவும் பரந்துபட்ட முறையில் உடன்பாடுகள் காணப்பட வேண்டும்.

நிருவாகரீதியியாக வடக்கு, கிழக்கிலே பல இடங்களில் இந்தப் பிரச்சினை இருந்துகொண்டிருக்கின்றது. குறிப்பாக, மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக்கொண்டால்,

கோரளைப்பற்று மத்தி பிரதேச செயலகப் பிரிவில் 8 கிராமசேவகர் பிரிவுகள் இருக்கின்ற நிலையிலும் இன்னும் அதனுடைய எல்லைகள் சரிவர நிர்ணயிக்கப்படாத ஒரு துர்ப்பாக்கியமான நிலைமை இருந்துகொண்டிருக்கின்றது. எனவே, மட்டக்களப்பு மாவட்டத்தில் கோரளைப்பற்று மத்தி பிரதேச செயலகம் சம்பந்தமான விவகாரத்திலும் அந்தப் பிரச்சினையிருக்கின்றது.

இன்று வடக்கு, கிழக்கில் மாத்திரம்தான் இனரீதியான வகையில் பிரதேச செயலகங்களைப் பிரித்து ஆளுகின்ற ஒரு நடைமுறை இருக்கின்றது. கொள்கைரீதியாக அரசாங்கம் இவ்வாறான ஒரு முடிவுக்கு வந்திருக்கிறதா? என்ற பிரச்சினையை நாங்கள் சீர்தூக்கிப் பார்க்கவேண்டிய அவசியமும் இருக்கிறது. இந்த அடிப்படையில்தான் இரண்டு தமிழ் பேசும் இனங்களாக இருக்கின்ற தமிழர்களும் முஸ்லிம்களும் ஒற்றுமையாக இந்த எல்லைப் பிரச்சினை சம்பந்தமான விவகாரத்தில் ஒரு தீர்க்கமான முடிவுக்கு வருவதன் நிமித்தமாக நாங்கள் பல பேச்சுவார்த்தைகளை நடத்தியிருக்கின்றோம். அந்த வகையில், எல்லை நிர்ணயக் குழு உருவாக்கப்பட்டிருக்கின்றது. இதுசம்பந்தமாக பொதுநிர் வாக, உள்நாட்டலுவல்கள் அமைச்சின் எல்லை நிர்ணயக் குழுவின் அறிக்கை வெளிவந்ததன் பிற்பாடு பேச்சுவார்த்தையின்மூலம் தமிழ் தேசியக் கூட்டமைப்பும் முஸ்லிம் காங்கிரஸும் ஏனைய கட்சிகளும் சேர்ந்து சுமுகமான ஒரு முடிவுக்கு வருவதுதான் சாலச்சிறந்தது. இதைவிடுத்து, இந்தச் சாய்ந்தமருதுப் பிரதேச சபையைத் தரமுயர்த்தித் தவறுவதாகக் கூறி, அதனூடாக ஏற்பட்ட பல விபரீதங்களின் பிற்பாடு அந்த விசயமும் கைவிடப்பட்டிருக்கின்ற ஒரு நிலையில், அதற்கும் இதற்கும் முடிச்சுப்போட்டு இதன்மூலமாக அரசியல் குளிர்காய நினைத்த சக்திகளும் இன்று விரக்தியடைந்துபோயிருக்கின்ற நிலையில் இந்தப் பிரச்சினையை இன்னும் நீடித்துக்கொண்டு போகாமல் ஒரு தீர்வுக்குக்கு வரவேண்டியது அவசியம் என்பதையும் நான் இங்கு வலியுறுத்தி அமர விரும்புகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have two minutes.

[பி.ப. 5.17]

**ගරු සාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த இடத்தில் முன்னாள் அமைச்சர் அவர்களுக்குப் பிறகு பேசக்கிடைத்தமையையிட்டுச் சந்தோசம் அடைகின்றேன். கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களே, இரண்டினங்களுக்குள்ளும் நாங்கள் நல்லிணக்கத்தைப் பேணவேண்டும். வடக்கு, கிழக்கு தமிழ் பேசும் மக்களின் தாயகம் என்ற அடிப்படையில் நாங்கள் சில இடங்களில் சில விட்டுக்கொடுப்புக்களைச் செய்யத்தான் வேண்டும். அந்த அடிப்படையில், நீங்கள் இந்த விடயத்தில் இதைவிடக் கூடியளவு கவனத்தை எடுத்து இதனைத் தீர்ப்பதற்கு உதவவேண்டும். இரண்டினங்களுக்குமிடையில் நல்லிணக்கம் ஏற்பட வேண்டும் என்ற அடிப்படையில் நாங்கள் கடந்த காலத்திலே அதிக விடயங்களில் நாங்கள் ஒன்றாகச் செயற்பட்டிருக்கின்றோம். அந்தவகையில், நீங்கள் இந்த விடயத்துக்குத் தடையாக இருக்காவிட்டால் நல்லது என்ற விடயத்தைச் சொல்ல விரும்புகின்றேன்.

Hon. Minister, as you are due to respond to this question, I would like to say that the issue of the Kalmunai North Tamil Sub-divisional Secretariat is not even an issue. Cabinet approval was granted on the 28th of July, 1993 for that Sub-divisional Secretariat to be upgraded. So, there is no issue at all. This has been put on hold for various reasons which are unknown to us. They could be political reasons. There is actually nothing to be done. It is almost a DS office; land powers are also there. We just need to send an accountant to that office. A cadre has also been created. Only an accountant has not been sent there. That is the only issue. I do not even understand why they are talking about it in 2020, after nearly 27 years. The Hon. Athaullah is speaking to you, Hon. Minister, but I hope that you would pay attention to me because I am trying to get your attention. Please give me a minute, Hon. Athaullah.

So, the Cabinet decision was taken in 1993. Therefore, there is no issue as to why we cannot have an accountant. There are 29 divisions. Presently, to make payments, they have to fill out all the vouchers and send those to another Divisional Secretariat, which is situated within one kilometre. So, all the paper work is done by the Sub-divisional Secretariat and sent to the Divisional Secretariat. Then, the accountant at that Divisional Secretariat signs it and sends it back. "பிச்சைச் சம்பளம்" is what they call in Tamil - I do not know what it is called in English - for the basic payment that is made to the people. I think it is Rs. 500 or Rs. 1,000. That is the only payment that is being made by that Sub-divisional Secretariat. So, what is the issue in making this a Divisional Secretariat?

During the last Presidential Election, Mr. Basil Rajapaksa, soon to be "Hon. Basil Rajapaksa", came to Kalmunai and said that if they win the Presidential Election and their Government comes to office, they will do it within one month. The Hon. S. Viyalanderan was there and he did a protest. Mr. Basil Rajapaksa came there with the Ven. Gnanasara Thero and they promised that this would be done. Mr. Karuna Amman contested the Parliamentary Election from the Ampara District citing these reasons, that if Mr. Gotabaya Rajapaksa is elected, it would be done in a day. Today, what is happening? We are sitting and debating about a Cabinet decision that had been made. The Cabinet decision had already been made and we just need to implement it. There is a cadre for it with an accountant. So, why can it not be done? Are you going to keep falling into this trap?

I really wish the Hon. Rauff Hakeem would support this idea because we need to live together in the North and East of this country. How can we live together if this little issue cannot be resolved? Please do not bring politics into this. I know the Hon. H.M.M. Harees has been opposing this decision. That is his own politics; that is his own Electorate and that is his district. As the Leader of the Sri Lanka Muslim Congress, you just mentioned, "We need to work together with the TNA". So, why can you not allow this? The people who live in that area need justice. Why can you not be fair by them? We are not asking for a new Divisional Secretariat.

There are so many issues that we face. There is an educational zone.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

ගරු සාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මඩකළපුව දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාපයක් තිබෙනවා, ඉඩම් සම්බන්ධයක් නැතිව. අපි කවදාවත් ඒකට විරුද්ධ වුණේ නැහැ. මොකද, අපි ඒකට විරුද්ධ වුණේ නැත්තේ ජාතීන් දෙකම අපට අවශ්‍ය නිසායි. ඒ නිසා අපි ඒකට ඉඩ ලබා දුන්නා. ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා, ආපසු ඡන්දයක් එන්නේ අවුරුදු හතරකට පසුවයි. අවුරුදු දෙක හමාරෙන් පාර්ලිමේන්තුව විසුරුවන්න පුළුවන් නිසා සමහර විට ඡන්දයක් පවත්වයි. හැබැයි, දැන්ම ඡන්දයක් එන්නේ නැහැ. මේ ඡන්ද පවත්වන කාලය නොවෙයිනේ. මේක දෙන්න කැමැති නැත්තේ ඇයි? මම පළමුවැනි කථාව කළාම ගරු රවුෆ් හකීම් මැතිතුමා මට note එකක් එවලා තිබුණා, "Congratulations! Great speech." කියලා. අද ගරු රවුෆ් හකීම් මැතිතුමාට මෙහෙම කථා කරන්න අවස්ථාව ලැබෙයි කියලා මම හිතුවේ නැහැ. Hon. Member, please allow this. You mentioned that your Members voted for the Twentieth Amendment without your knowledge. I hope that you would get your Members in line to get this done. I do not know if your Members voted for the Twentieth Amendment for this. If you could not get your Members to vote against that, at least get your Members to support this because this is an issue that has been dragging for a long time.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. S. Viyalanderan. You have three minutes.

[பி.ப. 5.21]

ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உண்மையிலே கல்முனை வடக்கு தமிழ் உப பிரதேச செயலகம் தரமுயர்த்தப்படாமலிருப்பது அந்தத் தமிழ்ப் பகுதி மக்களுக்கு ஓர் அநீதியான செயற்பாடாகும். ஏனென்றால், புவியியல் தொடர்பில்லாமல் ஒரு கல்வி வலயத்தை மட்டக்களப்பு மத்திய வலயத்தில் உருவாக்க முடியுமானால், வவுனியாவிலே புவியியல் தொடர்பில்லாமல் ஒரு பிரதேச செயலகத்தை உருவாக்க முடியுமானால், ஏன் அதனைத் தரமுயர்த்த முடியாது? அதே காலப்பகுதியில் உருவாக்கப்பட்ட 27 உப பிரதேச செயலகங்கள் தரமுயர்த்தப்பட்டுள்ள நிலையில், இந்த உப பிரதேச செயலகம் மட்டும் இன்னும் தரமுயர்த்தப் படாமலிருப்பது என்பது ஏற்றுக்கொள்ள முடியாத விடயமாகும். முன்னாள் பிரதமர் ரணில் விக்கிரமசிங்கவின் கடந்த ஆட்சிக்காலத்தில் அந்தக் கல்முனை வடக்கு தமிழ் உப பிரதேச செயலகத்தைத் தரமுயர்த்துமாறு மக்கள் பல்வேறுபட்ட ஆர்ப்பாட்டங்களை, போராட்டங்களை மேற்கொண்டபோது ரணில் விக்கிரமசிங்க அவர்களோடு இணைந்து செயற்பட்ட தமிழ்த் தேசியக் கூட்டமைப்பினுடைய பேச்சாளார் சுமந்திரன் அவர்கள் இங்கிருந்து கல்முனை வடக்குப் பிரதேசத்துக்குச் சென்று, அங்கே மக்கள் மத்தியிலே, "இதை நாங்கள் ஒரு மாத காலத்துக்குள் தரமுயர்த்தித் தருவோம்." என்ற வாக்குறுதியை வழங்கியிருந்தார். அதை நம்பி அந்த மக்கள் அந்த ஆர்ப்பாட்டத்தைக் கைவிட்டிருந் தார்கள். உண்மையிலே, கடந்த ஆட்சிக்காலத்திலே தமிழ்த் தேசியக் கூட்டமைப்பை ஏமாற்றியதுதான் நடந்தது. ஆகவே, நாங்கள் இந்த அரசாங்கத்துக்கு -

ගරු සාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
கௌரவ வியாழேந்திரன் அவர்களே, இது பாராளுமன்ற உறுப்பினர் சுமந்திரனுக்குத் தொடர்பில்லாத ஒரு விடயம்! தயவுசெய்து இங்கு அவரைப்பற்றிக் கதைக்கவேண்டிய அவசியமில்லை. நீங்கள் விசயத்தை மட்டும் கதையுங்கள்! இது கல்முனை வடக்கு தமிழ் உப பிரதேச செயலகத்தைத் தரமுயர்த்தும் விடயம்! நீங்கள் எதற்கு இதில் பாராளுமன்ற உறுப்பினர் சுமந்திரனைப் பற்றிக் கதைக்கவேண்டும்? இது தொடர்பான விசயத்தை மட்டும் கதையுங்கள்! கதைக் கவேண்டியதை மட்டும் கதையுங்கள்! நாங்களே ஒரு DS Division இற்காகக் கதைக்கின்றோம். எவ்வளவு கஷ்டப்பட்டு -

ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
அவர் இங்கிருந்து கல்முனைப் பிரதேசத்துக்குச் சென்று அந்தச் செயலகத்துக்கு முன்னால் கூடியிருந்த மக்களிடம் கல்முனை வடக்கு தமிழ் உப பிரதேச செயலகத்தைத் தரமுயர்த்தித் தருவதாகக் கொண்டுசென்ற கடிதத்தைக்கூட வாசித்துக்காட்டினார். ஆனால், என்ன நடந்தது? சுமந்திரனுடைய கதையை நம்பி, தமிழ்த் தேசியக் கூட்டமைப் பினுடைய கதையை நம்பி அந்த மக்களும் கலைந்து சென்றார்கள். நடந்தது அதுதான்!

ගරු සිවඥානම් සිරීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
அப்படி எதுவும் நடக்கவில்லை!

ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
ஏன் நடக்கவில்லை? அது உங்களுக்கும் நன்றாகத் தெரியும். எனக்கும் நன்றாகத் தெரியும். அந்த விடயம் எல்லோருக்கும் தெரிந்த விடயமாகும். கடந்த காலத்திலே அந்த மக்களுடைய உண்மையான, நேர்மையான போராட்டம் மழுங்கடிக்கப்பட்டது. அந்தப் போராட்டத்திலே நாங்களும் கலந்துகொண்டிருந்தோம். ஆகவே, கல்முனை வடக்கு தமிழ் உப பிரதேச செயலகம் தரமுயர்த்தப்பட வேண்டும் என்பதிலே நாங்கள் கவனமாக இருக்கின்றோம். கடந்த அரசாங்கக் காலத்திலே கல்முனை மக்களை ஏமாற்றினார்கள். கலையரசன் அவர்கள் கூறியதுபோல, அங்கு தமிழ் மக்கள் தமிழ்த் தேசியக்கூட்டமை வெறுப்பதற்கு அதுதான் ஒரு காரணமாக அமைந்தது.

ගරු නිමල් ලාන්සා මහතා (ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிமல் லான்சா - கிராமிய வீதிகள் மற்றும் ஏனைய உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Nimal Lanza - State Minister of Rural Roads and Other Infrastructure)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් ගරු මන්ත්‍රීතුමෙකු, ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා ගැන කථා කරන කොට ඔබතුමා කිව්වා, එතුමා මේ ගරු සභාවේ නැති නිසා එතුමා ගැන කථා කරන්න එපා කියලා. නමුත් බැසිල් රාජපක්ෂ මැතිතුමා ගැන කථා කරනවා. [බාධා කිරීමක්] ඔබතුමා වාඩි වෙන්නකෝ. එල්ටීටීඊ කාලයේ ත්‍රස්තවාදීන් වාගේ මේ ගරු සභාවට ඇවිල්ලා හැසිරෙන්න එපා. තමුන්නාන්සේ ත්‍රස්තවාදියෙක් නොවෙයි. ප්‍රභාකරන් වාගේ ඔබතුමාට මේ පාර්ලිමේන්තුවේ හැසිරෙන්න බැහැ. මේ ගරු සභාවට ඇවිල්ලා, ප්‍රභාකරන් වාගේ මිනිස්සු මරන්න බැහැ. තමුන්නාන්සේට සුමන්තිරන් මන්ත්‍රීතුමා ගැන කථා කරන්න එපා කියන්න පුළුවන්. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. ඒ කාරණය තමුන්නාන්සේ අහ ගන්න. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තමයි පසුගිය අවුරුදු පහ තුළ තිබුණේ. තමුන්නාන්සේලා තමයි යහ පාලන ආණ්ඩුව කළේ. ඒ කාලය තුළ ඒ ජනතාවට සාධාරණය ඉටු කරන්න තිබුණා. මෙතැනට ඇවිල්ලා බොරුවට දඟලන්න ලෑස්ති වෙන්න එපා.

[බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එය ස්ථාවර නියෝගවලට අනුව රීති ප්‍රශ්නයක් නොවෙයි.

කථා කරන්න ගරු එස්. වියාලේන්ද්‍රන් රාජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා**
(மாண்புமிகுச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
கல்முனை வடக்கு தமிழ் உப பிரதேச செயலகம் தரமுயர்த்தப்பட வேண்டும் என்பது அந்த மக்களுடைய நியாயமான கோரிக்கையாகும். அந்த நியாயமான கோரிக் கையை நாங்கள் ஒருபோதும் மறுக்கவில்லை. உண்மையிலே அந்த மக்கள் ஏமாற்றப்பட்டிருக் கின்றார்களென்று கூறி முக்கிறேன்.

**ගරු චමල් රාජපක්ෂ මහතා (වාරිමාර්ග අමාත්‍ය සහ අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - நீர்ப்பாசன அமைச்சரும் உள்ளகப் பாதுகாப்பு, உள்நாட்டலுவல்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa - Minister of Irrigation and State Minister of Internal Security, Home Affairs and Disaster Management)
කරුණාකරලා මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න ඉඩ දෙනවාද?

[බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමල් රාජපක්ෂ රාජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

[අ.භා. 5.26]

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී චාල්ස් නිර්මලනාදන් මැතිතුමා විසින් ගෙනෙන ලද සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳව ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ ඇමතිවරයා හැටියට මම පිළිතුරු ලබා දෙනවා.

"එක රටක්. එක නීතියක්" යන සංකල්පය යටතේ සියලු ජාතීන් සමඟ සමගියෙන් කටයුතු කිරීම අපේ ප්‍රතිපත්තියයි. ඒ සියලු ජාතීන්ගේ අයිතිවාසිකම්, ඒ අයගේ ප්‍රශ්නවලට සාධාරණව, සොයා බලා විසඳුම් ලබා දීම අපේ ප්‍රතිපත්තියයි. එම නිසා වත්මන් තත්ත්වය පිළිබඳව මම පැහැදිලි කරන්නම්.

අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුණේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 1989 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි 1993.07.24 වන දින සිය අමාත්‍ය මණ්ඩලය විසින් කල්මුණ උතුර උපප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඇතුළු උපකාර්යාල 28ක් උත්ශ්‍රේණිගත කිරීමට අනුමැතිය ලබා දී ඇත.

කෙසේ වෙතත් විවිධ හේතු මත 1993 වර්ෂයේ සිට මේ දක්වා මෙම කල්මුණේ උතුර උපප්‍රාදේශීය ලේකම් කාර්යාලය උත්ශ්‍රේණිගත කිරීම සිදු වී නොමැති අතර, මේ පිළිබඳව අවධානය යොමු කරමින් වත්මන් ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2020 පෙබරවාරි මස 17 වැනි දින පැවති සාකච්ඡාවේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පිහිටුවීමේදී සියලු සාධක පිළිබඳව අධ්‍යයනය කර තීරණය ගැනීම සුදුසු බවට යෝජනා කර ඇත. ඒ සඳහා සීමා නිර්ණය කමිටුවක් පිහිටුවා, ඒ පිළිබඳව අධ්‍යයනය කර තීරණය කිරීමට යෝජනා කර ඇත. එසේම මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය "කල්මුණේ උතුර දෙමළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය" ලෙස නම් කිරීම පිළිබඳව අච්චි මොහොමඩ් නසීර් මහතා විසින් රිට් 300/218 අංක යටතේ අභියාචනාධිකරණයේ නඩු පවරා ඇත. එම කාර්යාලයට අමාත්‍යාංශය විසින් යෝජනා කර ඇත්තේ කල්මුණේ උතුර උපප්‍රාදේශීය ලේකම් කාර්යාලය ලෙස භාවිත කරන ලෙසය. ඒ අනුව නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පිහිටුවීම, දැනට පිහිටුවා තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගැසට් කිරීම සහ ග්‍රාම නිලධාරි වසම් පිහිටුවීම හා ප්‍රතිශෝධනය කිරීම සඳහා සීමා නිර්ණය කමිටුවක් පත් කිරීම සඳහා 2020 ඔක්තෝබර් මස 26 වැනි දින රැස් වූ ගරු අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. එබැවින්, එම ගරු අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි සියලු ජාතීන් නියෝජනය කරන නිලධාරින්ගෙන් සමන්විත සීමා නිර්ණය කමිටුවක් ස්ථාපිත කිරීමට මේ වනවිට කටයුතු කර ඇති බවත්, එම සීමා නිර්ණය කමිටුවේ යෝජනා පරිදි මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාල උත්ශ්‍රේණිගත කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී සලකා බලන බවත් කාරුණිකව දැනුම් දෙමි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් පිහිටෙව්වාම එයට අයිති සියලු බලතල ඒ සඳහා ලබා දිය යුතුයි. සෑම ජාතියකටම සාධාරණ වන විධියට වැඩි කාලයක් යන්න ඉස්සෙල්ලා මම මේ ප්‍රශ්නයට මැදිහත් වෙලා, ඔබ හැමදෙනාගේම අදහස් සාකච්ඡා කර බලලා, විශේෂයෙන් ඇමතිවරයා හැටියට කටයුතු කරනවා.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
ගරු අමාත්‍යතුමනි, මඩකළපුව දිස්ත්‍රික්කයේ, කෝරළේපත්තු මධ්‍යම කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත්, ඒ වාගේම ග්‍රාම නිලධාරි වසම් අටක් පිළිබඳවත් ගැටලුවක් තිබෙනවා. ඒවාත් සීමා නිර්ණයට යොදාගෙන, ඒ කොමිටිය හරහා එයටත් විසඳුමක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகுசமல்ராஜபக்ஷ)
(The Hon. ChamalRajapaksa)
ඔබතුමාට බොහොම ස්තුතියි.

ලංකාව පුරා සෑම තැනම, හැම කොට්ඨාසයකටම අදාළව සීමා නිර්ණ කටයුතු කරගෙන යනවා.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகுசாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා අර කොමිටියේ යෝජනාවලින් පස්සේ ඒ වැඩ කරනවා කියලා. මම ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න ඕනෑ. දැනට accountant කෙනෙක් සඳහා cadre එක create කරලා තිබෙන්නේ. දැන් accountant කෙනෙක් හෙට වුණත් ඔබතුමාට දාන්න පුළුවන්. ඒකට committee එකක් ඕනෑ නැහැ. ඉඩම් පිළිබඳ ප්‍රශ්නයට තමයි කොමිටියක් දාලා තිබෙන්නේ.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, සීමා නිර්ණ කමිටුව එක ප්‍රදේශයකට විතරක් සීමා කරලා කටයුතු කරනවා නොවෙයි. ලංකාව පුරාම මේ ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා අපි කෙටි කලක් තුළ සියලුදෙනාගේ අදහස් අරගෙන ජනතාවගේ ප්‍රශ්න විසඳලා,- [බාධා කිරීමක්]-

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ගරු ඇමතිතුමා, එතැන ප්‍රශ්නය තිබෙන්නේ- [බාධා කිරීමක්] දැනට accountant cadre එක create කරලා තිබෙනවා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
සීමා පිළිබඳ ප්‍රශ්න දකුණේත් සමහර තැන්වල තිබෙනවා. සමහර ග්‍රාම නිලධාරි කොට්ඨාස සීමා පිළිබඳ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමා පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. [බාධා කිරීමක්]-

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ඔබතුමන්ලාගේ රජය පත් වෙන්න ඉස්සර වෙලා, පොරොන්දු වුණා ඒ ප්‍රදේශ- [බාධා කිරීමක්] හැබැයි ඒ මොකුත් කරලා නැහැ.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට තිබෙන බලතල ලබා දෙනවා. ඒ නිසා ප්‍රශ්නයක් නැහැ. හැමෝටම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්-

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
හැබැයි, ඒ පොරොන්දුව වෙලා දැන් අවුරුද්දක් ඉවරයි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
අවුරුද්දක් ගෙවුණා වුණාට මේ ප්‍රශ්නය මට නම් ආවේ අදයි. [බාධා කිරීම්] අවුරුද්දක් විතර ගියාට මේ ප්‍රශ්නය මගේ අවධානයට යොමු වුණේ අදයි. [බාධා කිරීම්] ඒ නිසා අපි එය සාධාරණව ඉක්මනින් විසඳලා දෙන්නම්. විශ්වාසය තබන්න. එච්චරයි ඕනෑ.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
විශ්වාසය තිබෙනවා, ගරු ඇමතිතුමනි. [බාධා කිරීම්]

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
අපි තුන්දෙනාම එකට ඉන්න එපායැ.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
Accountant කෙනෙක් මේකට දාලා දෙන්න, ගරු ඇමතිතුමා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු ඇමතිතුමනි, accountant cadre එක create කරලා ලු තිබෙන්නේ. Accountant කෙනෙක් පත් කරන්න විතර ලු තිබෙන්නේ.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
හරි, ඒ ගැන මම බලන්නම්. Accountant කෙනෙක් නේ. ඔහුගෙන් කෙරෙන්නේ මුදල් දෙන එක නේ. අපි දුන්නොත් විතරයි දෙන්නේ. හොඳයි, බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ. භා. 5.30 වුයෙන් ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2020 නොවැම්බර් 13 දින සභා සම්මතිය අනුව, 2020 නොවැම්බර් 21 වන සෙනසුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*
*அதன்படி பாராளுமன்றம், அதனது 2020 நவம்பர் 13 ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2020 நவம்பர் 21, சனிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m.,* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly until 9.30 a.m. on Saturday, 21st November, 2020 pursuant to the Resolution of Parliament of 13th November, 2020.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
**හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau at the Department of Government Information, No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.